82 වන කාණ්ඩය
6 වන කලාපය

බ්‍රහස්පතින්දා
1968 ඔක්තෝබර් 10

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

## නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ

## නිල වාර්තාව

### අන්තර්ගත ප්‍රධාන කරුණු

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [තී. 1053]

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමති, ගරු අයි. එම්. ආර්. ඒ. ඊරියගොල්ල කෙරෙහි විශ්වාස භංගය : [තී. 1072] :

යෝජනාව නිෂ්ප්‍රභ විය.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தொகுதி 82
இல. 6

வியாழக்கிழமை
10 ஒக்ரோபர் 1968

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

## பிரதிநிதிகள் சபை

அதிகார அறிக்கை

பிரதான உள்ளடக்கம்


வினாக்களுக்கு வாய்மூல விடைகள் [ப. 1053]

கல்வி, கலாசார விவகார அமைச்சர் கௌரவ ஐ. எம். ஆர். ஏ. ஈரியகொல்லவில் நம்பிக்கை இல்லாப் பிரேரணை [ப. 1072] :
*பிரேரணை நிராகரிக்கப்பட்டது*


---

Volume 82
No. 6

Thursday
10th October 1968

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## HOUSE OF REPRESENTATIVES

OFFICIAL REPORT

PRINCIPAL CONTENTS


ORAL ANSWERS TO QUESTIONS [Col. 1053]

MOTION OF NO CONFIDENCE IN THE HON. I. M. R. A. IRIYAGOLLE, MINISTER OF EDUCATION AND CULTURAL AFFAIRS [Col. 1072] :
Motion negatived



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# නියෝජිත මන්ත්‍රී මණ්ඩලය
## பிரதிநிதிகள் சபை
## *House of Representatives*

**1968 ඔක්තෝබර් 10 වන බ්‍රහස්පතින්දා**

*வியாழக்கிழமை, 10 ஒக்ரோபர் 1968*

*Thursday, 10th October 1968*

---

**පූ. භා. 10 ට මන්ත්‍රී මණ්ඩලය රැස් විය. කථානායකතුමා [ගරු එස්. සී. ෂර්ලි කොරයා] මූලාසනාරූඪ විය.**

*சபை, மு. ப. 10 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [கௌரவ எஸ். சி. ஷேர்லி கொறயா] தலைமை தாங்கினார்கள்.*

*The House met at 10* A.M., MR. SPEAKER [THE HON. S. C. SHIRLEY COREA] *in the Chair.*

---

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### "පීකිං රිවිව්" සඟරාව බෙදා හැරීම තහනම් කිරීම
"பீகிங் றிவியு" பங்கீட்டுத் தடை

**BAN ON DISTRIBUTION OF "PEKING REVIEW"**

9. **ප්‍රින්ස් ගුණසේකර මයා.** (හබරාදූව)
*(திரு. பிறின்ஸ் குணசேக்கர—ஹபறுதுவ)*
(Mr. Prins Gunasekera—Habaraduwa)

අග්‍රාමාත්‍ය, රාජ්‍යාරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති, ක්‍රම සම්පාදක හා ආර්ථික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: "ඇමෙරිකන් වීව්පොයින්ට්" නම් ප්‍රකාශයක් මෙරටේ බෙදා හැරීමට අවසර දී ඇති රජය "පීකිං රිවිව්" සඟරාව බෙදාහැරීම තහනම් කර ඇත්තේ මන් ද?

*பிரதம அமைச்சரும், பாதுகாப்பு, வெளி விவகார அமைச்சரும் திட்ட அமைப்பு, பொருளாதார விவகார அமைச்சருமான வரைக் கேட்ட வினா: "அமெரிக்கன் வியு பொயின்ற்" எனப்படும் வெளியீடு இந்நாட்டில் பங்கீடு செய்யப்படுவதை அனுமதித் திருக்கையில், "பீகிங் றிவியு" எனப்படும் சஞ்சிகைப் பங்கீட்டை அரசாங்கம் தடை செய்துள்ளதேன்?*

asked the Prime Minister, Minister of Defence & External Affairs and Minister of Planning & Economic Affairs: Why has the Government banned the distribution of the magazine "Peking Review", while permitting the distribution in this country of the publication called "American Viewpoint"?

**ගරු ඩඩ්ලි සේනානායක (අග්‍රාමාත්‍ය, ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති සහ ක්‍රම සම්පාදක හා ආර්ථික කටයුතු පිළිබඳ ඇමති)**
*(கௌரவ டட்லி சேனநாயக்க—பிரதம அமைச்சரும் பாதுகாப்பு, வெளி விவகார அமைச்சரும் திட்ட அமைப்பு, பொருளாதார விவகார அமைச்சரும்)*
(The Hon. Dudley Senanayake—Prime Minister, Minister of Defence & External Affairs and Minister of Planning & Economic Affairs)

The Government has not banned the distribution of the magazine "Peking Review". The publication "American Viewpoint" is published and distributed by the United States Information Service in Colombo. All foreign missions in Ceylon are permitted to publish and distribute such publications provided they conform to the relevant circulars issued by the Ministry of Defence and External Affairs.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

අගමැතිතුමා කියන්නේ "පීකිං රිවිව්" සඟරාව මේ රටේ බෙදා හැරීම තහනම් කර නැති බවයි. බෙදාහරින්නට කලින් එය රටට ගෙන්විය යුතුයි. ගෙන්වීම තහනම් කර තිබෙන්නේ ඇයි?

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

ප්‍රශ්නය අසා තිබෙන්නේ බෙදා හැරීම සම්බන්ධවයි.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

මා දුන් අහන්නේ අතුරු ප්‍රශ්නයක්.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

ප්‍රශ්නය අසා තිබෙන්නේ බෙදා හැරීම ගැනයි. The Principal Collector of Customs acts under certain provisions of the law and where anything infringes the law he has the right to stop it. Possibly, he has taken action under those provisions of the law.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

"පිකිං රිවිව්" සඟරාවෙහි ඇතුළත් දෙයින් ලංකාවේ නීතියේ කිසියම් තැනක් උල්ලංඝණය වී තිබෙනවායයි අගමැතිතුමා කියනවාද?

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

නීතිය උල්ලංඝණය වන හුඟක් දේවල් "පිකිං රිවිව්" සඟරාවත් සමඟ ලංකාවට එනවා.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

එහෙම නම්, ඒ හුඟක් දේවල් අයින් කොට, "පිකිං රිවිව්" සඟරාව පමණක් ගෙන්වීමට ඉඩ සලස්වන්න.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

ඒවා තෝරන්නට ගියොත් නිළධාරීන්ට කොපමණ වැඩිපුර වැඩ ඇති වේයිද?



## රත්නපුර රෝහලේ නේවාසික ශල්‍ය වෛද්‍යවරයාට ටැලිෆෝනයක්

*இரத்தினபுரி ஆசுப்பத்திரி வாச சத்திரவைத்தியருக்கு தொலைபேசி*

## TELEPHONE FOR RESIDENT SURGEON, RATNAPURA HOSPITAL

10. ඩබ්ලිව්. ඒ. ධම්දාස මයා. (පැල්මඩුල්ල)
*(திரு. டபிள்யு. ஏ. தர்மதாச—பெல்மதுல)*
(Mr. W. A. Dharmadasa—Pelmadulla)

සෞඛ්‍ය ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) (1) රත්නපුර මහ රෝහලේ වෛද්‍ය විශේෂඥවරුන් අතරින් ශල්‍ය වෛද්‍යවරුන් සඳහා දුර කථන සේවයක් අත්‍යවශ්‍ය බවත්; (2) මෙම රෝහලේ එක් නේවාසික ශල්‍ය වෛද්‍ය වරයකුගේ රජයේ නිවාසයට සවිකර තිබූ දුර කථනය එම ස්ථානයෙන් ඉවත් කර තවත් වෛද්‍ය වරයකු පදිංචිව සිටින පුද්ගලික නිවසකට සවිකර ඇති බවත්; එතුමා දන්නවාද? (ආ) මේ දුර කථනය ඉවත් කිරීමට හේතු මොනවාද? (ඉ) මෙම නේවාසික ශල්‍ය වෛද්‍යවරයාට නැවත වරක් දුර කථනයක් සැපයීමට එතුමා අදහස් කරනවා ද? (ඊ) නො එසේ නම්, ඒ මන් ද?

*சுகாதார அமைச்சரைக் கேட்ட வினா: (அ) (i) இரத்தினபுரி ஆசுப்பத்திரியிற் கடமையாற்றும் விற்பன்ன சத்திர வைத்தியருக்கு தொலைபேசி வசதி அவசியமானது என்பதையும், (ii) இவ்வாசுப்பத்திரி வதிவு சத்திர வைத்தியர் வாசஞ் செய்யும் அரசாங்க வீட்டிலிருந்த தொலைபேசி அகற்றப்பட்டு வேறொரு வைத்தியரின் சொந்த வீட்டில் நிறுவப்பட்டிருப்பதையும், அறிவாரா? (ஆ) இத்தொலைபேசி அகற்றப்பட்டதேன்? (இ) இவ்வதிவு சத்திர வைத்தியருக்கு தொலைபேசி கொடுக்க உத்தேசமுண்டா? (ஈ) இல்லையெனில், ஏன்*

asked the Minister of Health: (*a*) Is he aware that—(i) telephone facilities are a necessity for the specialist surgeons attached to the Ratnapura hospital; (ii) the telephone in the government bungalow occupied by a resident surgeon of this hospital has been removed and installed in the private residence of another doctor? (*b*) Why was this telephone removed? (*c*) Is it intended to provide this resident surgeon with a telephone? (*d*) If not, why?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු ඊ. එල්. සේනානායක (සෞඛ්‍ය ඇමති)**

*(கௌரவ ஈ. எல். சேனநாயக்க—சுகாதார அமைச்சர்)*

(The Hon. E. L. Senanayake—Minister of Health)

(අ) (i) ඔව්. (ii) ඔව්. (ආ) දැනට නේවාසික ශල්‍ය වෛද්‍යවරයා පදිංචිව සිටින රජයේ බංගලාවේ කලින් සිටි ආගන්තුක වෛද්‍ය විශේෂඥවරයා පදිංචිව සිටි නිසා එම බංගලාවේ සවිකොට තිබුණ දුරකථනය ආගන්තුක වෛද්‍ය විශේෂඥවරයාට වෙන්කර දී තිබෙන දුරකථනය වන්නේ ය. රත්නපුර ආරෝග්‍ය ශාලාවේ දැනට සිටින වෛද්‍ය විශේෂඥවරයා වන වෛද්‍ය කේ. ධම්දස මහතාගේ නිවසෙහි මෙම දුරකථනය දැන් සවිකොට ඇත. (ඉ) ඔව්. විදුලි සන්දේශ පාලක වෙත දැනටමත් ඒ සඳහා ඉල්ලුම් පත්‍රයක් යවා තිබේ. (ඊ) පැන නොනගී.

## ඒ. වී. ඇල්බි සිංඤෝ මහතා, මුරකරු, රජයේ ගොවිපල, පස්යාල

*திரு. ஏ. வி. எல்பி சிங்கோ, காவற்காரர், அரசாங்கப் பண்ணை, பஸ்யால*

**MR. A. V. ALBI SINGHO, WATCHER, GOVERNMENT FARM, PASYALA**

1. **එම්. පී. ද සොයිසා සිරිවර්ධන මයා.** (මිනුවන්ගොඩ—ලක්ෂ්මන් ජයකොඩි මයා.—දිවුලපිටිය—වෙනුවට)

*(திரு. எம். பீ. டி சொய்சா சிறிவர்தன—மினுவாங்கொட—திரு. லக்ஷ்மன் ஜயக்கொடி—திவுலுபிட்டிய—சார்பாக)*

(Mr. M. P. de Zoysa Siriwardena—Minuwangoda—on behalf of Mr. Lakshman Jayakody—Divulapitiya)

කෘෂිකර්ම හා ආහාර ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) දනට පස්යාලේ රජයේ ගොවිපලේ මුර සේවක ඒ. වී. ඇල්බි සිංඤෝ මහතාට ගොවිපල පාලන හා නිෂ්පාදන කාර්යාලයේ පරිපාලන නිලධාරි විසින් එවන ලද ඔහුගේ ආ/131 හා 21. 1. 65 දරණ විශ්‍රාම වැටුප් තත්ත්වයට පත්කිරීම ගැන ලිපිය ඔහුට නොලැබුනේ මන්ද යන වග එතුමා සඳහන් කරණවාද? (ආ) නොඑසේ නම්, ඒ මන්ද?

*விவசாய, உணவு அமைச்சரைக் கேட்ட வினா: (அ) பஸ்யால அரசாங்கப் பண்ணை காவற்காரர் திரு. ஏ. வி. எல்பி சிங்கோ உபகாரச் சம்பள பதவிக்கு நியமிக்கப்பட்டதை தெரிவிக்குமுகமாக ආ/131 இலக்கமிட்டு 21.1.65 இல் பண்ணை முகாமை, ஆக்க அலுவலகத்தின் பரிபாலன உத்தியோகத்தர் அனுப்பிய கடிதம் கிடைக்காததன் காரணத்தை அவர் கூறுவாரா? (ஆ) இன்றேல், ஏன்;*

asked the Minister of Agriculture and Food: (*a*) Will he state the reason why Mr. A. V. Albi Singho, watcher at the Government Farm, Pasyala, did not receive letter No. ආ/131 of 21.1.1965 sent to him by the Administrative Officer of the Farm Management and Production Office, informing him of his being appointed to the pensionable grade? (*b*) If not, why?

**ගරු එම්. ඩී. බණ්ඩා (කෘෂිකර්ම හා ආහාර ඇමති)**

*(கௌரவ எம். டீ. பண்டா—விவசாய, உணவு அமைச்சர்)*

(The Hon. M. D. Banda—Minister of Agriculture and Food)

(*a*) Letter No. ආ/131 dated 21.1.68 granting pensionable status to Mr. A. V. Albi Singho, Watcher, Pasyala Farm, was recalled as it was contrary to Treasury instructions. At about this time grant of pensionable status was suspended pending approval of a cadre of employees by the Treasury. He will be granted pensionable status after the cadre is approved. (*b*) Does not arise.

## මාතර ඉසදීන් නගරයේ නිවාස යෝජනා ක්‍රමයේ හිස් ඉඩම් කැබලි

*மாத்தறை இஸ்ஸதீன் நகர வீடமைப்புத் திட்டத்திலுள்ள ஆளில்லாத காணித்துண்டுகள்*

**VACANT ALLOTMENTS IN ISSADEEN TOWN HOUSING SCHEME, MATARA**

2. **පර්සි වික්‍රමසිංහ මයා.** (කඹුරුපිටිය—බී. වයි. තුඩාවේ මයා.—මාතර—වෙනුවට)

*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ—கம்புறுப்பிட்டிய—திரு. பி. வை. துடாவ—மாத்தறை—சார்பாக)*

(Mr. Percy Wickremasinghe—Kamburupitiya—on behalf of Mr. B. Y. Tudawe—Matara)

විද්‍යාත්මක පර්යේෂණ හා නිවාස ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) මාතර ඉසදීන් නගරයේ නිවාස යෝජනා ක්‍රමයට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පර්සි වික්‍රමසිංහ මයා.]

අයත් හිස් ඉඩම් කැබලි ස්වකීය සාමාජික යන්ට ලබා දෙන ලෙස ඉල්ලමින් ඉසදීන් නගරයේ ඉඩම් කැබලි හිමියන්ගේ ශුභ සාධක සංගමය ඉල්ලීමක් කර තිබෙන බව එතුමා දන්නවාද? (ආ) එම ඉල්ලීම සම්බන්ධයෙන් ගෙන ඇති පියවර කුමක් දැයි එතුමා සඳහන් කරනවාද?

*விஞ்ஞான ஆய்வு, வீடமைப்பு அமைச்சரைக் கேட்ட வினா: (அ) இஸ்ஸதீன் நகரத்தில் காணித்துண்டு பெற்றவரின் நலன் பேணுஞ் சங்கமானது மாத்தறையிலுள்ள இஸ்ஸதீன் நகர வீடமைப்புத் திட்டத்திற்குச் சொந்தமானதும் ஆளில்லாததுமான காணித் துண்டுகளைத் தம் அங்கத்தவருக்குக் கொடுக்கும்படி கோரியதை அவர் அறிவாரா? (ஆ) இக்கோரிக்கை சம்பந்தமாக அவர் எடுத்த நடவடிக்கைகளைக் கூறுவாரா?*

asked the Minister of Scientific Research and Housing: (*a*) Is he aware that the welfare association of the allotment holders in Issadeen Town, have requested that the vacant allotments that belong to the Issadeen Town Housing Scheme in Matara be given to its members? (*b*) Will he state the steps taken regarding this request?

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන (විද්‍යාත්මක පර්යේෂණ හා නිවාස ඇමති)**

*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன—விஞ்ஞான ஆய்வு, வீடமைப்பு அமைச்சர்)*

(The Hon. M. D. H. Jayawardena—Minister of Scientific Research and Housing)

(අ) නැත. (ආ) පැන නොනගී.

### අම්පාරේ අංක 21 ජනපදයට ජලය සැපයීම

*அம்பாறை 21 ஆம் இலக்க குடியேற்றத்திற்குக் குடி தண்ணீர் வசதி*

WATER SUPPLY FOR COLONY NO. 21, AMPARAI

3. ද සොයිසා සිරිවර්ධන මයා. (සෝමරත්න සෙනරත් මයා.—අම්පාරෙයි—වෙනුවට)

*(திரு. டி சொய்ஸா சிறிவர்தன—திரு. சோமரத்ன செனரத்—அம்பாறை—சார்பாக)*

(Mr. de Zoysa Siriwardena—on behalf of Mr. Somaratne Senerath—Amparai)

ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) (i) අම්පාරේ අංක 21 දරණ ජනපදයේ බීමට ජලය සැපයීම සඳහා ඉඩම් කොමසාරිස්වරයා විසින් රුපියල් එක්ලක්ෂ තිස්තුන්දහසක් අනුමත කොට ඇති බවත්; (ii) මෙම ජනපදයේ වැසියන්ට ගංගා නිම්න සංවර්ධන මණ්ඩලය මගින් බවුසර් මාර්ගයෙන් සපයන ලද වතුර නවතා ඇති බවත්; එතුමා දන්නවාද? (ආ) බීමටවත් වතුර නැතිව ඉතාම දුක්ඛිත තත්ත්වයකට වැටී සිටින මෙම ජනපද වැසියන්ට ජලය සැපයීමට ඉඩම් කොමසාරිස්තැනගේ යෝජනාව එතුමා වහාම ක්‍රියාත්මක කරනවාද? (ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

*காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரைக் கேட்ட வினா: (அ) (i) அம்பாறையில் 21 ஆம் இலக்கக் குடியேற்றத்திற்குக் குடி தண்ணீர் வசதி கொடுப்பதற்காக ரூபா 1,33,000 செலவை காணி அதிகாரி அங்கீகரித்துள்ளதையும், (ii) இக் குடியேறிகளுக்கு லொறித் தாங்கி மூலம் தண்ணீர் கொடுப்பதை ஆற்றுப் பள்ளத்தாக்கு அபிவிருத்திச் சபை நிறுத்தியிருப்பதையும் அறிவாரா? (ஆ) குடி தண்ணீர் வசதியேனுமில்லாது அல்லற்படும் இக்குடியேறிகளுக்கு தண்ணீர் கொடுப்பதற்கெனக் காணி அதிகாரி வகுத்த திட்டத்தை உடனேயே நடைமுறைக்குக் கொண்டுவருவாரா? (இ) இல்லையெனில், ஏன்?*

asked the Minister of Land, Irrigation and Power: (*a*) Is he aware (i) that the Land Commissioner has approved the expenditure of Rs. 133,000 to provide drinking water to Colony No. 21 in Amparai; (ii) that the River Valleys Development Board has stopped supplying water by bowser to these colonists? (*b*) Will he immediately implement the proposal of the Land Commissioner for supplying water to these colonists who are in a very sad plight without even a supply of drinking water? (*c*) If not, why?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**සී. පී. ජේ. සෙනෙවිරත්න මයා. (ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. சி. பீ. ஜே. செனெவிரத்ன—காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mr. C. P. J. Seneviratne—Parliamentary Secretary to the Minister of Land, Irrigation and Power)

(අ) (i) ඔව්. (ii) මෙම ජනපදයට ගංගා නිම්න සංවර්ධන මණ්ඩලය බවුසර් මඟින් කුලියට වතුර සපයනු ලදී. කෙසේ වුවද පසුගිය දිනවල බවුසර් කිහිපයක් කැඩී ගිය බැවින් වතුර සැපයීම අත්හිටු වනු ලදී. කැඩීගිය බවුසර් අළුත්වැඩියා කිරීමෙන් පසුව යළිත් වතුර සැපයීම දැන් කෙරීගෙන යනු ලැබේ. (ආ) මෙම මුදල් වර්ෂය තුළදී මෙම වැඩය කරගෙන යන සේ ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනට උපදෙස් දී ඇත. (ඉ) පැන නොනඟී.

### ඊ. පී. ධනපාල ගුරු මහතා

திரு. ஈ. பீ. தனபால, ஆசிரியர்

MR. E. P. DHANAPALA, TEACHER

4. **ඩී. පී. ආර්. වීරසේකර මයා.** (දෙහිඕවිට)

*(திரு. டீ. பீ. ஆர். வீரசேக்கர—தெகியோவிற்ற)*

(Mr. D. P. R. Weerasekera—Dehiowita)

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) ගුරු වෘත්තියේ යෙදී සිටි ඇඩ්වින් පී. ධනපාල මහතා ර. පා. ක. 5914 සහ 16. 7. 65 දින දරණ ලිපියෙන් කරන ලද වැඩ තහනමෙන් පසු සේවයෙන් අස් කළ බව එතුමා දන්නවාද? (ආ) සේවය නැවැත්වීමට එම අයට විරුද්ධව ඇති චෝදනා මොනවාද? (ඉ) එම චෝදනාවට එරෙහිව රාජ්‍ය සේවා කොමිෂන් සභාවට අභියාචනයක් ඉදිරිපත් කළ බව එතුමා දන්නවාද?

*கல்வி, கலாசார விவகார அமைச்சரைக் கேட்ட வினா: (அ) ஆசிரியத் தொழிலில் ஈடுபட்டிருந்த திரு. எட்வின் பீ. தனபால அவர்களை ர. பா .க. 5914 ஆம் இலக்க 16.7.65 ஆம் தேதிக் கடிதம் மூலம் வேலையிலிருந்து இடைநிறுத்தஞ் செய்தபின் சேவையிலிருந்து நீக்கியதை அவர் அறிவாரா? (ஆ) சேவையிலிருந்து நிறுத்துவதற்கு அவருக்கு எதிராக வுள்ள குற்றச்சாட்டென்ன? (இ) அக்குற்றச்சாட்டிற்கு எதிராக அரசாங்க ஆணைக்குழுவிற்கு மனுச் செய்ததை அவர் அறிவாரா?*

asked the Minister of Education and Cultural Affairs: (*a*) Is he aware that Mr. Edwin P. Dhanapala, a school teacher, was interdicted by letter ර.පා.ක. 5914 of 16.7.65 and was subsequently dismissed from service? (*b*) What were the charges that led to his dismissal? (*c*) Is he aware that an appeal against this decision has been made to the P. S. C.?

**ගාමිණී ජයසූරිය මයා. (අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. காமினி ஜயசூரிய—கல்வி, கலாசார விவகார அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mr. Gamani Jayasuriya—Parliamentary Secretary to the Minister of Education and Cultural Affairs)

(*a*) Yes. (*b*) (i) Contravention of the Administrative Regulations Nos. 264 and 265 by presenting himself as a candidate for Ward No. 5 of the Kuruvita Village Committee at the local government election, 1965. (ii) Furnishing of incorrect information in reply to letter No. ර/පා. ක./5914 of 28.1.1965 of the Assistant Director of Education, Ratnapura. (*c*) No.

### නාවලපිටිය රෝහලේ හිටපු වින්නඹු එස්. එම්. හේමාවතී මිය.

திருமதி எஸ். எம். ஹேமாவதி, இளைப்பாறிய மருத்துவத் தாதி, நாவலப்பிட்டி வைத்தியசாலை

MRS. S. M. HEMAWATHIE, RETIRED MIDWIFE, NAWALAPITIYA HOSPITAL

5. **වීරසේකර මයා.**

*(திரு. டீ. பீ. ஆர். வீரசேக்கர)*

(Mr. Weerasekera)

සෞඛ්‍ය ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) (i) නාවලපිටිය රෝහලේ වින්නඹු සේවිකාවක් වශයෙන් සේවය කළ එස්. එම්. හේමාවතී මහත්මිය 1967 වර්ෂයේ මාර්තු මස 1 වෙනිදා විශ්‍රාම ගිය බවත්; (ii) හේමාවතී මහත්මියගේ විශ්‍රාම වැටුප් සහ පෙබරවාරි මස වේතනය මේ වනතුරු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වීරසේකර මයා.]

ගෙවා නැති බවත් ; එතුමා දන්නවාද ? (ආ) ඇයට විශ්‍රාම වැටුප් සහ පෙබරවාරි මස වේතනය ඉක්මණින් ලබා දීමට කටයුතු කරනවාද ? (ඉ) එසේ නම්, කවදද ? (ඊ) නොඑසේ නම්, ඒ මන්ද ?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா: (அ) (i) நாவலப்பிட்டி வைத்தியசாலையில் மருத்துவத் தாதியாகச் சேவை செய்த திருமதி எஸ். எம். ஹேமாவதி 1967 ஆம் ஆண்டு மார்ச் மாதம் 1 ஆம் தேதி இளைப்பாறினரென்பதையும், (ii) திருமதி ஹேமாவதி அவர்களின் இளைப்பாற்றுச் சம்பளமும் பெப்ரவரி மாதச் சம்பளமும் இதுவரை கொடுபடவில்லையென்பதையும் அவர் அறிவாரா? (ஆ) அவருக்கு இளைப்பாற்றுச் சம்பளத்தையும் பெப்ரவரி மாதச் சம்பளத்தையும் விரைவில் பெற்றுக் கொடுப்பதற்கு நடவடிக்கை எடுப்பாரா? (இ) அவ்வாறெனில், எப்போது? (ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Health : (*a*) Is he aware—(i) that Mrs. S. M. Hemawathie who was a midwife in the Nawalapitiya Hospital retired from service on 1st March 1967 ; and (ii) that neither her salary for February nor her pension has been paid to her yet ? (*b*) Will he take action early to pay her pension and the salary for February ? (*c*) If so, when ? (*d*) If not, why ?

ගරු ඊ. එල්. සේනානායක

(கௌரவ ஈ. எல். சேனநாயக்க)

(The Hon. E. L. Senanayake)

(*a*) (i) Yes. (ii) Yes, pension only. Her February salary has since been paid. (*b*) Yes, pension only. (*c*) Steps are being taken by the Superintendent of Health Services, Kandy, to forward the pension application to the Director of Pensions early. (*d*) Does not arise.

## දෙහිඕවිට තැපැල් කාර්යාලය

தெகியோவிற்ற தபாற் கந்தோர்

DEHIOWITA POST OFFICE

6. වීරසේකර මයා.

(திரு. வீரசேக்கர)

(Mr. Weerasekera)

රජයේ වැඩ, තැපැල් සහ විදුලි සංදේශ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) (i) දෙහිඕවිට තැපැල් කාර්යාලය මගින් උප තැපැල් කාර්යාල දහයක් සහ ප්‍රධාන ලිපි බෙදීමේ මාර්ග හතක් පාලනය කෙරෙන බවත් ; (ii) එම කාර්යාලයේ ලිපි බෙදීමේ කොටස් 1960 න් පසු සංශෝධනය කර නැති බවත් ; (iii) මෙම කාර්යාලයට මෙතෙක් ලියුම් තේරීමේ නිලධාරියෙකු පත් කර නැති බවත් ; එතුමා දන්නවාද ? (ආ) එම අඩුපාඩුකම් සපුරා ලීමට ක්‍රියා කරන්නේද ? (ඉ) එසේ නම්, ඒ කවදද ? නොඑසේ නම්, ඒ මන්ද ?

அரசாங்கக் கட்டுவேலை, தபால், தந்திப் போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினா: (அ) (i) தெகியோவிற்ற தபாற் கந்தோர் மூலம் பத்து உப தபாற் கந்தோர்களும் ஏழு பிரதான தபால் விநியோகப் பாதைகளும் பரிபாலிக்கப்படுவதையும், (ii) அக்கந்தோரின் தபால் விநியோகிக்கும் பகுதிகள் 1960 ஆம் ஆண்டின் பின் திருத்தியமைக்கப்படவில்லையென்பதையும், (iii) கடிதங்களைத் தெரிவு செய்யும் உத்தியோகத்தரை இக் கந்தோருக்கு இதுவரை நியமிக்கவில்லை யென்பதையும் அவர் அறிவாரா? (ஆ) இக்குறைபாடுகளை நீக்குவதற்கு நடவடிக்கை எடுப்பாரா? (இ) அவ்வாறெனில், எப்போது? இன்றேல், ஏன்?

asked the Minister of Public Works, Posts and Telecommunications : (*a*) Is he aware—(i) that there are ten sub-post offices and seven principal mail delivery zones under the Dehiowita Post Office ; (ii) that the mail delivery zones of this post office have not been revised since 1960 ; and (iii) that a sorting officer has not been appointed to this post office so far ? (*b*) Will he take action to remedy these shortcomings ? (*c*) If so, when ? If not, why ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**විජයපාල මෙන්ඩිස් මයා. (රජයේ වැඩ, තැපැල් හා විදුලි සන්දේශ ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. விஜயபால மெண்டிஸ்—அரசாங்கக் கட்டுவேலை, தபால் தந்திப் போக்குவரத்து அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mr. Wijayapala Mendis—Parliamentary Secretary to the Minister of Public Works, Posts and Telecommunications)

(අ) (i) දෙහිඹිවිට තැපැල් කාර්යාලය මගින් පාලනය කරන උප තැපැල් කාර්යාල 9 ක් සහ ලිපි භාරදීමේ කාර්යාල 1 ක් ඇත. ලිපි බෙදීමේ කොටස් 8 ක් තිබේ. (ii) ඔව්. (iii) ඔව්. (ආ) දෙහිඹිවිට තැපැල් කාර්යාලයට සීමා වූ විශේෂ අඩුපාඩුකම් කිසිවක් නොමැත. අලුතෙන් නිලධාරීන් බඳවා ගැනීමට හැකි වන ලෙස මුදල් තත්ත්වය සතුටුදායක වූවායින් පසු අඩුපාඩුකම් කිසිවක් ඇත්නම් එය සම්පූර්ණ කරනු ලැබේ. (ඉ) අතිරේක තැපැල් කරුවන් පත් කිරීම සඳහා අවශ්‍ය මුදල් ප්‍රතිපාදන 1960 සිට 1963 දක්වා ඇස්තමේන්තු වලින් අනුමත නොවිය. 1964 වර්ෂයේ ලද ප්‍රතිපාදන ප්‍රමාණය ඉතා අල්පය. 1960 සිට 1963 දක්වා වූ කාලය තුල ප්‍රමාද වුන කටයුතු යථා තත්ත්වයට ගෙන ඒමට දෙපාර්තමේන්තුව ක්‍රියා කර ගෙන යන නිසා එම කටයුතු අවසාන වන තෙක් ප්‍රතිශෝධන කිරීම තාවකාලිකව අත්හිටවා ඇත. මෙම තැපැල් කාර්යාලයේ දිනපතා හුවමාරු වන ලිපි සංඛ්‍යාව අනුව, ලියුම් තෝරන නිලධාරියෙකු පත් කිරීමට අවශ්‍ය සුදුසුකම් නැත.

## තිරප්පනේ තානායම් භාරකරුව සිටි එන්. ඩබ්ලිව්. ජෝන් අප්පුහාමි මහතාගේ වැන්දඹුවට ලැබිය යුතු ගෙවීම්

திரு. என். டபிள்யு. யோண் அப்புஹாமி, இளைப்பாறிய வாடிவீட்டுப் பொறுப்பாளர், திறப்பனைப் விதவைக்குச் சேரவேண்டிய பணம்

MR. N. W. JOHN APPUHAMY, RETIRED RESTHOUSE-KEEPER, THIRAPPANE: PAYMENTS DUE TO WIDOW

7. පී. එම්. කේ. තෙන්නකෝන් මයා. (මිහින්තලේ)

*(திரு. பி. எம். கே. தென்னகூன்—மிஹிந்தலை)*

(Mr. P. M. K. Tennekoon—Mihintale)

මුදල් ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) (1) තිරප්පනේ තානායම් භාරකරුව සිටි විශ්‍රාම වැටුප් අංක පී. ඇන්. ආර්. සී/113 හා 1959.7.18 දරණ ඇන්. ඩබ්ලිව්. ජෝන් අප්පුහාමි මහතා කලකට ඉහත මිය ගිය බවත්; (2) ඒ මහතාගේ මරණයෙන් පසු වැන්දඹු හා අනත්දරු වැටුප ඒ මහතාගේ භාර්යාව වූ තිරප්පනේ පදිංචි එච්. ඇම්. හීන් මැණිකේ මහත්මියට ලැබිය යුතු නමුත්, මෙතෙක් එය ලබා ගැනීමට නොහැකිවූ බවත්; එතුමා දන්නවාද? (ආ) එම වැටුප නොපමාව එම මහත්මියට ලබාදීමට එතුමා කටයුතු සලස්වන්නේද? නොඑසේ නම්, හේතු කවරේද?

*நிதி அமைச்சரைக் கேட்ட வினா: (அ) (i) திறப்பனை வாடிவீட்டுப் பொறுப்பாளராயிருந்தவரும் இளைப்பாற்றுச் சம்பள எண். பீ. என். ஆர். சீ/133 உம் 1959.7.18 உம் கொண்டவருமான திரு. என். டபிள்யு. யோண் அப்புஹாமி அவர்கள் சிறிது காலத்திற்கு முன் இறந்து போனரென்பதையும்; (ii) அவருடைய மரணத்தின்பின் விதவைகள், அநாதைகள் சம்பளம் அவரின் மனைவியும் திறப்பனையிலிருப்பவருமான திருமதி எச். எம். ஹீன் மெணிக்கே அவர்களுக்குக் கிடைக்கவேண்டியிருந்தும், இதுவரை அதனைப் பெற்றுக்கொள்ள முடியவில்லையென்பதையும் அவர் அறிவாரா? (ஆ) அச்சம்பளத்தைத் தாமதமின்றி அவருக்குப் பெற்றுக்கொடுக்க அவர் நடவடிக்கை எடுப்பாரா? இன்றேல் காரணமென்ன?*

asked the Minister of Finance: (a) Is he aware—(i) that Mr. N. W. John Appuhamy, retired resthouse keeper of Thirappane resthouse (pension number P. N. R. C/113 of 18.7.1959) died some time ago; and (ii) that the widows' and orphans' payments due to his widow Mrs. H. M. Heenmenike of Thirappane have not yet been paid to her; (b) Will he take action to make these payments to her without delay? If not why?

**ගරු එම්. ඩී. බණ්ඩා (මුදල් ඇමති වෙනුවට)**

*(கௌரவ எம். டீ. பண்டா—நிதி அமைச்சர் சார்பாக)*

(The Hon. M. D. Banda—(on behalf of the Minister of Finance)

(a) (i) Yes. He was a circuit bungalow-keeper, and not a resthouse keeper. (ii) His widow is not entitled

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු එම්. ඩී. බණ්ඩා]

to a widow's pension as he was not a contributor to the Widows' and Orphans' Pension Scheme. (*b*) Does not arise in view of reply to (*a*) (ii) above.

## කටුනායක සිවිල් ගුවන් හමුදාවේ අනියම් කම්කරුවන්

கட்டுநாயக்க சிவில் விமானப்படை சமயோசிதத் தொழிலாளர்

**CASUAL WORKERS, CIVILIAN AIR FORCE, KATUNAYAKE**

8. ද සොයිසා සිරිවර්ධන මයා. (ලක්ෂ්මන් ජයකොඩි මයා. වෙනුවට)

*(திரு. எம். பீ. டி சொய்சா சிறிவர்தன—திரு. லக்ஷ்மன் ஜயக்கொடி சார்பாக)*

(Mr. de Zoysa Siriwardena—on behalf of Mr. Lakshman Jayakody)

ප්‍රවාහණ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) කටුනායක සිවිල් ගුවන් හමුදාවේ සේවයේ සිටින අනියම් කම්කරුවන් 55 දෙනාට ලැබෙන මූලික වැටුප වන රු. 1.25 පඩි ක්‍රමය අද ජීවත්වීමට නොසෑහෙන බව එතුමා දන්නවාද? (ආ) 1966 සැසි වාර යේදී පාර්ලිමේන්තුවේදී නගන ලද ප්‍රශ්න යකට ඔවුන්ගේ ස්ථිර කිරීම 1968 දී කරන බවත් අළුත් ගුවන් තොටුපළ අව සාන කිරීමෙන් පසු එය කළ හැකි බවත් දන්වා සිටියේ ද? (ඉ) මෙය ඉටු කරනවා ද? නො එසේ නම්, ඒ මන් ද?

*போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினா: (அ) கட்டுநாயக்க சிவில் விமானப்படையில் சேவைசெய்யும் 55 சமயோசித தொழிலாளர் பெறும் அடிப்படைச் சம்பளமான ரூபா 1.25 சம்பளத்திட்டம் இன்று வாழ்க்கையை நடத்துவதற்குப் போதாதென்பதை அவர் அறிவாரா? (ஆ) 1966 ஆம் ஆண்டின் கூட்டத்தொடரில் பாராளுமன்றத்தில் எழுப் பப்பட்ட வினாவிற்கு, அவர்களை 1968 இல் நிரந்தரமாக்குவதென்றும் புதிய விமானத் துறை முடிவடைந்தபின் அதனைச் செய்ய முடியுமென்றும் அறிவித்தாரா? (இ) இதனை நிறைவேற்றுவாரா? இன்றேல், ஏன்?*

asked the Minister of Communications: (*a*) Is he aware that the salary scale of Re. 1.25 basic, which is paid to the 55 casual workers employed in the Civilian Air Force of Katunayake, is not a living wage? (*b*) In reply to a question asked in Parliament during the 1966 session, did he state that they would be given permanent appointments in 1968 and that this would be possible after the construction of the new airport is completed? (*c*) Will he honour this undertaking? If not why?

**ගරු ඊ. එල්. බී. හුරුල්ලේ (ප්‍රවාහණ ඇමති)**

*(கௌரவ ஈ. எல். பி. ஹுருல்ல—போக்குவரத்து அமைச்சர்)*

(The Hon. E. L. B. Hurulle—Minister of Communications)

(*a*) Casual unskilled labourers employed at the Katunayake Airport are paid according to wages board rates in terms of paragraph 4 of Treasury Circular No. 543/E/218|DE of 18.1.64. Accordingly, they now receive a basic wage of Rs. 1.40 per diem plus an allowance of Rs. 1.42 per diem. (*b*) No undertaking has been given to make all casual employees permanent. (*c*) 32 posts of sanitary labourers and 18 posts of unskilled labourers have been sanctioned on a permanent basis for the Katunayake Airport. 22 vacancies have already been filled on a permanent basis from among these casual unskilled labourers and action is being taken to fill the remaining vacancies by appointing suitable persons from the rest of these employees.

## 1964 දී බඳවා ගන්නා ලද ශිෂ්‍ය ගුරුවරුන්

மாணவ ஆசிரியர் நியமனம், 1964

**PUPIL TEACHERS APPOINTED IN 1964**

11. ප්‍රින්ස් ගුණසේකර මයා. (එස්. ඩී. බණ්ඩාරනායක මයා.—ගම්පහ—වෙනුවට)

*(திரு. பிறின்ஸ் குணசேக்கர—ஹபருதுவ—திரு. எஸ். டீ. பண்டாரநாயக்க—கம்பஹா—சார்பாக)*

(Mr. Prins Gunasekera—Habaraduwa—on behalf of Mr. S. D. Bandaranayake—Gampaha)

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) අභ්‍යාස විද්‍යාල වලට ඇතුළත් කරගනු ලබන සංඛ්‍යාව සීමා සහිත හෙයින්, අතිශය තරඟකාරී විභාගයකින් පසුව, 1964 දී තෝරාගනු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලැබ, මෙතෙක් අභ්‍යාස විද්‍යාලවලට ඇතුළු වීමට නොහැකි වූ ශිෂ්‍ය ගුරුවරුන්ගේ සේවය, 1969 දී කෙළවර කරන්නට යන බව එතුමා දන්නවාද? (ආ) මෙම ගුරුවරුන්ට, අවුරුදු පහක ඉගැන්වීමේ පළපුරුද්දක් තිබෙන හෙයින්, ඔවුනට ගුරු සහතිකයක් දී, ස්ථිර කිරීමට එතුමා සලකා බලනවා ද?

*கல்வி, கலாசார விவகார அமைச்சரைக் கேட்ட வினு: (அ) 1964 இல் கடும்போட்டிப் பரீட்சை மூலம் தெரிவு செய்யப்பட்டவர்களும், பயிற்சிக் கல்லூரிகளில் அனுமதிக்கப்படுவர் தொகை போதாமையால் இதுவரையில் பயிற்சிக்கல்லூரியில் பிரவேசிக்க முடியாமலிருப்பவர்களுமான மாணவ ஆசிரியர்களின் சேவைகள் 1969 இல் நிறுத்தப்பட இருப்பதை அவர் அறிவாரா? (ஆ) இந்த ஆசிரியர்களுக்கு ஐந்து வருஷ ஆசிரிய அனுபவமிருப்பதால் அவர்களுக்கு ஒரு ஆசிரியர் சான்றிதழ் வழங்கி அவர்களை நிரந்தரமாக்குவதை அவர் கருத்திற்கெடுப்பாரா?*

asked the Minister of Education and Cultural Affairs,—(*a*) Is he aware that pupil teachers who were selected in 1964 after a highly competitive examination, and who have so far failed to enter a training college due to the inadequacy in the intake of training colleges, are to have their services terminated in 1969? (*b*) In view of the fact that these teachers have teaching experience of five years will he consider granting them a Teachers' Certificate and making them permanent?

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)

(*a*) No. Pupil teachers appointed in 1964 may gain permanency under Government by passing either the Guru Vidyalaya Entrance Examination or the Teachers' Certificate Examination. Those who have not been able to secure permanent appointments under Government yet are given time till 3.2.1969 to pass one of the above examinations. The final course of action to be taken in regard to those pupil teachers who do not pass in one of these examinations will be decided in due course. (*b*) No. Even at this stage the pupil teachers can sit the Teachers' Certificate Examination. This examination is not competitive. Pupil teachers who pass this examination can secure permanent appointments as teachers under the Government.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

ගරු උප ඇමතිතුමා කරුණාකර කියනවාද ශිෂ්‍ය ගුරු පත්වීම් ලැබුණාට පසුව විශ්ව විද්‍යාලවලට ගිහින් උපාධි ලබාගත් අයට එම පත්වීම් අලුතෙන් දෙනවාද කියා?

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)

දෙපාර්තමේන්තුවෙන් අවසර අරගෙන ගියා නම්, නිවාඩු ලබාගෙන ගියා නම්, පත්වීම් ලැබෙනවා. අස් වී ගියා නම් ලැබෙන්නෙ නැහැ.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

අස් වී ගිය අය නොවෙයි. ශිෂ්‍ය ගුරු පත්වීම් ලබා සිටි නමුත්, විශ්ව විද්‍යාලවල උපාධි ලබා ගැනීමේ අවස්ථාව ඔවුන්ට ලැබී තිබුණ නිසා ඒ බව දෙපාර්තමේන්තුවට දන්වා උපාධි ලබාගෙන එ[illegible] පිණිස අවසර අරන් ගිය අය ගැනයි මා ඇසුවේ. ඒ අයට අලුතෙන් පත්වීම් දෙනවාද?

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)

අවසර අරගෙන ගියානම් දෙන්නම්.

**ටී. බී. එම්. හේරත් මයා.** (වලපනේ)
*(திரு. ரி. பி. எம். ஹேரத்—வலப்பனை)*
(Mr. T. B. M. Herath—Walapane)

ශිෂ්‍ය ගුරුවරුන්ට විශ්ව විද්‍යාලයට ඇතුළු වන්නට අවස්ථාව ලැබුණ වෙලාවේ දෙපාර්තමේන්තුව බල කළා, අස් වී මිස

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වාචික පිළිතුරු

[ටී. බී. එම්. හේරත් මයා.]
යන්න එපාය කියා. ඒ නිසා වැඩි දෙනෙක් විශ්ව විද්‍යාලයට ගියේ අස්වෙලායි. එහෙත් දෙපාර්තමේන්තුවට කිසිසේත්ම නො දන්වා ගිය අයට පත්වීම් ලැබී තිබෙනවා. දන්වා ගිය අයට පත්වීම් ලැබී නැහැ. මෙය අසාධාරණයක්. ඒ ගැන කරුණාකර සම්පූර්ණයෙන් සොයා බලනවාද ?

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)
ඒ ගැන සොයා බලන්න පුළුවනි.

## අන්නාමලෙයි විශ්ව විද්‍යාලයේ පුලවාර් උපාධිධාරීන්

அண்ணாமலை பல்கலைக்கழக புலவர் பட்டதாரிகள்

PULAVAR GRADUATES, ANNAMALAI UNIVERSITY

12. **එස්. ඩී. බණ්ඩාරනායක මයා.** (ගම්පහ)
*(திரு. எஸ். டீ. பண்டாரநாயக்க—கம்பஹா)*
(Mr. S. D. Bandaranayake—Gampaha)
අධ්‍යාපන සහ සංස්කෘතික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) අන්නාමලෙයි විශ්ව විද්‍යාලයේ සංගීත උපාධිධාරීන්ට රජයේ පාසල්වල ගුරු පත්වීම් දෙනු ලබන අතර, රජයේ අවසරය ඇතිව සිව් අවුරුද්දක් ද්‍රවිඩ විෂයය පිළිබඳ අධ්‍යාපන පාඨමාලා හැදෑරූ එම විශ්ව විද්‍යාලයේම පුලවාර් උපාධිධාරීන් පසුගිය හත් අවුරුද්ද තුළම රක්ෂා විරහිතව සිටින බව එතුමා දන්නවාද ? (ආ) මෙම උපාධිධාරීන්ට එතුමා පත්වීම් දෙනවාද ?

கல்வி, கலாசார விவகார அமைச்சரைக் கேட்ட வினா: (அ) அண்ணாமலை பல்கலைக் கழகத்து இசைப்பட்டதாரிகளுக்கு அரசாங்கக் கல்லூரிகளில் நியமனங் கொடுக்கப்படுகையில் அரசாங்கத்தின் அனுமதியுடன் அதே பல்கலைக்கழகத்தில் தமிழ்க் கல்வித் திட்டமொன்றினை 4 ஆண்டுகளாக தொடர்ந்து கற்று புலவர் பட்டதாரி ஆனவர்கள் கடந்த 7 ஆண்டுகளாக வேலை இல்லாதிருப்பதை அவர் அறிவாரா? (ஆ) இப்பட்டதாரிகளுக்கு நியமனங்களை அவர் வழங்குவாரா?

asked the Minister of Education and Cultural Affairs: (*a*) Is he aware that, while music graduates of the Annamalai University are given teaching appointments in government schools, Pulavar graduates of the same university who followed courses of studies for four years in Tamil with the permission of the Government, have been unemployed for the last seven years? (*b*) Will he give appointments to these graduates?

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)
(අ) ඔව්. (ආ) නැත.

## අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමති ගරු අයි. එම්. ආර්. ඒ. ඊරියගොල්ල කෙරෙහි විශ්වාස භංග යෝජනාව

கல்வி, கலாசார விவகார அமைச்சர் கௌரவ ஐ. எம். ஆர். ஏ. ஈரியகொல்லயில் நம்பிக்கையில்லாப் பிரேரணை

MOTION OF NO CONFIDENCE IN THE HON. I. M. R. A. IRIYAGOLLE, MINISTER OF EDUCATION AND CULTURAL AFFAIRS

පූ. භා. 10.14

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
ගරු කථානායකතුමනි, වර්තමාන රජයේ අධ්‍යාපන ඇමතිවරයාට විරුද්ධව දෙවැනි වරටත් විශ්වාස භංග යෝජනාවක් ඉදිරිපත් කිරීමට ලැබීම ගැන මා සන්තෝෂ වෙනවා. තමුන්නාන්සේට මතක ඇති, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු භාර ඇමති අයි. එම්. ආර්. ඒ. ඊරියගොල්ල මහතා කෙරෙහි විශ්වාස භංග යෝජනාවක් 1965 ජූලි 28 වන දිනත් මේ ගරු සභාවේදී සාකච්ඡාවට භාජන කෙරුන බව. එදා එම යෝජනාව ඉදිරිපත් කළේ මැතිවරණයෙන් පසුව මේ රටේ අධ්‍යාපනය විෂයෙහි හා ගුරුවරුන් විෂයෙහි කරන ලද විශාල ආන්දෝලනයක ප්‍රතිඵලයක් වශයෙනුයි. එම විශ්වාස භංග යෝජනාවේදී අපි පැහැදිලිව පෙන්නුම් කර දුන්නා, ගරු අධ්‍යාපන ඇමතිවරයා ඇමති ධුරයට පත්වූ වහාම ඉවක් බවක් නැතිව කටයුතු කරමින් මේ රටේ අධ්‍යාපන තත්ත්වයත් ගුරුවරුන්ගේ තත්ත්වයත් කෙළෙසූ අන්දම ගැන.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු කථානායකතුමනි, මගේ කථාව ආරම්භයේදීම එදා අප විසින් ඉදිරිපත් කරන ලද විශ්වාස භංග යෝජනාව මොකක්ද කියන එක මතක් කර දීම මගේ යුතුකමක්ය කියා මා කල්පනා කරනවා. අපි එදා ඉදිරිපත් කළ විශ්වාස භංග යෝජනාව නම් මෙයයි: එය 1965 ජූලි 28 වෙනි දින හැන්සාඩ් වාර්තාවේ 3139 වන තීරුවේ සඳහන් වෙනවා:

(1) ගුරුමාරු මණ්ඩල ගැන නොසලකා හරිමින් හා දේශපාලන හේතූන් උඩ ගුරුවරුන් මාරු කිරීම නිසා පාසැල්වල සෑහෙන සහ නියම ප්‍රමාණයක ගුරු මණ්ඩල නැතිවන සේ අනාගත අධ්‍යාපනය ප්‍රපාතයෙහි හෙලමින්ද;

(ii) විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීන්ගෙන් දේශපාලන පළිගැනීමේ චේතනාවෙන් ටෙන්ඩර් කැඳවීමෙන ගොඩනැගීමට භාර දෙන ලද ගෝ බෑගෙට ගොඩ නගා ඇති පාසැල් ගොඩනැගිලි තැනීම හිතූ පරිදි නවතා දැමීමෙන්ද ගන්නා ලද ක්‍රියාමාර්ග නිසා අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමති ගරු අයි. එම්. ආර්. ඒ. ඊරියගොල්ල මහතා කෙරෙහි විශ්වාසය තැබිය නොහැකි බව මෙම මන්ත්‍රී මණ්ඩලය අදහස් කරයි."

මෙන්න මේ යෝජනාවයි එදා අපි සාකච්ඡා කළේ. සම්පූර්ණ දවසක් තිස්සේ අපි එම යෝජනාව සාකච්ඡාවට භාජන කළා. අන්තිමේදී යෝජනාව පරාජයට පත් වුණ බව ඇත්තයි. රජයේ ඡන්දවල බල මහිමය නිසා එදා එම යෝජනාව පරාජයට පත් වුණා. නමුත් යම් තරමක ප්‍රතිඵලයක් වත් එම යෝජනාව මගින් අපට ලැබුණ බව කිව යුතුව තිබෙනවා. එම යෝජනාවෙන් පසුව 1965 අවසානයේ සිට නැත්නම් 1966 ආරම්භයේ සිට එතුමාගේ ඒ අයුතු ක්‍රියා ඒ තරම් වේගයෙන් ක්‍රියාත්මක කෙරුණේ නැහැ. අතරින් පතර යම් යම් අවස්ථාවලදී කෙරුණත් කලින් තරම් වේගයෙන් කෙරුණේ නැහැ. ඒ නිසා අපි කල්පනා කළා, අධ්‍යාපන ඇමතිතුමා විසින් ආරම්භයේදී කරන ලද ඒ දඟකාර කම් නවත්වා දමා නියම අධ්‍යාපන ප්‍රතිපත්ති උඩ ඉදිරියේදී මේ රටේ අධ්‍යාපන ක්‍රමය නගා සිටු වන අන්දමට ක්‍රියාත්මක වැඩ පිළිවෙළක් යොදාවිය කියා. එතුමා ඒ විධියට කටයුතු කරනවා ඇතැයි කියන විශ්වාසයක් ඇතිව අපි ක්‍රියා කළා. නමුත් අවුරුදු 3 කට නැත්නම් අවුරුදු තුනකුත් මාස ගණනකට පසුව අද අපට නැවතත් විශ්වාස භංග යෝජනාවක් ඉදිරිපත් කිරීමට සිදු වී තිබෙනවා. කලින් අප විසින් ඉදිරිපත් කරන ලද්දේ තනිකර මේ රටේ ගුරුවරුන්ටත්, ඒවගේම විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන්ටත් කරන ලද අසාධාරණය පිළිබඳ සීමා සහිත යෝජනාවකුයි. නමුත් අද අප විසින් ඉදිරිපත් කර තිබෙන්නේ සීමා රහිත යෝජනාවකුයි. ඒ බව යෝජනාව කියවන විට තමුන්නාන්සේට පැහැදිලි වෙයි. මෙන්න එම යෝජනාව:

"තවමත් පාර්ලිමේන්තුවේ දෙවැනි වර විවාදයට පමා ලක් නොවූ සාමාන්‍ය හා කාර්මික අධ්‍යාපන පනතට ඇතුලත් යෝජනා මන්ත්‍රී මණ්ඩලයේ සම්මතය නොලබා අමාත්‍යාංශයේ නියෝග මගින් ක්‍රියාත්මක කරගෙන යන බැවින් ද, දැනටමත් ඉද්ධිමත් ගම්බද දරුවන්ට නිදහස් අධ්‍යාපනය යටතේ විවෘතව තිබූ උසස් අධ්‍යාපන පහසුකම් රාශියක් අහිමි කර ඇති බැවින්ද, මේ නිසාම විද්‍යා, කාර්මික ආදී උසස් යයි සම්මත වෘත්තිය අධ්‍යාපනය එක්තරා පිරිසකට සීමාවන බැවින්ද, දැනට වර්ගකර ඇති පාසැල් ශ්‍රේණී ක්‍රමය යටතේ ගුරු ශිෂ්‍ය දෙපක්ෂයටම බලවත් අසාධාරණයක් සිදුවී ඇති බැවින්ද, වර්තමාන ඇමතිවරයාගේ කාලයේදී සම්පූර්ණ අධ්‍යාපන ප්‍රණාලිය අවුල් ජාලයක් බවට පත්ව ඇති බැවින්ද, මෙම මන්ත්‍රී මණ්ඩලය වර්තමාන අධ්‍යාපන ඇමතිවරයා කෙරෙහි විශ්වාසය නොතබයි."

ගරු කථානායකතුමනි, ගරු අධ්‍යාපන ඇමතිතුමා මේ රටේ අධ්‍යාපන ප්‍රණාලිය අවුල් ජාලයක් බවට පත් කර ඇති නිසා ඊට විරුද්ධත්වය දැක්වීමක් වශයෙන් මෙම යෝජනාව ඉදිරිපත් කර තිබෙනවා. ගරු අධ්‍යාපන ඇමතිතුමා ප්‍රමාද වී නමුත් දැන් ගරු සභාවට පැමිණෙනවා දකින්න ලැබීම ගැන මා සතුටු වෙනවා.

**ගරු ජේ. ආර්. ජයවර්ධන (රාජ්‍ය ඇමති සහ අග්‍රාමාත්‍යතුමාගේත් ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමතිගේත් පාර්ලිමේන්තු ලේකම්)**

*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன—இராஜாங்க அமைச்சரும் பிரதம அமைச்சரதும் பாதுகாப்பு, வெளிவிவகார அமைச்சரதும் பாராளுமன்றக் காரியதரிசியும்)*

(The Hon. J. R. Jayewardene—Minister of State and Parliamentary Secretary to the Prime Minister and Minister of Defence & External Affairs)

සාමාන්‍යයෙන් ප්‍රශ්න අවසන් වෙන්නෙ 10.30 ට නිසාත් විවාදය ඇරඹෙන්නේ 10.30 ට නිසාත් එතුමා දැන් පැමිණෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

ගරු කථානායකතුමාගේ දක්ෂතාව නිසා ඉක්මනින් ඒ කටයුතු අවසන් කර විවාදය පටන් ගැනීමට හැකි වුණා.

ගරු කථානායකතුමනි, මෙයට කලින් ඉදිරිපත් කළ විශ්වාස භංග යෝජනාවෙන් බලාපොරොත්තු වුණේ, අධ්‍යාපන ඇමතිතුමා විසින් ගෙන යන ලද අසාධාරණ වැඩ පිළිවෙළ නවත්වා දැමීමට, මේ රටේ අධ්‍යාපනයට වැදිය හැකි බරපතල පහර වළක්වා ලීමට මහන්සි ගැනීමයි. එදා ගුරුවරුන්ට අත ගැසූ අධ්‍යාපන ඇමතිතුමා, එදා විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන්ගේ අයිතිවාසිකම්වලට අත ගැසූ අධ්‍යාපන ඇමතිතුමා, අද සම්පූර්ණ අධ්‍යාපනයටම අත ගසා තිබෙනවා; අධ්‍යාපන පනතටම අත ගසා තිබෙනවා. එම නිසා, අධ්‍යාපන ඇමතිතුමා එබඳු පියවරක් තබමින් ඒකාධිපති ඇමතිවරයකු බවට පත් වී තිබීම ගැන මේ රටේ ජනතාව වෙනුවෙන් අපේ බලවත් කනගාටුව ප්‍රකාශ කරන්න සිදු වී තිබෙනවා.

ගරු කථානායකතුමනි, එදා විශ්වාස භංග යෝජනාවක් එතුමාට විරුද්ධව ඉදිරිපත් කළ අවස්ථාවේදී මා විසින් පෙන්වා දෙන ලද කරුණු කීපයක් ගැන නැවතත් එතුමාගේ අවධානය යොමු කරවන්න කැමතියි. නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ නිල වාර්තාවේ 60 වන කාණ්ඩයේ 3149 වන තීරුවේ මා විසින් ඒ අවස්ථාවේදී කරන ලද කථාවෙන් කොටසක් උපුටා දක්වන්න කැමතියි. මෙන්න මා විසින් පෙන්වා දෙන ලද කාරණය :

"එක්සත් ජාතික පක්ෂයේ මැතිවරණ ප්‍රකාශනයේ මේ පිළිවෙළටයි, සඳහන් වී තියෙන්නෙ :"

එක්සත් ජාතික පක්ෂයේ මැතිවරණ ප්‍රකාශනයෙහි සඳහන්ව ඇති එක් කාරණයක් ගැනයි මා පෙන්නා දෙන්න යන්නේ. තවදුරටත් ඒ අවස්ථාවේදී මෙසේ පෙන්වා දී තිබෙනවා :

"ගුරු වෘත්තිය වැදගත් බව විශ්වාස කරන අපි එයට වෛද්‍ය හා නීති වෘත්තිවලට තරම් ගරු කළ යුතු බව කියමු."

ඒ අන්දමට මැතිවරණ ප්‍රකාශනයෙන් මහජනතාවට කීවත් ක්‍රියා කර තිබෙන්නේ කොයි අන්දමටද? ගරු කථානායකතුමනි, මෙම යෝජනාවේ පදනම ගොඩ නැගෙන්නේ එතැනිනුයි. එම නිල වාර්තාවේම 3162 තීරුවේ මෙන්න මේ අන්දමට පළ කර තිබෙනවා. මා උපුටා දක්වන්නේත් එදින කළ කථාවෙනුයි.

"අද එම නිදහස් ජාතික අධ්‍යාපන ක්‍රමය අවුල් ජාලයෙකි. ගුරුවරුන් මාරු කිරීම හා පත් කිරීම අද දේශපාලන තුරුම්පුවක් වශයෙන් විනා ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ හා ඒ ඒ ප්‍රදේශයේ වුවමනා එපාකම් අනුව සිදු නොවේ."

ගරු කථානායකතුමනි, 1965 මැතිවරණ ප්‍රකාශයෙන් මේ අන්දමට මහජනතාවට පොරොන්දු දී තිබෙනවා, එක්සත් ජාතික පක්ෂය. එදා තමුන්නාන්සේලාගේ ප්‍රකාශනයෙන් හෙළි කළ කරුණු ගැන කල්පනාකාරීව බලනවා නම්, 1965 දී යම්කිසි තත්ත්වයක් අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි තිබුණාද, අද 1968 වන විට ඒ තත්ත්වය, ඊට වඩා භයානක ලෙස, ඊට වඩා කනගාටුදායක ලෙස, ඊට වඩා පහත් ලෙස, මහජනතාවගේත් ශිෂ්‍ය සමූහයාගේත්, ඒ වාගේම ආචාර්යවරුන්ගේත්, කොටින්ම මේ රටේ අධ්‍යාපනය ගැන සැලකිල්ලක් දක්වන නාගේත් භීතියට නැතිනම් සැකයට පත් වන තත්ත්වයකට වෙනස් වී ඇති බව කනගාටුවෙන් නමුත් ප්‍රකාශ කළ යුතුව තිබෙනවා.

ගරු කථානායකතුමනි, අපගේ යෝජනාවෙන් එතුමාට එල්ල කරන පළමු වන චෝදනාව මෙයයි : අධ්‍යාපන ඇමතිවරයා විසින් හෝ වේවා වෙනත් ඇමතිවරයකු විසින් හෝ වේවා මේ ගරු සභාව ඉදිරියේදී දෙන ලද යම් පොරොන්දුවක් වේද ඒ පොරොන්දුව ඉටු කිරීම ඇමතිවරයකුගේ යුතුකමක්. මෙම ගරු සභාව තමයි, මේ රටේ තිබෙන ප්‍රජාතන්ත්‍ර වාදී වරප්‍රසාද ඇති උත්තරීතර මණ්ඩලය. ගරු ඇමතිවරයකු මෙම ගරු සභාවට පැමිණ කරන ප්‍රකාශයක් අවංක විය යුතුයි. සත්‍යවාදී විය යුතුයි. එහෙත් මේ අධ්‍යාපන ඇමතිවරයා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඒ විධියට ක්‍රියා කර තිබෙනවාද? මේ ඇමතිවරයා උසස් අධ්‍යාපන පනතක් ඉදිරිපත් කළා; භික්ෂු විශ්ව විද්‍යාල පනතක් ඉදිරිපත් කළා; කාර්මික හා සාමාන්‍ය අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යෝජනා සම්බන්ධයෙන් ධවල පත්‍රිකාවක් ඉදිරිපත් කළා; ඒ වාගේම සාමාන්‍ය හා කාර්මික අධ්‍යාපනය පිළිබඳ පනතක් ඉදිරිපත් කළා. ගරු ඇමතිතුමා මුලින්ම ප්‍රකාශ කෙළේ මොකක්ද? තමන්ගේ අධ්‍යාපන ක්‍රමයේ කොටස් තුනක් තිබෙන බවත්, උසස් අධ්‍යාපනය, භික්ෂු අධ්‍යාපනය සහ සාමාන්‍ය හා කාර්මික අධ්‍යාපනය යනු ඒ කොටස් තුන බවත්, ඒ කොටස් තුනටම සම්බන්ධ නීති සම්පාදනය කිරීමේදී ගරු මන්ත්‍රීවරුන්ගේ සහ මහජනයාගේ අදහස්වලට ගරු කරමින් ක්‍රියා කරන බවත්, මේ රටේ අධ්‍යාපනය එක්සත් ජාතික පක්ෂයට එසේ නැත්නම් දැනට තිබෙන ආණ්ඩු පක්ෂයට පමණක් සීමා වූවක් නොව එය රටේ සියලු දෙනාටම අයත් ජාතික කර්තව්‍යයක් බවත්, ඒ නිසා ඒ හැම දෙනාටම අධ්‍යාපනයට සම්බන්ධ කාරණා ගැන සාකච්ඡා කරන්නට අවස්ථාව සලසා දෙන බවත් එතුමා ප්‍රකාශ කළා. එහෙත් දැන් සිදු වී තිබෙන්නේ මොකක්ද? එතුමා ඉදිරිපත් කළ ධවල පත්‍රිකාව ගනිමු. එතුමා ඉදිරිපත් කළ ඒ සාමාන්‍ය හා කාර්මික අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යෝජනා නම් වූ ධවල පත්‍රිකාවේ අවසාන කොටසේ සිය වන ඡේදයෙන් එතුමා මෙසේ කියා තිබෙනවා:

"100. සාමාන්‍ය හා කාර්මික අධ්‍යාපනය ප්‍රතිසංස්කරණය කිරීම පිණිස වූ මෙම ධවල පත්‍රිකාව පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේත් මහජනයාගේත් අදහස දැන ගැනීම පිණිස ද විවේචනය සඳහා ද ඉදිරිපත් කරනු ලැබේ. අධ්‍යාපනය රටෙහි සෑම පුරවැසියකුගේ ම ජීවිතය කෙරෙහි බලපාන කරුණක් බවත්, එබැවින් ඒ පිළිබඳව පුළුල් අවධානයක් යොමු විය යුතු බවත්, රජය මූලික ප්‍රතිපත්තියක් වශයෙන් පිළිගන්නා හෙයින් මෙම යෝජනා මෙපරිද්දෙන් ඉදිරිපත් කිරීම රජයේ නිරණය විය."

ගරු අධ්‍යාපන ඇමතිතුමා අපට කලින් කීවේ ඔන්න ඕකයි. හොඳයි, එතුමාගේ කථාවකිනුත් කොටසක් ගෙන බලමු. මා මේ කියවන්නේ නිල වාර්තාවේ 79 වන කාණ්ඩයේ 3199 වන තීරුවෙනුයි.

"ඩඩ්ලි සේනානායක රජය පිහිට වූ නොබෝ දිනෙකින් අගමැතිතුමා විසින් විශේෂයෙන් මට දන්වන ලද කරුණක් නම්, රටේ අධ්‍යාපනය මේ රටේ වුවමනාවන්ට ගැළපෙන පරිද්දෙන් සකස් කිරීමේ වැඩ පිළිවෙළක් ඉතා ඉක්මනින් ඉදිරිපත් කිරීමේ අවශ්‍ය කමයි. රාජාසන කථාවෙහිද ඒ අනුව ප්‍රකාශයක් කෙරුණු බව තමුන්නාන්සේට මතක ඇති. මා සිතනව, ලංකාවේ දැනට පවත්නා අධ්‍යාපන ප්‍රතිපත්ති සංශෝධනය විය යුතු බව; ප්‍රතිසංවිධානය විය යුතු බව. එය නොපිළිගන්නා කෙනෙක් මෙම පාර්ලිමේන්තුවේවත් රට තුළවත් නැහැ. ඒ ගැන කවුරුන් විසිනුත් පුද්ගලිකව මෙන්ම ප්‍රසිද්ධියේද මත ප්‍රකාශ කරනව. අධ්‍යාපන අංශය පිළිබඳව තරම් මත ප්‍රකාශ කළ හැකි තවත් අංශයක් නැහැ. වෙන වෙනත් අංශ පිළිබඳව නොයෙකුත් විශේෂඥයන් සිටිනව."

ඊළඟට එම හැන්සාඩ් වාර්තාවේම 3201 වන තීරුවෙහි මෙසේ සඳහන් වෙනවා.

"කෙසේ වුවත්, මේ යෝජනා සම්බන්ධයෙන් මෙහිදී දක්වෙන අදහස් සැළකිල්ලට ගෙන, කෙරෙන විවේචනය විමසා බලා, අධ්‍යාපන ප්‍රතිසංවිධාන යෝජනා පිළිබඳව අලුත් පනතක් 1967 වර්ෂයේදීම නීතිගත කිරීමට මේ ගරු සභාවේ සහයෝගය මට ලැබෙතැයි මම බලාපොරොත්තු වෙනවා. කල් යත් යත්ම, දවසින් දවසම කාරණය අවුලෙන් අවුලට යන බව ගරු මන්ත්‍රීවරුන්ගේ සැළකිල්ලට භාජන විය යුතු කරුණක්. 1939 දී ඇතිවුණු අධ්‍යාපන ප්‍රතිසංවිධාන ක්‍රමය වරින් වර සංශෝධන කීපයක් ඇතුළු කිරීමෙන් වෙනස් කරන ලද නමුත් එහි මූලික තත්ත්වයේ එදාට වඩා කිසිම වෙනසක් සිදු වී නැති බව මන්ත්‍රීවරුන්ට රහසක් නොවෙයි. වෙන සෑම රටකම අධ්‍යාපන ක්‍රම ඉතා ඉක්මනින් වෙනස් වේගෙන යද්දී අපේ රටේ පමණක් එය යල් පැනපු ක්‍රමය අනුව පවත්වාගෙන යාම ඉදිරියට අපට හිතකර නොවන බවද ගරු මන්ත්‍රීවරුන්ට නොරහසකි. එම නිසා, හැකි තරම් ඉක්මනින් මේ යෝජනා ක්‍රියාත්මක කිරීමට හැකි වන පරිද්දෙන් මේ ගරු සභාව මට රුකුල් දෙනවා ඇතැයි මම විශ්වාස කරනවා."

දැනට තිබෙන යල් පැන ගිය අධ්‍යාපන ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේත්, මහජනයාගේත් අදහස් වුවමනා බව ගරු ඇමතිතුමා ධවල පත්‍රිකාව මඟිනුත්, ගරු සභාවේදී කරන ලද කථාවෙනුත් ප්‍රකාශ කර තිබෙනවා. ඒ සියලුම අදහස් සලකා බලා තමන් පනතක් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන බවත් ඒ පනත සම්මත කර ගන්නට සියලු දෙනාගේම සහයෝගය ඉල්ලා සිටින බවත් එතුමා කියා තිබෙනවා. එතුමාගේ කථාවෙන් තවත් කොටසක් කිය වන්නට මා කැමතියි. එම කලාපයේම 3216 වැනි තීරුවේ මේ විධියට තිබෙනවා:

"අවසාන වශයෙන් කථානායකතුමනි, ගරු මන්ත්‍රීවරුනි, අවංක චේතනාවෙන් ඉදිරිපත් කරන ලද මේ යෝජනාවල අඩුපාඩු ඇතොත් අවංක චේතනා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. බී. එම්. හේරත් මයා.]

වෙන් තමුන්නාන්සේලා දක්වන අදහස් පිළිගෙන ඒවා ඇතුළත් කිරීමට මා බලාපොරොත්තු වන බව කියන්ට කැමතියි. මෙය ඉක්මනින් කිරීම අවශ්‍යයි. එම නිසා හැකි තරම් කාල සීමාව කෙටි කර විවාද කොට නව අධ්‍යාපන පනත ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දෙන මෙන් ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා."

ගරු කථානායකතුමනි, මේ ප්‍රතිසංස්කරණ යෝජනා ඉදිරිපත් කිරීමේදී ගරු ඇමතිතුමා කළ ප්‍රකාශවලට සිදු වුණේ මොකක්ද? එතුමා 1967 දී සාමාන්‍ය හා කාර්මික අධ්‍යාපන පනත යනුවෙන් පනතක් ඉදිරිපත් කළා. මේ තරම් හදිසියෙන් සම්මත කළ යුතුය කී මේ පනත අවුරුද්දක් යන තුරු මේ ගරු සභාවේ න්‍යාය පත්‍රයේ තිබී පාර්ලිමේන්තු සභා වාරය අවසාන කරන අවස්ථාවේදී අහෝසි වුණා. දැන් මොකක්ද සිද්ධ වෙලා තියෙන්නෙ? දැන් තියෙන්නෙ පරණ අධ්‍යාපන පනත මයි. ගරු අධ්‍යාපන ඇමතිතුමා, මේ ප්‍රතිසංස්කරණය කරන්නට වුවමනාවක් තිබෙන බව, ගරු මන්ත්‍රීවරුන්ගේ අදහස්වලට ගරු කරන්නට වුවමනාවක් තිබෙන බව, මහජනයාගේ අදහස්වලට ගරු කරන්නට වුවමනාවක් තිබෙන බව, මේ රටේ අධ්‍යාපනඥයන්ගේ අදහස්වලට ගරු කරන්නට වුවමනාවක් තිබෙන බව ප්‍රකාශ කරමින්, ධවල පත්‍රිකාවක් ඉදිරිපත් කර විශාල උද්ඝෝෂණයක් කර අවසානයේදී කුමක්ද කළේ. එතුමා කළ දේ මම එතුමාගේ වචනවලින් කියන්නම්. නිල වාර්තාවේ 82 වැනි කාණ්ඩයේ 2 වැනි කලාපයේ 280 වැනි තීරුවේ එතුමා මේ විධියට කියා තිබෙනවා :

"මේ තත්ත්වය ඇතිවී තිබෙන්නේ අපේ වරදකින් නොවන බව පිළිගත යුතුයි. එදා තිබුණු ක්‍රමය අප වෙනස් කෙළේ 1968 ජනවාරි මාසයේ 4 වැනිදායි. එදා සිට වුවද සියලු දෙනාටම ඒ අලුත් ක්‍රමය අනුව ඉගෙන ගැනීමේ වරප්‍රසාද නැහැ."

එදා තිබුණු ක්‍රමය එතුමා 1968 ජනවාරි 4 වැනිදා වෙනස් කළාලු. එහෙම නම් මේ ගරු සභාවට ධවල පත්‍රිකාවක් ඉදිරිපත් කර ලබා ගත් කරුණු ගැන, මහජනයා ඉදිරිපත් කළ කරුණු ගැන, අධ්‍යාපනඥයන් ඉදිරිපත් කළ කරුණු ගැන එතුමා කිසිම සැලකිල්ලක් දක්වයේ නැහැ. මේ රටේ ජනතාවට සාමූහික වශයෙන් බලපාන අධ්‍යාපන ප්‍රශ්නය ගැන කරුණු සොයා බැලීමට ප්‍රජාතන්ත්‍රවාදයේ නාමයෙන් පවත්නා මේ උත්තරීතර ආයතනයට අවස්ථාවක් සැලසුවේ නැහැ. ඒ පනත ගැන සාකච්ඡා කෙළේ නැහැ. ගරු මන්ත්‍රීවරුන්ගේ ඇස්වලට වැලි ගහලා, මහජනතාවගේ ඇස්වලට වැලි ගහලා 1968 ජනවාරි 4 වැනිදා සිට මේ රටේ අළුත් අධ්‍යාපන ක්‍රමයක් ක්‍රියාත්මක කර තිබෙනවා. එහෙම නම්, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යෝජනා පිළිබඳව සාකච්ඡා කරන අවස්ථාවේදී මහජනයාගේ අදහස්වලට ගරු කරනවාය, මන්ත්‍රීවරුන්ගේ අදහස්වලට ගරු කරනවාය එමනිසා ඉක්මනින්ම මෙය සම්මත කර ගන්නට අවස්ථාවක් දෙන්නය යනුවෙන් ගරු ඇමතිතුමා මේ සභාවටත්, මහජනතාවටත් කළ ප්‍රකාශය සම්පූර්ණයෙන්ම අසත්‍ය එකක් බවට මා එතුමාට චෝදනා කරනවා. ඒ විධියට මේ ගරු සභාවටත්, මහජනතාවටත් අසත්‍යයක් කියා—මුසාවාදයක් කියා—තමුන්නාන්සේට වුවමනා විධියට 1968 ජනවාරි 4 වැනිදා සිට අළුත් අධ්‍යාපන ක්‍රමයක් මේ රටේ පටන් ගෙන තිබෙනවා. පසුගිය ආණ්ඩුව කාලයේදී කළ දේ එකින් එක අරගෙන ඒ ආණ්ඩුවට පහර ගසමින් මෙයට පිළිතුරු දෙන්නට තමුන්නාන්සේට පුළුවන්කමක් නැහැ. තමුන්නාන්සේම කී දේ තමුන්නාන්සේම වෙනස් කර තිබෙනවා. මෙය ජාතික ප්‍රශ්නයක්ය, මෙය වැදගත් ප්‍රශ්නයක්ය, කවුරුත් සාකච්ඡා කර කාගේත් සහයෝගය ඇතිව මේ කට යුත්ත කළ යුතුය කියා ප්‍රකාශ කෙළේ තමුන්නාන්සේයි. ඒ නිසා අප මහන්සි වෙලා, පොත්පත් කියවා මේ විවාදයට සූදානම් වුණා. මේ රටේ අධ්‍යාපනඥයනුත්, මහා සංඝයා වහන්සේත් මේ පනත සම්මත කරන්නට එන අවස්ථාවේදී සංශෝධන ඉදිරිපත් කර වඩා හොඳ පනතක් සම්මත කරවා ගන්නට සූදානම් වුණා. එසේ තිබෙද්දී ගරු ඇමතිතුමා හැමෝටම කොලේ වහලා 1968 ජනවාරි 4 වැනිදා සිට අළුත් අධ්‍යාපන ක්‍රමය ආරම්භ කළා. ආරම්භ කළාය කියන්නේ ඇමතිතුමාමයි. මේක පාර්ලිමේන්තු සම්ප්‍රදායද? මේක ප්‍රජාතන්ත්‍රවාදයද? එහෙම නැත්නම් මේක යුක්තිසහගතද? මේක සාධාරණද? මේ තරම් වැදගත් ජාතික ප්‍රශ්නයකදී, මේ රටේ අනාගත ඉරණම විසඳෙන මේ වගේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ප්‍රශ්නයකදී අධ්‍යාපන ඇමතිවරයා වැනි වගකිවයුතු ඇමතිවරයකු ක්‍රියා කරන්නේ මේ විධියටද කියා මා මේ ගරු සභාවේදී ප්‍රශ්න කරන්නට කැමතියි. මෙම සභාවේ වරප්‍රසාද යටතේ ඉඳගෙන, මහජනයාට අවස්ථාවක් දෙනවායැයි පොරොන්දු වී එම පොරොන්දුව කඩ කරමින්, හිතුවක්කාර ලෙස ක්‍රියා කිරීම ගැන මා නැවත වරක් ඇමතිතුමාට චෝදනා කරනවා. මේ රටේ වර්තමාන අධ්‍යාපන ක්‍රමය සකස් විය යුත්තේ මේ රටේ තිබෙන මහජන වුවමනා වන් ඉටු කිරීම සඳහා සියළුදෙනාගේම එකඟත්වය ඇතුවයි. එසේ නැතුව තනිකර අධ්‍යාපන ඇමතිවරයා පමණක් සර්වබල ධාරියා හැටියට ඉඳගෙන, ඒකමතිකව අළුත් ක්‍රියා මාර්ගයක් ක්‍රියාවට යොදවන්නට යනවා නම්, එය සම්පූර්ණයෙන්ම වැරදි සහගත බව මෙහිලා සඳහන් කළ යුතුයි. ඇමතිතුමාගේම කතාවලින් උපුටා දක්වමින් මට එය ඔප්පු කරන්නට පුළුවනි. එහෙත් මගේ කතාව දික්ගැසෙන නිසා මා සඳහන් කරන්නට අදහස් කරන්නේ අවශ්‍ය කරුණු ටික පමණයි.

"1939 පටන් ගන්නා ලද අධ්‍යාපන පනත කිසිම දෙයක් කරන්නට බැරි එකක් ; වරින් වර එය සංශෝධනය කළත් ඒ යටතේ මේ රටට ගැලපෙන ජාතික අධ්‍යාපන ක්‍රමයක් සකස් කරන්නට බැහැ ; ඒ නිසා එය විසිකර දමා අළුත් පනතක් ගෙනෙන්නට ඕනෑ" යනුවෙන් එතුමා කියා තිබෙනවා. මෙම ආඥා පනතෙත් තිබෙනවා, පරණ අධ්‍යාපන පනත අවලංගු කරන බව. එහෙත් ඒ ගෙනාපු අළුත් යෝජනා සියල්ල විසිකර දමා, කිසිවක් කරන්නට බැරිය කී එම පරණ ආඥා පනත යට ඉඳ ගෙන, මොකක්දෝ නව අධ්‍යාපන ක්‍රමයක් ඇති කරන්න එතුමා දැන් මහන්සි ගන්නවාලු. එක වරක් නොව දෙවරක් නොව කීප වරක්ම පරණ ආඥා පනත අනුව ක්‍රියා කරන්නට බැරිය කිව්වා. එහෙත් දැන් එම ආඥා පනත යට ඉඳගෙන අළුත් අධ්‍යාපන ක්‍රමයක් ක්‍රියාවට යොදවනවාය කීමෙන් තමුන්නාන්සේ කරන්නේ ආත්ම වංචාවක් නොවේද ? වරක් දෙවරක්, තුන් වරක් හතර වරක් පස් වරක් යනාදී වශයෙන් නැවත නැවතත් බැරිය කිව්වා. එහෙත් දැන් තමුන්නාන්සේට කරන්නට පුළුවන් වී තිබෙන්නේ තමුන්නාන්සේගේ අළුත් උපදේශකයන්ගේ මගපෙන්වීම නිසාද, එසේ නැතිනම් තමුන්නාන්සේට ඉස්සර තිබුණු නොදැනීම දැන් හරි දැනුම බවට පත් වී තිබෙන නිසා ද ? එසේත් නැත්නම් ඉස්සර තිබුණු හරි දැනුම දැන් නොදැනුම බවට පත් වී තිබෙන නිසාද ? එම ප්‍රශ්නයයි, මා අහන්නේ.

මෙසේ සිදු වන්නට හේතු තිබෙනවා. අධ්‍යාපන ඇමතිතුමා දන්නවා, මේ සාමාන්‍ය හා කාර්මික අධ්‍යාපන පනත පාර්ලිමේන්තුව ඉදිරිපිටදී සාකච්ඡා කළා නම් එතුමාට කෙසේ වෙතත් එතුමාගේ පුරෝහිතයන්ට අවශ්‍ය කරන දේවල් ඉටු වන්නේ නැති බව. මේ රටේ අධ්‍යාපන පුරෝහිතයන් බවට පත් වී සිටින සමහර උදවියට වුවමනා කර තිබෙන්නේ මේ රටේ වැඩියෙන් ඉගෙනීම ලබන දරුවන්ගේ දියුණුව කොතැනින් හෝ නවත්වා දමන්නටයි. මේ රටේ බොහොමයක් අධ්‍යාපන පුරෝහිතයන් එය එසේ වියයුතු යයි කල්පනා කරන බව පෙනෙනවා. එම නිසායි, ධවල පත්‍රිකාවේ තේරීම් ක්‍රමයක් ගෙනාවේ. 8 වන පන්තියේදී තෝරනවා. එදා ධවල පත්‍රිකාව පිළිබඳව සාකච්ඡා කළ සෑම මන්ත්‍රීවරයෙක්ම ඒ ක්‍රමයට විරුද්ධත්වය පළ කළා. එසේ හෙයින් සාමාන්‍ය හා කාර්මික අධ්‍යාපන පනත ගෙනෙන විට ඒ තේරීමේ ක්‍රමය අහෝසි වී තිබුණා. එහි තේරීමේ ක්‍රමයක් ඇත්තේ නැහැ. මේ රටේ අධ්‍යාපන පුරෝහිතයන්ට නැතිනම් මේ රටේ අධිරාජ්‍යවාදී ධනපති කාණ්ඩායම් වලට ඔවුන්ගේ දරුවන් පමණක් විශ්ව විද්‍යාලවලට යවා ඔවුන්ට පමණක් මේ රටේ සදාකාලිකව වැජඹෙන්නට තිබුණු ඉඩකඩ මෙම අළුත් අධ්‍යාපන පනතෙන් නැති වෙන නිසා අධ්‍යාපන ඇමතිතුමා කෙසේ හෝ පොළඹවාගෙන තිබෙන බව පෙනෙනවා. මේ අධ්‍යාපන පුරෝහිතයන්ට අධ්‍යාපන ඇමතිතුමා යටත් වී සිටින බව පෙනෙනවා. මෙම පනත සම්මත නොකර 1939 අධිරාජ්‍යවාදීන්ගේ කාලයේ ගෙනා පරණ පුස් කාපු පනත යටතේ තවදුරටත් ක්‍රියා කරන්නට පෙළඹන්නට අධ්‍යාපන ඇමතිතුමාට සිදු වුණා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ටී. බී. එම්. හේරත් මයා.]

ගරු ඇමතිතුමා මෙම සභාවේදී කියා තිබෙනවා, සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා 1945 දී මේ රටේ අධ්‍යාපන ඇමතිතුමා වශයෙන් සිටියදී සිදු වුණු සිද්ධීන් ගැන. ඊට පසුව මේ රටේ අධ්‍යාපන ඇමති වශයෙන් ක්‍රියා කළේ දැනට සිටින ආහාර හා කෘෂිකර්ම ඇමතිතුමායි. එතුමාගේ කාලයේ සිදු වුණු සිද්ධීන් ගැනත් ඒවාගේම ආචාර්ය දහනායක මැතිතුමා මේ රටේ අධ්‍යාපන ඇමතිවරයා වශයෙන් සිටියදී ඇති වූ සිද්ධීන් ගැනත් ඒවාගේම බදියුද්දීන් මහ්මුද් මැතිතුමා මේ රටේ අධ්‍යාපන ඇමති වශයෙන් සිටි කාලයේ සිදු වුණු සිද්ධීන් ගැනත් එතුමා කියා තිබෙනවා. ඒ හැම කාලයකම සැලකියයුතු වෙනස්කම් සිදු වුණාට මොකද ඒ කිසිම වෙනස්කම්කින් මේ රටේ අධ්‍යාපනයේ මූලික ප්‍රතිපත්ති වෙනස් කිරීමේ සංශෝධනයක් ඇති වූණේ නැති බව එතුමා පිළිගෙන තිබෙනවා. නිල වාර්තාවල සඳහන් කථාවලින් ඒ බව එළිදරව් වෙනවා. ඒ හැම වාර්තාවක්ම මා දැන් කියවන්නට යන්නේ නැහැ. එසේ පිළිගත් ඇමතිතුමා සුළු කාලයකින්ම සුළු මොහොතකින්ම වෙනස් වී තිබෙනවා. යළිත් එතුමා අර පරණ හණ මිටියම කර තබාගෙන යන්නට සූදානම් වී සිටිනවා. එතුමා එසේ යන්නට සූදානම් වන්නේ හරි අන්දමකට නම් ඒත් අපට කමක් නැහැ. එතුමා යන්නට සූදානම් වන්නේ හරි පිළිවෙළට නොවෙයි; වැරදි පිළිවෙළටයි.

එදා ධවල පත්‍රිකාව බොහොම හදිසියේ දින දෙකක් තුළ සාකච්ඡා කළා. එවේලේ ඇමතිතුමා කිව්වා, "පනත එනවාය; ඒවිට ඕනෑතරම් සාකච්ඡා කරන්නට ඉඩ තිබෙනවාය" යනුවෙන්. එහෙත් පනත ආවේ නැහැ. එන්නෙත් නැහැ. ගිය අවුරුද්දේ පනත අහෝසි වුණා. මේ අවුරුද්දේ න්‍යාය පත්‍රයට එය ඇතුළත් වී නැහැ. එහෙත් එතුමා දැන් කියනවා, 1968 ජනවාරිවල ඉඳලා අළුත් එකක් ක්‍රියාවේ යෙදාවන බව. කුමන බලයක් පිටද එතුමා අළුත් එකක් ක්‍රියාවේ යෙදෙව්වේ? මේ අන්දමට ක්‍රියා කරන්නට පරණ ආඥා පනත යටතේ එතුමාට බලතල තිබුණා නම් වරින් වර මෙවැනි පනත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරමින් මේ රටේ මහජනතාවගේ කාලයත් ධනයත් විනාශ කරන්නට එතුමා කල්පනා කළේ ඇයි? ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව, කාර්මික අධ්‍යාපන කොමිෂන් සභාව මේ රටේ අධ්‍යාපනයේ ඇති වැරදි පිළිබඳව බොහොම වැදගත් වාර්තා ඉදිරිපත් කර තිබෙනවා. එම වැරදි සකස් කරන්නට හැකි අධ්‍යාපන පනතක් මෙම සභාවට ඉදිරිපත් කොට කාගේත් සහයෝගයෙන් රටට ගැලපෙන අධ්‍යාපනයක් ඇති කිරීම පිළිබඳව කිසිවකු විරුද්ධ වන්නේ නැහැ. ගරු ඇමතිතුමා හිටියේ නැතත් පටන් ගන්නා විටම මා ඒක තමයි කිව්වේ, මේක ගුරුවරයෙක් මාරු කිරීම වැනි ප්‍රශ්නයක් නොවේය; මේක ජාතිය නැති කිරීමේ ජාතිය විනාශ කිරීමේ පරිශ්‍රමයක්ය යනුවෙන්.

එතුමා මහජනතාවගේත් අධ්‍යාපනඥයන්ගේත් මන්ත්‍රීවරුන්ගේත් අදහස් නොසලකාහැර හිතුවක්කාර අන්දමට ක්‍රියා කර තිබෙන බව මෙයින් පෙනෙනවා. වරක් කියාපු දෙයක් එතුමා විසින්ම වෙනස් කිරීම ගැන මා එතුමාට චෝදනා කරනවා. එය මගේ පළමුවන චෝදනාවයි. ඒවාගේම එතුමා මහජනතාවගේත් අධ්‍යාපනඥයන් ගේත් මහා සංඝයා වහන්සේගේත් මන්ත්‍රීවරුන්ගේත් අදහස් සපූර්ණයෙන්ම ඉවතට දමා හිතුවක්කාර අන්දමට ක්‍රියා කර තිබෙන නිසා එය මගේ දෙවන චෝදනාව හැටියට ඉදිරිපත් කරනවා. එතුමා කියා තිබෙනවා 1968 දී මෙය පටන් ගත්තේ කැබිනට් මණ්ඩලයේ අනුදැනුම ඇතිවය කියා. මේ රටේ කැබිනට් මණ්ඩලයක් සහිත ආණ්ඩු ක්‍රමයක් තිබෙන එක ඇත්තයි. මේ රටේ අධ්‍යාපන ප්‍රශ්නය ගැන සැලකිළිමත් විය යුත්තේ කැබිනට් මණ්ඩලය පමණක් නොවෙයි. මුළු රටම ඒ ගැන සැලකිළිමත් විය යුතුයි. ඒ බව මෙම වැඩ කටයුතු ක්‍රියාවට යොදන විට තමුන්නාන්සේට තේරෙනවා ඇති. දැන් ක්‍රියා කරන්නේ හොරෙනුයි. එසේ හෙයින් යම් යම් අමාරුකම් තවම හොඳට තේරී නැහැ. ඒවා හෙට අනිද්දා වන විට තේරේවි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

1968 ජනවාරිවල ආරම්භ වුණු අධ්‍යාපන ක්‍රමය කුමක්දැයි විමසා බලමු. ප්‍රාථමික අධ්‍යාපනය අවුරුදු 5 කුත්, පශ්චාත් ප්‍රාථමික අධ්‍යාපන ක්‍රමය අවුරුදු 3කුත් යනුවෙන් ප්‍රාථමික අධ්‍යාපනය අවුරුදු 8 කට සීමා වන බව එතුමාගේ ධවල පත්‍රිකාවේ සඳහන් වෙනවා. එහෙත් එතුමා දැන් ආරම්භ කර තිබෙන පාඨශාලා ක්‍රමයේ පළමුවන පාඨශාලා වර්ගය අවසන් වන්නේ 7 වන ශ්‍රේණියෙනුයි. එතකොට ප්‍රාථමික අධ්‍යාපනය අවුරුදු 5 කින් ඉවර වෙලා පශ්චාත් ප්‍රාථමික අධ්‍යාපනය අවුරුදු 2ක් ලබා ගන්නට සිදු වෙනවා. එතකොට තව අවුරුද්දක් ඉතිරියි. ඒ අවුරුද්ද ගෙවන්නට සිදු වන්නේ කොහොමද? පශ්චාත් ප්‍රාථමික අවධියට අයත් අවුරුදු 3න් අවුරුදු 2ක් කණිෂ්ඨ පාඨශාලාවේ ගෙවන ළමයාට එහි 3 වන අවුරුද්ද ගෙවන්නට වෙනත් ස්කෝලයකට යන්නට සිදු වෙනවා. ඒ ක්‍රමය සම්පූර්ණයෙන්ම වැරදියි.

අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් ම පාඩම් මාලාවක් සකස් කර තිබෙනවා. 6 වැනි 7 වැනි පන්තිවලට ඉගැන්වීම සඳහා ඒවා ගුරුවරුන්ට යවා තිබෙනවා. පළමු වැනි වාරයේ එම පාඩම් මාලාව ඉවර කරන්නට බැරි වුණොත් නතර කළ තැන සිට දෙවැනි වාරයේ ඉගැන්වීමටත්, දෙවැනි වාරයේත් ඉවර කරන්නට බැරි වුණොත් දෙවැනි වාරයේ නතර කළ තැන සිට තුන් වැනි වාරයේ ඉගැන්වීමටත්, තුන් වැනි වාරයේත් යම් යම් අපහසුකම් නිසා අවුරුද්ද අවසාන වන තුරුත් ඉවර කරන්නට බැරි වුණොත් නතර කළ තැන සිට ඊළඟ අවුරුද්දේ ඉගැන්වීමටත් දෙපාර්තමේන්තුව උපදෙස් දී තිබෙනවා. අවුරුද්ද අවසානයේ 7 වැනි පන්තියෙන් සමත් වූ ළමයෙක් යම්හෙයකින් පාඩම් මාලාව සම්පූර්ණ නොකළා නම්, එමෙන්ම ඊට පසුව ඔහු වෙනත් පාසලකට ගියා නම් ඇති වන තත්ත්වය කුමක්ද? එවැනි තත්ත්වයක් ඇති වුණොත් ඒ ළමයාට සිදු වන්නේ 8 වැනි පන්තියේ පාඩම් මාලාව මුල සිට පටන් ගැනීමටයි. ඒ නිසා එතැන පරතරයක් ඇති වෙනවා. එසේ පරතරයක් ඇතිවීම නිසා ඉදිරියට යන්නට ඒ ළමයාට බැරි වෙනවා.

තේරීමේ විභාගයක් තබා 8 වැනි පන්තියෙන් ළමයා නතර කරන්නට ගරු ඇමතිතුමා ධවල පත්‍රිකාවෙන් මහන්සියක් ගත්තා. එහෙත් දැන් තේරීමේ විභාගයක් නැතිව 7 වැනි පන්තියෙන් ළමයින් නතර කර තිබෙනවා. එය කළ හැටි මම කියන්නම්. නිදර්ශනයක් වශයෙන් මගේ ආසනය ගනිමු. මගේ ආසනයේ නිල්දණ්ඩාහින්න මහා විද්‍යාලය කියා එකක් තිබෙනවා. කෘෂිකර්ම හා ආහාර ඇමතිතුමා හොඳ හැටි දන්නවා, මඩුල්ලේ ළමයෙකුට නිල්දණ්ඩාහින්න මහා විද්‍යාලයට එන්නට හැතැප්ම 6 ක් පයින් යන්නට සිදු වෙනබව. කන්දෙයායේ ළමයෙකුට නම් හැතැප්ම 8 ක් පයින් යන්නට වෙනවා. මොරහෙල ළමයෙකුට හැතැප්ම 7 කුත් තුන්හිටියාව ළමයෙකුට හැතැප්ම 5 කුත් පයින් යන්නට සිදු වෙනවා. ගරු අධ්‍යාපන ඇමතිතුමාගේ නිලධාරීන්ගේ ඔළමොට්ටල වර්ග කිරීම උඩ ඔය පාසල්වලින් හය හත සමත් වන ළමයින් නිල්දණ්ඩාහින්න මහා විද්‍යාලයට යාවිය කියා ගරු ඇමතිතුමා කල්පනා කරනවාද? එක් කෙනෙක්වත් යන්නේ නැහැ. ඇඳුමක් පැළඳුමක් පවා සොයා ගන්නට බැරි තරම් ආර්ථික පීඩනයකින් පෙළෙන ගම්බද අයගේ දරුවන් හැතැප්ම පහක්, හයක්, හතක්, අටක් පයින් ගමන් කර—ඒත් පොළොවෙන් නොවෙයි අහසින්—නිල්දණ්ඩාහින්න මහා විද්‍යාලයට යාවිය කියා කල්පනා කළොත් ඒ ළමයින්ගේ අධ්‍යාපනය එතැනින් ඉවරයි. ප්‍රතිගාමීන්ට වුවමනා වී තිබෙන්නේ ඒකයි. ළමයින් ඉගෙන ගන්නවා වැඩියි. ඉබේ මඟ නැවතියන් කියලයි ඔය විධියට කටයුතු කරන්නේ. තේරීමේ විභාගයකින් නතර කළොත් අධ්‍යාපන ඇමතිතුමාට දොස් කියනවා. ධවල පත්‍රිකාව ඉදිරිපත් කළ අවස්ථාවේදීත් අපි එයට දොස් කීවා. ඒ නිසා ඉබේ නතර වන අන්දමට කටයුතු පිළියෙළ කළා.

මහා විද්‍යාල කියා වර්ගයක් ඇති කළා. ඒ අවට පාසැල්වල ළමයින් හැතැප්ම පහ හය හත අට පයින් ඇවිත් අර මහා විද්‍යාලයට එන්නට ඕනෑ. එහෙම නැත්නම් හැතැප්ම 4 ක් 5 ක් බස් එකේ එන්නට ඕනෑ. හැතැප්ම 4 ක් 5 ක් බස් එකෙන් ආවාට කමක් නැතිලු. ගරු අධ්‍යාපන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වී. බී. එම්. හේරත් මයා.]

ඇමතිතුමාට නම් හැතැප්ම 5 ක් බස් එකකින් යන එක ලෙහෙසියි. එහෙත් කඳුකරයේ හැතැප්ම 5 කට බස් කුලිය සත 25 යි. යන්න එන්න සත 50 යි. දවස් 20 ක් පාඨශාලාව පැවැත්වුවොත් රුපියල් 10 යි. එමෙන්ම හොඳ ඇඳුමක් නැත්නම් "යුනිෆෝර්ම්" එකක් ඕනෑ. සපත්තු ඕනෑ; පොත්පත් ඕනෑ; දවාලට කන්නත් මොනවා හෝ ගෙනයන්නට ඕනෑ. එවැනි තත්ත්වයක් යටතේ මහා විද්‍යාලයට ළමයින් යවන්නට දෙමව්පියන් කීදෙනකුට පුළුවන්ද ? මේ හතේ නැවැත්වීමේ ක්‍රමයෙන් ගම්බද දරුවන්ගේ අධ්‍යාපනය සම්පූර්ණයෙන්ම නැවැත්වීමට තමුන්නාන්සේලා ක්‍රියා කර තිබෙනවා.

ගරු ඇමතිතුමාට නිලධාරීන් එවන වාර්තා පමණක් නොවෙයි, අපි කියන ඒවාත් ඇත්තද බොරුද කියා කරුණාකර එළියට ගොස් සොයා බලන්න. අර ළමයින්ට නිල්දණ්ඩාහින්න මහා විද්‍යාලයට පයින් යන්නට පුළුවන්ද කියා ගරු ආහාර ඇමතිතුමාගෙන් අහන්න. අපේ ළමයින්ට හත වැදිලා; හතේ නැවතිලා. දෙමව්පියන් කියන්නේ අපේ ළමයින් හතේ නැවැත්වූ ඇමතිට හෙණ හත වැදියන් කියලයි. හොඳට අහගන්න. මහජනයා කියන්නේ ඒකයි. දෙමව්පියෙකුට දරුවකුට වඩා වටිනා වස්තුවක් නැහැ. ඊට වඩා වටිනා වස්තුවක් තිබෙනවාය කීවාට කවුරුවත් පිළිගන්නේ නැහැ. තමුන්නාන්සේට වුණත් මට වුණත් එහෙමයි. හැම දෙමව්පියකුටම ලෝකයේම තිබෙන වටිනාම වස්තුව තමන්ගේ දරුවායි. ඒ නිසා දරුවාගේ අධ්‍යාපනය හතෙන් නවත්වනවා නම් එය අනුමත කරන දෙමව්පියෙක් සිටින්නට බෑහැ. කුරුඳුවත්ත, මහනුවර, ගාල්ල, යාපනය ආදී නගරවල සිටින අයට නම් අමාරුවක් නැතුව ඇති. කුලියාපිටියටත් අමාරුවක් නැතිව ඇති. එහෙත් ගම්බද ජනතාව අද අමාරුවට වැටී සිටිනවා.

ගරු අධ්‍යාපන ඇමතිතුමා මේ විධියේ තත්ත්වයක් මේ රටේ ඇති කෙළේ මේ ගරු සභාවේ අවසරයක් නැතිවයි. එතුමාට විරුද්ධව අප ඉදිරිපත් කරන ඊළඟ චෝදනාව එයයි. මහජනයාගේ අදහස් නොවිමසා, මේ ගරු සභාවේ අදහස් නොවිමසා ගරු ඇමතිතුමා මෙවැනි තත්ත්වයක් ඇති වන ආකාරයට ක්‍රියා කිරීම ඉතාමත් බරපතල දෙයක් බව සඳහන් කළ යුතුව තිබෙනවා. මේ ගරු සභාවෙන් ඇහුවා නම් එතුමාට මෙවැන්නක් කරන්නට ඉඩ ලැබෙන්නේත් නැහැ. අපේ කාලයේදී මඩුල්ල පාඨශාලාව වැනි පාසල්වල ජ්‍යෙෂ්ඨ පංක්තිය නැත්නම් 10 වැනි ශ්‍රේණිය දක්වා පංක්ති පැවැත්වූවා. ඒ තරම්වත් අධ්‍යාපනයක් දෙන්නට පුළුවන් නිසයි එසේ කෙළේ. එහෙත් තමුන්නාන්සේලා සම්පූර්ණයෙන්ම එය නැති කර ඇම්මා. තමන්ගේ කාලයේදී මේ රටේ අධ්‍යාපනය සැහෙන තත්ත්වයකට ගෙන ආ බවක් ගරු ඇමතිතුමා කියනවා. එහෙම ගෙනාවා නම් එය පෙනෙන්නට ඕනෑ. ඒ නිසා ගරු අධ්‍යාපන ඇමතිතුමනි, තමුන්නාන්සේට එක් කාරණයක් මතක් කරන්නට කැමතියි. තමුන්නාන්සේගේ ක්‍රියා කලාපය නිසා දැන් අපේ දරුවන් අතරමං වෙලා සිටිනවා.

තවත් කාරණයක් කෙරෙහි ගරු ඇමතිතුමාගේ සැලකිල්ල යොමු කරන්නට මම කැමතියි. එතුමා ඉදිරිපත් කළ ධවල පත්‍රිකාව සාකච්ඡාවට භාජන වූ අවස්ථාවේ මා කළ කථාව ගැන මතක් කරන්නට කැමතියි. නිල වාර්තාවේ 70 වැනි කාණ්ඩයේ 3433 වැනි තීරයේ සිට මගේ කථාව වාර්තාගත වී තිබෙනවා. එහි 3437 වැනි තීරයේ තිබෙන කොටසක් කියවන්නට කැමතියි. සාමාන්‍ය හා කාර්මික අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යෝජනා සම්බන්ධයෙන් ඇති වූ විවාදයටයි මෙය සම්බන්ධ. පාඨශාලාවලට ඇතුළත් කිරීමේ වයස වෙනස් කිරීමට ධවල පත්‍රිකාවෙන් යෝජනා කර තිබෙන බව එදා මා කියා සිටියා. අනිවාර්ය වයස අවුරුදු හයක් කිරීම වැරදි බවත් එය අවු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රුදු පහක් විය යුතු බවත් මා කියා සිටියා. ඒ අවස්ථාවේදී ගරු ඇමතිතුමා මෙහෙමයි කිව්වේ :

**ගරු ඊරියගොල්ල**

අවුරුදු 6 දී අනිවාර්යයි.

**පී. බී. එම්. හේරත් මයා.**

එතකොට අවුරුදු පහේදීත් ඇතුළත් කර ගන්නවාද ?

**ගරු ඊරියගොල්ල**

ඔව්.

**පී. බී. එම්. හේරත් මයා.**

ස්ථිර පොරොන්දුවක්ද ?

**ගරු ඊරියගොල්ල**

ඔව්.

එයින් පැහැදිලි වන්නේ කුමක්ද? අවුරුදු පහේදීත් ඇතුළත් කර ගන්නා බවට එදා ගරු ඇමතිතුමා ස්ථිර පොරොන්දුවක් දුන්නා. ඒ ස්ථිර පොරොන්දුව එසේ දී, අනෙක් පැත්තෙන් පාඨශාලා වයස් සීමාව සම්බන්ධයෙන් තිබෙන තත්ත්වය වෙනස් කළා. අනිවාර්ය වයස් සීමාව හැටියට තිබුණු උපරිම සීමාව වෙනස් කළා. උපරිම අනිවාර්ය වයස් සීමාව අවුරුදු 14යි. වයස අවුරුදු පහේදී පාඨශාලාවට ඇතුළත් වන ළමයා ඒ අනුව සිය ඉගෙනීම කර ගෙන ගියාම 7වැනි ශ්‍රේණියට යැමට ගත වන්නේ අවුරුදු හතක් පමණයි. එතකොට ඒ ළමයාගේ වයස අවුරුදු 12යි. හතේදී නවතිනවාය කියන්නේ වයස 12 දී නවතිනවාය කියන එකයි. එතකොට අවුරුදු 12 දී ඒ ළමයාගේ අධ්‍යාපනය නවතිනවා. අවුරුදු 12 දී නවතින්නේ 7 වැන්නට පමණක් ගියොත් බව අපි දන්නවා. හොඳයි, 8 වැනි පංක්තියට ගියාය කියමු. එතකොට වයස 13 යි. අවුරුදු 13 දී අධ්‍යාපනය නවතිනවා නේද කොයි තරම් අමාරුවෙන් ගියත්? මේ පැත්තෙන් අවුරුද්දක් දුන්නා. ඒ අවුරුද්ද අනෙක් පැත්තෙන් කැපුවා නේද?

අනිවාර්ය වයස් සීමාව තුළ දරුවන් පාසලට යවන්නට සියලුම දෙමව්පියන්ට බල කරනවාය කියනවා. එහෙත් සිද්ධ වන්නේ කුමක්ද? 7 වැනි පංක්තියෙන් සමත් වුණාට පස්සේ අසුවල් පාසලට පලයන්නැයි කියනවා. එසේ කිව්වත් යන්නට විධියක් නැහැ. අනිවාර්ය වයස් සීමාවේදීම ගෙදර ඉන්නට වෙනවා. එහෙම නම් සිද්ධ වන්නේ කුමක්ද? වයස අවුරුදු 14 දක්වා ඉගෙනීම ලැබිය යුතු ළමයින් විශාල සංඛ්‍යාවකට, ගරු අධ්‍යාපන ඇමතිතුමා අපේ අවසරයක් නැතිව ඉදිරිපත් කර තිබෙන මේ අලුත් වැඩ පිළිවෙළ නිසා, අමාරුවට වැටෙන්නට සිදු වෙනවා. ගම්බද ළමයින් බොහොමයකට අනිවාර්ය අධ්‍යාපනය ලැබෙන්නේ නැහැ. වයස දොළහෙන් ඉවරයි. හත්වැන්න පාස් කළ හැටියේ ඔක්කොම ඉවරයි. ඉන් එහාට අනිවාර්ය අධ්‍යාපනය ලැබෙන්නේ නැහැ. එහෙම නම් මෙය පරණ අධ්‍යාපන පනතේ විධිවිධාන සම්පූර්ණයෙන්ම කඩ කිරීමක් නොවෙයිද ? මෙය, ඒ පනත යටතේ ක්‍රියා කිරීමක් නොවෙයි, සම්පූර්ණයෙන්ම එය කඩකිරීමක්. ඒකයි අපේ චෝදනාව.

මා සඳහන් කළ කාරණය මම තව දුරටත් පැහැදිලි කර දෙන්නම්. මේ ළමයින්ගේ අධ්‍යාපනය 7 වැනි පංක්තියෙන් නවතින්නේ පාඨශාලා ප්‍රතිසංවිධානයේ තිබෙන යම් යම් වැරදි නිසයි. ඒ බව මීට පෙර මා විස්තර කළා. අලුතින් පාඩම් මාලා සකස් කිරීමේ ක්‍රමය නිසාත් මේ තත්ත්වය ඇති වෙනවා. ගුරුවරුන්ට පාඩම් මාලාවක් දෙනවා. කොළඹ ඉන්න ගුරුවරයාටත්, වලපනේ මැතිවරණ කොට්ඨාශයේ තෙරිපැහැ සහ මඩුල්ල වැනි පාඨශාලාවල වැඩ කරන ගුරුවරයන්ටත් අනුරාධපුරයේ හැතැප්ම විසිපහක් පමණ පයින් යන්නට තිබෙන ප්‍රදේශවල සේවය කරන ගුරුවරුන්ටත් එකම පාඩම් මාලාවයි දී තිබෙන්නේ. මේ රටේ සමහර පාඨශාලාවල සිටින්නේ එක ගුරුවරයායි; නැත්නම් දෙදෙනායි. ඒක තමුන්නාන්සේ දන්නවා. අලුත් ක්‍රමයට මේ පාඨශාලාවල 1 වන ශ්‍රේණියේ සිට 7 වන ශ්‍රේණිය දක්වා පන්ති තිබෙනවාය කියා අපි සිතමු. නමුත් එක ගුරුවරයායි ඉන්නෙ. කොහොමද ඒ තනි ගුරුවරයා පාඩම් මාලාව හරියාකාරව උගන්වන්නෙ. ඔහුට ඒ විධියට උගන්වන්නට පුළුවන්ද? බැහැ. ගුරු සම්මේලනයකදී එක් ගුරුවරයෙක් තමුන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. බී. එම්. හේරත් මයා.]

නාන්සේගෙන් ප්‍රශ්නයක් ඇසුවා. ඒ විධියේ තනි ගුරුවරයකු සිටින පාඨශාලාවක මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නෙ කොහොමද ගරු ඇමතිතුමනි කියා එක් ගුරුවරයකු ප්‍රශ්න කළා. මොකක්ද තමුන්නාන්සේගේ උත්තරය? "පුලුවන් මිනිසුන් ඉන්නවා; තමුසෙට බැරි නම් යනවා" ය කියා තමුන්නාන්සේ උත්තර දුන්නා. තමුන්නාන්සේ පුලුවන් මිනිසුන් පෙන්වනවා. නමුත් මා කියනවා, පන්ති හතකට එකවර එක දවසේ සියලුම කරුණු හරියාකාරව ඉගැන්විය හැකි ගුරුවරයකු තවම මේ රටේ ඉපදී නැති බව. එවැනි ගුරුවරයකු ඉපදෙන්නෙත් නැහැ. පන්ති හතකට එකවර ඉගැන්විය හැක්කේ කොයි මිනිසාටද? දැනීම දෙන්නට ඕනෑ. දැනීම ස්ථිර කරන්නට ඕනෑ. දැනීම භාවිතා කරන්නට ඕනෑ. දැනීම සංස්කරණය කරන්නට ඕනෑ. හේනක් කොටා මඤ්ඤොක්කා ගහක් සිටුවා එනවා වාගේ වැඩක්ද අධ්‍යාපනය? කුඹුරකට වී ටිකක් ඉස එනවා වාගේ වැඩක්ද අධ්‍යාපනය? අධ්‍යාපනය ගැන දන්න කෙනෙකුද මෙවැනි උත්තරයක් දෙන්නෙ? කොහොමද ගරු ඇමතිතුමනි, පන්ති හතකට එකවර උගන්වන්නෙ කියා ගුරුවරයකු අසනවා. තමුසෙට බැරි නම් යනවා. තව මිනිසුන් සිටිනවාය කියා තමුන්නාන්සේ උත්තර දෙනවා. අපට කියන්නට තිබෙන්නේ මේකයි. මෙවැනි විකාර වැඩ නොකර, මේ රටේ අධ්‍යාපනය කාබාසිනියා නොකර තමුන්නාන්සේට බැරි නම් යන්න. අධ්‍යාපන ඇමති ධුරයට මේ රටින් ඕනෑ තරම් මිනිසුන් සොයා ගන්නට පුළුවනි; ඕනෑ තරම් සුදුසුකම් තිබෙන හොඳ මිනිසුන් මේ රටේ ඉන්නවා. මෙහෙමද අධ්‍යාපන ඇමතිවරු ක්‍රියා කරන්නෙ? කරන්නට බැරි දෙයක් පෙන්නුම් කර දුන්නාම ඒක හරිගස්සන්නට ක්‍රමයක් සකස් කිරීමට තමුන්නාන්සේට ශක්තියක් තිබෙන්නට ඕනෑ. සාමාන්‍ය ගණන අඩු, පන්ති වැඩි පාඨශාලාවලට මීට වඩා ටිකක් වැඩියෙන් ගුරුවරුන් සැපයීමට යුතුකමක් තිබෙනවා. ඈත පිටිසර සැතැපුම් දහය පහළොව පයින් ගමන් කළයුතු පාඨශාලා තමයි වැඩි වශයෙන්ම මෙවැනි තත්ත්වයක තිබෙන්නෙ. තනි ගුරුවරයකු 1 වන ශ්‍රේණියේ සිට 7 වන ශ්‍රේණිය දක්වාවූ පන්ති සියල්ලටම උගන්වන්නේ කෙසේද? ළමයින්ගේ ගණන අඩුය, එමනිසා උගන්වන්නය කියනවා නම් ඒක වැරදියි. එවැනි පාඨශාලා සම්බන්ධයෙන් විශේෂයක් කර ඒ අඩුපාඩුකම් සකස් කරන්නට ක්‍රියාමාර්ගයක් ගන්නට ඕනෑ. අර වගේ වචනයක් පාවිච්චි කිරීම නම් බොහොම ලෙහෙසියි. නමුත් එයින් ප්‍රශ්නය විසඳෙන්නේ නැහැ. ඒකයි අප කියන්නෙ. පාඩම් මාලාව හරියාකාරව උගන්වන්නට බැරිවීමෙන් ළමයින්ට අමාරුකම් රාශියකට මුහුණපාන්නට සිද්ධ වෙනවා. එය ළමයින්ගේ අධ්‍යාපනය 7 වන ශ්‍රේණියෙන් නතරවීමට හේතුවෙනවා.

ළමයින්ගේ දුෂ්කරතා ගැන මා කලින් ටිකක් සඳහන් කළා. ළමයින්ගේ කෑම බීම, ඇඳුම් පැළඳුම්, යාම ඊම, වාහනවලට ගෙවිය යුතු ගාස්තු ආදී කරුණු ගැනත් අප මේ අවස්ථාවේදී කල්පනා කර බැලිය යුතුයි. ගරු කථානායකතුමනි, මා පදිංචිව සිටින්නේ මහනුවර නගරයේයි. මහනුවර නගරයේ අරුප්පොල පාඨශාලාව 7 වන ශ්‍රේණියෙන් නතර කළා. ඉන්පසු ඒ ළමයින් බූවැලිකඩ විද්‍යාලයට පිටත් කළා. අරුප්පොල විද්‍යාලයේ සිට එතැනට දුර සැතැපුම් එකහමාරයි. නමුත් මොකද වුණේ? ඒ ගිය ළමයින්ගෙන් සියයට 50ක් පමණ පාඨශාලා නොගොස් ගෙදර නතර වුණා. මක්නිසාද? ඔය ගෙදර සිටින විධියටම සරමක් ඇඳගෙන, කමිසයක් ඇඳගෙන, මොනවා හරි ටිකක් කාල අරුප්පොල විද්‍යාලයට ගියා. නමුත් බූවැලිකඩ විද්‍යාලයට ගියාම සපත්තු අසුවල් පාට ඒවා විය යුතුය, ටයි අසුවල් පාට ඒවා විය යුතුය, යුනිෆෝම් එක අසුවල් විධියට විය යුතුය කියා නීතිය දැම්මා. ඉතින් ඒ නීතියට අනුව දෙමව්පියන්ට වියදම් කරන්නට බැහැ. අපට ඔවා කරන්නට ශක්තියක් නැත කියා දෙමව්පියන් තම දරුවන් ගෙදර නවතා ගත්තා. ඒ නගරයේ තත්ත්වයයි. එතකොට පිටිසර ප්‍රදේශවල තත්ත්වය කුමක්ද? පුළුවන් අය සිටින බව ඇත්තයි. මේ රටේ මිනිසුන් දැන් හොඳට අඳිනවාය, හොඳට කනවාය කියා ගරු ඇමතිතුමා කියනවා. අප බොහොම සතුටුයි ඒ ගැන. නමුත් සියලු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දෙනාගේම තත්ත්වය ඒක නොවෙයි.. මේ රටේ බැරි මිනිසුනුත් විශාල සංඛ්‍යාවක් සිටිනවා. නොසලකා හැර සිටින මිනිසුනුත් විශාල සංඛ්‍යාවක් සිටිනවා. ඒ උදවියගේ ප්‍රශ්න විසඳී නැහැ. එමනිසා මොකක්ද වෙන්නෙ? ඔවුන්ගේ දරුවන්ගේ අධ්‍යාපනය 7 වන ශ්‍රේණියෙන් නතරවී තිබෙනවා.

ඊළඟට ශිෂ්‍යයන්ගේ අයිතිවාසිකම් ගැන බලමු. අප ඉස්සරට වඩා දැන් ශිෂ්‍යයන්ට සලකනවාය, අයිතිවාසිකම් දෙනවාය කියා තමුන්නාන්සේ කියනවා. මා අහනවා තමුන්නාන්සේගෙන් ප්‍රශ්නයක්. කෝ පස්වන ප්‍රමාණයේ ශිෂ්‍යත්ව විභාගය? පස්වන ප්‍රමාණයේ ශිෂ්‍යත්ව විභාගයෙන් සමර්ථ වී, මධ්‍ය මහා විද්‍යාලයට ඇතුළු වී, එමගින් විශ්ව විද්‍යාලයට ඇතුළු වී උපාධි ලබාගෙන සිටින ගම්බද සාමාන්‍ය මිනිසුන්ගේ දරුවන් විශාල සංඛ්‍යාවක් අද මේ රටේ උසස් ස්ථානවල සිටිනවා. සිවිල් සේවකයන්, දිසාපතිවරුන්, පරිපාලන සේවයේ නිලධාරීන් විශාල සංඛ්‍යාවක් සිටිනවා. මා දන්නා විධියට මේ වැඩ පිළිවෙළ ආරම්භ කළේ සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමායි. මේ අවස්ථාවේදී මා එතුමා කෘතඥපූර්වකව සිහිපත් කරන අතර, එතුමා ආරම්භ කළ මේ වැඩ පිළිවෙළ අනුව ගම්බද ප්‍රදේශවල උදවියගේ මොළය තිබෙන දරුවන් විශාල සංඛ්‍යාවක් අද මේ රටේ උසස් ස්ථානවල වැජඹෙන බව මතක් කරනවා. පස් වෙනි ප්‍රමාණයේ ශිෂ්‍යත්ව විභාගය දැන් කෝ? ඒක නවත්වලා. ඒක කැව. පුළුවන් නම් කියන්න තියෙනවා කියා. 1967 අවුරුද්දෙත්, 1968 අවුරුද්දෙත් පස් වෙනි ප්‍රමාණයේ ශිෂ්‍යත්ව විභාගය තිබ්බෙ නැහැ. ළමයින් දහස් ගණනකට ලැබෙන්නට තිබුණු වාසියක් අධ්‍යාපන ඇමතිතුමා සම්පූර්ණයෙන්ම කාබාසිනියා කර දැමුවා. අධ්‍යාපන ඇමතිතුමා ඒ විධියටයි මේ රටේ ළමයින්ට අයිතිවාසිකම් දී තිබෙන්නෙ.

පාසල් ප්‍රතිසංවිධානය කිරීමට පෙර ගුරු දෙගුරු සමිති සමග සාකච්ඡා කරනවාය, ඊටත් කලින් මන්ත්‍රීවරුන්ගේ අදහස් විමසනවාය කියා තමුන්නාන්සේ මේ ගරු සභාවේ මන්ත්‍රීවරුන්ට පොරොන්දු වක් දුන්නා නේද? ඒ පොරොන්දුව ඉෂ්ට කළාද කියා මම ප්‍රශ්නයක් අහනවා. මම කියනවා නැහැ කියා. අධ්‍යපන ඇමතිතුමා මේ ගරු සභාවට ප්‍රකාශ කළේ අසත්‍යයක්. බොරුවක ය කියන වචනය පාවිච්චි කළොත් ගරු කථානායකතුමා මා සමග විරුද්ධ වෙයි. ගරු කථානායකතුමනි පාසල් ප්‍රතිසංවිධානය සම්බන්ධයෙන් මන්ත්‍රීවරුන් සමග සාකච්ඡා කරනවා යයි අධ්‍යාපන ඇමතිතුමා මුසාවාදයක් බොරුවක් කිව්වා.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

මම හිතුවා, තමුන්නාන්සේ ඒ වචනය පාවිච්චි කරන එකක් නැහැ කියල. අමතක වුණාද?

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

සිංහල භාෂාවේ ඔය වචනවල වැඩි වෙනසක් නැහැ ගරු කථානායකතුමනි. හොඳයි, තමුන්නාන්සේ කියන නිසා මම අසත්‍යය කියා කියන්නම්. අධ්‍යපන ඇමතිතුමා කළ ප්‍රකාශය කියවන්නම්. මම අධ්‍යාපන ඇමතිතුමාගෙන් ඇසූ ප්‍රශ්නයක් හැන්සාඩ් වාර්තාවේ 70 වෙනි කාණ්ඩයේ 3190 වෙනි තීරුවේ වාර්තා වී තිබෙනවා. මෙන්න ඒ ප්‍රශ්නය :

"(අ) වලපනේ පාඨශාලා නැවත වර්ග කිරීමට ක්‍රියාකර තිබේද? (ආ) නැවත වර්ග කරන ලද පාසල් පිළිබඳ සම්පූර්ණ විස්තර එතුමා සඳහන් කරනවාද? නොඑසේ නම්, ඒ මන්ද?

ඒ ප්‍රශ්නයට පිළිතුරු දී තිබෙන්නේ අධ්‍යාපන ඇමතිතුමාගේ පාර්ලිමේන්තු ලේකම් තුමායි.

මෙන්න පිළිතුර :

"මුළු ලංකාවේම පාසැල් වර්ග කිරීම පිළිබඳ යෝජනාවක් ඇති හෙයින් ඒ අනුව පිළියෙල කරන ප්‍රතිසංවිධාන වැඩ පිළිවෙල ක්‍රියාත්මක වන්නේ නම් හෝ ක්‍රියාත්මක වන අවස්ථාවකදී වලපනේ පාසැල්ද වර්ග කිරීම ගැන සළකා බලනු ඇත. (ආ) නැත. (ඉ) යෝජිත වර්ග කිරීමේ වැඩ පිළිවෙල ක්‍රියාත්මක වන ආකාරය ගැන තවම තීරණය කර නැති හෙයින් ඒ පිළිබඳ විස්තර සැපයීම දැනට කළ නොහැක."

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. බී. එම්. හේරත් මයා.]

ඒ අවස්ථාවේදී පානදුරේ ගරු මන්ත්‍රීතුමා අතුරු ප්‍රශ්නයක් ඇසුවා.

"ලෙස්ලි ගුණවර්ධන මයා :

ඇමතිතුමාගෙන් අතුරු ප්‍රශ්නයක් අහන්න කැමතියි. වලපනේ කොට්ඨාශයට පමණක් නොව සාමාන්‍යයෙන් ලංකාවේ අනිකුත් මැතිවරණ කොට්ඨාශවලටත් බලපාන මීට අදාළ ප්‍රශ්නයක් ගැනයි මම විමසන්නෙ. පාසල් වර්ග කිරීම පිළිබඳ ප්‍රතිසංවිධාන කටයුතු කිරීමට පෙර ඒ ඒ ප්‍රදේශවල පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ අදහස් දැනගැනීම පිණිස එම වාර්තාව මන්ත්‍රීවරුන් වෙත නිකුත් කරනවාද, එසේ නැත්නම් මහජනයාටත්, මන්ත්‍රීවරුන්ටත් එක වරම නිකුත් කරනවාද ?"

ඒ අතුරු ප්‍රශ්නයට උත්තර දුන්නේ පාර්ලිමේන්තු ලේකම්තුමා නොවෙයි; ඇමතිතුමායි.

"ගරු අයි. එම්. ආර්. ඒ. ඊරියගොල්ල (අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති) :

අවසාන තීරණයකට බැසීමට පෙර මන්ත්‍රීවරුන්ගෙ අදහස් විමසනව.

ලෙස්ලි ගුණවර්ධන මයා :

ඒක හරි. මගේ ප්‍රශ්නය, වර්ග කිරීම පිළිබඳ අදහස් මන්ත්‍රීවරුන්ගෙන් විමසන්න මහජනතාවගෙනුත් විමසන අවස්ථාවේදීමද, එසේ නැතිව ඊට පෙරද ?

ගරු ඊරියගොල්ල :

ඊට පෙර."

ඔන්න ප්‍රකාශය. මහජනයාගෙන් විමසන්නට පෙර අපෙන් විමසනවාලු. මම අද නොවෙයි මීට පෙරත් මේ චෝදනාව කර තිබෙනවා. වලපනේ පාඨශාලා වර්ග කිරීම සම්බන්ධයෙන් මගෙන් කිසිම විධියක විමසීමක් කළේ නැහැ. මා විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් කීප දෙනකු සමඟ මේ ගැන සාකච්ඡා කළා. ඒ කිසිම මන්ත්‍රීවරයෙකුගෙන් පාඨශාලා වර්ග කිරීම ගැන අදහස් විමසා නැහැ. හැබැයි, වර්ග කරල ඉවර වෙලා අපට ලැයිස්තු එව්වා. ඒ වර්ග කිරීම් සම්පූර්ණයෙන්ම වැරදි බව දන්වා අපි ඒවාට විරුද්ධත්වය ප්‍රකාශ කර යැව්වා. ඒවා කුණු බාල්දියට වීසි කළා. අධ්‍යාපන ඇමතිතුමාට පෞද්ගලිකවත් විරුද්ධත්වය ප්‍රකාශ කර එව්වා. ඒවාට තවම පිළිතුරුවත් නැහැ. මන්ත්‍රීවරුන්ගේ අදහස් විමසා මන්ත්‍රීවරුන්ගේ අදහස් ලබාගෙන තමයි, පාඨශාලා ප්‍රතිසංවිධානය කරන්නේ කියා ඇමතිතුමා මේ ගරු සභාවේදී වගකීම් සහිතව ප්‍රකාශයක් කළා. එහෙත් එවන ලියුම් කුණු බාල්දියට දමනවා. අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් මේ ගැන අප සමඟ සාකච්ඡා කළේ නැහැ. මහජනයා සමඟවත් ගුරු දෙගුරු සමිති සමගවත් සාකච්ඡා කළේ නැහැ. ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂවරයා හෝ පරීක්ෂකවරයා හෝ වලපනේ කිසිම ගුරු දෙගුරු සමිතියක් කැඳවා පාසල් ප්‍රතිසංවිධානය සම්බන්ධයෙන් සාකච්ඡා කළේ නැහැ. ඒ ඒ ප්‍රදේශවල නියෝජිතයන් වශයෙන් අප කී දේ නොපිළිගෙන රහසේ කටයුතු කරන්නට පටන් ගත්තා. පන්ති නතර කිරීම ගැන ගම්වල කිසිම කලබලයක් ඇති වන්නට ඉඩ දෙන්න එපායයි ගුරුවරුන්ට කිව්වා. ගමේ කිසියම් උද්ඝෝෂණයක්, කලබලයක්, විරුද්ධත්වයක් ඇති වුණොත් ඒ ගැන තමුසෙලා වග කිව යුතුයයි ගුරුවරුන්ට තර්ජනය කළා. එම නිසා, ගුරුවරුන් දඬුවමට, මාරු කිරීමට බයේ මේ පන්ති නතර කිරීම ගැන කිසිම කෙනකුට දැන්නුවේ නැහැ. තම කොට්ඨාශවල සමහර පාඨශාලාවල 7 වන පන්තිය නතර කර තිබෙන බව ආණ්ඩු පක්ෂයේම සමහර මන්ත්‍රීවරුන් පවා දන්නේ නැහැ.

1 සිට 10 දක්වා පන්ති තිබෙන පාසලේ 7 වැන්න සමත් වුණු ළමයා වෙනත් පාඨශාලාවකට යැව්වා. 8 සමත් ළමයාත් 9 සමත් ළමයාත් ඒ පාසලේම සිටිනවා. එක් අවුරුද්දකදී 7 වන පන්තිය අහෝසි කරනවා. ඊළඟ අවුරුද්දේ 8 වන පන්තියත් ඊළඟ අවුරුද්දේ 9 වන පන්තියත් ඊළඟ අවුරුද්දේ 10 වන පන්තියත් ආදී වශයෙන් මේ පන්ති අහෝසි කිරීමේ වැඩ පිළිවෙළක් යෙදුවා. තම ගමේ පාඨශාලාවේ විශ්ව විද්‍යාල ප්‍රවේශ පන්තිය අහෝසි වී ඇති බව දෙමවුපියන් දන්නේ අවුරුදු 5 කට පසුවයි. දෙමවුපියන්ට රහස එළි නොවන අන්දමට මේ පිළිවෙළ යෙදුවා. ඉතාමත් වංචනික පිළිවෙළට පාඨශාලාවල තත්ත්වය පහළ දැම්මා. "මේ තත්ත්වය නිසා යම් උද්ඝෝෂණයක් ඇති වුණොත් ඊට තමුසෙලා වග කිවයුතුය" යනුවෙන් ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් කෙළින්ම ගුරු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වරුන්ට තර්ජනය කළා. මේ තරම් වැද ගත් ජාතික ප්‍රශ්නයක් සම්බන්ධයෙන් අධ්‍යාපන ඇමතිතුමා කටයුතු කෙළේ මෙහෙමයි. "මේ ප්‍රශ්නයේදී මුළු ජාතියේම අදහස් මට ඕනෑ, මුළු රටේම අදහස් මට ඕනෑ, මුළු පාර්ලිමේන්තුවේම අදහස් මට ඕනෑ" යනුවෙන් මහා කයිවාරුවක් ගැසූ අධ්‍යාපන ඇමතිතුමා අනෙක් පැත්තෙන්, "තමුසෙලා මේ වැඩේ හොර රහසේ කරන්නට ඕනෑ" යි ගුරුවරුන්ට කිව්වා. "ගමේ උද්ඝෝෂණයක් ඇති වුණොත් 'ඩිස්මිස්' වන්නේ තමුසේලා" යි ගුරුවරුන්ට තර්ජනය කළා. අධ්‍යාපන ඇමතිතුමා කොතරම් වංකභාවයකින් මෙහිදී කටයුතු කර තිබෙනවාද යන වග මෙයින් පෙනෙනවා නේද? අධ්‍යාපන ඇමතිතුමා විසින් මෙම ගරු සභාවෙහිදී කරන ලද ප්‍රකාශය වංකය කීවොත්, අවංක නැත කීවොත්...

ගරු අයි. එම්. ආර්. ඒ. ඊරියගොල්ල (අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති)
*(கௌரவ ஐ. எம். ஆர். ஏ. ஈரியகொல்ல—கல்வி, கலாச்சார விவகார அமைச்சர்)*
(The Hon. I. M. R. A. Iriyagolle—Minister of Education and Cultural Affairs)

කථානායකතුමනි, මේ සම්බන්ධව මගේ ලියකියවිලි මොනවා හෝ තිබෙනවා නම් ඒවා පෙන්නුම් කර, චෝදනා කරනවා නම් හොඳයි.

ටී. බී. එම්. හේරත් මයා.
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

පෙන්නලා තමයි චෝදනා කරන්නේ. [බාධා කිරීම්]

ගරු ඊරියගොල්ල
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

මොනවද පෙන්නුවේ? [බාධා කිරීම්] කට පළල තියෙන පළියට කථා කරන්න එපා.

ටී. බී. එම්. හේරත් මයා.
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

කට පමණක් නොවෙයි, වෙනත් දේවලුත් පළල ඇති. [බාධාකිරීම්] ඒ කට පළල් කථාව ඉල්ලා අස්කර ගන්නවා. [බාධාකිරීම්] මගේ කට පළල තමයි. තමුසෙගෙ වෙන දේවල් පළල ඇති.

ගරු ඊරියගොල්ල
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

වංචනික විධියට මා ගුරුවරුන්ට තර්ජනය කළායයි කිව්වා.

ටී. බී. එම්. හේරත් මයා.
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

මා කිව්වේ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් තර්ජනය කළ බවයි. තමුසෙට සිංහල නොතේරෙනවාට මට කරන්නට දෙයක් නැහැ.

කථානායකතුමා
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

I am not given an opportunity to make an Order. They are fighting each other.

කේ. බී. රත්නායක මයා. (අනුරාධපුර)
*(திரு. கே. பி. ரத்ணயக்க—அனுராதபுரம்)*
(Mr. K. B. Ratnayake—Anuradhapura)

They are debating the sizes.

ගරු ඊරියගොල්ල
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

මා ගුරුවරුන්ට තර්ජනය කළායයි මන්ත්‍රීතුමා මට චෝදනා කරනවා.

කථානායකතුමා
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

There is no point of Order. The Hon. Minister can reply.

ටී. බී. එම්. හේරත් මයා.
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

ගරු ඇමතිතුමා මෙම ගරු සභාවෙහිදී දුන් පොරොන්දුව ඉෂ්ට කෙළේ නැහැ. මා එතුමාට එල්ල කරන චෝදනාව එයයි. එය මා එක වරක් නොව සියවරක් එතුමා වෙත

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ටී. බී. එම්. හේරත් මයා.]

එල්ල කරනවා. ඇමතිතුමාගේ ඇට නැති දිව නැමෙන නැමෙන පළියට අද එකකුත් හෙට වෙනත් දේකුත් ආදී වශයෙන් එතුමා කියන කියන දේට අත ඔසවන්නට සිටින පිරිසක් නොවෙයි මන්ත්‍රීවරුන්. මන්ත්‍රීවරුන්ටත් ආත්ම ගෞරවයක් තිබෙනවා. කටට එන පළියට ඇමතිතුමා කියන හැම දේම පිළිගන්නට මන්ත්‍රීවරුන් සූදානම් නැහැ.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

තරහ නොගෙන කථා කරන්න.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

අධ්‍යාපන ඇමතිතුමා මේ විධියේ ඔළමොට්ටල කථා කියන විට තරහ යන්නේ නැද්ද කථානායකතුමනි?

ඌව පළාතේ එක්තරා පාසලක ගුරු දෙගුරු සමිතියකට තමන් බලහත්කාරයෙන් ගිය අන්දම සොරණාතොට ගරු මන්ත්‍රීතුමා (විජේරත්න බණ්ඩා මයා.) මෙම ගරු සභා වෙහිදී ප්‍රකාශ කළ බව ඔබතුමාට මතක ඇති. ඒ මන්ත්‍රීතුමා එම පාඨශාලාවට තම ළමයින් යවන පියෙක්. එහෙත්, ගුරු දෙගුරු සමිතියේ රැස්වීම එතුමාට දැනුම් දුන්නේ නැහැ. මන්ත්‍රීතුමාට ආරංචිය ලැබී කොහොම හරි ඒ ස්ථානයට ගියා. එහෙම ගිහිල්ල බලහත්කාරයෙන් ඒ සාකච්ඡාවට සහභාගි වුණා. එහිදී එතුමා යම් යම් කරුණු පෙන්නා දුන්නා; නමුත් ඒ කරුණු කිසිවක් ඉටු කළේ නැහැ. මේ ගැන සොරණාතොට මන්ත්‍රීතුමා මේ ගරු සභාවේදී පැමිණිලි කළා. පානදුරේ ගරු මන්ත්‍රීතමාත් (ලෙස්ලි ගුණවර්ධන මයා.) අනුරාධපුරයේ ගරු මන්ත්‍රීතුමාත්, (රත්නායක මයා.) මාත් මේ ගරු සභාවට මේ සම්බන්ධයෙන් පැමිණිලි කර තිබෙනවා. නමුත් එයින් කිසිම ප්‍රතිඵලයක් නොලැබුණ නිසා මා කෙළින්ම කියනවා, එම නිලධාරීන් ක්‍රියා කළේ අධ්‍යාපන ඇමතිතුමාගේ අනදැනම ඇතුවය කියා. ඇයි තමුන්නාන්සේ ඒ අයව ආරක්ෂා කළේ? තමුන්නාන්සේ ඒ නිලධාරීන් ආරක්ෂා කළේ මේ වංචනික ක්‍රියාවට ඇමතිතුමාගේ අනුබලය දී තිබෙන නිසයි.

හොඳයි, ගරු කථානායකතුමනි, පාසැල් වර්ග කිරීමට මත්තෙන් ගරු අධ්‍යාපන ඇමතිතුමාට යුතුකමක් තිබුණේ නැද්ද, ඒ ඒ අංශවලට යන ළමයින්ට පාසැල් ලබා දෙන්න? ඒ ළමයින්ට මොකක් හෝ පාසැලක් ලබා දෙන්න ඕනෑ. කෘෂිකර්මයෙන් සමත් වුණ ළමයෙක් ඉන්නවා නම්—අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගය කෘෂිකර්මය අංශයෙන් සමත් වුණ ළමයෙක් සිටිනවා නම්—ඒ ළමයා මොන පාසැලටද යා යුත්තෙ? මහනුවරදී අධ්‍යාපන ඇමතිතුමාගෙන් එක් ගුරුවරයෙක් අසා තිබෙනවා, කෘෂිකර්මයෙන් සමර්ථ වුණ ළමයෙක් සිටිනවා, ඒ ළමයා මොන පාසැලටද යවන්නේ, කියා. මොකක්ද දුන්න උත්තරය? "ඕනෑ තැනකට යවන්න" කියායි. පසුව ඒ ගැන ගුරුවරුන් හිතා වුණා. එවිට එතුමා කිව්වා, අධ්‍යාපන අධ්‍යක්ෂතුමාට ලියා එවන්නය, ඒ ගැන මොකක් හෝ කර දෙන්නම්ය කියා. ඔන්න ඔය විධියටයි පාසැල් වර්ග කරන්නෙ.

කර්මාන්ත අංශයෙන් ළමයින්ට අධ්‍යාපනය ලබන්නට අනුබල දෙනවා. ඒ අංශයෙන් අධ්‍යාපනය ලැබූ ළමයා අන්තිමේදී අතරමං වෙනවා. විද්‍යාව අංශයෙන් අධ්‍යාපනය ලබන්නය කියා අනුබල දෙනවා. ඒ අංශයෙන් අධ්‍යාපනය ලැබූ ළමයාත් අන්තිමේදී අතරමං වෙනවා. කෘෂිකර්මය අංශයෙන් අධ්‍යාපනය ලබන්නය කියා අනුබල දෙනවා. වල් නෙළීම් කරනවා, ශ්‍රමදාන කරනවා. නමුත් කෘෂිකර්මයෙන් සමර්ථ වුණ ළමයාත් අන්තිමේදී අතරමං වෙනවා.

අඩු ගණනේ එක දිස්ත්‍රික්කයට එක් කෘෂිකර්ම ආයතනයක්වත් ලබා දෙන්න බැරි ඇයි? අඩු ගණනේ එක ආසනයකට නැත්නම් එක දිස්ත්‍රික්කයකට එක් කෘෂිකර්ම ආයතනයක්වත් සකස් කර කෘෂිකර්ම අංශයෙන් සමර්ථකම් දක්වන ළමයින් එයට ඇතුළත් කිරීමට වැඩපිළිවෙළක් සකස් කරන්න ඕනෑ නේද? නමුත් එවැනි දෙයක් කරන්නෙ නැහැ. ළමයින් අතරමං වෙනවා. නමුත් මෙහි දෙගෙන අහසේ මාළිගා තනනවා. එය කොයි වේලේ කඩා වැටෙයිද දන්නෙත් නැහැ. අධ්‍යාපනය කියන්නේ අහස් මාළිගාවක් පමණයි. අධ්‍යාපන ඇමතිතුමා ඉන්නේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මාලිගාවේ නොවෙයි. එතුමා ඉන්නේ දිව්‍ය ලෝකයත් මේ ලෝකයත් අතරේයි. අධ්‍යාපන ඇමතිතුමා ඉන්නේ දෙලොවක් අතරයි. දෙලොවක් අතරේ සිටින, අධ්‍යාපන ඇමතිවරයෙකුයි අපට සිටින්නෙ. "අපට පුතේ මගක් නැතේ"—එයත් තහනම් කළා නේ. මේ රටට අද ලැබී තිබෙන තත්ත්වය තමයි ඔය. අනික් කරුණ නම් ගරු කථානායකතුමනි, ළමයෙකුට අද අධ්‍යාපනය නියම අන්දමට කර ගෙන යන්න ක්‍රමයක් නැහැ. ගම්බද ළමයින් පාසැලේ සිට පැමිණී විගසම තමන්ගේ පියාත් සමග කුඹුරට යනවා. ඔවුන් ඊ වන තෙක් කුඹුරේ වැඩ හෝ වෙනත් වැඩ කරන්න ඕනෑ. ඒ වගේම පාසැලට යන්න ප්‍රථමත් හරකුන් බැඳීම, ඔවුන්ට කන්න දීම, ආදී වැඩ ටික කරන්න ඕනෑ. ඔය රාජකාරි ටික අවසන් කර පාසැලට ගිය විගසම ඊළඟට ඔවුන් කළ යුත්තේ මොකාක්ද? "වැඩ හුරුව" කියා කාගේවත් කුඹුරකට එක්ක ගොස් වල් නෙළීම් පැළ සිටුවීම් ආදිය කරවනවා. ඔය විධියට මඩ ගා ගෙන ඔවුන් වැඩ කරන විට ඒ දවසම අවසානයි. "ශ්‍රමදානය" කියා දෙයක් තවත් දවසකට කරනවා. ඔය විධියේ ශ්‍රමදානය කරන පිරිසක් මහනුවර නගරයේ සිට එන අතර මගේ ගෙදරටත් පැමිණියා. මා ඒ ළමයින්ගෙන් ඇසුවා මොකටද ආවේ කියා. ශ්‍රමදානය වශයෙන් මිදුල අතුගෑමට හෝ කානු පිරිසිදු කිරීමට කැමති බව ඒ ළමයින් කිව්වා. මා කිව්වා, මගේ ගෙදර ඒ වැඩ ටික මට කර ගන්න පුළුවනි, ඔය ළමයින් යන්නය කියා. අද පාසැල්වලට යන ළමයින්ට ඔන්න ඔය විධියේ වැඩ තමයි කරන්න සිදු වී තිබෙන්නෙ. ගරු කථානායකතුමනි, වැඩක් කරනවා නම් හරියට කරන්න ඕනෑ. මොකක්ද මේ කරන වැඩේ තේරුම? ගම්බද පාසැල්වල සිටින ළමයින් කුඹුරුවලට ගෙන ගොස් වැඩ දෙනවා. නගරබද ඉන්න ළමයින්ට වැඩ හුරුවක් දෙන්න කුඹුරු ඇත්තේ නැහැ නේ. ඒ නිසා ඒ ළමයින් ලවා ගෙවල්වල කානු පිරිසිදු කර වනවා. මොකක්ද මේ ගෙන යන ව්‍යාපාරය? මොකක්ද මේ රටේ තිබෙන අධ්‍යාපන ක්‍රමය? කසල සෝධකයින් කරන වැඩද මේ ළමයින් ලවා කර වන්නෙ? කක්කුස්සි සේදවීම සහ කානු සේදවීමයි ළමයින් ලවා කරවන්නෙ. සෙම දමා ගෙන කරන්නෙ මේවාද? ඔන්න ඔකට තමයි ශ්‍රමදාන කියන්නෙ.

කුඹුරුවල පැළ සිටුවීම, වල් නෙළීම, ආදියට මේ අයවැය ලේඛනයෙන් මුදල් වෙන් කර තිබෙනවා. මේ තරම් කාලයක් අපේ මිනිසුන් කුඹුරුවල වල් නෙළීම් පැළ සිටුවීම් කර ගත්තේ මේ පාසැල් ළමයින් ලවාද? මිනිසුන් එක් කෙනෙකු නැත්නම් හතර පස් දෙනෙකුන් විසින් කරන පැළ සිටුවීම් නැත්නම්, වල් නෙළීම කිරීමට මුළු පාසැලේම සිටින ළමයින් ගෙන යනවා. ඒ සඳහා යන වියහියදම්, ප්‍රයෝජන ලබා ගන්නා ඒ මිනිසුන් විසින් ගෙවිය යුතු වුවත් එවැන්නක් කෙරෙන්නේ නැහැ. පාසල් ළමුන් ගොස් ඒ ඒ කුඹුරුවල වල් නෙළනවා නම්, ගොයම් සිටුවනවා නම්, ලාභ ප්‍රයෝජන සැලසෙන්නේ ඒ කුඹුරු අයිතිකාරයන්ටයි. ඒ නිසා ඒ සඳහා යන වියදම් දැරිය යුත්තේ ඒ අය විසින් වුවත් ආණ්ඩුව ඒ වියදම දරනවා. ඒ වියදමෙන් කොටසක්වත් ඒ කුඹුරු අයිතිකාරයන්ට දරන්නට බැරිද? ඇයි ආණ්ඩුවම මුළු වියදම දරන්නේ? මේකත් ඡන්ද ලබා ගැනීමේ ව්‍යාපාරයක්ද?

ගරු අධ්‍යාපන ඇමතිතුමා ප්‍රදර්ශනයට භාජන වන්නට බොහොම කැමතියි. එතුමා යන බව කිවොත් පාසල්වල සිටින ළමයින් සියලු දෙනාම පාරේ. ගුරුවරුනුත් පාරේ. ඇමතිතුමා යන යන තැන ඇමතිතුමා බලන්නට ළමයිනුයි, ගුරුවරුනුයි, පෝලිමේ. බලන්නම වැඩේ නොවැ? ළමයින් සහ ගුරුවරුන් පෝලිමට වෙලා ඉන්නවා. ඇමතිතුමා මෝටර් රථයෙන් යනවා. සමහර විට කුඩයක් ඉහළාගෙන පයින් යනවා. ඇමතිතුමා නොතෙමී යන අතර ළමයින් ටික තෙමී තෙමී යනවා. අර උයන්වත්ත සහ පොල්ගොල්ල ගුරු අභ්‍යාස විද්‍යාලවලට ඇමතිතුමා ගියාට පසුවද, ඔය කොණ්ඩය කළු කර ගන්නට කල්පනා කෙළේ? ඇත්තෙන්ම මොකක්ද මේකේ තේරුම?

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

(Mr. Speaker)

The hon. Member has been given one hour and ten minutes by the Opposition Whip.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමති ගරු අයි. එම්. ආර්. ඒ. ඊරියගොල්ල කෙරෙහි

[කථානායකතුමා]

ගරු මන්ත්‍රීතුමාට තව තියෙන්නේ මිනිත්තු 10 යි.

**ටී. බී. එම්. හේරත් මයා,**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

මිනිත්තු 10 දී ඉවර කරන්නට පුළුවන් තරම් මහන්සි ගන්නවා.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Hon. Members of the Opposition must realize the fact that time has been allotted for this Debate after discussion. The total number of hours allotted for the Debate is seven and a half hours and I cannot give even one minute more to any hon. Member because, if I do so, I will not be able to control the Debate.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

මා තව ගරු මන්ත්‍රීවරයකුගේ කාල යෙන් කොටසක් ඉල්ලා ගත්තාට තමුන්නාන්සේ විරුද්ධ වන්නේ නැහැ නේද? මා තව ගරු මන්ත්‍රීවරයකුගෙ කාලයෙන් මිනිත්තු 10 ක් ඉල්ලා ගන්නවා.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

If the hon. Member can get ten minutes from another hon. Member I do not mind.

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்சா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

He can take ten minutes from the time allowed to the hon. Member for Colombo South (Mr. Bernard Soysa) —[*Interruption.*]

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

ඊළඟට පාඨශාලාවලට ශිෂ්‍යයන් ඇතුළු කිරීම ගැන කල්පනා කර බලමු. ඇත්තෙන්ම මේ සඳහා කිසිම වැඩ පිළිවෙළක් නැහැ. අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේ තුණ්ඩු ගෙන යන ළමයින් විතරයි, පාඨශාලාවලට ඇතුළු කරන්නේ. තමන් එවන අය පමණක් පාඨශාලාවලට ඇතුළත් කරන ලෙස පසුගිය අවුරුද්දේදී මහනුවර අධ්‍යාපන අධ්‍යක්ෂවරයා සියලුම විදුහල්පතිවරුන්ට නියම කළා. මොන මොන විධියටද මේ තුණ්ඩු යන්නේ? මේ තුණ්ඩු ක්‍රය නිසා අද ළමයින් අතරමං වී සිටිනවා. මේ අධ්‍යාපන ඇමතිතුමාගේ ප්‍රතිපත්තිය යටතේ අද ළමයින් අතරමං වී සිටිනවා.

එදා ගරු අධ්‍යාපන ඇමතිවරයාට විරුද්ධව ඉදිරිපත් කරන ලද විශ්වාස භංග යෝජනාව පිළිබඳ විවාදයේදී පිළිතුරු දෙමින් එතුමා ප්‍රකාශ කළ දේ මම කොටින් කියන්නම්. "විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන්ට කිසිම අයුත්තක් කරන්නේ නැහැ. කාටත් එක හා සමානව සලකනවා." යනුවෙන් කියා ඇති මේ කාරණය සඳහන් වන්නේ හැන්සාඩ් වාර්තාවේ 60 වන කාණ්ඩයේ 3361 වන තීරුවේයි. ගරු ඇමතිතුමා මේ විධියට කියා ඇතත් මට කර තියෙන දෙයක් මා පෙන්වා දෙන්නට කැමතියි. මේ ඇමතිතුමා පත් වුණායින් පසුව වලපනේ කොට්ඨාශයේ නම් එකම අලුත් පාඨශාලා ගොඩනැගිල්ලක්වත් සාදා නැහැ. සමහර ප්‍රතිසංස්කරණ වැඩ නම් කර තිබෙන බව ඇත්තයි. එහෙත් එක අලුත් ගොඩනැගිල්ලක්වත් සාදා නැහැ.

මා පාඨශාලා ගැන පෞද්ගලික යෝජනාවක් ඉදිරිපත් කළා. 66 වන කාණ්ඩයේ 1458 තීරුවේ ඒ ගැන සඳහන් වෙනවා. හිඟුරේවෙල, ගල්කඩවෙල, මැදකඳුර, ගලබඩ, ඇලිවල, නැන්නබෝධිය යන ස්ථානවල පාඨශාලා පිහිටුවිය යුතු යයි ඉදිරිපත් කරන ලද ඒ යෝජනාව සම්බන්ධයෙන් පිළිතුරු දුන්නේ ගරු පාර්ලිමේන්තු ලේකම්තුමායි. එදා ගරු අධ්‍යාපන ඇමතිතුමා පැමිණ සිටියේ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පාර්ලිමේන්තු ලේකම්තුමා පිළිතුරු දී තිබෙන්නේ මේ අන්දමටයි:

"ගරු කථානායකතුමනි, වලපනේ ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගැන අපට කියන්නට තිබෙන්නෙ තැන්නබෝධිය පාඨශාලාව හැර එතුමා සඳහන් කළ ඉතිරි පාඨශාලා පහම පිහිටුවීමේ කටයුත්තට ප්‍රමුඛත්වය දී ඒවා ලැයිස්තුවට ඇතුළත් කර තිබෙන බවයි. මුදල් ලැබුණු වහාම ඒ ගැන කටයුතු කරනවා ඇති."

ප්‍රමුඛත්ව ලැයිස්තුවට ඇතුළත් කර තිබෙනවාය, මුදල් ලැබුණු වහාම කරනවා යයි එදා කීවත් අද වත් ඒ පොරොන්දුව ඉටු කර නැහැ. 1966 ජූනි 5 වනදා ඒ අන්දමට පිළිතුරු දුන්නා. මේ වන තෙක් අංක එක වත් සාදා නැහැ. අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් මෙම පාඨශාලා ගොඩනැගිලි හදන්නේ නැති නිසා උඩරට ගැමි සංවර්ධන දෙපාර්තමේන්තුවෙන්, පාඨශාලා තුනක් සෑදීම පිණිස මුදල් අනුමත කර ගත්තා. මෙසේ මුදල් අනුමත කර ගත්තාට පසුව නුවර එළි දිස්ත්‍රික්කයේ අධ්‍යාපන අධ්‍යක්ෂවරයා කියන්නේ මොකක්ද? "දැලිවල විද්‍යාලය: මෙය යෝජිත පාසැලකි. පාසැල රජයට පවරා ගෙන නැත. ඉඩමණ් පවරා ගැනීමට කටයුතු කෙරේ. ගල බඩ විද්‍යාලය: මෙය යෝජිත පාසැලකි. ඉඩමක් පවරා ගැනීමට කටයුතු කෙරේ. හිගුරේවල විද්‍යාලය: මෙය යෝජිත පාසැලකි. රජයට මෙතෙක් පවරා ගෙන නැත. එහි සඳහන් කර ඇති පාසැල් මෙතෙක් රජයට පවරා ගෙන නැති බැවින් ඇස්තමේන්තු පිළියෙළ කළ නොහැකි බව මෙයින් දන්වමි." මෙය කියන්නේ 1968 ජනවාරි 31 වනදායි.

ගරු කථානායකතුමනි, මේ අතරම තමුන්නාන්සේට පෙන්වා දෙන්න කැමතියි, නුවරඑළිය දිස්ත්‍රික්කයේ අධ්‍යාපන නිලධාරිවරයා, 1964 නොවැම්බර මස 27 වනදා ගැසට් මගින් පළ කොට ඇති නිවේදනය ගැන. මෙම නිවේදනය, මා කලින් සඳහන් කළ පාඨශාලා ගොඩනැගිලි සෑදීම පිණිස ටෙන්ඩර් කැඳවීම සඳහායි. නමුත් ඊට අවුරුදු හතරකට පසුව අලුත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා කියනවා, මේ පාඨශාලා ගොඩනගන්න විධියක් නැතැයි කියා. පාඨශාලා සඳහා ඉඩම් පවරා ගෙන ඇති නම්, ඇස්තමේන්තු සකස් කර ඇති නම්, ටෙන්ඩර් කැඳවා තිබෙනවා නම්, රජය එබඳු පියවරක් ගත්තේ මොන කාරණයක් නිසා දැයි දැනගන්න කැමතියි. ටෙන්ඩර් කැඳවා ගොඩනැගිලි තනන්න සූදානම්ව සිටි අවස්ථාවේදීයි ආණ්ඩු පෙරළියක් ඇති වුණේ. ඉන් පසුව තමුන්නාන්සේලා එම ටෙන්ඩර් අවලංගු කර දැමුවා. අප ඒ ගැන විරුද්ධත්වයක් නැහැ. නමුත් ඊට පසුවවත් එම ගොඩනැගිලි සෑදීම සඳහා පියවර ගන්න යුතුකමක් තිබුණා. ඒ පිළිබඳව යෝජනාවක් මෙම ගරු සභාවට ඉදිරිපත් කළ අවස්ථාවේදී ප්‍රමුඛත්ව ලැයිස්තුවලට ඇතුළත් කර ඇති බව කීවත්, නමුත් දැන් කියනවා හදන්න බැරිය කියා. එහෙමනම්, තමුන්නාන්සේලා විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන්ගේ කොට්ඨාශවල පාඨශාලා ගොඩනැගිලි සෑදීමට මුදල් සාධාරණ අන්දමින් දෙන්නේ නැතැයි කියන කියමන අසත්‍යයක්ද? බොරුවක් නොවෙයි, අසත්‍යයක්!

ගුරුවරුන් බඳවා ගැනීම ගැන කථා කරන විට පසුගිය අවුරුදු තුනක කාලය තුළ එකම ස්ථිර ගුරුවරයකුවත් සේවයට බඳවා ගෙන නැති බව කියන්න ඕනෑ. ගුරුවරුන් විශ්‍රාම යනවා, සේවයෙන් ඉවත් වෙනවා, මැරෙණවා, නමුත් ඒ වෙනුවට කිසිම ගුරුවරයකු ස්ථිර වශයෙන් පත් කර ගෙන නැහැ. එපමණක් නොවෙයි, අසාධාරණ අන්දමට අදත් ගුරුවරුන් මාරු කරනවා, ගුරුවරුන්ගේ වැඩ තහනම් කරනවා, ඊයේ පෙරේදාත් ගුරුවරුන් මාරු කර තිබෙනවා. ළඟයට කලින් අවස්ථාවකදීත් මා ඇමතිතුමාට පෙන්වා දුන්නා, රක්ෂාවට පත් වන්න අවුරුදු හතකට පමණ පෙර, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සේවයට පත් වන්නට අවුරුදු හතකට පෙර, නීත්‍යානුකූලව කසාද නොබැඳ එක්ව විසූවාය, ළමයකු ලැබුණාය ඔන්න ඔය විධියේ චෝදනාවක් යටතේ වැඩ තහනම් කර ඇති අවස්ථාවක් ගැන. ඇමතිතුමාට ඒ ගැන බොහොම කේන්ති ගිහින්, වලපනේ මන්ත්‍රීතුමා මොනවක්වත් දන්නෙ නැතැ'යි කීවා. කොහොම වුණත් අපේ ඇමතිතුමාට ඔවැනි දේවල් කීවාම ඉක්මනට කේන්ති යනවා. කිසි තේරුමක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමති ගරු අයි. එම්. ආර්. ඒ. ඊරියගොල්ල කෙරෙහි

[පී. බී. එම්. හේරත් මයා.]

නැතුව ඔවැනි දේවලට ගුරුවරුන්ගේ වැඩ තහනම් කර ඇති අවස්ථා තිබෙනවා. මගේ කොට්ඨාශයේ, සැරසුම්තැනන විද්‍යාලයේ ගුරුවරයකුගේ වැඩ, මෙයට අවුරුදු තුනකට උඩදී කිසිම තේරුමක් නැතුව, තහනම් කර තිබෙනවා. අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගෙන් ප්‍රශ්න කළාම කියනවා, දිසාපතිවරයා දන්වා එවා තිබෙනවාය, ඒ ගුරුවරයාට විරුද්ධව නඩුවක් තිබෙනවාය කියා. චෝදනා පත්‍ර ඉදිරිපත් කරන්නේත් නැහැ, ගුරුවරයාට වැඩ දෙන්නේත් නැහැ. අද ඔහු අතරමං වී සිටිනවා. ඒ විධියේ අසහනකාරී තත්ත්වයකට මේ රටේ ගුරුවරුන් අද මුහුණ පා තිබෙන බව පෙන්වා දෙන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, ගුරුවරුන්ගේ උසස් වීමේ ක්‍රමය සම්පූර්ණයෙන් වෙනස් කර දමා තිබෙනවා; ජ්‍යෙෂ්ඨතාවය අනුව උසස්වීම් දීමේ ක්‍රමය සම්පූර්ණයෙන්ම අහෝසි කර දමා තිබෙනවා. පළමුවැනි ශ්‍රේණියට පත් කරන්නේ දෙවැනි ශ්‍රේණියේ සිටි මුල් ගුරුවරුන්. දෙවන ශ්‍රේණියට පත් කරන්නේ තුන්වන ශ්‍රේණියේ මුල් ගුරු පත්වීම් ලැබූ ගුරුවරුන්. මේ අනුව එක්තරා පිළිවෙළකට, එක්තරා ක්‍රමයකට මුල් ගුරු පත්වීම් දී ගෙන ආවා. නමුත් ඒ තත්ත්වය සම්පූර්ණයෙන්ම වෙනස් කර තිබෙනවා පමණක් නොවෙයි මේ සුදුසුකම් එකක්වත් නැති පුද්ගලයන්ට පළමුවැනි ශ්‍රේණියේ පත්වීම් දී තිබෙනවා. තමුන්නාන්සේලාට පන්දම් අල්ලන, දේශපාලන පන්දම් අල්ලන පුද්ගලයන්ට ඒ අන්දමට පත්වීම් දී තිබෙනවා. ඉල්ලුම් පත්‍ර කැඳවා කෙළින්ම පළමු වැනි ශ්‍රේණිය දුන්නා. බැස්ටියන් කවි කෝශවට විද්‍යාලයාධිපති තනතුරක් ලැබුණා පමණක් නොවෙයි, කොළඹ හොඳ ගෙයක් සදා ගන්නටත් පුළුවන් වෙලා තියෙනවා. ඉස්සර බස් තියන් නොවෙයි, බස් නැතිව සිටි තැනැත්තෙක් එයා. දැන් කොළඹ හොඳ ගෙවල් හදාගෙන ඉන්නවා. ගුරුවරුන් උසස් කිරීමේ පිළිවෙළ තමුන්නාන්සේ සම්පූර්ණයෙන්ම වෙනස් කළා. මුහුණ බලා ලකුණු දමා තිබෙන බව ඇත්තය, ඒක [illegible]නට බැරිය කියා තමුන්නාන්සේම කිව්වා, ගුරු සම්මේලනවලදී. මහනුවරදී තමුන්නාන්සේ එසේ කිව්වා. මුහුණ බලා ලකුණු දෙනනේ ගුරු මහත්මියන්ට නම් ඒ ගැන අපේ විරුද්ධත්වයක් නැහැ. මුහුණ බලා නොවෙයි, යුක්තිසහගතව ලකුණු දෙන්නට ඕනෑ. මොකක්ද තමුන්නාන්සේ හැදුවය කියන්නේ? හැදුවිය කියන එකේ තේරුම මොකක්ද? ගුරුවරුන් බෙදා හැරීමේ වැඩ පිළිවෙළේ ගන්න දෙයක් නැහැ. මගේ කොට්ඨාශයේ මහා විද්‍යාලවලට අදත් විද්‍යාලයාධිපතිවරුන් නැහැ. දෙනවාය කියා තමුන්නාන්සේ පොරොන්දු වෙලා තියෙනවා. ඒ පොරොන්දු හැන්සාඩ් වාර්තාවලට ඇතුළු වී තිබෙනවා. ඒවා කියවන්නට මට වෙලා නැහැ. විද්‍යාලයාධිපතිවරුන් පත් කළාම වහාම දෙනවාය කිව්වා. තුන් වැනි ශ්‍රේණියට පත් කළා; දෙවැනි ශ්‍රේණියට පත් කළා; පළමුවැනි ශ්‍රේණියට පත් කළා; නමුත් තවම අපට එක් කෙනකුවත් ලැබුණේ නැහැ. මුල් ගුරුවරුනුත් නැහැ. වැඩ බලන මුල් ගුරුවරුනුයි ඉන්නේ. වැඩ බලන මුල් ගුරුවරුන් තබා ගැනීමේ ක්‍රමය අහෝසි කළාය කියා තමුන්නාන්සේ කියනවා. නැහැ; තවම ඉන්නවා, ඒ අය. සුදුසු ගුරුවරුන් නැහැ. විද්‍යා ගුරුවරුන් නැහැ. ගුරු මාරු මණ්ඩල ආපසු දෙනවාය කිව්වා. තවම දුන්නෙ නැහැ. ඕනෙන ඕනෙන විධියට දාම් ඉත්තන් අදිනවා වගේ ගුරුවරුන් මාරු කරනවා. අධ්‍යාපන අධ්‍යක්ෂවරයා 15 වැනිදා විශ්‍රාම යනවා නම් ඊට කලින්, එයාගේ නෑයන් ඉන්නවා නම්, ඒ සියළු දෙනාටම පත්වීම් දෙනවා. දුනුවිල ස්කෝලයට ඒකනායක මහත්මයාගේ නෑයෙක් පත් කර නැද්ද කියා සොයා බලන්න. 15 වැනිදා විශ්‍රාම යන්නට පෙර නෑයන්ට පත්වීම් දෙනවා. තමුන්නාන්සේ ඒ හැම එකක්ම අනුමත කරනවා.

විශ්ව විද්‍යාල ළමයින්ගේ තත්ත්වය මොකක්ද? විශ්ව විද්‍යාල ශිෂ්‍ය සංගමයේ සභාපතිගේ ප්‍රකාශය කියවා බලන්න. මට එය කියවන්නට වෙලාවක් නැහැ. මට පසුව කථා කරන කව්රුන් හෝ එය කියවනවා ඇති. මා දන්න ඉංග්‍රීසියෙන් එහි කොටසක් මා කියවනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

"Why this shameless talk of our sister undergrads?"

මොකක්ද මේ විලි ලජ්ජා නැති කථාව කියා අහනවා. ශිෂ්‍යාවන් ඔක්කොම විශ්ව විද්‍යාලයෙන් එළියට එන්නේ කන්‍යා භාවය නැති කරගෙනලු. කව්රුන් හෝ මනුෂ්‍යයකුට තේරෙනවා නම්, ඔහුගේ දුව විශ්ව විද්‍යාලයෙන් එළියට ආවේ කන්‍යා භාවය නැති කරගෙනය කියා, අනික් හැම ශිෂ්‍යාවක්මත් විශ්ව විද්‍යාලයෙන් එළියට එන්නේ කන්‍යා භාවය නැති කරගෙනය කීම වැරදි නේද? ඒ කථාව සම්පූර්ණයෙන්ම වැරදියි. අපෙත් සහෝදර සහෝදරියන් දැනටත් විශ්ව විද්‍යාල ඇතුලේ ඉගෙනීම ලබනවා.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
**(The Hon. Iriyagolle)**
කියාපු තැනක් පෙන්වන්න.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
**(Mr. T. B. M. Herath)**
තමුන්නාන්සේ කිව්වෙ නැහැ කිව්වට, කියාපු දේවල් හැන්සාඩ් වාර්තාවේ තියෙනවා. 1968 සැප්තැම්බර් 25 වැනිදා හැන්සාඩ් වාර්තාවේ 290 වැනි තීරුවේ තමුන්නාන්සේ කී දේ මේ විධියට වාර්තා වී තිබෙනවා:

"යම් ස්ත්‍රියක් ගණිකාවක වුණත් ඇය ඇගේ දියණිය ගණිකාවක වනු දකින්නට කැමති නැහැ. ............මෙතෙක් කල් මහජනයා යම් යම් කරුණු නො දැන සිටියා. ඒවා මහජනයාට අවබෝධ කර වන්නටයි, මා කථා කරන්නේ. එක්කෝ විශ්ව විද්‍යාලවල මහාචාර්යවරුන් හැදෙන්නට ඕනෑ...... ......තමුන් නියම තත්ත්වය කුමක්ද යන්න දැන් තමුන්නාන්සේලාට අවබෝධ වී ඇත. එම නිසා මේ නොමග යන මහාචාර්යවරුන් හදන්නට තමුන්නෝසේලාත් අපට උපකාර කරන්නට ඕනෑ."

මට පසුව කථා කරන කෙනෙක් ඒ කොටස කියවනවා ඇති.

තමුන්නාන්සේ වගේ අධ්‍යාපන ඇමතිවරයකු මේ රටේ ඉඳලත් නැහැ; මීට පස්සෙත් ඇති නොවේවා කියා අප ප්‍රාර්ථනා කරනවා. තමුන්නාන්සේ විශ්ව විද්‍යාල විනාශ කර තිබෙනවා. විශ්ව විද්‍යාලවල ආචාර්යවරුන්ගේ ප්‍රශ්න, විශ්ව විද්‍යාලවල අධ්‍යාපන ක්‍රමය පිළිබඳ ප්‍රශ්න, විශ්ව විද්‍යාලවලින් එළියට එන උපාධිධාරින්ගේ රැකීරක්ෂා පිළිබඳ ප්‍රශ්න අවුල් ජාලයක් කර තිබෙනවා. එහෙම සිදු වුණේ අපේ වැරැද්දෙන්ලු. අවුරුදු 3 ක් තිස්සේ තමුන්නාන්සේ මොකද කළේ? ගමේ භාෂාවෙන් අහනවා නම් පොල් ගෑවද? අවුරුදු තුනක් තිස්සේ එක උපාධිධරයකුටවත් රක්ෂාවක් දෙන්නට තමුන්නාන්සේට එකම ක්‍රමයක්වත් සකස් කරන්ට බැරි වුණාද? රක්ෂා නැති උපාධිධාරීන් දැන් දොළොස් දහසක් පමණ ඉන්නවා. හැම තැනම අසහනය. අසත්‍ය ප්‍රකාශ කිරීමෙන් ජනතාව අසහනයට පත් කරනවා. අධ්‍යාපනය සම්පූර්ණයෙන්ම විනාශවී තිබෙනවා; නීති විරෝධි කර තිබෙනවා. අධ්‍යාපන පනත කඩාකප්පල් කර තිබෙනවා.

මේ ගරු සභාවට අසත්‍ය ප්‍රකාශ කර, මන්ත්‍රීවරුන්ට අසත්‍ය පොරොන්දු දී එම කටින්ම නැවත ඒවා වෙනස් කරමින් මේ ගෙන යන අධ්‍යාපන නාඩගම අනුමත කරන්නට අපට කොහෙත්ම පුළුවන් කමක් නැහැ. මේ රටේ දෙමව්පියන්, ශිෂ්‍ය ශිෂ්‍යාවන්, ගුරුවර ගුරුවරියන්, මහාචාර්යවරුන්, මන්ත්‍රීවරුන් හා තමුන්නාන්සේ නිතර බණින අධ්‍යාපන පුරෝහිතයනුත් ඇතුළු සියලු දෙනාගේම අදහස් උදහස් විමසා මේ රටේ අධ්‍යාපනයේ කිළුටු තැන් සෝද හැර හොඳ අධ්‍යාපන ක්‍රමයක් ඇති කිරීම අප සියලු දෙනාටම වුවමනා කරනවා. දරදඬු, වගකීමෙන් තොර ප්‍රකාශ කරන, අසත්‍ය ප්‍රකාශ කරන, මේ රටේ අධ්‍යාපන ප්‍රණාලියම අවුලෙන් අවුලට පත් කර විනාශ කර දමන අධ්‍යාපන ඇමතිවරයකු සිටිනවා දකින්නට අපට වුවමනාවක් නැහැ. අප එවැනි ඇමතිවරයකුට විරෝධ නිසා, විරෝධය ප්‍රකාශ කළයුතු නිසා මේ අධ්‍යාපන ඇමතිවරයා කෙරෙහි අපේ කිසිම විශ්වාසයක් නැත කියන මේ විශ්වාස භංග යෝජනාව දෙවන වරටත් බොහොම සතුටින් ඉදිරිපත් කරන අතර මේ රටේ ජනතාවට මේ යෝජනාවෙන් සෙතක් වේවායි මා ප්‍රාර්ථනා කරනවා. යම් විධියකින් අවසාන මොහොතේදී හින්දු විශ්ව විද්‍යාලය දෙනවාය කියා තමුන්නාන්සේ පෙඩරල් පක්ෂයට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමති ගරු අයි. එම්. ආර්. ඒ. ඊරියගොල්ල කෙරෙහි
[පී. බී. එම්. හේරත් මයා.]

පොරොන්දු නොවූවා නම් තමුන්නාන්සේ මෙයින් පරාජය වන බව ඒකාන්තයි. නමුත් දැන් තමුන්නාන්සේ පෙඩරල් පක්ෂයේ සහයෝගය ලබාගෙන තිබෙනවා. එමනිසා මේ යෝජනාව පරදිනවා ඇති. එසේ වුවත් අප මේ ඉදිරිපත් කළ කරුණු අසත්‍යය කියා තමුන්නාන්සේට කවදාවත් කියන්නට බැහැ. තමුන්නාන්සේගේ මේ දෙලොවක් අතර ජීවිතය අවසාන වේවායි ප්‍රාර්ථනා කරමින් මගේ කථාව මෙයින් අවසාන කරනවා.

ද සොයිසා සිරිවර්ධන මයා.
(திரு. டி சொய்சா சிறிவர்தன)
(Mr. de Zoysa Siriwardena
ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
*Question proposed.*

පූ. භා. 11.31

පී. ජී. බී. කෙනමන් මයා. (මැද කොළඹ තුන්වන මන්ත්‍රී)
(திரு. பி. ஜீ. பி. கெனமன்—கொழும்பு மத்தி மூன்ரும் அங்கத்தவர்)
(Mr. P. G. B. Keuneman—Third Colombo Central)

Mr. Speaker, I have already given away some of the time that was allotted to me to the previous speaker and to other speakers. Therefore I shall keep my remarks as brief as possible.

There are many things, Mr. Speaker about which the people of this country disagree, but I think there is one matter on which there is very wide consensus of agreement, and that is that the biggest misfortune that has befallen the education system of this country is the Hon. I. M. R. A. Iriyagolle. That is an opinion which has been expressed not only from this side of the House; it has been expressed from that side of the House; it has been expressed in the newspapers that are opposed to the Government; it has been expressed in newspapers that support the Government and even created the Government.

This motion seeks to draw attention to some of the reasons why there should be this widespread consenus of opinion in regard to the misfortunes that have befallen the education system of this country.

We have had in our history good Ministers of Education, indifferent Ministers of Education, and bad Ministers of Education. But I think the present Minister of Education holds the record in that he is the only Minister of Education in the history of this country who has successfully antagonized every section of persons concerned with education. He has antagonized the students; he has antogonized the parents; he has antagonized the teachers; and he has now not only antagonized but insulted the university dons.

I do not know whether his own appointees to the National Council of Higher Education and to the vice-chancellorships of the various universities like him, but nobody else seems to like him as Minister of Education.

கௌரவ சபாநாயகரவர்களே, கௌரவ கல்வி அமைச்சரவர்களை நெசவு ஆசிரிய சங்கம் பல முறை சந்தித்து அதன் பிரச்சினைகளை எடுத்துக் கூறியிருக்கிறது. பல வருடங்களுக்கு முன்னர் கல்வி இலாகா எத்தனையோ ஆண்களை நெசவு ஆசிரியர்களாக நியமித்தது. அதற்குப் பிறகு நெசவு ஆசிரியர்கள் பயிற்சி பெறும் திட்டத்தில் ஆண்கள் உயர்தரப் பயிற்சிபெற முடியாவண்ணம் சில திட்டங்கள் தயாரிக்கப்பட்டன. இந்தத் திட்டங்கள் தற்போதைய அமைச்சரின் காலத்தில் தயாரிக்கப்பட்டவையல்ல. சென்ற அரசாங்க காலத்திலேயே இவ்வித ஒழுங்குகள் செய்யப்பட்டன. அந்தநேரத்திலே நெசவு ஆசிரியர்கள் அப்போதைய கல்வி அமைச்சரைப் பேட்டி கண்டு தமது குறைகளை எடுத்துக் கூறிய போது அவர் இந்த ஆசிரியர்களுக்கு உதவி செய்வேன் என்று கூறினுர். ஆனுல், அப்போதைய கல்வி அமைச்சருக்கு ஆலோசகர்களாக இருந்தவர்கள், இந்த நெசவு ஆசிரியர்கள் சம்பந்தப்பட்ட விடயத்தில் அவர்களுக்கு அமைச்சர் அவர்கள் செய்ய விரும்பியவைகளைச் செய்யவிடவில்லை.

நெசவு ஆசிரியர்கள், இப்பொழுது கல்வி அமைச்சராக இருக்கின்ற கௌரவ ஐ. எம். ஆர். ஏ. ஈரியகொல்ல அவர்களை கொழும்பிலும் தென்னிலங்கையிலும் பின்னர் யாழ்ப்பாணத்திலும் சந்தித்துத் தங்கள் குறைகளை எடுத்துக் கூறினுர்கள். இப்போதைய கல்வி அமைச்சர் இந்த ஆசிரியர்களுடைய கோரிக்கைகள் நியாயமானவை என்று கூறினுர். ஆனுல், சென்ற அரசாங்ககாலத்தில் கல்வி அமைச்சராக இருந்தவருக்கு யார் ஆலோசகர்களாக இருந்தார்களோ அவர்கள் தமது அந்தப் பழைய ஆலோசனையை இந்த அமைச்சருக்கும் கொடுத்து அவரை நல்லதைச் செய்யவிடாமல் தடுத்துக் கொண்டிருக்கிறுர்கள். கல்வி அமைச்சருக்கு ஆசிரியர்கள் மத்தியில் செல்வாக்கைக் குறைக்கவே இவர்கள் இப்படித் திட்டமிட்டு வேலை செய்கிறுர்கள்.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

கல்வியின் நோக்கம் ஒரு பிள்ளையை வாழ்க்கைப் போராட்டத்திற்குத் தயார் செய்வது தான் என்பதை நாம் எல்லோரும் அறிவோம். ஒரு பிள்ளையின் வாழ்க்கைக்கு புத்தகப் படிப்பு மட்டுமோ அல்லது வெறும் வகுப்புப் பயிற்சி மட்டுமோ முக்கியமல்ல. ஒரு பிள்ளைக்கு அதன் வாழ்க்கை சீர்பெறப் பலவிதமான பயிற்சிகளும் கொடுக்கப்பட வேண்டுமென்பது கல்வி உலகில் அனுபவம் உள்ளவர்களது கொள்கையாகும். கல்வித் திட்டத்தில் உடற் பயிற்சி வகுப்புக்கள் மிக முக்கியம் என்பதையும் எவரும் அறிவர். ஆனால் இதுவரை உடற் பயிற்சி ஆசிரியர்களாக இருந்தவர்களைக் கல்வி அமைச்சு விளையாட்டு அமைச்சிடம் பாரம்கொடுத்து விட்டது. இப்பொழுது எமது பாடசாலைகளில் உடற்பயிற்சி வகுப்புக்கள் நல்லமுறையில் நடைபெறுதது மிகவும் மனவருத்தத்திற்குரிய விடயமாகும். இதையும் கௌரவ அமைச்சர் கவனிக்கவேண்டுமென்று கேட்டுக் கொள்ளுகிறேன்.

கௌரவ சபாநாயகர் அவர்களே. இதுவரை நான் கல்வி அமைச்சிலுள்ள சில குறைகளைப் பற்றிப் பேசினேன். எனக்குப் பிறகு எனது கட்சியில் இருந்து பேச இருப்பவர்கள் உயர் கல்வி விடயமாகப் பேசுவார்கள். கௌரவ கல்வி அமைச்சர் அவர்களுடைய விசேட நல்ல குணங்களை இந்த நேரத்தில் எடுத்துக் கூற வேண்டியது எங்கள் கடமையாக இருக்கின்றது. தற்போதைய அமைச்சர் அவர்கள் கல்வி இலாகாவைப் பொறுப்பு எடுக்கமுன் சிங்கள மாணவர்களைப் பொறுத்த அளவில் கொழும்பு, கண்டி, காலி ஆகிய இடங்களில் திறமான ஆசிரியர்கள் இருந்தார்களே தவிர நாட்டுப் புறங்களில் நல்ல ஆசிரியர்கள் இருக்கவில்லை. தமிழ் மாணவர்களைப் பொறுத்த அளவில், வடபகுதியில் சிறந்த ஆசிரியர்கள் இருந்தார்கள். ஆனால் தென்னிலங்கையில் ஆசிரியர் பற்றுக்குறை இருந்தது. கடந்த காலத்தில் சென்ற அரசாங்கமும் அமைச்சரும் எடுத்த பல மாற்றுத்திட்டங்கள் பல காரணங்களினால் முற்ருகக் கைவிடப்பட்டன. ஆனால், தற்போதைய அமைச்சர் எதைச்செய்தாலும் தாமே சிந்தித்து, எதையும் சரியாகவே செய்வார்.

ஆசிரியர் மாற்றுத் திட்டங்கள் இருக்கக் கூடாது என்று எவ்வளவோ செல்வாக்கு உள்ளவர்கள் தடுத்தபோதிலும் கல்வி அமைச்சர் கிராமப்புறக் கல்வியில் அக்கறைகொண்ட காரணத்தினால் மாற்றுத் திட்ட விடயங்களில் தளும்பாமல் நின்றது மிகவும் பாராட்டத் தக்க ஒரு விடயமாகும். அதோடு இவர் மாணவ ஆசிரியர் பரீட்சையொன்றையும் இரண்டு வருடங்களுக்கு முன்னர் நடாத்தினர். ஒரு இலட்சத்திற்குமேற்பட்ட பரீட்சார்த்திகள் இந்தச் சோதனைக்குத் தோற்றினர்கள். மாணவ ஆசிரியர்களைத் தெரிவு செய்யும் முறைபற்றிப் பலவிதமான ஆலோசனைகள் அமைச்சர் அவர்களுக்குத் தெரிவிக்கப்பட்டன. ஆனால் அமைச்சர் அவர்கள் மிகவும் உறுதியாகவும் மிகவும் திட்டவட்டமாகவும் பரீட்சார்த்திகளின் புள்ளிகளைக் கொண்டே நியமனங்கள் வழங்கப்படவேண்டுமென்று கூறியதுமட்டுமன்றி பரீட்சார்த்திகளது புள்ளிகளை எவரும் பார்க்கக்கூடிய விதத்தில் பகிரங்கமாகவும் வைக்கச் செய்தார். இம்முடிவுகளின்படி, இரண்டாயிரம் பேருக்கோ அல்லது இருபதினயிரம் பேருக்கோ நியமனம் கொடுப்பது முக்கியமல்ல. நியமனம் பெருத 90,000 அல்லது 98,000 பரீட்சார்த்திகள், எடுபட்ட மற்றவர்கள் எங்களிலும் பார்க்க நல்ல விசேஷமான முறையிலே இருந்த காரணத்தாலேயே தெரிவு செய்யப்பட்டார்கள் என்ற ஒரு திருப்தியை அடையக்கூடியவிதத்தில் நடந்தமைக்காக கௌரவ அமைச்சரவர்களுக்கு எமது பாராட்டுக்களைத் தெரிவிக்க வேண்டியவர்களாக இருக்கிருேம். இதே மாதிரியாக வருங்காலத்திலும், புதிய நியமனங்கள் செய்யப்படும்போது, பட்டதாரிகளை நியமிக்கின்ற நிலைமையும் ஏற்பட்டிருக்கின்றது. அச் சந்தர்ப்பத்திலே, அமைச்சரவர்களிடத்திலோ அல்லது அவரது அலுவலக உத்தியோகத்தர்களிடத்திலோ எவரும் குறை சொல்லாதிருக்கும் வண்ணம், பகிரங்கமாகச் சோதனையை வைத்தாயினும் அல்லது வேறு விதத்திலாயினும் மிகச் சிறந்த, தகுதியுடையவர்களையே எடுக்கக்கூடிய நிலையை ஏற்படுத்த வேண்டுமென்று கேட்டுக்கொள்கின்றேன்.

நான் எனது உரையை முடிப்பதற்கு முன்பு, கௌரவ அமைச்சரவர்கள் எமது சர்வகலாசாலை மாணவர்களைப்பற்றிக் கூறியவற்றை நாங்கள் ஏற்கவில்லையென்பதைத் தெரிவிக்க விரும்புகிறேன். சர்வகலாசாலை

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වී. එන්. නවරත්නම් මයා.]

மாணவர்கள் எமது நாட்டுச் செல்வங்கள். அவர்களை அமைச்சரவர்கள் கண்டிப்பதை நாங்கள் ஏற்க முடியாது என்பதைக் கூறி எனக்குப் பேசுவதற்கு அனுமதியளித்த கௌரவ சபாநாயகரவர்களுக்கு எனது நன்றியைத் தெரிவித்து எனது பேச்சை முடிக்கின்றேன்.

**වී. නවරත්නම් මයා.** (කයිට්ස්)
*(திரு. வீ. நவரத்னம்—ஊர்காவற்றுறை)*
(Mr. V. Navaratnam—Kayts)

Mr. Speaker, I am very happy to follow on my hon. Friend from Chavakachcheri, (Mr. V. N. Navaratnam), and I would certainly compliment him on the very efficient manner in which he has been indulging in a little bit of tight-rope walking in this Debate.—[*Interruption*]. I would like to be left severely alone.

I am treating this Motion purely as a condemnation of the Government's educational policy, and not as a Motion against the Minister of Education alone. After all, the Government must take collective responsibility for the educational ills that prevail in this country ; it cannot shift the responsibility on any individual Minister.

Personally, I have the highest regard and, shall I say, affection for the Hon. Minister of Education. Of course, there have been occasions on which I have quarrelled with him, but on every such occasion I left him with the utmost goodwill and friendship. That was on matters on which he and I hold different views, and we can differ. But, certainly, as far as this Motion is concerned, I am treating it purely as a general condemnation of the educational policies of the Government. My time is limited and, therefore, I have got to be rather brief in my comments.

First of all, I wish to lodge an emphatic protest against the reorganization of schools that has already been implemented without the Minister coming before this House for its approval. As my hon. Friend, the Third Member for Colombo Central, (Mr. Keuneman), remarked, there is a Bill on the subject on the Order Paper, and that ought to come up before this House in due course. Or, it may not come up at all. Anyway, we have not had the opportunity of discussing that matter. Still, from the 1st of January this year that reorganization has been taking place—with this result.

I think it is the general consensus of opinion among educational circles that this reorganization is going to bring about the greatest damage to the education of children all over. I am not only on the question of any particular sector. I am referring to the doing away with of Standard 6 and Standard 7 in maha vidyalayas. I do not know how many hon. Members have studied that aspect of the problem, but the result is this.

Today, the primary schools are mostly having their classes up to the 5th standard. Then, for admission to the 6th standard in maha vidyalayas the children have to sit for an admission test. And they are admitted to maha vidyalayas where, it must be remembered, the real foundation for subjects like algebra, geometry, science, English, and so on, is laid in Grade 6. When these grades 6 and 7 are attached to maha vidyalayas, what happens ? Sometimes, the graduate teachers on the staff come down to teach in Grade 6. Sometimes, the specialist teachers—the so-called teachers who have gone through secondary training and who are known as specialist teachers in mathematics, English, science, home science, and so on,—are available for teaching in the 6th and 7th grades. So, the children really get the benefit of teaching by specialist teachers, and a good foundation is laid in the 6th standard. That is continued in the 7th, 8th and 9th grades and the G.C.E. (Ordinary Level) Class. Today, when you compulsorily do away with grades 6 and 7 in the maha vidyalayas, what is going to be the result ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

As my hon. Friend from Walapane, (Mr. T. B. M. Herath remarked, we are going to get an army of unemployed at Grade 7 level. At this level quite a large number of students who have received their education at the so-called *kanishta* vidyalayas and who come up to Grade 7 will be ill-equipped and taught not by specialist teachers but by the normal, ordinary trained teachers, and those students will not be able to satisfy the requirements of the maha vidyalayas for entry into Grade 8, with the result that there will be quite a large number of failures at Grade 7 who will not find any accommodation in the maha vidyalayas. They will just drop out.

Parents have no say in this matter. Even if the parents desire to give their child higher education, they will not get the opportunity of getting him admitted to Grade 7 of any school. Unless he passes that grade to gain entry into Grade 8, he will not be admitted to any maha vidyalaya. So, he will drop by the way side.

Is this fair by our student population ? Does this not show some lop-sided planning at the Ministry of Education ? We have always been pointing out this aspect, and we were really waiting to pinpoint this problem when the General and Technical Education Bill comes before this House. Instead of bringing that Bill before the House, the Hon. Minister has side-tracked this House and is implementing the proposals by administrative directives. That is the other danger and what is most mischievous.

I say that you should not compulsorily close down grade 6 and 7 in the maha vidyalayas. Every maha vidyalaya must have those classes so that a child may go up from Grade 6 to Grade 12—that is the University Entrance level—in the same school.

Instead of that, what will happen now is that even those who would be lucky enough to succeed in the admission test into the Maha vidyalayas at the end of Grade 7 will be dumped into the maha vidyalayas as a very badly prepared set of students and the teachers of the maha vidyalayas will be confronted with that type of material.

The *kanishta* vidyalayas will not normally consider it their responsibility to see the child through the G. C. E. (Ordinary Level) Examination. They will say that their responsibility ends at Grade 17. That is the danger.

I pointed out this matter to the Director of Education when the re-organization proposals were being discussed. No opportunity however, was given to Members of Parliament to oppose them. Only a list was prepared by the schools and we had to accept it. I also pointed out that specialist teachers were not going to be available at grades 6 and 7 levels. The reply was, " No ; it is the intention of this Government to find the specialist teachers for these classes. "

As my hon. Friend, the Member for Chavakachcheri remarked, this is really putting the cart before the horse. Where are we going to find the specialist teachers ?

කථානායකතුමා
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Order, please ! The Sitting is suspended till 2 P.M.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, ප. ව. 2 ට නැවත පවත්වන ලදී.

*அதன்படி அமர்வு இடை நிறுத்தப்பட்டு, மீண்டும் பி. ப. 2 மணிக்கு ஆரம்பமாயிற்று.*

*Sitting accordingly suspended till 2* P.M. *and then resumed.*

වී. නවරත්නම් මයා.
*(திரு. வீ. நவரத்னம்)*
(Mr. V. Navaratnam)

Mr. Speaker, before the lunch interval I was dealing with the question of the Government doing away with grades 6 and 7 in the maha vidyalayas, and I pointed out how that

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

measure was going to affect the education of our children for generations to come.

I entirely agree with the hon. Member for Chavakachcheri (Mr. V. N. Navaratnam) when he said that all this was due to a set of schemers in the Ministry of Education. They not only prevented officers who were entitled to be promoted from being promoted, but it is they who brought about this state of affairs in regard to the education of the children of this country.

What better could we have expected from a set of schemers, who as my hon. Friend from Chavakachcheri remarked, after the retirement of Mr. Alwis, the last Director of Education, schemed to reorganize the administrative set-up in order to, if I may use the phrase, play out a particular officer, an officer who was known to be very efficient, a fountain of experience, a man of wisdom who had great experience in matters educational. The reorganization was done with a view to playing him out and to bring about a new set-up in the departmental machinery to introduce measures without the sanction of this House. I say without the sanction of this House, because there was, as I said earlier, a Bill on General and Technical Education which was to provide for a particular type of educational machinery.

Without seeing that Bill through this House, they reorganized the Ministry of Education and the Department of Education. Who is responsible for all this? It is not correct as my hon. Friend the Member for Chavakachcheri did to dismiss all this as the action of a set of administrative officers. Ultimately, it is the Government that must take the responsibility for what has happened. The Ministry of Education has got to take the responsibility for what has happened.

These are the very same schemers who had seen to it that the plums of office in the Ministry of Education did not go to Tamil officers.

I want to lay a specific charge of discrimination which has prevented Tamil officers from getting their legitimate dues. I would cite a few examples.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

The hon. Member has only five minutes more.

වී. නවරත්නම් මයා.
(திரு. வி. நவரத்னம்)
(Mr. V. Navaratnam)

I thought I was given twenty-five minutes.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

The hon. Member has been given twenty minutes. I am sorry I cannot give any more time. As it is the last speaker had less time than what he was allotted.

වී. නවරත්නම් මයා.
(திரு. வி. நவரத்னம்)
(Mr. V. Navaratnam)

In 1946 four officers were recruited and all four of them were Sinhalese. Two of them have risen to Grade II, Director of Education and the other two have risen to the grade of Chief Education Officer.

In 1944 eleven circuit education inspectors were recruited, and all of them have become Grade I or Grade II directors of education except two Tamil officers. After 24 years they are still stagnating in the grade of circuit education inspector.

In 1948 two officers were recruited, one a Tamil and the other Sinhalese. The Sinhalese officer has now become

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

a chief education officer. The Tamil officer still remains a circuit inspector.

In 1945 six officers were recruited. The Sinhalese officers have become chief education officers and so on. The two Tamil officers still stagnate in the grade of educational adviser.

That is how discrimination is practised within the administrative machinery.

About 58 per cent of the schools in the Eastern Province are Tamil schools. What do we have in these schools ? We have only one Tamil director of education in Batticaloa and one Tamil chief education officer in charge in Trincomalee. All the others are Sinhalese officers. There is work for Tamil officers at least on the basis of the percentage of schools. Tamil officers are entitled to be put in charge of that work. Here, again, we find the same type of discrimination practised.

There is another matter to which I must draw the attention of this House, and that is in regard to the selection of students for scholarships.

This year a total of 217 scholars were selected from 28 countries for the award of scholarships in London. These scholarships were offered by the Commonwealth Scholarship Commission in London, and the Government of Ceylon was asked to recommend students for higher technological education. Of the total number of scholarships awarded, Ceylon was fortunate in getting six.

I do not for a moment say that those students should not be granted those scholarships. The six Ceylonese scholars are : N. S. A. Amerasinghe—Manchester University—Agricultural Economics ; P. H. Billimoria—Edinburgh University—Medicine ; J. N. O. Fernando—Imperial College of Science and Technology, London—Physical Chemistry ; L. E. N. Fernando—Hull University—Economics ; S. D. Gunasekera—University College of Swansea—Geography ; and N. E. Wijesundera—Birmingham University—Reactor Physics and Technology.

I would not grudge it if all those scholars had been selected on the basis of merit. It cannot be said that Tamil students have fallen in their standards all of a sudden and so not a single one of them was fit enough to be selected for these scholarships.

That is the type of discrimination we are protesting against.

The other day, when a Bill to change the name of the Colombo University was before the House. I brought to the notice of the Hon. Minister of Education the fact that the students who were selected for a course in bio-science had been written to by the Central Agency for University Admissions, which is a limb of the National Council of Higher Education. These students were written to and told that there were a few vacancies in the Vidyalankara University, where the medium of instruction is 75 per cent Sinhala and 25 per cent English, and that if they were willing to be admitted to the Vidyalankara University they should pass a proficiency test in Sinhala of the standard of the G. C. E. (Ordinary Level) Examination. When I raised this matter the Hon. Minister said that he was ignorant of it, but he was kind enough to say that he would look into it. The universities have started their courses on the 8th of this month and these students are still waiting for admission to the only two universities where they could get higher education in the Tamil medium. We do not know what the fate of these students would be. I have been informed that some 110 students were selected for a two year Science Diploma course in the Sinhala medium, that they would have oridinarily gone into the Vidyalankara University but that they have been put into the Peradeniya and Colombo Universities, and thus the situation of no vacancies was created. So those 45 students of bio-science who had to

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

follow the course in the Tamil medium have been denied that right so far. I do not know what the future is going to be.

Then we have a news item in yesterday's newspapers about the Peradeniya University being closed to Tamil students, that only this year the second year students from Colombo University Tamil Section would be received in the Peradeniya University and that thereafter they would cease to take any second year students or any Tamil students into the Arts School. This year the Peradeniya University has not admitted any Tamil students for the first year course and therefore it follows that eventually the Tamil stream would be dried up, and Vidyalankara University too would be closed to the Tamil Students. I do not know whether that press report is correct or not, but we should like to know from the Minister of Education the actual situation.

It is on these grounds that I am compelled to support this Motion which states :

"...as a consequence the privilege of obtaining a so-called professional higher education in such spheres as science and technology are being restricted to a privileged few,.... "

I entirely agree with this Motion and as a representative of the Tamil people I support it.

We do not know what the position of the Tamil students who have been admitted through the medium of Tamil is as far as the Katubedda institution is concerned. When the Hon. Minister visited the Junior Technical School in Jaffna sometime ago, in 1965 or 1966, there was a unanimous demand to up-grade that school to the standard of a senior technical college to the standard of the Katubedda institution, so that it could cater to the needs of the students who have gone through their education in the Tamil medium. The Hon. Minister gave them that assurance and promised to up-gade that school, but so far it has not been done.

කථානායකතුමා
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

I am sorry that I cannot allow you any further time.

වී. නවරත්නම් මයා.
*(திரு. வீ. நவரத்னம்)*
(Mr. V. Navaratnam)

I am finishing, Sir.

That is why I would ask my former Colleagues of the Federal Party as well as the hon. Members of the Tamil Congress whether they do not agree with the statement : "....as a consequence the privilege of obtaining a so-called professional higher education in such spheres as science and technology are being restricted to a privileged few, and since the present system of grading of schools has constituted a gross injustice both to the teacher as well as the student ;"—I have already explained that—and further, whether they agree that education has been brought to a state of utter chaos in this country today. I do not think that any impartial observer will dispute that statement. As I said before, Sir—

කථානායකතුමා
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

You are going on and I cannot allow it. I cannot stretch the seven and a half hours allotted for this Debate.

වී. නවරත්නම් මයා.
*(திரு. வீ. நவரத்னம்)*
(Mr. V. Navaratnam)

I am concluding.

කථානායකතුමා
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

You have exceeded your time.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමති ගරු අයි. එම්. ආර්. ඒ. ඊරියගොල්ල කෙරෙහි

**වී. නවරත්නම් මයා.**

*(திரு. வீ. நவரத்னம்)*

(Mr. V. Navaratnam)

That is why I said that this Motion is a condemnation of the educational policy of the Government and I treat it as such and support it.

අ. භා. 2.15

**ගරු ඊරියගොල්ල**

*(கௌரவ ஈரியகொல்ல)*

(The Hon. Iriyagolle)

ගරු කථානායකතුමනි, නොයෙකුත් බලාපොරොත්තු ඇතිව අධ්‍යාපන අමාත්‍යවරයාට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ඉදිරිපත් කළත්, ඒ බලාපොරොත්තු සුන් වූ බව විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන්ගේ කථාවල ස්වරූපයෙන් පැහැදිලි වෙනවා. හින්දු විශ්ව විද්‍යාලයක් දෙන්නට පෙඩරල් පක්ෂයට පොරොන්දු වූ නිසා, පෙඩරල් පක්ෂය මේ විශ්වාස භංග යෝජනාවට විරුද්ධව, ආණ්ඩුවට පක්ෂව ඡන්දය දෙනවා යයි කියැවුණු බව කථානායකතුමාට මතක ඇති. එහෙම එකක් නැති බව පෙඩරල් පක්ෂයත්, අපත් දන්නවා. ඒ වැනි කථා කියන අය තරම් පහත් තත්ත්වයකට පෙඩරල් පක්ෂයේ උදවිය වැටී නැතැයි මා හිතනවා. සමහර ප්‍රතිපත්ති සම්බන්ධයෙන් වෙනස්කම් ඇතත්, යම් යම් කාරණා පිළිබඳව හිතන්නට පුළුවන්, අවබෝධයකින් කථා කරන්නට පුළුවන් පිරිසක් පෙඩරල් පක්ෂයේ සිටින බව කියන්නට කැමැතියි.

මේ විශ්වාස භංග යෝජනාවේ මෙසේ සඳහන් වෙනවා :

"නවමත් පාර්ලිමේන්තුවේ දෙවැනි වර විවාදයට පවා ලක් නොවූ සාමාන්‍ය හා කාර්මික අධ්‍යාපන පනතට ඇතුලත් යෝජනා මන්ත්‍රී මණ්ඩලයේ සම්මතය නොලබා අමාත්‍යාංශයේ නියෝග මගින් ක්‍රියාත්මක කරගෙන යන බැවින් ද, දූනටමත් බුද්ධිමත් ගම්බද දරුවන්ට නිදහස් අධ්‍යාපනය යටතේ විවෘතව තිබූ උසස් අධ්‍යාපන පහසුකම් රාශියක් අහිමි කර ඇති බැවින් ද, මේ නිසාම විද්‍යා, කාර්මික ආදී උසස් යයි සම්මත වෘත්තීය අධ්‍යාපනය එක්තරා පිරිසකට සීමා වන බැවින් ද, දූනට වර්ග කර ඇති පාසල් ශ්‍රේණි ක්‍රමය යටතේ ගුරු ශිෂ්‍ය දෙපක්ෂයටම බලවත් අසාධාරණයක් සිදු වී ඇති බැවින් ද, වර්තමාන ඇමතිවරයාගේ කාලයේ දී සම්පූර්ණ අධ්‍යාපන ප්‍රණාලිය අවුල් ජාලයක් බවට පත්ව ඇති බැවින් ද, මෙම මන්ත්‍රී මණ්ඩලය වර්තමාන අධ්‍යාපන ඇමතිවරයා කෙරෙහි විශ්වාසය නොතබයි."

මෙහි කියැවෙන හැම කරුණක්ම පිළිබඳ තත්ත්වය අනෙක් පැත්ත නම්, මේ විශ්වාස භංග යෝජනාවට විරුද්ධව විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් ඡන්දය දේවි යැයි මා හිතනවා. මේ ගැන සාකච්ඡා කරද්දී මීට අවුරුදු 25 ක් ඈත බලන්නට සිදු වෙනවා. එවකට පැවැති අසාධාරණ අධ්‍යාපන තත්ත්වය අවබෝධ කර ගත්, 1943 රාජ්‍ය මන්ත්‍රණ සභා යුගයේදී අධ්‍යාපන අමාත්‍ය ධුරය දැරූ කන්නන්ගර මැතිතුමා, උස් පහත් හා දුප්පත් පොහොසත් භේදයෙන් තොරව මේ රටේ සියලුම ළමයින්ට සමාන අධ්‍යාපනයක් දිය හැකි පිළිවෙළ ගැන කරුණු විමසා බලා වාර්තා කිරීම සඳහා විශේෂ කාරක සභාවක් පත් කළා. ඒ කාරක සභාවේ යෝජනා සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීමට රාජ්‍ය මන්ත්‍රණ සභාවට හෝ මෙතෙක් පැවැති අන් කිසිම රජයකට හෝ පුළුවන්කමක් ලැබුණේ නැහැ. ඒ අනුව, කන්නන්ගර අමාත්‍යතුමා බලාපොරොත්තු වූ සුභසිද්ධිය සම්පූර්ණයෙන් ඉටු නොවීම, මේ අළුත් ක්‍රියා මාර්ගයට ප්‍රධාන හේතුවක්. නිදහස් අධ්‍යාපනය ප්‍රතිපත්තියක් වශයෙන් පිළිගත් නමුත්, මේ යෝජනාවේ සඳහන් පරිදි උසස් අධ්‍යාපනය පිළිබඳ වරප්‍රසාදය සීමාසහිත පිරිසකට හිමි වුණාය කියතොත්, අර මා කලින් කී තත්ත්වය අනුව නම් එය සත්‍යයක්. ද්වීතියික අධ්‍යාපනය කලින් නොලැබුණු සෑහෙන පිරිසකට කන්නන්ගර මැතිතුමාගේ ප්‍රතිසංවිධානය අනුව ද්වීතියික අධ්‍යාපනය ලැබුණත්, එතුමා බලාපොරොත්තු වුණු පරිදි ඒ වරප්‍රසාදය සියලුම අංශවලින් සාධාරණව හැම ළමයකුටම ලැබුණේ නැහැ. එදත් ක්‍රියාත්මක කරන්න බැරි වුණා. අපේ මේ රජය ක්‍රියාත්මක කරන තුරු කිසිම කෙනෙකුට ක්‍රියාත්මක කරන්න බැරි වුණා. ඒ නිසා එදා විද්‍යා, කාර්මික, ආදී අංශවල වරප්‍රසාද හිමි වූයේ නගරබදව සිටි පිරිසකටත්, ගම්බද ඇතැම් මධ්‍යම පාඨශාලාවල අධ්‍යාපනය ලබා ගැනීමේ වරප්‍රසාදය හිමි වුණු ස්වල්ප දෙනකුටත් පමණයි. එය හිතේ තබාගත යුතු කාරණයක්.

තමුන්නාන්සේ දන්නවා ඇති, කථානායකතුමනි, ද්විතීයික අධ්‍යාපනය කලා අංශයෙන් පමණක් නොව, කාර්මික,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ඊරියගොල්ල]

විද්‍යා, කෘෂිකර්ම, ආදී සියලුම අංශවලින් රට මුළුල්ලේ සිටින දක්ෂ වූත් සහජ දක්ෂ කම් දක්වන්නාවූත් සියලුම තරාතිරමේ ළමයින්ට ලබා දීමට කන්නන්ගර අමාත්‍යතුමා බලාපොරොත්තු වුණු බව. මා මෙය පුන පුනා කියන්නේ එය මතක තබාගත යුතු කාරණයක් නිසායි. එහෙත් ඒ බලාපොරොත්තුව ඉටු වුණේ නැහැ. ඒ වර ප්‍රසාදය කලා අංශයෙන් විශාල ළමා පිරිස කට ලැබුණ බව ඇත්ත. නගරබද හෝ ධනවතුන්ගේ හෝ ළමයින්ට ලැබුණ ඒ කලා අංශ ද්විතීයික අධ්‍යාපනය ගම්බද සැහෙන පිරිසකටත් ලැබුණ බව ඇත්ත. සැහෙන පිරිසකටය කියා මා කිව්වේ, එතුමා බලාපොරොත්තු වූ තරම් පිරිසකට නො ලැබුණ නිසයි. සාමාන්‍ය අධ්‍යාපනය සාධාරණව සියලු දෙනාටම එක සේ ලැබිය යුතු යයි එතුමා බලාපොරොත්තු වූ නමුත්, ඒ කලා අධ්‍යාපනයත් ගම්බදව ලැබුණේ සුළු පිරිසකටයි. ඒ සුළු පිරිස නම් 5 වෙනි පංක්තියේ ශිෂ්‍යත්ව විභාගයෙන් සමත් වූ ස්වල්ප පිරිස සහ 8 වෙනි පංක්තියේ ශිෂ්‍යත්ව විභාගයෙන් සමත් වූ ස්වල්ප පිරිසත් පමණයි. ඒ පිරිස සීමා සහිත ගණනක්. විශාල ළමා සංඛ්‍යාවකට, සාමාන්‍ය ගම්බද පාඨශාලාවල 5 වැනි පංක්තියෙන් කෙළවර වී ගෙදර යැමට, හෝ සාමාන්‍ය පාඨශාලාවල 10 වැනි පංක්තියේ ජ්‍යෙෂ්ඨ විභාගයට පෙනී සිට සමත් වී හෝ අසමත් වී හෝ ගෙදර යැමට සිද්ධ වුණා. 10 වෙනි ශ්‍රේණිය දක්වා තිබෙන සාමාන්‍ය ගම්බද පාසල් ගණන මධ්‍යම පාසල් සහ මහා විද්‍යාල ගණන මෙන් හතර ගුණයකටත් වඩා වැඩියි. එවිට කන්නන්ගර අමාත්‍යතුමා බලාපොරොත්තු වුණ ඒ අධ්‍යාපනය කලා අංශයෙන්වත් ලැබුණ පිරිස සීමා සහිත සංඛ්‍යාවක් වූ අතර, ඒ ළඟට පාර්ලිමේන්තු ක්‍රමය අනුව, අධ්‍යාපන අමාත්‍යවරයා වශයෙන් පත් වූ නුගවෙල මහතා කන්නන්ගර අමාත්‍යතුමා බලාපොරොත්තු වුණු පරිදි එවකට තිබුණ හැම පාර්ලිමේන්තු කොට්ඨාශයකම මධ්‍ය මහා විද්‍යාල ඉදි කළා. ඒ අනුව මධ්‍ය මහා විද්‍යාල 56ක් ඉදි කළා. එනිසා කන්නන්ගර අමාත්‍යතුමාගේ කාලයේදී ද්විතීයික අධ්‍යාපනය ලබාගැනීමේ වරප්‍රසාදය ලැබූ ස්වල්ප පිරිස මෙන් කීප ගුණයකට නුගවෙල අමාත්‍යතුමාගේ කාලයේදී ද්විතීයික අධ්‍යාපනය ලබා ගන්නට පුළුවන් වුණා. එයිනුත් වැඩි පිරිසක් වූයේ කලා අංශයෙනුයි.

අධ්‍යාපනය සම්බන්ධයෙන් දැන් මෙතැන කිව්වාක් මෙන්ම, සෑම වේදිකාවකම කියනවා, ගම්බද දුප්පත් ළමයින්ට මව් භාෂාවෙන් මේ විෂයයන් ඉගෙන ගැනීමට ලැබුණේ 1956න් පසුවය කියා. මේ විධියේ—"බොරුවක්" කියන වචනය පාවිච්චි කිරීම හරිද දන්නෙ නැහැ——

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
හරි නැහැ.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
—හරි නැත්නම් මේ තරම් කට පළල් කථාවක් පාර්ලිමේන්තු ඉතිහාසයේ මෙතෙක් ඇති වී නැහැ. මෙය අමුම අමු අසත්‍යයක්. මක්නිසාද ? ස්වභාෂාවෙන් අධ්‍යාපනය ගෙන යා යුතුය කියන ඒ අදහස පටන් ගත්තේ කන්නන්ගර ඇමතිතුමාගේ කාලයේදීයි. එතුමා මුලින් 5 වැනි ප්‍රමාණය දක්වාත්, ඊට ළඟට 8 වැනි ප්‍රමාණය දක්වාත්, ඉන් පසුව 12 වැනි ප්‍රමාණය දක්වාත්, ඊට පසුව විශ්ව විද්‍යාලය දක්වාත් ස්වභාෂාවෙන් අධ්‍යාපනය ගෙන යන වැඩ පිළිවෙළක් ඇති කර තිබුණ අතර එතුමාගේ කාලයේදී එය 5 වැනි ප්‍රමාණය දක්වා ක්‍රියාත්මක වුණා. ඉන් පසු නුගවෙල අමාත්‍යතුමාගේ කාලයේදීත්, බණ්ඩා ඇමතිතුමාගේ කාලයේදීත්, 8 වැනි ප්‍රමාණය දක්වා ස්වභාෂාවෙන් අධ්‍යාපනය සිදු විය යුතුය කියන තීරණය ක්‍රියාත්මක නොවී තිබෙන කාලයේ, එනම් එය ක්‍රියාත්මක වීමට අවුරුදු දෙකක් තිබියදී, මේ පිළිබඳව නිගමනාත්මක තීරණයක් දීම සඳහා විශෙෂ කාරක සභාවක් පත් කරන්නට යෙදුණා. ඒ තීරණය අනුව බණ්ඩා ඇමතිතුමා කැබිනට් මණ්ඩලයේදී යෝජනාවක් සම්මත කරගත්තා. මා මේ කියන්නේ ඓතිහාසික කරුණු; බොරු නොවෙයි. 8 වෙනි පංක්තිය දක්වාත්, 12

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වෙනි ශ්‍රේණිය දක්වාත්, ඊට පසු විශ්ව විද්‍යාලය දක්වාත් ස්වභාෂාවෙන් ඉගැන්වීම 1968 වන විට සිදු විය යුතු යයි යෝජනා කළා. ඒ අනුව පළමුවෙනි ශ්‍රේණියේ සිට 12 වෙනි ශ්‍රේණිය දක්වාත් ඊට පසු විශ්ව විද්‍යාලය දක්වාත් අධ්‍යාපනය ස්වභාෂාවෙන් සිදු විය යුතුය යන නිගමනය පාර්ලිමේන්තු කැබිනට් මණ්ඩලයේදී තීරණය වුණා. එම යෝජනාව කරන ලද්දේ බණ්ඩා ඇමතිතුමා විසිනුයි. ඒ විධියට තමයි දැන් කටයුතු කර ගෙන යන්නෙ. එහි කිසිම වෙනසක් සිදු වී නැහැ.

මේ හැම තිස්සේම 1956 අවුරුද්ද ඇද ගන්නේ මොනවටද කියා මා දන්නේ නැහැ. 1956 දී මාත් තරඟ කළා. ඡන්ද ලබා ගැනීමේ බලාපොරොත්තුවෙන් එදා අපිත් කෑ ගැහුවා, රාජ්‍ය භාෂාව සිංහල භාෂාව විය යුතුය කියා. එය වෙනම දෙයක්. මේ කරුණු දෙක එකට සම්බන්ධ කරන්න බැහැ. සිංහල භාෂාව රාජ්‍ය භාෂාව විය යුතුය කියන ප්‍රශ්නය ගැන වැඩි උද්ඝෝෂණයක් ඇති වුණේ 1956 න් පසුවයි. එය ඇත්ත. නමුත් අධ්‍යාපනය ස්වභාෂාවෙන් සකස් විය යුතුය කියා තීරණය කරන ලද්දේ කන්නන්ගර ඇමතිතුමා, නුගවෙල ඇමතිතුමා, බණ්ඩා ඇමතිතුමා යන අය විසිනුයි. ඒ අනුව තමයි දැන් කටයුතු කර ගෙන යන්නේ. කොහොමවත් එය නවත්වන්න බැහැ.

ගරු කථානායකතුමනි, ඉංජිනේරු අංශයෙත් වෛද්‍ය අංශයෙත් සිංහල භාෂාවෙන් ඉගැන්වීම ගැන මාත් ගරු අගමැතිතුමාත් විශ්ව විද්‍යාල උප කුලපති ඇතුළු තවත් පිරිසකුත් අතර සාකච්ඡාවක් ඇති වුණා. එහිදී ඒ පිරිස කියන්න යෙදුනා, මේ අංශ වලින් අධ්‍යාපනය ලබා දීම සිංහල භාෂාවෙන් කිරීම බොහොම අමාරුයි, ඒ නිසා එය තව ටිකක් කල් දමන්නය කියා. නමුත් අපේ අගමැතිතුමා කිව්වා, එය ඒ විධියට කරන්න බැහැ, 1967 දී එම අංශයත් සිංහල භාෂාවෙන් ඉගැන්වීම කළ යුතුමය කියා.

ගරු කථානායකතුමනි, ඡන්ද ලබා ගැනීමේ බලාපොරොත්තුවෙන් මහජනයා රවටන්න මේ විධියේ කතා විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන් කියනවාද කියා මා දන්නේ නැහැ. නමුත් මා කියන්නේ අනම් මනම් දොඩවන්නේ නැතිව ඇත්ත කතා කරන්න කියායි. අධ්‍යාපනය ස්වභාෂාවෙන් කිරීමේ ප්‍රශ්නය ගැනයි මා ඒ කිව්වේ.

ඊළඟට ගරු කථානායකතුමනි, විරුද්ධ පක්ෂයෙන් කියන්න යෙදුනා, අධ්‍යාපන විශේෂඥයින් මා සමග අමනාපයිලු. ගුරුවරුත්, ඒ වාගේම පත්‍රකාරයිනුත්, විරුද්ධ පක්ෂයත් මා සමග අමනාපයිලු.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
මේ පැත්තෙ ඉන්න අයත් අමනාපයිලු.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
ඔව්, අපේ පැත්තෙ ඉන්න අයත් අමනාපයි කියා කිව්වා. මගේ හිතුවක්කාර වැඩවලට ඒ හැම දෙනාම මා සමග අමනාපයිලු. නමුත් මා කියන්න කැමතියි, අපේ පැත්තේ ඉන්න එකම එක මන්ත්‍රීවරයෙක්වත් මගේ ප්‍රතිපත්තිවලට විරුද්ධ නැති බව. තමුන්නාන්සේලා හිතනවා ඇති එහෙන් මෙහෙන් කුඤ්ඤ ගහගෙන අප කටයුතු කර ගෙන යනවාය කියා. එහෙම තත්ත්වයක් අපේ පැත්තේ නැහැ. නොයෙක් නොයෙක් අවස්ථාවලදී බොහොම උණුසුම් අන්දමට අප අතරේ සාකච්ජාවල් ඇති වෙනවා. නමුත් අන්තිමේදී හැම එක්කෙනාම එකා වගෙයි. ගලේ ගැහුවත් කිසිම දෙයක් කරන්න බැහැ. එක්කෙනා වගෙයි. අපි වෙනස් වන්නේ නැහැ. තමුන්නාන්සේලා වගේ එහාට මෙහාට යන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, අධ්‍යාපන විශේෂඥයින්ගේ මතයට විරුද්ධව, කැබිනට් මණ්ඩලයේ අදහස්වලට විරුද්ධව මට මේ ඇමතිකම කරන්න පුළුවන්කමක් නැහැ. අධ්‍යාපන විශේෂඥයින් කියන්නේ මාක්ස්වාදීන් නොවෙයි. මැද කොළඹ මන්ත්‍රීතුමා හිතනවා නම් අධ්‍යාපන විශේෂඥයින් ඉන්නේ එතුමාගේ පක්ෂයේය කියා, එය වැරදියි. තමුන්නාන්සේලාත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ඊරියගොල්ල]

සමහර විට දන්නවා ඇති රුසියාවේ අධ්‍යාපන විශේෂඥයින්ට විරුද්ධව නඩුවක් තිබෙන බව. චෙකොස්ලොවැකියාවට 6 වරක් රුසියන් භට හමුදා කඩා පැනීම අපරාධයක්ය කියා ඒ ගැන විරුද්ධත්වය පළ කරමින් මහා පඬිවරු දෙදෙනෙක් ලිපිනොච් තුමාගේ ප්‍රධානත්වයෙන් කොඩියක් එසෙව්වා. ඒ වරදට අද නඩුවක් දමා තිබෙනවා ඒ අයට විරුද්ධව.

ගරු කථානායකතුමනි, 1943දී සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර අමාත්‍යතුමා විසින් පත් කරන ලද විශේෂ කාරක සභාවේ නිගමන 1945දී ව්‍යවස්ථාගත කරන ලද නමුත්, එය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කරන්නට බැරි වීමෙන් අධ්‍යාපනය අතින් ඇති වූ අවුල් නිරවුල් කොට ඒ නිගමන අනුව ලංකාවේ හැම දෙස හැම කෙනකුටම සාධාරණව ලැබිය යුතු සමාන අධ්‍යාපනය ලබා දීමේ මාර්ගයක් විනා කොතැනකවත් නීතිය වෙනස් කළ තැනක් මේ ප්‍රතිසංවිධානයේ නැහැ.

උස් පහත් භේදයක් හෝ දුප්පත් පොහොසත් භේදයක් හෝ නොතකා කාටත් සාධාරණ සමාන අධ්‍යාපනය දෙන්නේ කොහොමදැයි මම දැන් විස්තර කර දෙන්නම්. ගම්බද පාඨශාලා බොහොමයක පංක්ති 1 සිට 10 දක්වා තිබුණු බව තමුන්නාන්සේලා පිළිගත යුතුයි. මහා විද්‍යාල තුබුණේ ඉතාමත්ම ස්වල්පයයි. මා එන කොට මහා විද්‍යාල තුබුණේ 1,200 යි. එයින් 200 ක පමණ තුබුණේ නාම පුවරු පමණයි. ගොඩනැගිලිවත් තුබුණේ නැහැ. ගොඩනැගිලි නැත්නම් ගුරුවරුන් ගැන කිව යුතුද? හබරාදුව කොට්ඨාශයේ හැතැප්ම 2 කට මහා විද්‍යාල 9 ක් තරම තුබුණා. මා කියන දේ වැරදි නම් හබරාදුවේ ගරු මන්ත්‍රීතුමා (ප්‍රින්ස් ගුණසේකර මයා.) එය නිවැරදි කරනවා ඇති. මහා මැතිවරණය ළං වත් වත්ම විදුලි පුවත්වලින් මහා විද්‍යාල සඳහා බෝඩ් දැම්මා.

පාඨශාලා ප්‍රතිසංවිධානය පිළිබඳව අප හැම ගරු මන්ත්‍රීවරයකුටම ලියා දන්වා තිබෙනවා. මන්ත්‍රීවරුන් එක් කෙනකු දෙදෙනකු සාකච්ඡාවලට පැමිණ නැහැ. ඒ ගැන අපට කරන්නට දෙයක් නැහැ. දෝලා ගෙන ගොස් වඩම්මවා ගෙන එන්නටයැ? නොපැමිණීයත් අප හැම මන්ත්‍රීවරයකුටම ලියා දන්වා තිබෙනවා. [බාධා කිරීමක්] ගුරු දෙගුරු සමිතිවල සාකච්ඡාවට භාජන කරවීමෙන් පසුව ලැබුණු තීන්දු නැවතත් දෙපාර්තමේන්තුවේ සැලකිල්ලට භාජන කොට ඒවා නැවතත් අමාත්‍යාංශයේ සැලකිල්ලට භාජන කොට බසින ලද නිගමනයක් අනුවයි, අප ක්‍රියා කර තිබෙන්නේ. මේ යෝජනාවලට සමහර මන්ත්‍රීවරුන් විරුද්ධ බව ඇත්තයි. එහෙත් මේ ගැන කවුරුනුත් දන්නවා. මට පසුව කථා කරන නිසා යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) මොනවා කියත්දැයි මා දන්නේ නැහැ. මේ වැඩ පිළිවෙළ හුඟක් හොඳ බව දන්වමින් උන්නැහේත් ලිපියක් නම් එවා තුබුණා. පාඨශාලා 9,000 න් 1,200 ක් අයින් කළ විට තව 7,800 ක් ඉතුරු වෙනවා. එයින් 800 ක් අයින් කළහොත්, ඉතුරු වූ ප්‍රමාණයෙහි වර්ග ගණනාවක් තුබුණා. මේක ගුරුවරුන්ටත්, ළමයින්ටත්, දෙමව්පියන්ටත් කාටත් ලොකු කරදරයක්. ස්ථිර වශයෙන්ම පාඨශාලා ජාති 7ක් තුබුණා. 1 සිට 2 දක්වා, 2 සිට 5 දක්වා, 1 සිට 5 දක්වා, 1 සිට 6 දක්වා, 1 සිට 8 දක්වා, 6 සිට 12 දක්වා ආදී වශයෙන් පාඨශාලා වර්ග 7 ක් තිබුණා. මේ අන්දමට වර්ග ගණනාවක් තුබුණු හෙයින් අධ්‍යාපනය ක්‍රමානුකූලව සකස් කරන්නට හෝ වුවමනා පරිද්දෙන් ගුරු මණ්ඩල පිළියෙල කරන්නට හෝ පඩිනඩි හරියාකාර සකස් කරන්නට හෝ ගිය විට නොයෙකුත් ප්‍රශ්න මතුවන්නට පටන් ගත්තා. ඉතින් පාඨශාලා 9,000 න් 1,200 ක් මහා විද්‍යාල. ඒවායින් දෙතුන් සීයක තුබුණේ බෝඩ් විතරයි. අගමැතිතුමාගේ දැදිගම කොට්ඨාශයේත් බෝඩ් එකක් තුබුණා. පසුගිය රජය පවතිද්දී එතුමා විරුද්ධ පාර්ශ්වයේ නායකයා. ඉතින් ඒ විරුද්ධ ප්‍රාර්ශ්වයේ නායකයාගෙන්වත් අහන්නේ නැතිව එතුමා නියෝජනය කළ කොට්ඨාශයෙහි බෝඩ් දැම්මා. එතුමාට විරුද්ධව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අපේක්ෂකයා වශයෙන් තරඟ කරන්නට බලාපොරොත්තුවෙන් සිටි පද්ගලයාගේ ඉල්ලීම පිටයි, එසේ කළේ අප නම් කවදාවත් ඒ විධියට කර නැහැ විරුද්ධ පාර්ශ්වයේ නායිකාවගේ ආසනයේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එබන්දක් කරනවා නම් එතුමියට දන්වායි කරන්නේ. ඒ ගෞරවය අප තබනවා.

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்ஸா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)
ගුරුවරුන් මාරු කළෙත් ඒ විධියටද?

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
තමුන්නාන්සේලායි එහෙම ගුරු මාරු කළේ, අප නොවෙයි.

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்ஸா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)
පැරදුණු අපේක්ෂකයාගෙන් අහළයි මාරු කරන්නෙ.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
මන්ත්‍රීවරයා නොදන්න මළ ඉළව්වක් ගැන කථා කරන්න එන්න ඕනෑ නැහැ. මේ විධියෙ අධ්‍යාපන විශේෂඥයන් නිසා—වෙනත් කිසිම අංශයක නැති තරම් විශේෂඥයන් අධ්‍යාපන අංශයේ සිටින නිසා—කිසිම දෙයක් හරියාකාරව කරන්න ඉඩ දෙන්නෙ නැහැ. සැම දෙනාම කියන කියන විධියට මට කටයුතු කරන්න බැහැ. අපේ කැබිනට් මණ්ඩලයේ නියම යන්ට අනුව හා ඉතාම විශිෂ්ඨ අධ්‍යාපන විශේෂඥයන්ගෙන් යුක්ත කාරක සභාව මගින් කරන ලද තීරණ—ක්‍රියාත්මක නො කළ තීරණ—ක්‍රියාත්මක කිරීමයි මට ඇති පැවරී ඇති වගකීම. ගරු කථානායක තුමනි, මේ රජය බලයට පැමිණෙන තුරු ලංකාවේ සැම පාඨශාලාවකම ඉගෙන ගන්නා සැම ළමයකුටම අධ්‍යාපනය අතින් සමාන සභනයන් සලසා දුන්නේ නැහැ. ඒ කටයුතු සාධාරණ අන්දමින් ඉටු කළේ නැහැ. මගේ දැනීමේ හැටියට 1 සිට 10 වන ශ්‍රේණිය දක්වා, උගැන්වීම කරන පාඨශාලා හත් දහසක් පමණ තිබුණු අතර, මෙම පාඨශාලාවල ළමයින්ට විශේෂඥ ගුරුවරුන් යටතේ, උපාධිධාරී ගුරුවරුන් යටතේ, ඉගෙනීම ලැබීමේ වාසනාවක් භාග්‍යයක් තිබුණේ නැහැ. 10 වන පංක්තියේදී, ජ්‍යෙෂ්ඨ විභාගය ගැනීමට අවස්ථාව තිබුණා. ජ්‍යෙෂ්ඨය සමත් වුණත්, සාමාන්‍ය ලිපිකරුවකු, ශිෂ්‍ය ගුරුවරයකු, බස් කොන්දොස්තරවරයකු වැනි තිලය කට මිස ඊට වඩා උසස් නිලයකට පත් වීමට ඉතාම දක්ෂ ශිෂ්‍යයන් දහසකින් එක් අයකුටවත් අවස්ථාව සැලසුණේ නැහැ.

ඔන්න ඔකයි තිබුණු තත්ත්වය. තමුන් නාන්සේලා ඇත්ත පිළිගන්න ඕනෑ. එහෙම නම්, තමුන්නාන්සේලා පිළිගන් නවා ඇති, සමාන සාධාරණ අධ්‍යාපනයක් ලැබුණා නම් ලැබුණේ මහා විද්‍යාලවල හා මධ්‍ය මහාවිද්‍යාලවල අධ්‍යාපනය ලැබූ සීමා සහිත පිරිසකට බව. එවැනි තත්ත්වයක් තිබුණා නම් සමාන අධ්‍යාපනයක් ගැන මේ අය කථා කරන්නේ කොහොමද? ගරු කථානායකතුමනි, මේ කාරණය මා හැමදා මත් කියනවා, නැවත නැවතත් කියන්න සිදු වී තිබෙනවා. දැන්වත් මේ උදවියට වැටහී ගියාද? කොටින්ම සමාන අධ්‍යාපන යක් පසුගිය කාල පරිච්ඡේදය තුළ තිබුණේම නැහැ. එපමණක් නොවෙයි, පාඨ ශාලා තුන් සියයක පමණයි විද්‍යාව උගැන් වීම කළේ. ඒ අනුව හත් දහසක පමණ පාඨශාලාවල තිබුණේ ඊටත් වඩා දුර්වල අධ්‍යාපන තත්ත්වයක්. ඒ අතරම මහා විද්‍යාලවල 9—10 යන පංතිවල කර ගෙන ගිය අධ්‍යාපනය නොවෙයි, සාමාන්‍ය පාඨ ශාලාවල 9—10 පමණ පංතිවල කර ගෙන ගියේ. මේ තත්ත්වය එසේ බව තමුන් නාන්සේලා පිළිගන්න ඕනෑ. මහා විද්‍යාල වල ශිෂ්‍යයනට උපාධිධාරී හා විශේෂඥ ගුරුවරුන්ගෙන් අධ්‍යාපනය ලබා ගැනීමට අවකාශ සැලසුණා, 9—10 පංක්තිවලදී. නමුත් සාමාන්‍ය පාඨශාලාවල පුහුණු ගුරුවරුන්ගෙන් පමණයි එම පංක්තිවලදී අධ්‍යාපනය ලැබීමට හැකි වුණේ. එහෙනම්, මගෙන් ගම්බද දුප්පත් ළමයින්ගේ අධ්‍යාපනය කැඩී ගියාය, විනාශ වී ගියාය කියා ඉහ අත බදාගෙන ඇඬිලීමේ තේරුම කුමක්ද? ගරු කථානායකතුමනි, දැන්වත් මෙහි නියම තත්ත්වය ඒ අය තේරුම් ගෙන තිබෙනවාද?

ගරු කථානායකතුමනි, පෙඩරල් පක්ෂය මට විරුද්ධව ඡන්ද දෙන්න පුළුවනි; එවිට ඒ අයගේ බලාපොරොත්තුව හරියාවි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ඊරියගොල්ල]

වැඩේ කර ගන්න පුළුවන් වෙයි කියන අදහසින් මෙම යෝජනාව ඉදිරිපත් කළා මිස, මෙවැනි තත්ත්වයක් නොදැන කළා නොවෙයි. ඇත්ත වශයෙන්ම සිදු වී තිබෙන දෙය කුමක්ද? කන්නන්ගර ඇමතිතුමාගේ ක්‍රමය අනුව පාසල් වර්ග දෙකකට බෙදුවා. ඒ කියන්නෙ හත දෙකට බෙදුවා. වෙනසක් වුණේ නැහැ. 1 සිට 2 දක්වා තිබුණා ; 1 සිට 5 දක්වා තිබුණා ; 1 සිට 8 දක්වා තිබුණා. ඊට පස්සේ 5 සිට 12 දක්වා තිබුණා. ඔය අන්දමට පාඨශාලා හත් වර්ගයක් තිබුණ නමුත් පසුව එය දෙක දක්වා අඩු කරන්න පුළුවන් වුණා. ඒ කියන්නේ 1 සිට 7 දක්වාත්, 8 සිට 12 දක්වාත් යන අන්දමට දෙවර්ගයකට වෙන් කළා. දැන් පවතින ක්‍රමය අනුව හැම ළමයකුටම පහසුකම් සැලසෙනවා. ඒ කාලයේ 10 වන ශ්‍රේණියට ගොස් ජ්‍යෙෂ්ඨ විභාගයට පෙනී සිටි ශිෂ්‍යයන් විශාල සංඛ්‍යාවකට උපාධිධාරී ගුරුවරුන්ගෙන්, විශේෂඥ ගුරුවරුන්ගෙන් අධ්‍යාපනය ලබා ගැනීමට වරප්‍රසාද හිමිවුණේ නැහැ. මේ නිසා මා කලින් විස්තර කළ අන්දමට ලිපිකාරකමක්, ශිෂ්‍ය ගුරුකමක්, කොන්දොස්තරකමක් වැනි වෘත්තියක් ලබාගැනීම හැරෙන්න වෙනත් උසස් රක්ෂාවක් ලබාගැනීමට මාර්ගයක් ලැබුණේ නැහැ. දැන් ඒ තත්ත්වය සම්පූර්ණයෙන්ම වෙනස් කර තිබෙනවා. 1 සිට 7 දක්වා ශ්‍රේණිවල උගෙන ගන්නා ළමයින් සියළු දෙනාටම, හත්වන ශ්‍රේණිය සමත් වීමෙන් පසුව මහා විද්‍යාලයකට යාමට අවකාශ සැලසෙනවා.

ශිෂ්‍යත්ව ගැනත් එක්තරා කථාවක් කීවා. තමුන්නාන්සේ දන්නවා ඇති ගරු කථානායකතුමනි, ප්‍රාථමික අංශයේ ශිෂ්‍යත්ව ලැබූවන් මහා විද්‍යාලවලට ඇතුළත් වුණේ හය වැනි ශ්‍රේණියට බව. දැන් මහා විද්‍යාලවල 6 වැනි ශ්‍රේණියක් ඇත්තේ නැහැ. දැන් 6 වැනි ශ්‍රේණිය තිබෙන්නේ කණිෂ්ඨ විද්‍යාලවලයි. කණිෂ්ඨ විද්‍යාලයේ අවසාන පන්තියේ ප්‍රතිඵල අනුව, ශිෂ්‍යත්ව ගණනත් වැඩි කර ඒ ශිෂ්‍යත්ව දිනූවන් මහා විද්‍යාලවලට ඇතුළු කරන්නට වැඩ පිළිවෙළ සකස් කර අවසානයි. කලින් තිබුණු ක්‍රමය අනුව නම්, ප්‍රාථමික අංශයේ අවසාන පන්තිය වූ 5 වැනි පන්තියේදී ශිෂ්‍යත්ව දිනා ගත් ළමුන්, මහා විද්‍යාලයේ 6 වැනි පන්තියට ඇතුළු වුණා. දැන් තිබෙන කණිෂ්ඨ විද්‍යාලවල අවසාන පන්තිය 7 වැන්නයි. එහිදී ශිෂ්‍යත්ව දිනා ගන්නා ළමුන් මහා විද්‍යාලයේ 8 වැනි පන්තියට නැත්නම් 8 වැනි ශ්‍රේණියට ඇතුළු වෙනවා.

කලින් ගම්බද ළමුන්ට ලැබුණු වරප්‍රසාද දැන් ලැබෙන්නේ නැතිලු. කලින් තිබුණු අධ්‍යාපන ක්‍රමය අනුව පාසල් 7,000 ක ඉගෙන ගත් අයට ලැබුණු වරප්‍රසාද අනුව, ඒ ඉගෙනීමෙන් පසු බස් කොන්දොස්තර, ශිෂ්‍ය ගුරු හා ලිපිකරු වැනි වෘත්තියකට වඩා ඉහළ වෘත්තියක යෙදෙන්නට පුළුවන්කමක් ලැබුණේ නැහැ. ඒ පාඨශාලා හත් දාහේ ඉගෙන ගත් ලක්ෂ සංඛ්‍යාත ළමුන් අතුරෙන් සහජ දක්ෂතාවන්ගෙන් හෙබි විශිෂ්ඨ ශිෂ්‍යයකුට දෙන්නකුට පමණක්, සමහර විට කලාතුරෙකින් ඉහළ තත්ත්වයකට යන්නට පුළුවන්කම ලැබෙන්නට ඇති. එහෙත් මා කලින් සඳහන් කළ තත්ත්වයයි, සාමාන්‍යයෙන් ඒ පාසල්වල උගත් ළමුන්ට හිමි වුණේ.

එහෙත් අද තත්ත්වය මොකක්ද? ලංකාවේ හැම කණිෂ්ඨ විද්‍යාලයකම තත්වය එක හා සමානයි. කණිෂ්ඨ විද්‍යාලයේ 7 වැනි ශ්‍රේණියෙන් සමත් වන සියලුම ළමුන්ට, මහා විද්‍යාලයේ 8 වැනි ශ්‍රේණියට ඇතුළු වන්නට පුළුවනි. ඒ සියලුම ළමුන්ට, විශේෂඥ හා උපාධිධර ගුරුවරුන්ගෙන් ඉගෙන ගැනීමේ භාග්‍යය ලැබෙනවා. වලපනේ ගරු මන්ත්‍රීතුමා (පී. බී. එම්. හේරත් මයා.) කීවා, වලපනේ නිල්දණ්ඩාහින්න ප්‍රදේශයේ ළමුන්ට සැතැපුම් පහ හය ඈත තිබෙන පාසල්වලට යන්නට සිදු වී තිබෙනවාය කියා. එවැනි අමාරුකම් තිබෙන, වලපනේ හා යාපහුව වැනි ඡන්ද දායක කොට්ඨාශ දෙක තුනක් තිබෙන බව ඇත්තයි. යාපහුවේ සැතැපුම් දහය පහළොව යන්නට තිබෙනවා, ළඟම පිහිටි පාසලට. පොළොන්නරුව හා මහියංගනය වැනි ප්‍රදේශවලත් එවැනි පාඨශාලා කීපයක් තිබෙනවා. ඒ අපහසුකම් කලිනුත් තිබුණා. ඒ අපහසුකම් නැති කිරීම සඳහා දැන් අප කටයුතු කරගෙන යනවා. එවැනි දුෂ්කරතාවලට ලක් නොවී මහා විද්‍යාලවලට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යන්නට සිසුන්ට පහසුකම් සැලැස් වීම පිළිබඳව දැන් පරීක්ෂණ පවත්වා ගෙන යනවා. බස් ගමනාගමනය අතින් පහසුකම් සැලැසී තිබෙන ප්‍රදේශවල නම් සැතැපුම් දෙක තුනක් බසයෙන් යන්නට සිදු වීම ඒ තරම් අපහසු කාරණයක් නොවෙයි. එහෙත් 8 වැනි ශ්‍රේණියේ ඉගෙන ගන්නේ පුංචි ළමයින් නොවන බවත්, වයස අවුරුදු 12 ක තරමේ ළමයින් බවත් අප මතක තබා ගන්නට ඕනෑ. මා කලින් සඳහන් කළ ප්‍රදේශ කීපයේ හැරෙන්නට මුළු ලංකාවේ ඉන්නා සියලුම ළමුන්ට මහා විද්‍යාලවල අධ්‍යාපනය ලැබීමේ සාධාරණ සහනය දැන් සලසා තිබෙනවා. එම නිසා, පසුගිය රජය කාලයේ පාසල් 7,000 ක පමණ උගත්, කොයි තරම් සහජ දක්ෂතාවන් තිබුණත් උසස් අධ්‍යාපනයක් ලැබීමේ භාග්‍යය අහිමි වී අවාසනාවන්ත අඩියක සිටි සියලුම ළමුන්ට දැන් මේ සාධාරණය ඉෂ්ට වී තිබෙනවා.

එපමණක් නොවෙයි. දැන් වලපනේ ඉගැන්වෙන්නේත්, කොළඹ ඉගැන්වෙන්නෙත් එකම පාඩම් මාලාවයි. ඒ අනුව ළමුන් ඉගෙනගෙන එන විට ඔය මන්ත්‍රීවරුන්ට නම් අමාරුකම් ඇති වේවි. පාඩම් මාලා පමණක් නොව අනෙකුත් හැම දෙයක්මත් අමුත්තක් නැතිව ලංකාවේ හැම ප්‍රදේශයකම සමානව කෙරෙනවා. අධ්‍යාපන කාර්යාලයට විශේෂඥ ගුරුවරුන් ගෙන්වාගෙන අප දැන් පාඩම් මාලා සකස් කරනවා. අධ්‍යාපන කාර්යාලයෙන් හැම පාඨශාලාවකටම දන්වා යවනවා, මෙන්න මේ පිළිවෙළට උගන්වන්නය කියා. එය නරකද? වලපනේ ගරු මන්ත්‍රීතුමා කියනවා, එයත් නරකයි කියා. එහෙම නැතිව වෙන කොයි ක්‍රමයකටද, ලංකාවේ සියලුම ළමුන්ට සමාන අධ්‍යාපනයක් දෙන්නේ? කඹුරුපිටියේ ගරු මන්ත්‍රීතුමාත් (පර්සි වික්‍රමසිංහ මයා.) මා දැන් කියන දෙය ස්ථිර කරයි. 1965 තමුන්නාන්සේලාගේ ආණ්ඩුව තිබුණු කාලයේ, විශේෂඥ ගුරුවරුන්ගෙන් අධ්‍යාපනය ලැබීමේ පූළුවන්කම ලැබුණේ කොළඹ, ගාල්ල, මහනුවර, යාපනේ හා කලුතර වැනි ප්‍රදේශවල ළමුන්ට පමණයි. ගම්බද පාඨශාලාවලට කව්රුවත් නැහැ. සමහර විට කර්මාන්ත ඉගැන්වීමට කව්රුවත් නැහැ. ඒ නිසා විශාල නගරවල වැඩිපුර සිටි අය තෝරා අප ගම්බදට යැව්වා. කොළඹින් 300 ක් ඇරියා. යාපනයෙන් 350 ක් ඇරියා. මීට කලින් 6 වැනි පන්තියටත් ඉගැන්නුවේ උපාධිධාරීන්ය කියා එක මන්ත්‍රීවරයෙක් කිව්වා. දැන් එහෙම කරන්නට බැහැ. 8 වැනි පන්තියේ සිට පමණයි, උපාධිධාරීන්ට උගන්වන්නට පුළුවන්. අප එය කලින් දැනගෙන සිටියේ නැහැ. මේ අන්දමට අප ගුරුවරුන් සමසමව බෙදා හැරියා. ඒ බෙදා හැරීමට විරුද්ධව ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් පවා මා හමු වන්නට ආවා. මේක නම් කොහොමවත් නවත්වන්නට බැරිය කියා මා කීවා. මුලින් ඒ මන්ත්‍රීවරුන් විරුද්ධ වුණා. දැන් නම් බොහොම පක්ෂයි. ප්‍රතිඵල හොඳ බව දැන් පැහැදිලියි. පසුගිය දිනවල පත්‍රයේ පළ වූ ප්‍රතිඵල දැක්කොත් ප්‍රතිඵල හොඳ බව තමුන්නාන්සේලාට පැහැදිලි වෙයි. කවදාවත් විශ්ව විද්‍යාලයකට ළමයකු යැව්වේ නැති හද්ද පිටිසර ස්කෝලවලින් 9, 10, 11 එවා තිබෙනවා. 1965 කෙළවරදී කළ ව්‍යාපාරයේ ප්‍රතිඵලයි, මේ. අවුරුදු 2 ක් ගියා, ප්‍රතිඵල ලැබෙන්නට. මීට පෙර ඉංජිනේරු අංශයට ශිෂ්‍යයන් තේරුණේ කොළඹින්, යාපනයෙන්, ගාල්ලෙන්, මහනුවරින් පමණයි. මේ වතාවේ ඒ අංශයට ආ ශිෂ්‍යයන්ගෙන් තුනෙන් එක කොටසකටත් වඩා ඇවිත් තිබෙන්නේ පිටිසර ස්කෝලවලින්. මාහෝවලිනුත් ආවා. කාටත් සාධාරණ, සමාන අධ්‍යාපනයක් දීම ගැනයි, මට පෙනෙන පිළිවෙළට විරුද්ධ වන්නේ. ඒ ගැන විරුද්ධ වුණාට මට කමක් නැහැ. කොයි ළමයින්ටත් හරියට උගන්වන්නට ඕනෑ.

කාර්මික අධ්‍යාපනයත්, ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනයත් මීට පෙර වෙන වෙනමයි, තිබුණේ. ඒ කොටස් තුනම එකට එකතු කිරීමේදී, ඒ ඒ අංශවල නිලතල සඳහා අයවැය ලේඛනයෙන් මුදල් වෙන් කළා. පාර්ලිමේන්තුවට ඇවිල්ලයි, ඒක කෙළේ. පෙඩරල් පක්ෂය ඔය තරම් ඉක්මනට එහාට යයි කියා ඒ අය හිතුවෙ නැහැ. එහෙම හිතුවා නම් ඒ අවස්ථාවේදියි ඔය ගැන කථා කරන්නෙ. ඔය කොටස් තුන එකට එකතු කර කාර්මික අංශය සඳහා නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්වරයකුත්, ප්‍රාථමික අධ්‍යාපනය සඳහා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ඊරියගොල්ල]

නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්වරය කුත්, ද්විතීයික අංශය සඳහා නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂවරයකුත්, අංශ 3ටම ප්‍රධානයා වශයෙන් අධ්‍යාපන අධ්‍යක්ෂ ජන රාල්වරයකුත් පත් කළා. කලින් අධ්‍යාපන අධ්‍යක්ෂට ලැබුණු පඩිය දැන් නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්වරයකුට ලැබෙනවා. ඒ තුන් දෙනා භාරව තිබෙන කොටස් තුන අතර දැන් සම්බන්ධකමක් ඇති කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, මීට කලින් පිටි සර ස්කෝලවලට විද්‍යාගාර ලැබුණේ නැහැ. ඒ ස්කෝලවලට ලැබුණේ කුඩම්මා ගේ සැලකිල්ලයි. විද්‍යාගාර සියල්ලක්ම ලැබුණේ කොළඹ, ගාල්ල, යාපනය, මහ නුවර වැනි නගරවලටයි. මේ වර විද්‍යාගාර 90න් 60 ක්ම පිටිසරට දී තිබෙනවා. කෘෂි කර්මාගාර පිටිසරටම නේ දෙන්නට ඕනෑ? මේ අවුරුදු 2 ඇතුළත කෘෂිකර්මා ගාර 25 ක් ඇති කර තිබෙනවා. වාණිජ අංශයේ කර්මාන්තාගාර කිසිම පිළිවෙළ කට තිබුණේ නැහැ. ගුරුවරයාගේ පදිංචි වීමේ පහසුව සලකා කොළඹ වැනි නගර වලම තිබුණා මිස සෑම තැනම විසිරී යන පිළිවෙළට, ක්‍රමානුකූලව ඒවා ඇති කර තිබුණේ නැහැ. ලංකාවේ ළමයින් තමුන් නාන්සේලාගේ ළමයින් වගේම අපේත් ළමයින්. මන්ත්‍රීවරයා නරක් වුණාට ළම යින් මොනවා කරන්නටද? එමනිසා මන්ත්‍රීවරයාගේ හොඳ නරක ගැන නො බලා ළමයින්ගේ යහපත සලකා එක්තරා ක්‍රමයකට අනුකූලව ලැබෙන විද්‍යාගාර අනු වත්, දනට සිටින ගුරුවරුන්ගේ සංඛ්‍යාව අනුවත් කල්පනා කර මුළු ලංකාවටම පොදු වැඩ පිළිවෙළක් දැන් අප සකස් කර තිබෙනවා. සමසේ, කාටත් සාධාරණ පරිද්දෙන් ඒ අංශ බෙදා හැරීමේ වැඩ පිළි වෙළක් සකස් කර තිබෙනවා. තමුන්නාන් සේලාගේ කාලයේ නොතිබුණු වැඩ පිළි වෙළක් අප දැන් අනුගමනය කරන්නෙ.

විද්‍යා ගුරුවරුන්ගේ හිඟය ගැන දැන් කී වරක් සඳහන් කර තිබෙනවාද කියා මා දන්නේ නැහැ. විද්‍යා ගුරුවරුන් පුහුණු කරගෙන යනවාය කියා කයිවිස්ති ගරු මන්ත්‍රීතුමා (වී. නවරත්නම් මයා.) දැන් කිව්වා. විරුද්ධ පක්ෂයේ—

**පී. බී. ජී. කළුගල්ල මයා.** (කෑගල්ල)
*(திரு. பீ. பி. ஜி. கலுகல்ல—கேகாலை)*
(Mr. P. B. G. Kalugalla—Kegalla)
1960 පටන් ගත්තාය යන්නයි කිව්වෙ.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
තමුන්නාන්සේ බොහොම දේවල් පටන් ගත්තා. නමුත් කෙරුණේ නැහැ.

**කළුගල්ල මයා.**
*(திரு. கலுகல்ல)*
(Mr. Kalugalla)
මම කියන්නම්.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
වේදිකාවල කියන ඒව මෙහිදී කිව්වාට කවුරුවත් පිළිගන්නේ නැහැ. තමුන් නාන්සේ පටන් ගන්නට ඇති. නමුත් කෙරී නැහැ.

**කළුගල්ල මයා.**
*(திரு. கலுகல்ல)*
(Mr. Kalugalla)
කෙරී තිබෙන හැටි මා පෙන්වන්නම් සංඛ්‍යා ලේඛන අනුව. නිලධාරීන් යවා බලන්න. මා ළඟ තිබෙනවා ඒ සංඛ්‍යා ලේඛන සියල්ලම.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
වැඩිය පෙන්වන්නට එපා. මගේ කථා වෙන් පසු බොරු පමණක් කියන්නට එපා. ඇත්ත කියන්න. මොකද, මේ විවාද යේදී මට නැවතත් පිළිතුරු දෙන්නට අවස්ථාවක් නොලැබෙන නිසයි. අසත්‍ය දේවල් කිව්වොත් මට තවත් දවසක ඒවා ට පිළිතුරු දෙන්නට සිද්ධ වෙනවා. එම නිසා සංඛ්‍යා ලේඛන අනුවම කථා කරනවා මිස වැඩිපුර කථා කරන්නට යන්නට එපා.

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்ஸா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)
ඇත්ත කියන්නෙ කවුද යන්න මහ ජනතාව තෝරා ගනීවි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

අදත් විද්‍යා ගුරුවරුන්ගේ පුරප්පාඩු 172 ක් තිබෙනවා. තිබෙන විද්‍යාගාරවල වත් ගුරුවරුන් නැහැ. පසුගිය ආණ්ඩුවෙන් විද්‍යා ගුරු හිඟය පිළිබඳව කර තිබුණේ කුමක්ද? විද්‍යා ගුරු හිඟය පිළිබඳව ඒ ආණ්ඩුවෙන් කිසිම දෙයක් කර තිබුණේ නැහැ; ඒ පුරප්පාඩු පිරවීම සඳහා ගුරුවරුන් පුහුණු කිරීමේ වැඩ පිළිවෙලක් ආරම්භ කර තිබුණේ නැහැ.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

ඇයි ඉංග්‍රීසි ගුරුවරුන්ගේ හිඟය?

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

ඉංග්‍රීසි ගුරුවරුන් 2,400 ක් අඩුයි.

තිකවැරටියේ නානායක්කාරදීත් සමහර ගුරුවරුන් පත් කර තිබෙනවා. ඒකෙ වරදක් නැහැ. රාජකාරිය කොතැනක දී කළත් කමක් නැහැ. රාජකාරිය වුවමනා තැනදී කළාට කමක් නැහැ. පත්වීම් ලැබිය යුතු අය තෝරා ගන්නට ඇති. නමුත් ඒ පුරප්පාඩු පුරවා තිබුණේ නැහැ. අදත් විද්‍යා ගුරුවරුන් 172 ක් අඩුයි. ඒ අඩුව පිරිමසා ගන්නට අප මොකක්ද කළේ? අප විශ්ව විද්‍යාල ප්‍රවේශ විභාගයෙන් විද්‍යා විෂයයන් දෙකකින් දක්ෂ ලෙස සමර්ථවූ, විශ්ව විද්‍යාලයට ඇතුළත් වන්නට නොහැකි වූ උදවිය අරගෙන දැන් පුහුණු කරවා ගෙන යනවා. විශ්ව විද්‍යාලයට ඇතුළත් වන්නට නම් අඩු වශයෙන් විෂයයන් තුනකින් සමර්ථ වෙන්නට ඕනෑ. විෂයයන් දෙකකින් සමර්ථ වූවන්ට විශ්ව විද්‍යාලයට ඇතුළත් වන්නට බැහැ. ඔය රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, සත්ව විද්‍යාව ආදී විද්‍යා විෂයයන් දෙකකින් දක්ෂ ලෙස සමර්ථ වූවන් 110 දෙනෙකු අරගෙන විද්‍යා ගුරුවරුන් වශයෙන් දැන් පුහුණු කරවා ගෙන යනවා. අපේ මේ වැඩ පිළිවෙළ අනුව 1970 වන විට ලංකාවේ විද්‍යා ගුරුවරුන්ගේ හිඟය සම්පූර්ණයෙන් නැති වෙනවා. සෑම විද්‍යාගාරයකටම ගුරුවරුන් පත් වෙනවා.

ගමේ ගොඩේ පිටිසර අයට අසාධාරණයක් වී තිබෙනවා කිව්වා. ඒ අයට අසාධාරණයක් වී තිබෙනවා තමයි. එහෙත් එය කොයි කාලයේ සිදුවූ අසාධාරණයක්ද? සාමාන්‍යයෙන් අධ්‍යාපනය පිළිබඳ තොරතුරු දන්නේ නැත කියා සිතාගෙනදෝ දැන් විරුද්ධ පක්ෂයේ සමහර මන්ත්‍රීවරුන් පිටිසර ප්‍රදේශවල දේශපාලන වේදිකාවලට ගිහින් තවත් දෙයක් කියනවා. ගමේ සිංහල මිනිසාට තිබෙන තැන නැති කරන්නට අප දැන් ඉංග්‍රීසි ඉගැන්වීමේ වැඩ පිළිවෙළක් ආරම්භ කර තිබෙනවාය කියා ප්‍රචාරයක් ගෙන යනවා. මන්ත්‍රීවරුන් වශයෙන් මෙහෙම කථා කරන්නට ගියොත් කොතැනින්ද මේක කෙළවර වන්නෙ? ඒකයි මා අසන ප්‍රශ්නය. සිංහල භාෂාවට තිබෙන තැන නැති කරන්නට අප දැන් ඉංග්‍රීසි උගන්වනවාලු. සිංහල භාෂාවට මමත් කැමතියි. සිංහල භාෂාව තරම් හොඳ භාෂාවක් මුලු ලෝකයේම නැත කියා මා කල්පනා කරනවා. සිංහල භාෂාව දියුණු කරන්නට මා උත්සාහ කරනවා. නමුන්නාන්සේලාගේ කැඩිච්ච සිංහල භාෂාව නොවෙයි. හොඳ, වැදගත්, ශාස්ත්‍රීය භාෂාවක් වශයෙන් සිංහල භාෂාව දියුණු කරන්නට අප සම්පූර්ණ විධිවිධාන යොදා අවසානයි. අප පත් කළ සම්මත භාෂා කාරක සභාවේ නිගමනයන් දැන් මුද්‍රණයට යවා තිබෙනවා, මුළු ලංකාවේ හැම පාඨශාලාවකම එකම ක්‍රමයේ භාෂාවක් ඇති කරන්න. දැන් භාෂා 10 ක් විතර තිබෙනවා. ගුරු කුල කීපයක් තිබෙනවා. එක ගුරු කුලයක් කියනවා, මෙතැනට "ඇ" යන්න ඕනෑ කියා. අනික් ගුරු කුලය ඇයි මේ "ඇ" යන්නක් දැම්මේ කියා ඒක කපනවා. නැවතත් අනික් ගුරු කුලය ආවාම ඒක දමනවා. ඔය අන්දමට මහා විකාරයක් තිබුණා. ඒ නිසා ළමයින්ට පහසුවෙන් කොයි ඉස්කෝලෙත් එක විධියට ඉගෙන ගන්නට පුළුවන් වන අන්දමට ඒ කාරක සභාවේ නිගමනයන් දැන් වාර්තාවක් වශයෙන් මුද්‍රණය කරගෙන යනවා. මීට පසු ලංකාවේ හැම පාසලේම ඉගෙන ගන්නට ඕනෑ, ඒ විධියටයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ඊරියගොල්ල]

ඉංග්‍රීසි: ගරු කථානායකතුමනි, අද ලෝකයේ දියුණුවන රටවල් හෝ දියුණු වෙන්නට බලාපොරොත්තු වන රටවල් හෝ ජාත්‍යන්තර භාෂාවක් දෙකක්, පුළුවන් නම් තුනක් ඉගෙන ගන්නට කමක් නැහැ. ඒ බව තමුන්නාන්සේලා පිළිගත යුතුයි. මෙතැනදී පිළිගන්නවා නම් වෙන තැන්වලදී වෙනත් දේවල් කියන්නට එපා. අපි දන්නවා රුසියාවේ—මම රුසියාවට ගිහින් නැහැ. මම අහල තිබෙනවා.—ප්‍රංශ, ජර්මන් සහ ඉංග්‍රීසි භාෂා උගන්වන බව. පාසල් වැඩි ගණනක් තිබෙන්නේ ඉංග්‍රීසි උගන්වන ඒවායි. බටහිර ජර්මනියේ ප්‍රංශ, ඉංග්‍රීසි සහ රුසියන් භාෂා උගන්වනවා මා දැක්කා. ස්විට්සර්ලන්තයේ භාෂා 3ක් අනිවාර්යයි. ඇමෙරිකාවේ රුසියන්, ප්‍රංශ හා ජර්මන් භාෂා උගන්වනවා. චීනයේ ඉංග්‍රීසි උගන්වමින් තිබී අවුරුද්දක් අත්හැර දමල දැන් නැවතත් ඉංග්‍රීසි උගන්වනවා. ජාත්‍යන්තර භාෂා කොයි එක ඉගැන්නුවත් කමක් නැහැ. ජාත්‍යන්තර භාෂා දෙකක් ඉගැන්නුවත් කමක් නැහැ. පුළුවන් නම් තුනක් ඉගැන්නුවත් කමක් නැහැ. එහෙත් එකක් නම් ඕනෑමයි. එසේ එකක් උගන්වන කොට තමන්ට සම්බන්ධකම් තිබෙන භාෂාව තෝරා ගන්නට ඕනෑ. හොඳට හෝ නරකට ඉංග්‍රීසි පිළිබඳව සම්බන්ධයක් ලංකාවේ තිබෙනවා. විජිත පාලන කාලයේදී ඉංග්‍රීසින් මෙහි ඇවිත් සිටි නිසා ඉංග්‍රීසි භාෂාවට අපේ සම්බන්ධයක් තිබෙනවා. අපි පිටිසර මිනිසුන් වුණත් ඉංග්‍රීසි වචන දෙක-තුනක් දන්නවා. ඒ නිසා විශේෂයෙන් අපට ඉංග්‍රීසි ඉගෙන ගන්නට ලෙහෙසියි. ඉංග්‍රීසි භාෂාව අපි උගන්වන්නේ සිංහල භාෂාව නැති කරන්නටවත්, පිටිසර මිනිහාට තැනක් නැති කරන්නටවත් නොවෙයි. පිටිසර මිනිහාටත් තැනක් ඇති කරන්නටයි. ජාත්‍යන්තර භාෂාවක් වන ඉංග්‍රීසි ඉගෙනගෙන ඒගොල්ලන්ටත් විද්‍යා, කාර්මික ආදී අංශවල උසස් අධ්‍යාපනයක් ලබා දීම සඳහායි ඒ පියවර ගන්නේ. සිංහලයන් හොඳට උගන්වනවා. පුළුවන් තරම් පොත් සිංහලයට පරිවර්තනය කරවනවා. එහෙත් පාඨ ග්‍රන්ථ කිහිපයක් පරිවර්තනය කළාට සතියෙන් සතිය, විටින් විට නිපදවන යම් යම් දේවල් පිළිබඳව ඒ ඒ අවස්ථාවට වුවමනා පරිදි පොතක් පිට කිරීමේ ශක්තියක් මේ වගේ කුඩා රටකට ඇති වෙන්නේ නැහැ. ඒ නිසා පරිවර්තන හෝ නිෂ්පාදන හෝ වශයෙන් පාඨ ග්‍රන්ථ පුළුවන් තරමක් අපේ භාෂාවෙන් ඇති කරන අතර ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමෙන් ශිෂ්‍යයන්ට වුවමනා පොත් පත් බැලීමටත් අවකාශ ලැබෙනවා ඇති.

පුස්තකාල දියුණු කළ යුතුය, පුස්තකාල විශාල කළ යුතුය ආදි වශයෙන් තමුන්නාන්සේලා හැම වෙලාවෙම කියනවා. විශාල කළා. විශාල පුස්තකාල තමයි තිබෙන්නේ. එහෙත් කවුද කියවන්නෙ? කාටද, මේ පොත්පත් බලන්නට පුළුවන්? ඒ නිසා ඉංග්‍රීසි වුවමනායි. මේ පොත් පත් හුඟක් තිබෙන්නේ ඉංග්‍රීසියෙන්. සිංහලෙන් සියයට 5ක් වත් නැහැ. ඉංග්‍රීසි භාෂාව ඉගෙනීමේ වරප්‍රසාදය තමුන්නාන්සේලා නගර බද පාඨශාලාවලට ලබා දී තිබුණා. ගම්බද පාඨශාලාවලට ලබා දී තිබුණේ නැහැ. හිටපු ගුරුවරන්ටත් උගන්වන්න බැහැ. ඒ නිසා අපට වුවමනා කළා, අඩු ගණනේ ඉංග්‍රීසි භාෂාවට සම්මාන ඇතුව ජ්‍යෙෂ්ඨ විභාගයෙන් සමත් වුණු ළමයින් 2,400 ක්. ඉල්ලුම්කරුවෝ හිටියේ අටසිය ගණනයි. යාපනේ දිස්ත්‍රික්කයට වුවමනා පිරිස සම්පූර්ණයෙන් හිටියා. අපට හිටියේ හාර සිය ගණනයි. ඒ නිසා අපි දැන් විශ්‍රාම ගත් ඉංග්‍රීසි ගුරුවරුන්, ඉංග්‍රීසි භාෂාවට සම්මාන හෝ විශිෂ්ඨ සම්මාන සහිතව ජ්‍යෙෂ්ඨය විභාගයෙන් විෂයයන් 5 ක් සමත් වූ අයත් ඉංග්‍රීසි ඉගැන්වීමට යොදවන්න අදහස් කරනවා. අපි කලින් බඳවා ගත්තේ ඉංග්‍රීසි විෂයයට සම්මාන හෝ විශිෂ්ඨ සම්මාන ඇතුව ජ්‍යෙෂ්ඨ විභාගයෙන් විෂයයන් 6 ක් සමත් වූ උදවියයි. ඉංග්‍රීසි විෂයයෙන් සම්මාන සාමාර්ථය හෝ විශිෂ්ඨ සාමර්ථය හෝ ලැබ විෂයයන් පහකින් වත් සමත් වී සිටින අයගෙන් මේ ඇබෑර්තු ටික පිරවීම සඳහා අප දැන් බන්දවා ගන්නට යනවා. බොහොම ඉක්මණින් ඉංග්‍රීසි උගන්වන්නට පුළුවන්කම තිබෙන විශෙෂඥයන් අප ගෙන්වාගෙන සිටිනවා. එම විශෙෂඥයන් ලවා ඉංග්‍රීසි ඉක්මනට උගන්වන ක්‍රම පුරුදු පුහුණු කිරීමට සංස්කරණ සම්මේලන පවත්වා ඒ අය පාඨශාලාවලට පිටත් කර යවන්නට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අප බලාපොරොත්තු වෙනවා. මා පැහැදිලි කරන්නට ආවේ ඒකයි. සමාන අධ්‍යාපනයක් සෑම ස්කෝලයකටම සාධාරණ අන්දමින් ලැබෙන පිළිවෙළටයි අපි දැන් කට යුතු සකස් කර ගෙන යන්නේ. එසේ නැතුව කොටසකට අඩුවටත් කොටසකට වැඩියටත් පහසුව සැළසෙන හැටියට නොවෙයි.

අපේ අධ්‍යාපන ක්‍රමයෙන් ජනතාව දියුණු වෙනවාට වඩා අධ්‍යාපන ක්‍රමයේ දියුණුවක් ඇති වෙනවා. 1962දී උසස් පෙළ විභාගය ගෙන තිබෙන්නේ 10,205 දෙනයි. 1963 දී 15,000යි. 1967 දී 35,000යි. එය කොතරම් නැගීමක්ද? විශ්ව විද්‍යාලවලට ඇතුළත් වීම පිළිබඳ විභාගවල තත්ත්වයත් එහෙමයි. මා සිතනවා මෙම කාරණය දැන් තමුන්නාන්සේලාට පැහැදිලි වී තිබෙනවාය කියා. අප කළේ අළුත් පනතක් ක්‍රියාත්මක කිරීමක් නොවෙයි. අපි එහෙම දෙයක් කළේ නැහැ. අපට අළුත් පනතක් ක්‍රියාත්මක කිරීමට වුව මනා නම් අප එය මෙම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා. ඒකාධිපති ආණ්ඩු ක්‍රමයක් අපේ නැහැ. මා කළේ පාර්ලිමේන්තුව විසින් පිළිගත් යට ගොස් තිබුණු අධ්‍යාපන ක්‍රමයක් සාධාරණ පරිද්දෙන් රටේ හැම ශිෂ්‍යයකුටම නිසියේ අධ්‍යාපනය ලැබෙන පරිද්දෙන් ප්‍රතිසංවිධානය කිරීමයි.

තවත් කාරණයක් ගැන සඳහන් කළ විට තමුන්නාන්සේලා පුදුම වෙනවා ඇති. හුඟ දෙනෙක් කිව්වා හතේදී ඉවර වේවිය කියා. දැනට කරගෙන යන හැටියට එහෙම ඉවර වීමක් වන්නේ නැහැ. 1963දී 5 වන ශ්‍රේණියට යන විට පළමුවන ශ්‍රේණියට බැඳුණු ළමයින්ගෙන් ඉතිරි වුණු සංඛ්‍යාව සියයට 60යි. 8 වන ශ්‍රේණියට යන විට ඉතිරි වුණු සංඛ්‍යාව සියයට 38යි. 11 වන ශ්‍රේණියට යන විට ඉතිරි වුණු සංඛ්‍යාව සියයට 6යි. මා එය නැවත විස්තර කර දෙන්නම්. ඒ මෙසේයි: 5 වන ශ්‍රේණියේදී සියයට 60යි. 8 වන ශ්‍රේණියේදී සියයට 38යි. 11 වන ශ්‍රේණියේදී සියයට 6යි. එහෙත් දැන් තත්ත්වය කෙසේද? දැන් 5 වන ශ්‍රේණියට යන විට ඉතිරි වන ගණන සියයට 70යි. 8 වන ශ්‍රේණියට යන විට ඉතිරි වන ගණන සියයට 48යි. 11 වන ශ්‍රේණියට යන විට ඉතිරි වන ගණන සියයට 18යි. එතකොට 60 සංඛ්‍යාව 70 වෙලා තිබෙනවා. 38 සංඛ්‍යාව 48 වෙලා තිබෙනවා. 6 සංඛ්‍යාව 18 වෙලා තිබෙනවා. එයින් පෙනෙනවා ඇති අධ්‍යාපනය ක්‍රමානුකූල වේගෙන යන ආකාරය.

ගුරු මාරුකිරීම් ගැන කිව්වා. තමුන්නාන්සේලා මාරු කළ ආකාරයට නොවෙයි අපි මාරු කළේ. අප කොතැනක දීවත් ස්කෝලවලට හානි සිදු වන පිළිවෙළට ගුරුවරුන් මාරු කළේ නැහැ. යම් මාරු කිරීමක් කළොත් ඒ වෙනුවට වෙන කෙනෙක් පත් කළා. සමහරවිට කලාතුරකින් එසේ නොවූ ස්ථාන තිබෙන්නට පුළුවනි. තවමත් ගුරු සංඛ්‍යාව සම්පූර්ණ වී නැති හෙයිනුයි, එසේ වන්නේ. වලපනේ ගරු මන්ත්‍රීතුමා (ටී. බී. එම්. හේරත් මයා.) කී කතාව ඇත්ත වන්නට පුළුවනි. සමහර පාඨශාලාවල වැඩ බලන මූල් ගුරුවරු සිටින්නට පුළුවනි. වැඩ බලන අය 5,000ක් සිටියා. අපි 5,000න් 4,000 ක් පිරෙව්වා. ඒක තමුන්නාන්සේලා නොකර තිබුණු දෙයක්. දෙයියනේ මේ කතාව මම 10 සැරයක් විතර කිව්වා. කිව්වාට මොකද නැවත නැවතත් ඒ ගැන අහනවා. වෙන දෙයක් කියන්නට නැතුව ඇති. මා මීට කලින් තුන් වතාවක් කිව්වා. වැඩ බලන අය 5,000ක් සිටියා. අපි 4,000ක් පිරෙව්වා. තවත් 1,000ක් සිටිනවා. ලබන අවුරුද්දේ ඒකත් පුරවනවා. ඒක එපමණයි. මේ අන්තිම වතාවටයි කිව්වේ; ආයි නම් අහන්නට එපා.

අනික් කරුණ ගුරුමාරු, ගුරුමාරු සාධාරණ විධියට කෙරෙන්නේ නැත කියා තමුන්නාන්සේලා කිව්වා. එහෙත් අපි ගුරුමාරු කරන්නේ හරි සාධාරණ විධියටයි. එක එක්කෙනා කියන විධියට මාරු කරන්නෙත් නැහැ. ඇත්තද නැත්තද පෙනෙන්නවත් වරදක් නැත්නම් මාරු කරන්නෙත් නැහැ. ඇත්තද නැත්තද කියා ගුරුවරුන්ගෙන් අසා බලන්න. ශ්‍රී ලංකා ජාතික ගුරු සංගමයේ අයගෙන් හැර—ඒ අයගෙනුත් හුඟ දෙනෙක් දැන් අපට පක්ෂයි—අනික් අයගෙන් අසා බලන්න.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ඊරියගොල්ල]

අපි අධ්‍යාපනය සමාන කිරීම සඳහා, ලංකාවේ හැම තැනකම සමාන අධ්‍යාපන යක් දීම සඳහා, හැම නිවාඩු කාලයකදීම සංස්කරණ සම්මේලන පවත්වනවා. එක අංශයක ගුරුවරුන් 1,300ක් පසුගිය නිවාඩු කාලයේදී ගෙන්වා සංස්කරණ සම් මේලන පැවැත්වූවා. බදුල්ල, මහියංගනය, මාතර, අම්පාරේ, කොළඹ, කුරුණෑගල, ආදී හැම ප්‍රදේශයකම සංස්කරණ සම්මේලන නැත්නම් එවැනි පන්ති 69ක් පසුගිය නිවාඩු මාසයේදී පවත්වා තිබෙනවා. දෙසැම්බර් මාසයේදීත් පවත්වනවා. නොවැම්බර් මාසයේදී ශිෂ්‍ය ගුරුවරුන් පත් කරන විට ඔවුන්ටත් එක්තරා අභ්‍යා සයක් දෙනවා. කලින් නම් තිබුණේ ලිය මන ගෙදරට ගියාම ඔහු පාසැලට යන එකයි. දැන් එහෙම නොවෙයි. ඔවුන් කැඳවා ඔවුන්ගේ වගකීම් ආදිය කියා දීලයි පිටත් කරන්නේ. අපි ඒ විධියට කටයුතු කරන්නේ ලංකාවේ හැම තැනකම සමාන අධ්‍යාපනයක් දීමටයි. ඒ කියන්නේ තමුන්නාන්සේලා කියන එකේ අනික් පැත්ත.

අම්පාරේ ප්‍රදේශයේ අව්වට වේළි වේළි ගැහි ගැහී සිටි ගුරුවරුන් 2,500ක් පමණ පසුගිය අවුරුද්දේදී ගම් ප්‍රදේශවලට ගෙනාවා. මෙහි සිටි අය—උපන්දා සිටම ගෙදරට වී සිටි අය, වයසට ගිය අය නොවෙයි, අවුරුදු 45ට අඩු අවුරුදු 7 කට වඩා සේවය කර ඇති අය—මාරු කළා. ඒ මහත්වරුන් හෝ නෝනාමහත්වරුන් එයට විරුද්ධව කථා කළේ නැහැ. එහෙත් මේ "ඩේලි මිරර්" පත්‍රය මොනවද කියන් නේ? කොහේ ඉඳගෙන කථා කරනවාද මා දන්නේ නැහැ. මිරර්කාරයා වගේ මිනි හෙක් නම් නැහැ. ටයිම්ස් කොම්පැනිය ගැන මා කණගාටු වෙනවා. [බාධාකිරීම්] මිරර්කාරයා ගැන මට කණගාටුයි. මිනිහා මට කොපමණ පක්ෂද කියනවා නම් අන්තිමට පත්‍රයේ ඉතිරි වන්නේ ඊරියගොල්ල කියන නම පමණයි. මිනිසුන්ට මතක හිටින්නේ එපමණයි. ඒ තරමටම ලිය නවා. හැමදාමත් ලියනවා. ගරු කථානායක තුමනි, මා කීවාය කියා පත්‍රයේ තිබුණු එකක් මම කියන්නම්. කලිසමකත් අඳ ගෙන නේ මේවා කියන්නේ, රෙදි නොවෙයි කලිසම් ඇඳගෙන. මේ මිනිහට

ලැජ්ජ තිබෙනවා නම් ඇමතිවරයෙකු ගැන කියන විට අඩු ගණනේ අහන්නවත් එපායැ මේවා ඇත්තද කියා. මට අකමැති වුණු පළියට රට ගිනිවද්දන්නේ ඇයි? මේ රට අවුරුද්දකට කොමියුනිස්ට්කාර යින්ට යනවා නම් මා කැමතියි. එහෙනම් මොවුන්ට හොඳ පාඩමක් උගන්වාවී.

මොකද දෙවියනේ, ප්‍රජාතන්ත්‍රවාදී නිද හස මෙහෙම නරක විධියට පාවිච්චි කරන් නේ? අවුරුදු දහය පහළොහ විස්ස වැඩ කළ විශ්‍රාම ගන්නට කැමති සමහර ගුරු වරියන් ඇවිත් මට කීවා, එහාට මෙහාට මාරු වෙන්න සිදු වන නිසා විශ්‍රාම යන් නට ක්‍රමයක් තිබෙනවා නම් ඒ අය කැම තියි කියා. විශ්‍රාම ගත්තද නැද්ද කියල නම් මා දන්නේ නැහැ. ඒ නිසා අවුරුදු 5ක් රාජකාරිය කළ ගුරුවරියකට විශ්‍රාම ගන්නට ඕනෑ නම් තවත් අවුරුදු 5ක් සේවයට එක් කර විශ්‍රාම ගන්නට අවසර දිය යුතුයි කියන යෝජනාවට මා කැබිනට් මණ්ඩලයේ අවසරය ගත්තා. එය නීති ගත කරලත් ඉවරයි.

මිරර්කාරයා අදත් එකක් ලියලා තියෙන වාලු. මම නම් ඒක කියෙව්වේ නැහැ. ඒ නිසා කරුණාකර මේ කතාව මම කිව්වාය කියලා එහෙම ගරු මන්ත්‍රීතුමන්ලා සභා වල කියන්නට එපා. මම මේ කියන්නේ මම කිව්වාය කියලා මිරර්කාරයා කියන එකක් පමණයි. මම නොවෙයි ඒ කතාව කියන්නේ. ගුරුවරියන්ට ළමයින් උපන දින ගණන සීමා කරන්නැයි මම කිව්වලු. එහෙම නැත්නම් විශ්‍රාම ගන්නැයි මම කිව්වලු. මේ මනුෂ්‍යයා කියන කථාවක හැටි. මෙහෙම දේවල් කියන මේ මනුෂ්‍ය යාගේ කන්තෝරුව ඔය විධියට තියෙන එකම ඇති. මොන කරදරයක්ද මම දන් නේ නැහැ මේ කරන්නේ. මම මොනවා කළාටද දන්නේ නැහැ මා ගැන මේ විධි යට එක එක දේවල් කියන්නේ. එහෙ මත් නැත්නම් මේ මනුෂ්‍යයාට මොනවා වෙලාද දන්නේ නැහැ. මම අර කී එකට කැමතියි. ඒ වුණාට දුන්නොත් ගන්ට බැරි නිසා දෙන්ට අමාරුයි.

ගුරු මාරු දැළවන් තරම් සාධාරණ විධිය ටයි කෙරෙන්නේ. සමහර විට පික දෙන කුට අසාධාරණයක් වෙනවාත් ඇති. එහෙම වෙන්නට ඉඩ තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ශ්‍රේණි ගැන වලපනේ ගරු මන්ත්‍රීතුමා (ටී. බී. එම්. හේරත් මයා.) කිව්වා. මුහුණ බලා ලකුණු දීම ගැන මමත් කිව්වලු රූස්වීම්වලදී සමහර තැන්වල. මුහුණ බලා ලකුණු දෙන්නැයි මම කිව්වලු. මම එහෙම නොවෙයි කිව්වේ. වලපනේ මන්ත්‍රීතුමා එක එක අවස්ථාවල එක එක දේ කිය නවා. දහඅටදාහක් සුදුස්සන් ඉන්නවා. එයින් දෙදාහක් පමණයි තෝරා ගන්නට පුළුවන්කම තිබෙන්නේ. ඉතින් එය පහසු කාර්යයක්ද? එක් තැනක පවත්වනු ලබන පරීක්ෂණයකින් නොවෙයි තෝරන් නේ. ප්‍රථම තේරීම්ල 24 පොළක කෙරෙ නවා. එක පොළක තෝරන ක්‍රමයකටම නොවෙයි සමහර විට අනෙක් තැන තෝරන්නේ. වෙනස් වෙනස් කණ්ඩා යම් මගින් කරනු ලබන තේරීල්ලේදී සුළු සුළු වශයෙන් නමුත් තෝරන ක්‍රමය, ලකුණු දෙන ක්‍රමය වෙනස් වන්නට ඉඩ තිබෙනවා. එක් තැනකදී පෙනෙන ක්‍රමය ටම නොවෙයි තවත් තැනකදී පෙනෙන් නේ. කිරලාත් නොවෙයි ලකුණු දෙන් නේ. මුහුණ බැලීමෙනුයි ලකුණු දෙන්නේ. එක් තැනකදී එක් පුද්ගලයකුට ලැබෙන ලකුණු සංඛ්‍යාවම එවැනි තවත් පුද්ගල යකුට වෙනත් තැනකදී නොලැබෙන්නට ඉඩ තිබෙනවා. ඒ විධියට ලකුණු ගණන අඩු වැඩි වන්නට පුළුවනි. සුදුසුකම් තිබෙන අයයි මේ සියලු දෙනාම. සියලු දෙනාම සුදුස්සන් නිසා, එයින් කොටසක් පමණක් තෝරා ගන්න විට අසාධාරණ යක් වන්නට ඉඩ තිබෙනවා. එවැනි අවස්ථා ඉදිරිපත් කරනු ලැබුවොත් නැව තත් ඒවා ගැන පරීක්ෂා කර බලන්නට පුළුවනි. ඒ නිසා අභියාචන කරන්නට ඉඩ දුන්නා. ඒ අන්දමට අභියාචන ලැබී තිබෙනවා. ඒවා ගැනත් සොයා බලනවා. ඒ අනුව තවත් අසූවක්, අනූවක් තේරෙන්නට ඉඩ තිබෙනවා. මේවා කිරලා මැනලා තෝරා ගන්නට පුළුවන් ද්‍රව්‍ය නොවෙයි. ඒ නිසා සමහර විට අඩුවෙන් සුදුසුකම් ඇති කීප දෙනකු තේරෙන්න ටත්, ඊට වඩා සුදුසුකම් ඇති කීප දෙනකු මග හැරී යන්නටත් පුළුවන්කම තිබෙ නවා. ඒවා සම්පූර්ණයෙන්ම වළක්වන් නට අමාරුයි. කොහොම වුණත් අපේ ආණ්ඩුව ශ්‍රේණි දුන්නා. තවත් ඇතැම් ස්ථානවල සුළු සුළු වශයෙන් නමුත් ඇඩෑර්තු තිබෙනවා. සෑහෙන ප්‍රමාණයක් දුන්නා. ඉතිරි හරියත් ළඟදී පුරනවා.

මා ක්‍රියා කරන්නේ අධ්‍යාපන අමාත්‍ය වරයා වශයෙන් පමණක් නොවෙයි, සාංස්කෘතික අමාත්‍යවරයා වශයෙනුත් මා කටයුතු කරනවා. ඒ නිසා සංස්කෘතියට ගැළපෙන පරිද්දෙන් මා ක්‍රියා නොකළ බවක් කොළඹ මැද මන්ත්‍රීවරයෙක් කියා තිබෙනවා. මා අදහස් කෙළේ මැද කොළඹ තුන්වැනි ගරු මන්ත්‍රීතුමා (කෙනමන් මයා.) ගැනයි. එතුමා එසේ කියා තිබෙ නවා. උන්නැහේගෙයි මගෙයි සංස්කෘතිය එකකට එකක් වෙනස්. එතුමාගේ සංස් කෘතිය අනුව අපේ රටේ සංස්කෘතිය සකස් කරන්නට මා බලාපොරොත්තු වන්නේ නැහැ.

යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) විසින් කියන ලද අසත්‍ය කථාවක් ගැන කියන්නට ඕනෑ. ප්‍රසිද්ධියේ මේ ගරු සභාවේදී කියන්නට මා අදහස් කෙළේ එය හැන්සාඩ් වාර්තා වේ සටහන් වන්නට ඕනෑ නිසයි. ශිෂ්‍ය යන්ට ඇපකාරයින් නැතිව මධ්‍යම බැංකු වෙන් මුදල් ණයට ගන්නට රු. 7,50,000 වෙන් කර තිබෙනවාලු. මධ්‍යම බැංකු වෙන්ය කියලයි කිව්වෙ. එය සම්පූර්ණ අසත්‍යයක්. එහෙම නැත්නම් මට තවම ඒ කඩදාසි හම්බවෙලා නැහැ. එක්කෝ එහෙම එකක් කෙරිලා නැහැ. එහෙම එකක් කෙරුණා නම් අපට ඒ කඩදාසි කන්තෝරුවේ තිබී තවම හම්බවෙලා නැහැ.

මහජන බැංකුවෙන් මුදල් ණයට ගන් නට පුළුවන් ක්‍රමයක් තිබුණා. ඒ ක්‍රමය අනුව මුදල් ගන්නට ඉඩක් ලැබෙන්නේ ඇපකාරයන් දෙදෙනකු ඉදිරිපත් වුණොත් පමණයි. නියම කරන ලද සුදුසුකම් තිබෙන ඇපකාරයන් දෙදෙනා සොයා ගන් නට අමාරුයි, ශිෂ්‍යයින්ට. ඇපකාරයන් එක්කෝ ආදායම් බදු ගෙවන්නන් වෙන් නට ඕනෑ, එහෙම නැත්නම් රජයේ සේවය කරන වගකිවයුත්තන් වන්නට ඕනෑ. එවැන්නන් සොයා ගැනීම ශිෂ්‍ය යන්ට අමාරුයි. ඒ නිසයි ජාතික ආණ්ඩුව පිහිටුවනු ලැබීමෙන් පසු ඒ ගැන සොයා බැලුවේ. ජාතික ආණ්ඩුවේ කැබිනට් මණ්ඩ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ඊරියගොල්ල]

ලයට මා යෝජනාවක් ඉදිරිපත් කළා. රු. 7,50,000 ක් නොවෙයි, රු. 30,00,000ක් වෙන් කරන්නට යෝජනා කළා. පියා, මව, භාරකාරයා, යන තුන් දෙනාගෙන් එක් කෙනකුත් ශිෂ්‍යයාත් පමණක් අත්සන් කළාම මාසයකට රු. 100 ක් බැගින් අවුරුද්දකට රු. 1000 ක් ලබා ගන්නට ඒ ක්‍රමය අනුව පුළුවන් වෙනවා. අවුරුද්දේ මාස දොළහෙන් දහයක් පමණයි ඉගෙනීමේ යෙදෙන්නේ. ඒ නිසා මාසයකට රු. 100 බැගින් මාස දහයට රු. 1,000 ක් ණයට ගන්නට ඒ ක්‍රමය යටතේ පුළුවන් වෙනවා. පියා, මව, හෝ භාරකාරයා යන තුන් දෙනාගෙන් එක් කෙනකුගේත් ශිෂ්‍යාගේත් අත්සන් ඇතිව රුපියල් දාහක් දක්වා ණයට දෙන්නට රුපියල් තිස් ලක්ෂයක් වෙන් කළා. රුපියල් 1000 දක්වා ණය දීම සඳහා රුපියල් 30,00,000 ක් වෙන් කිරීමට කැබිනට් මණ්ඩලය තීරණය කළා.

**කළුගල්ල මයා.**
*(திரு. கலுகல்ல)*
(Mr. Kalugalla)

කවදාද ඒවා දෙන්නේ ?

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

ඔක්තෝබර් මාසයේදී එය ක්‍රියාත්මක කරන්නට බලාපොරොත්තු වුණු නමුත් ඒ පිළිබඳ නීති සම්පාදනය කර අවසාන නැති නිසා තව ටික කලක් ගත වෙයි.

**කළුගල්ල මයා.**
*(திரு. கலுகல்ல)*
(Mr. Kalugalla)

අසූවල් මාසයේ සිට දෙන්නට පුළුවන් වේයයි සාමාන්‍යයෙන් කියන්නට බැරිද ?

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

නීති සම්පාදනය වුණු හැටියේම දෙනවා. සමහරවිට හෙට අනිද්දාම දෙන්නත් පුළුවන් වෙයි. අමාත්‍යාංශයේ නිලධාරීන් දැන් භාණ්ඩාගාරයත් සමග ඒ සම්බන්ධව ක්‍රියා කරගෙන යනවා.

**කළුගල්ල මයා.**
*(திரு. கலுகல்ல)*
(Mr. Kalugalla)

ඡන්දයට කලින් දෙනවාද ?

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

අප රටේ යහපතට මිස ඡන්ද බලාගෙන වැඩ කරන්නේ නැහැ. ඡන්ද අප පස්සෙන් එනවා නම් ආවාවේ. තමුන්නාන්සේලා ඡන්ද බලාගෙන මුල්ගල් තැබුවාක් මෙන් අප වැඩ කරන්නේ නැහැ. එක්සත් ජාතික පක්ෂයේ සිටින්නේ ඡන්ද පස්සෙන් දුවන ජාතියේ අය නොවෙයි. මේ සැරේ අපට මිනිසුන් ඡන්ද දෙන්නේ නැද්ද කියා බලනවකෝ.

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்ஸா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

ඔය කියන දේවල් තවම කෙරුණේ නැති එකයි වරද.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

බොරුවක්යැ. තමුන්නාන්සේලාට අවුරුදු 9 ක් තිස්සේවත් කරන්නට බැරි වුණු දේවල් මා කොහොමද අවුරුදු 3 කින් කරන්නේ ? අප කොච්චර කරලා තියෙනවාද ? තව කොච්චර දෙවල් කරන්නට තියෙනවාද ?

ණය දීම පිළිබඳව නීති සම්පාදනය වන තුරු, කලින් දීගෙන ආ සහනාධාර මුදල් ඒ පිළිවෙළටම දෙනවා. ඒ සහනාධාර දීමේ එක් පිළිවෙළක් තිබුණේ නැහැ. සමහර අයට රු. 10 බැගිනුත් සමහර අයට රු. 15 බැගිනුත් ලැබුණා. අප දැන් එය වෙනස් කොට හැම කෙනකුටම රු. 25 බැගින් දීමට කටයුතු යොදා තිබෙනවා. විශ්ව විද්‍යාල හතරේම දැන් රු. 300 බැගින් දීමටත් කටයුතු සලසා තිබෙනවා. වැඩි කල් යන්නට පෙරම අලුත් ණය ක්‍රමය ක්‍රියාත්මක කරන්නට පුළුවන් වේයයි මා අදහස් කරනවා. භාණ්ඩාගාරයේත්, අධ්‍යාපන අමාත්‍යාංශයේත්, බැංකුවේත් නිලධාරීන් දැන් මේ ගැන කටයුතු කරගෙන යනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මැද කොළඹ තුන්වන ගරු මන්ත්‍රීතුමා (කෙනමන් මයා.) කී කථාව අසත්‍යයක් බව මා නැවත වරක් කියන්නට ඕනෑ. යටියත්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) මුදල් ඇමති වශයෙන් සිටි කාලයේදී, විශ්ව විද්‍යාල ශිෂ්‍යයන්ට ඇපකරුවන් නැතිව ණය දීම සඳහා රු. 7,50,000 ක මුදලක් වෙන් කරන ලදැයි මැද කොළඹ තුන්වන ගරු මන්ත්‍රීතුමා විසින් කියන ලද කථාව මිථ්‍යාවක්. එහෙම නැත්නම්—එවැනි ක්‍රමයක් තිබුණා නම්—ඒ සම්බන්ධ ලියකියවිලි එතුමන්ලා යන විට පුච්චා දමා යන්නට ඇති. මට නම් එවැනි කිසිම ලියවිල්ලක් දකින්නට ලැබුණේ නැහැ.

මාක්ස්වාදී පක්ෂයක් වන කොමියුනිස්ට් පක්ෂය ගුරුවරුනුත් ශිෂ්‍යයනුත් මේ රජය කෙරෙහි බිඳුවන්නට බොහෝම ලොකු උත්සාහයක් දැරුවා. එහෙත් ඒ ව්‍යාපාරය සම්පූර්ණයෙන්ම අසාර්ථක වුණා. විරුද්ධ පාර්ශ්වයේ අනෙක් පක්ෂවල මන්ත්‍රීවරුන් මෙය විශේෂයෙන් හිතට ගත යුතු කරුණක්. තමුන්නාන්සේලා මේවාට උදව් දෙන්නට එපා. විශ්ව විද්‍යාලයෙන් පුහුණු කර එවන ලද උපාධිධර සමහර ගුරුවරුන් ලවා ශිෂ්‍යයන් බොහෝ ගණනක් සිටින පාසල්වල ජනප්‍රිය, නායකත්වයක් තිබෙන, ශිෂ්‍යයන් අල්ලාගෙන ශිෂ්‍ය සංවිධාන ඇති කරන්නට කොමියුනිස්ට් පක්ෂය උත්සාහ කළා. ජාතික ශිෂ්‍ය සම්මේලන නමින් හැඳින්වුණු එම ශිෂ්‍ය සංවිධානවල මුල තිබෙන්නේ විශ්ව විද්‍යාලයේ. ඒ ව්‍යාපාරයත් ලත් තැනම නැති වුණා. ගුරුවරුන් අතර ප්‍රචාරය කරනු ලබන ව්‍යාජ දැන් ගුරුවරුන් පිළිගන්නේ නැහැ. දැන් අපගේ විභාග හොඳින් පැවැත්වෙනවා; පාසල්වල උගැන්වීම හොඳයි; ගුරුවරුන් පාසල්වලට නොපැමිණ සිටීම අඩුයි. මෙවැනි තත්ත්වයක් ඇති වුණේ ගුරුවරුන්ගේ සහයෝගය නිසා බව තමුන්නාන්සේලාත් දන්නවා. දැන් පාඨශාලාවල විනය හොඳයි. තමුන්නාන්සේලාගේ කාලයේදී සුමානෙකට දෙකකට සැරයක් පංක්ති වර්ජනයක් ඇති නොවුණ අවස්ථාවක් පාසල්වල නොතිබුණ බව තමුන්නාන්සේට මතක ඇති. දැන් එසේ ඇති වන්නෙ නැහැ. මට මතක හැටියට එකම පාසලක ඇති වුණා. ඒක වසා දැම්මා. පසුව නැවත ඇරියා.

අනික් කාරණය, කථානායකතුමනි, විශ්ව විද්‍යාල පිළිබඳව යම් කිසි බලයක් අපට නැහැ. කවුරු කොහොම කිව්වත්, විශ්ව විද්‍යාල පාලනය කිරීමට ඇමතිවරයාට බලයක් නැහැ. එවැනි බලයක් නැති වීම ගැන මා කනගාටු වෙනවා. එනිසා විශ්ව විද්‍යාලවල දේශපාලන කට්ටි පැනීම් ඇති වෙනවා. ගරු මන්ත්‍රීතුමා පත්‍රයේ තිබෙන මොකක්දෝ කියවන්න සූදානම් වුණා. මා කවදාවත් අපේ විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් සියයට සියයක් හෙළා දැක්කේ නැහැ. ලෝකයේ වෙනත් විශ්ව විද්‍යාලවල සිදු වන භයානක ක්‍රියා ගැන විස්තර කරමින් අපේ විශ්ව විද්‍යාලවලටත් හෙමින් හෙමින් ඒවා ඇතුළු වේගෙන එන බව ප්‍රකාශ කර, අවස්ථාවක් දෙකකක් සාධක වශයෙන් ඉදිරිපත් කළා. එවැනි අවස්ථාවකදී දෙකකදී මා කිව්වා, අපේ ළමයින් ලෝකයේ අනික් විශ්ව විද්‍යාලවල ළමයින් සමග සම කරන විට බොහෝම හොඳයි කියා. හොඳ බව ඇත්ත. ඒ මොකද ? අපේ පරම්පරානුගත සංස්කෘතිය අනුව බලන විට බටහිර හෝ රුසියානු හෝ සංස්කෘතියට සකස් වුණ අය තරම් අපේ අය නරක නැහැ. එහෙත් දැන් එය හෙමින් හෙමින් අපේ විශ්ව විද්‍යාලවලට ඇතුළු වේගෙන එනවා. හරියට පිළිකාවක් වාගෙයි. පිළිකාවක් වාගේ හෙමින් හෙමින් ඇතුළු වී අතුනු බහන් බඩවැල් කුණු කරගෙන දැන් හදවත කරා එනවා. එම නිසා ඊට කලින් එය නැවැත්වීමට තමුන්නාන්සේලාගේ සහයෝගයත් අවශ්‍යයි. සමහර විට එක කණ්ඩායමකට ඒ අවුල හොඳ ඇති. සමාජයේ විනය නැති කිරීමේ අදහස ඇති කණ්ඩායමට එය හොඳ ඇති. අපේ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුව තිබෙන තාක්, කොමියුනිස්ට් මාක්ස්වාදී පක්ෂ කවදාවත් එය හොඳයි කියන්නෙ නැහැ. හැම අනකින්ම තත්ත්වය අවුල් කර මිනිසා හා සමාජය අතර ඇති සම්බන්ධය විනාශ කර ඒ ඒ කණ්ඩායම් මැරවර බලයෙන් හෝ වෙනත් බලයකින් හෝ තමන්ගේ පක්ෂයට හරවාගෙන මුලාවෙන් කුමන්ත්‍රණයෙන් හෝ පිං සවාරිවලින්—[බාධාකිරීම්] පිං ටිකට් හෝ පිං සවාරිවලින් හරවාගෙන—මේ රටේ තිබෙන ප්‍රජාතන්ත්‍රවාදී අත්තිවාරම දෙදරවන්නට



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ඊරියගොල්ල]

උත්සාහ කරනවා නම් තමුන්නාන්සේලා ඊට සම්බන්ධ වෙන්න එපා. ප්‍රජාතන්ත්‍රවාදයේ වටිනාකම මා නොකීවාට දැන් තමුන්නාන්සේලාට තේරී ඇති වෙකොස් ලොවෙකියානු ප්‍රශ්නය ගැන සිතා බලන විට. අපි එය අපේ වාසියට අදින්නෙ නැහැ. එහෙත් අවස්ථාව පැමිණී විටක උදාහරණයක් වශයෙන් ඉදිරිපත් කළා පමණයි.

අපේ විශ්ව විද්‍යාලවලට වී තිබෙන හදිය තමුන්නාන්සේලා දන්නවා නම් ඇත්ත වශයෙන් කනගාටු වෙනවා. චෝදනාව කළ යුත්තේ මට නොවෙයි. තමුන්නාන්සේලා දන්නවා ඇති මේ වර විශ්ව විද්‍යාලවල නවක වදේ හුඟක් අඩු වූ බව. අපේ විශ්ව විද්‍යාල දෙකකට පරිපාලන තත්ත්වයේ උප කුලපතිවරුන් පත් කළා. අප එසේ කෙළේ විශ්ව විද්‍යාලවලට මහා පණ්ඩිතවරුන් පත් කිරීම සුදුසු බව නොදැන නොවෙයි. එහි උප කුලපතිවරයාගේ සේවය දෙඅංශයකින් සිදු විය යුතුයි. එකක් පාලනයයි. අනික අනික් අය කරන වැඩ පිළිබඳව පරීක්ෂා කිරීමයි. පාලනය යනු විනය පිළිබඳ භාරකාරත්වයයි කියන්න පුළුවනි. ඒකයි වැදගත්. ඒ දෙකම එකට තිබෙනවා නම් උපකුලපති ධූරයකට සුදුසු ආචාර්ය, ප්‍රාචාර්ය, මහාචාර්ය තත්ත්වයයේ සිටින කෙනෙකු බව ඇත්ත. එහෙත් ඒ තත්ත්වයේ සිටින, පරිපාලනයට සුදුසු, පක්ෂග්‍රාහිත්වයෙන් තොර කෙනෙකු සොයා ගැනීම දුෂ්කරයි. මේ උදවිය සිටින්නේ කණ්ඩායම් වශයෙනුයි. තමුන්නාන්සේලාට මතක ඇති අප එක්කෙනෙක් කොළඹට පත් කළ බව. එහි විපාකත් තමුන්නාන්සේලා දන්නවා. අපේ ළමයින්ගේ විනය, අපේ ළමයින්ගේ දියුණුව, අපේ ළමයින්ගේ ශීලාචාරකම මා හිතන හැටියට තමුන්නාන්සේලාත් අප වාගේම බලාපොරොත්තු වෙනවා ඇති. මක්නිසාද? ජාතියේ අනාගතය, ඉරණම භාරකරුවන් තමයි විශ්ව විද්‍යාලයේ ඉන්නෙ. අපේ පාසැල්වලින් ද්විතියික අධ්‍යාපනයක් ලැබ විශ්ව විද්‍යාලයට ඇතුළු වන්නේ ඉතාමත් දක්ෂ ළමයිනුයි. එම ළමයින් වැඩි දෙනෙක්ම—සියයට 80 ක්ම—විනීත, විනය ගරුක ළමයිනුයි. නමුත් ඒ අය විශ්ව විද්‍යාලයට ඇතුළු වී අවුරුද්දක් එහි ඉගෙන ගත් පසු ඒ අයට මොකක්දෝ වෙනවා. අවුරුදු දෙකකට පමණ පසුවයි එය සිදු වන්නෙ. මොන වරදක් නිසා මෙය සිදු වෙනවාද කියා මා දන්නේ නැහැ. නමුත් මොකක් හෝ වරදක් තිබෙනවා. මේ රටේ පමණක් නොව, මුළු ලෝකයේම විශ්ව විද්‍යාලවල ඔවැනි තත්ත්වයක් තිබෙනවා.

ගරු කථානායකතුමනි, මේ නවක වදය සම්බන්ධයෙන් තමුන්නාන්සේත් දන්නවා ඇති. මේ වර්ෂයේ නම් එය හුඟක් අඩුවෙනුයි කෙරුණේ. එහිදී සිදු වුණ කාරණා දෙකක් පමණක් මා කියන්නම්. පිටතින් මුද්‍රණය කරන ලද කොමියුනිස්ට් සංවිධානවලට බැඳීමේ ඉල්ලුම් පත්‍ර දහස් ගණන් ගෙනැවිත් තිබෙනවා. විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යයින් 5,000 ක් ඉන්නවා නම් එයින් සියයකට වඩා නරක ළමයින් ඇත්තේ නැහැ. ඒ අයත් නරක් කරන්නේ පිටතින් හා අභ්‍යන්තරයෙන් පැමිණෙන බලපෑම්වලිනුයි. ඇත්ත වශයෙන්ම කියනවා නම් එක ළමයෙක්වත් නරක ළමයෙක්ය කියා කියන්න බැහැ. අනික් අය ඔවුන් නරක් කිරීමයි සිදු වන්නෙ. කීමෙහි හා බිනීමෙහි දක්ෂ, මැරවර කම් ටිකකුත් තිබෙන කිහිප දෙනෙක් නායකත්වයක් ලබා ගන්නවා. ඔවුන් කෙසේ හෝ නායකයින් වෙනවා. ඉන්න ඔය පිරිසගේ මාර්ගයෙන් තමයි හුඟක් දේවල් වෙන්නෙ. විළි බිය දෙක නිසා අනික් ළමයිනුත් ඔය අය කියන දේවලට විරුද්ධ වන්නේ නැහැ. මේ තත්ත්වය තමුන්නාන්සේලා අවබෝධ කර ගන්න ඕනෑ. තමුන්ගේ තත්ත්වය ආරක්ෂා කර ගන්න ඕනෑ නිසා කිසි දෙයකට විරුද්ධත්වයක් ප්‍රකාශ කරන්න යන්නේ නැහැ. ඉතින් ඒ අයත් මේ පිටතින් ගෙනෙන ලද ඉල්ලුම් පත්‍රවලට නම ඇතුළත් කර අත්සන් කරනවා. ඒ විධියට සාමාජිකයන් වශයෙන් බැඳෙනවා. එයට අකමැත්ත ප්‍රකාශ කළොත් ඒ අයට විසුමක් ලැබෙන්නෙ නැහැ. ඒ නිසා මොන පක්ෂයේ කෙනෙක් වුණත්, නිදහසේ කරදරයක් නැතිව ඉන්න ඕනෑ නිසා අත්සන් කරනවා. ඊළඟට මේ තරම් පිරිසක් සාමාජිකයන් වශයෙන් බැඳුනාය කියා ඒ ඒ රටවල තානාපති කාර්යාලවලට දන්වනවා. ඔය විධියට කටයුතු කර තමයි පින් ටිකට්, පින් සවාරි ආදිය ලබා ගන්නෙ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඔන්න ඔය වගේ දේවල් කළ කණ්ඩායමේ කෙනෙක් තමයි මේ අළුත් ශිෂ්‍ය පිරිස අතරට දමා තිබෙන්නෙ. අපේ උප කුලපතිතුමාත් විශ්වාසය තබා ඔහු යවා තිබෙනවා. කොමියුනිස්ට්කාරයින් කියන්නේ මිනිස් වර්ගයක් නොවන බව උප කුලපතිතුමාවත් දන්නේ නැහැ. මා එතුමාට කිව්වා, මේ කොමියුනිස්ට් කාරයින් මිනිසුන් නොවන බව. ඒ නිසා ඔවුන් ගැන හොඳට දැන ගෙන කටයුතු කරන්න ඕනෑ. මේ පුද්ගලයා කටයුතු කර තිබෙන්නේ පිටින් ලැබුණ ගුරු උපදෙස් අනුවයි. මේ ශිෂ්‍යයා විසින් වාර්තා ගත වීම සඳහා මා විසින් නොකියන ලද දේවල් මට විරුද්ධව කියන ලද්දේ ඒ නිසයි. ඔහු ලොකු හෑල්ලක් කියා තිබෙනවා. ගරු මන්ත්‍රීවරුන් විසින් උපුටා දක්වන ලද්දේ මා විසින් නොකියන ලද දේවලුයි. මා කවදාවත් කිව්වේ නැහැ, විශ්ව විද්‍යාලයේ ඉන්න හැම දෙනෙක්ම නරක ළමයින්ය කියා. කිහිප දෙනෙක් පමණක් දරදඬු දේශපාලකයන් නිසා නරක් වුණ බවයි මා කිව්වේ. සියයකට වඩා නරක ළමයින් නැති බවයි මා කිව්වෙ. වෙනත් රටවල විශ්ව විද්‍යාල සිසුනට වඩා අපේ විශ්ව විද්‍යාල ළමයින් හොඳ බවයි මා කිව්වෙ. එහෙත් මේ ශිෂ්‍ය පිරිස පිටතින් ලැබුණ උපදෙස් අනුව මට නොයෙක් අන්දමට චෝදනා කර තිබෙනවා. ඒ වගේම මා ලංකාව වටේ යනවිට—ගුරුවරුන් හමු වී සාකච්ඡා කිරීම සඳහා නොයෙක් නොයෙක් තැන්වලට යනවිට—මට බාධා කරන්න උත්සාහ කළා. එහෙත් ඒ අයට කිසිම දෙයක් කරන්න බැරිව පල් වී යන්න ගියා. එසේ කරන්නට සූදානම් වුණ එක් දෙයක් ගැන මා කියන්නම්. මෙය ඇත්ත සිද්ධියක්. ගරු කථානායකතුමනි, විශ්ව විද්‍යාල සිසුන්ගේ විනය ආරක්ෂා කිරීමට හෝ ඔවුන්ගේ සැප දුක් ගැන විමසීමට හෝ විශ්ව විද්‍යාල ගුරුවරුන් මැළිකමක් දක්වනවා. ඒ නිසා තමයි හුඟක් දුරට මේ අවුල සිදු වන්නෙ. ඒ ගුරුවරුන් අතරත් ඉන්නවා, පිටස්තර දේශපාලන කණ්ඩායම්වලට සම්බන්ධ අය. සමහර විට මැතිවරණ කටයුතුවලින් ප්‍රයෝජන ගැනීමට හෝ වෙනත් සංවිධානයක් තර ගැනීම සඳහා ප්‍රයෝජන ගැනීමට හෝ පිට ඉන්න කණ්ඩායම්වලට සම්බන්ධ පිරිසක් ඇතුලේ ඉන්නවා. සමහර විට එවැනි ගුරුවරුන්ගේ යම් යම් වුවමනාවලට ශිෂ්‍යයන් යෙදවීම නිසා එවැන්නන් කෙරෙහි ශිෂ්‍යයන් සැලකිල්ලක් දක්වන්නේ නැහැ. එවැනි අයට විනය ආරක්ෂා කරන්නත් බැහැ. මේ නිසාම මේ වාරයේදී වුණ සිද්ධියක් මා කියන්නම්. පිටිසර පළාතක ගැහැණු ළමයෙක් ඉංජිනේරු අංශයට ඇතුළත් වුණා. ඉංජිනේරු අංශයේ හොඳ ළමයින් ඉන්නවාය කියායි මා සිතාගෙන සිටියෙ. පිරිමි කණ්ඩායමක් මේ ළමයාව මැදි කරගෙන, "තෝ කොහේද? තොගෙ තාත්තගෙ නම මොකක්ද?" යනාදී වශයෙන් "තෝ තී" භාෂාවෙන් කථා කරන්න පටන් ගත්තා. මේ ළමයා කොතරම් භය වුණාදැයි කිවහොත් වෙවුල වෙවුලා ගුරුවරයා ළඟට ආවත් කථා කරන්නට බැරි වුණා. ඈයට කරන ලද හිරිහැර, ඈයට කියන ලද කුණුහරුප සීමාවක් නැහැ. මෙවැනි තත්ත්වයක් ඇති වුණේත් දෙමව්පියන් කිට්ටුව රැක සිටියදී හා උප කුලපති හුඟක් ආරක්ෂා සංවිධාන යොදා තිබියදී බව අමතක කරන්නට එපා.

කොළඹ විශ්ව විද්‍යාලයේ සිදු වුණු දේකුත් කියන්නම්. දැන් නම් කොළඹ නවක වදේ අඩුයි. විරුද්ධ පාර්ශ්වයේ වැඩ නිසා නොව, උද්ඝෝෂණය නිසයි. කොළඹ වෛද්‍ය අංශයේ ඉගෙනීමට ආ ළමයකු අල්ලා ගත් පස් දෙනකු ඔහු මෝටර් රථයකට දමා ගෙන ගොස් කාමරයකට ඇම්මා. ඒ කාමරයේ එහා කෙළවරේ සිට මෙහා කෙළවරට කලිසම උස්සාගෙන දණ ගසාගෙන එන්නට ඔහුට නියම කළා. මා මේ කියන්නේ ඇත්ත වශයෙන්ම සිදු වුණු දේයි. මේවා සාක්ෂි ඇතිව ඔප්පු කරන්නට පුළුවනි. ඊට පසුව ඒ ළමයාගේ මේස් දෙක ගළවන්නට කීවා. ඔහු මේස් දෙක ගැලෙව්වා. එවිට එය උරවන්නට කීවා; හොඳට උරවන්නට කීවා. මේ දාඩියෙන් තෙමුණු මේස් දෙක උරවන්නට ඒ ළමයාට සිදු වුණා. "මේ කරන ලද හිරිහැර මොනවාදැයි ප්‍රසිද්ධ කළහොත් තෝ මරන්නට වියදම් වන්නේ අරක්කු බෝතලයයි රුපියල් 15 යි" යනුවෙනුත් ඔහුට තර්ජනය කර තිබෙනවා. පේරාදෙණියේ ළම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ඊරියගොල්ල]

ශාට නම් කියා තිබෙන්නේ ගඟට දමන බවයි. ඉතින් මෙවැනි තර්ජන නිසා කර දර හිරිහැර ලැබූ ශිෂ්‍යයන් ඒවා ගැන ප්‍රසිද්ධියේ කියන්නට කැමති නැහැ. අර දෙවනුව කී ළමයාගේ පියා ගෙන්වා ඇසූ නමුත් ඔහුත් මේ ගැන කියන්නට කැමති වුණේ නැහැ. කොහොමද කැමති වන්නේ? එක් එක්කෙනාට වෙන වෙන ම තර්ජන කරනවා.

අපේ ළමයින් හැදිච්ච අය නිසා ඒ තරම් දූෂණ වෙලා නැහැ. හැබැයි, දූෂණය කරන්නට වුවමනා යයි කණ්ඩායමක් කල්පනා කළහොත් ඊට සම්බන්ධ නොවන ළමයාට සමහර විට විශ්ව විද්‍යාලය අපායක් වෙනවා. හැබැයි, එහෙම දූෂණය වෙලා සිටිනවා නම් ස්වල්ප දෙනයි. මේවා හීනාවට කාරණා නොවෙයි. ඉතින් විශ්ව විද්‍යාලවල පවතින මේ නරක තත්ත්වය නැති කෙළේ නැත් නම් මතුවට හැදිච්ච ළමයින් විශ්ව විද්‍යාලයට යන්නට භය වෙනවා. ඉතාමත්ම බලසම්පන්න හිතක් තියෙන කෙනකුට මිස වෙන කෙනකුට බේරෙන්නට බැහැ. විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් මොනවා කීවත් මට නම් කමක් නැහැ. එහෙත් මේ තත්ත්වය හොඳ නැහැ.

වෙනස් වීගෙන යන සමාජයේ තරුණ තරුණියන්ගේ සිත් තුළ මතු වන නිදහස් අදහස් යටපත් නොකර ඒවා විකාශනය කළ යුතු යයි එදා යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) කීවා. හැබැයි, ඔය විධියට විකාශනය කරන්නට ගියහොත් ලංකාව අපූරුවට තිබීවි. දැන් ඔය කියන විධියට යුරෝපය විකාශනය වෙලා ඉවරයි. ඇමෙරිකාවත් විකාශනය වෙලා ඉවරයි. ඒ විකාශනයෙන් මිදෙන්නේ කෙසේදැයි දැන් ඒ රටවල සිටින චින්තකයන් කල්පනා කරනවා. ඔය කියන විකාශනය දැන් අපේ රටට යන්තම් පිංගාගෙන එනවා. ඉතින් අප මේ වේලාවේදීම ඒක නවත්වා දැමිය යුතුයි. මේක දේශපාලන ප්‍රශ්නයක් නොවෙයි. රටේ, ජාතියේ, අනාගත පරම්පරාවේ, සමාජයේ, සංස්කෘතියේ ගෞරවය පිළිබඳ ප්‍රශ්නයක්. මේ රට හැදිච්ච රටක්. වෙන රටවලට වඩා නවමත් ප්‍රකෘති වශයෙන් අපේ රටේ හැදිච්ච අය ඉන්නවා. රුසියන් සංස්කෘතියත් බටහිර වාණිජ සංස්කෘතියත් අනුව හැඩ ගැසුණු අයට වඩා, අපේ රටේ පැවතුණු අවුරුදු දෙදහස් පන සීයක් පැරණි සංස්කෘතියක උදාර ගතිගුණ පිළිබඳ බීජ නවමත් ප්‍රකෘති වශයෙන් අපේ ඇගේ තිබෙනවා. ඒවා නැති කරන්නට දෙන්නට එපා. ඒවා මතු කර අපේ රට නැවතත් යථා තත්ත්වයට ගෙනැවිත් නොහැදිච්ච රටවලට ආලෝකය දෙන්නට ඕනෑ. අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමතිවරයා වශයෙන් පමණක් නොව මේ රටේ මනුෂ්‍යයකු වශයෙනුත් මා කියන්නේ ඒකයි. මේ තුවාල, කුණු වසාගෙන සිටිනවාට වඩා පැලැස්තර ගලවා දමා පිදි පිදී යද්දී කුණු ගළවා දමා තුවාල සුව පත් කර සමාජයට ශාන්තියක් දීම හොඳ නැද්ද? කවුරුන් බලයට ආවත් කළ යුත්තේ ඒකයි. සමහර විට යුරෝපයේ මිනිසුන්ට මේක ඒ තරම් වැදගාම්මක් නැතිව ඇති. එහෙත් අපේ හැදිච්චකම අනුව අපට මේවා අවලං. ඒ නිසා යුරෝපයේ පවතින ඔය ප්‍රගතිශීලී තත්ත්වය අපට වුවමනා නැහැ. මේක ප්‍රතිගාමී කථාවක් නොවෙයි.

ද්විතීයික විද්‍යාලයේ අපූරුවට හැදිච්ච ළමයිනුයි, උසස් අධ්‍යාපනයට ඇතුළු වන්නේ. එතකොට ඒ අය කොයි තරම් හොඳ පිරිසක් විය යුතුද? යුරෝපයේ පවතින උසස් අධ්‍යාපන ආයතනවල ළමයින් මැරකම්, දඟකම්, දූෂණකම් කරනවාය කියා මේ රටේත් උසස් අධ්‍යාපන ආයතනවල ඒවා අනුගමනය කරන්නේ ඇයි? ද්විතීයික විද්‍යාලයේදී ලැබූ අධ්‍යාපනයට වඩා උසස් අධ්‍යාපනයක් ලැබීමත්, වඩා විනීත ගතියක් ඇති කර ගැනීමත් උසස් අධ්‍යාපන ආයතනයේදී අප බලාපොරොත්තු විය යුතුයි. එම ආයතනවල මහා නැන්වල කෙරෙන හොරමැරකම් වළක්වන්න අමාරුයි. තමුන්නාන්සේලා දකින්න ඇති පසුගිය දා 'සිළුමිණ' පත්‍රයේ පළ වුණු ප්‍රවෘත්තියක් ගැන. එහි පළ කර තිබුණු බොහෝ දේ ඇත්ත බව මා දන්නවා. එහෙනම් උසස් තත්ත්වයක් බලාපොරොත්තු වන්නේ කොහොමද? එම නිසා, දේශ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පාලන වාසි ලබා ගැනීමට, තර්කයන් ගෙන් වාසි ලබාගැනීමට කල්පනා නො කර, ජාතියට සිදු වේගෙන යන දරුණු හානිය වළක්වා ලීමට, ජාතියේ යහපත සඳහා කටයුතු කිරීමට සියළුදෙනාගේම සහයෝගය අවශ්‍ය බව මතක් කරන්න කැමතියි. එහෙම නැති වුණොත් මෙවැනි සිදුවීම් වලින් ජාතියේ පරිහානිය වළක් වන්න බැහැ. මගේ අවබෝධයේ හැටි යට, මාක්ස්වාදී ආණ්ඩුවක් අපේ රටේ ඇති වන තුරු මෙවැනි දේවල් සිදු වීම නවත්වන්න ඉඩ දෙන්නේ නැහැ. මන් ද? ඔවුනට කමක් නැහැ, මේ රට හැදු ණත් නොහැදුණත්. ඔවුනට ඕනෑ කරන පිධියේ ආණ්ඩුවක් මෙහි පිහිටුවා ගත් තාට පසුව පොල්ල කෙලින් කරගෙන ආණ්ඩු කරයි, බොහොම අපූරුවට. එහෙම නම් එබඳු තත්ත්වයක් ඇති වීමට අප ඉඩ දිය යුතුද? ඇයි අපේ අනාගත පරම්පරාව විනාශ කර දමන්න ඉඩ දෙන්නේ? මෙම ශිෂ්‍යයන් ගැන අනුකම්පාවක් මටත් තිබෙනවා, තමුන් නාන්සේලාටත් තිබෙනවා. එහෙත් වාසි යක් පතා එක් පක්ෂයක් අරගෙන මේ කාරණයේදී ක්‍රියා නොකරන ලෙස ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා. මෙයට වඩා දීර්ඝ වශයෙන් මා කථා කරන්න යන් නේ නැහැ. මගේ කථාව අවසාන කිරී මට පෙර සඳහන් කළ යුතු තවත් කාර ණයක් තිබෙනවා.

පසුගිය පාලන කාල සීමාව තුළදී මේ රටේ පාඨශාලා නව දහසක පමණ අධ්‍යා පනය ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව අද තිස් ලක්ෂය දක්වා වැඩි වී තිබෙනවා. ඒ කාලයේදී. සමාන සාධාරණ අධ්‍යාපනයක් සමාන ගුරු පරපුරකින් නොලැබුණු බවත්, දැන් එම අධ්‍යාපනය සමානව, සාධාරණව නිරායාස යෙන් ලැබෙන පිළිවෙළට සකස් වී තිබෙන බවත්, වලපනේ, යාපහුව, මහියංගනය ආදී ප්‍රදේශවල සමහර ළමයින්ට තරමක දුෂ් කරතා ඇති බව පිළිගන්නා අතර වියදම් වැඩිය ගියත් ඒවාත් සකස් කිරීමට දැනට කරුණු පරීක්ෂා කර ගෙන යන බවත්, එම නිසා කිසිම අන්දමක නීති විරෝධි ක්‍රියා වක් කර නැති බවත්, කර ඇත්තේ 1943 දී කන්නන්ගර ඇමතිතුමා විසින් පත් කරන ලද—මැද කොළඹ තුන්වන මන්ත්‍රී තුමා (කෙනමන් මයා.) කියන අධ්‍යාපන විශේෂඥයන් [illegible]

පිරිස විසින් කරන ලද තීරණ අනුව බැස ගත් නිගමනයන් ක්‍රියාත්මක කිරීම බවත් තමුන්නාන්සේලාට අවධාරණයෙන්ම කියන්න කැමතියි. මෙන්න එම අධ්‍යාපන විශෙෂ කාරක සභාවට පත් කළ සාමාජිකයන් :

ආචාර්ය සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර, අධ්‍යාපන ඇමතිතුමා,

එල්. මැක්. ඩී. රොබිසන්, අධ්‍යාපන අධ්‍යක්ෂ,

එච්. එස්. පෙරේරා, වැඩබලන අධ්‍යාපන අධ්‍යක්ෂ,

ඊ. එල්. බ්‍රැඩ්බි, රාජකීය විද්‍යාලයේ විද්‍යාලයාධි පති,

ගරු එම්. ජේ. ලෙගොක් පියතුමා,

පී. ද එස්. කුලරත්න,

එස්. සිවපාදසුන්දරම්, වික්ටෝරියා විද්‍යාලයේ හිටපු විද්‍යාලයාධිපති,

ගරු ආර්. ඩබ්ලිව්. ස්ටොප්ෆෝඩ්, ට්‍රිනිටි විද්‍යාලයේ හිටපු විද්‍යාලයාධිපති,

එස්. නටේසන්, පරමේස්වර විද්‍යාලයේ විද්‍යා ලයාධිපති,

ටී. බී. ජයා, සහිරා විද්‍යාලයේ විද්‍යාලයාධිපති,

ඒ. රත්නායක,

එච්. ඩබ්ලිව්. අමරසූරිය,

ඩී. වනිගසේකර,

ජී. ඒ. එච්. විලේ,

ඒ. ආර්. ඒ. රාසික්,

මේජර් ඊ. ඒ. නුගවෙල,

එස්. ඒ. පේක්මන්, යුනිවර්සිටි කොලීජියේ, හිටපු ඉතිහාසය පිළිබඳ මහාචාර්ය,

ජී. පී. මලලසේකර,

ජී. කේ. ඩබ්ලිව්. පෙරේරා,

රාජනීතිඥ එන්. නඩරාජා,

ගරු ආර්. එස්. ද සේරම්

ජේ. සී. අමරසිංහම්, ඩින්නතම්බි අභ්‍යාස විද්‍යාලයාධිපති,

ආචාර්ය ඩබ්ලිව්. අයි. ජෙනිංග්ස්, ලංකා විශ්ව විද්‍යාලයේ උප කුලපති,

ආචාර්ය ඒ. පී. ද සොයිසා සහ ලේකම්, කේ. අල්වාපිල්ලේ.

මෙම කාරක සභාව විසින් ඉදිරිපත් කරන ලද වාර්තාව අනුව, කන්නන්ගර ඇමතිතුමා විසින් ව්‍යවස්ථාගත කරන ලද අධ්‍යාපන ප්‍රතිපත්තියේ නොකෙරුණු හරිය කිරීම පමණයි, මෙම ප්‍රතිසංවිධානය. ඒ ඒ අවස්ථාවලදී විටින් විට සකස් කරන ලද ආඥා පනත් හා සංශෝධනයන් [illegible] කොට අධ්‍යාපන මාර්ගයද ඊටම ඇතු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ඊරියගොල්ල]

ළත් කොට එකම ලේඛනයක් වශයෙන් ඉදිරිපත් කිරීම සඳහායි, ඒ කරුණු ධවල පත්‍රිකාවට ඇතුළත් කරනු ලැබුවේ. ඒ නිසා, පාර්ලිමේන්තුවේ බලතල හිතුවක්කාර විධියෙන් යටපත් කිරීමක් හෝ ඒකාධිපති විධියට වැඩ කිරීමක් හෝ මා නොකළ බවත්, නීති කඩ කිරීමක් නො වන බව ඉඳුරාම දැනගෙන, අමාත්‍යවරයකු වශයෙන් කැබිනට් මණ්ඩලයේ හා අගමැතිතුමාගේද අනුදැනුම ඇතිව මවිසින් කෙරුණේ, රටේ යහපත පිණිස අධ්‍යාපනය සාධාරණ ලෙස සියලු දෙනාටම සම යෙ ලැබෙන පරිද්දෙන් සකස් වුණු ප්‍රතිසංවිධානයක් බවත් කියමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

අ. භා. 3.42

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேகர)*
(Mr. Prins Gunasekera)

කථානායකතුමනි, අධ්‍යාපන ඇමතිතුමාගේ කථාවලට ඇහුම්කන් දී පුරුදු අපට අද හැන්දෑවේ එතුමා පැවැත්වූ කථාවෙන් සිහිපත් වුණේ, නීති විරෝධි ලෙස කටයුතු කිරීමේ චෝදනාවකට පාත්‍ර වුණු විත්තිකරුවකු සාක්කි කූඩුවට නැඟී තමාගේ ඇඟ බේරා ගැනීම සඳහා නිදහසට කරුණු දක්වමින් සාක්කි දෙන අවස්ථාවක්. එතුමා අද කළ ඒ කථාවට ඇහුම්කන් දෙන අයට ඒත්තු යන්නේ, සාධාරණව හා යුක්ති ගරුක අන්දමින් මේ රටේ ගුරුවරුන්ට මේසා විශාල යහපතක් කළ, මේ රටේ විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ට මේ තරම් ආදරේ ඇති, විශ්ව විද්‍යාලවල මහාචාර්යවරුන්ට මෙ පමණ ගරු කරන, රටේ පොදු අධ්‍යාපන කටයුතු වෙනුවෙන් මෙවන් සේවයක් කළ තවත් ඇමතිවරයෙක් මේ රටේ කවදාවත්ම නොවූ බවකුයි. ඒ, අද දුන් සාක්ෂියේ හැටියටයි. එහෙත් මෙවැනි ප්‍රශ්න, චෝදනා සම්බන්ධයෙන් මීට ඉස්සර තමා කළ ප්‍රකාශ මේ විත්තිකරුවාට අමතක වී තිබෙන හැඩයි. මෙවැනි චෝදනා සම්බන්ධයෙන් නොයෙක් තැන්වලදී, මෙවැනි නඩුවලදී මහජනයා ඉදිරියේ මේ විත්තිකරු කර ඇති ප්‍රකාශත්, අද කළ ප්‍රකාශයත් සංසන්දනය කර බලන විට, මේ විත්තිකරු වාට කලින් දෙන්නට අදහස් කළ දඬුවම වගේ තුන් හතර ගුණයක දඬුවමක් දෙන වාට කිසිම සැකයක් නැහැ.

තම කථාවේදී අධ්‍යාපන ඇමතිතුමා බොහොම උත්සාහ කළා, විරුද්ධ පාර්ශ්වයේ සිටින ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් කොමියුනිස්ට් පක්ෂයත් අතර මත භේදයක් ඇති කර, කොමියුනිස්ට් පක්ෂය වර්තමාන ශිෂ්‍ය සංහතියේ තිබෙන අසහනයට ප්‍රධාන හේතුවක් වශයෙන් පෙන්වා දෙන්න. එක්සත් ජාතික පක්ෂයේ උදවිය ඡන්දය බලාපොරොත්තුවෙන් කවදාවත්ම වැඩ කරන්නේ නැති බවත්, හැම වෙලාවේම වැඩ කරන්නේ මේ රටේ යහපත සලකාගෙන පමණක්ම බවත් එතුමා කීවා. පෞද්ගලික වශයෙන් ඒ උදවියගේ අතීතය ඒ තරම් මිහිරි එකක් නොවෙයි. එය අවුස්සන්ටත් මා කැමති නැහැ. එහෙත් මට මේවා කියන්නට සිදු වීම ගැන කරුණාකර සමා වන්න. වර්තමාන අධ්‍යාපන ඇමතිතුමා මීට අවුරුදු 10 කට පමණ පෙර එක්සත් ජාතික පක්ෂය ගැන කියූ දේවල් අමතක කොට, එක්සත් ජාතික පක්ෂය ප්‍රජාතන්ත්‍රවාදී සංස්ථාවක් වශයෙන් හඳුන්වන්නට දැන් උත්සාහ කිරීම කණගාටුවට කාරණයක්. අධ්‍යාපන ඇමතිතුමා වාගේම තම දේශපාලන අතීතය උකස් කර, අමතක කර, එක්සත් ජාතික පක්ෂයේ ඇමති පදවි ලබා ගැනීම සඳහා වර්තමාන ඇමති මණ්ඩලයට ඇතුළු වුණු තවත් කීප දෙනකු ඉන්නා බව හැබැයි. නමුත් විශේෂයෙන්ම ගරු අධ්‍යාපන ඇමති අයි. එම්. ආර්. ඒ. ඊරියගොල්ල මහත්මයා එක්සත් ජාතික පක්ෂයේ ශුද්ධවන්ත භාවය ගැන මේ විධියට කථා කිරීම පිළිබඳව අප කණගාටු වන්නට ඕනෑ. උන්නැහේ දැන් ආසනයේ නැහැ. ආ වෙලාවක උන්නැහේට පෙන්වන්නට මා ඔබතුමා වෙත පත්‍රයක් එවනවා. 1968 සැප්තැම්බර් 26 වැනිදා පළ වූ "සිරිලක" පත්‍රයේ ඡායාරූපයක් හැටියට පළ වී ඇති ලිපියක් තිබෙනවා. ඒ ලිපියෙන් වාක්‍යයක් පමණක් මම කියවන්නම්. වඩා වැදගත් වන්නේ එහි පළ වී තිබෙන දේ නොවෙයි, එය ලිව්වේ කාගේ අත් අකුරෙන්ද යන්නයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමති ගරු අයි. එම්. ආර්. ඒ. ඊරියගොල්ල කෙරෙහි

"ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් ගෙන යම සඳහා අපේ දූ දරුවන්ගේ අනාගත නිදහස ආරක්ෂා කිරීම සඳහා, එක්සත් ජාතික පක්ෂය පැරදවීමට මහජන එක්සත් පෙරමුණට ඡන්දය දෙන්න.'

ඊරියගොල්ල මහත්මයාගේ අත් අකුරෙන්මයි, එය ලියා තිබෙන්නේ. ගරු ඊරියගොල්ල ඇමතිතුමා වගේම, කට ඇරි යොත් කට ඇතුළේ කකුල දා ගන්න දේශපාලනඥයෙක් 1956 ට පෙර මේ රටේ හිටියා. ඒ දේශපාලනඥයා නම්, තාමුන් නාන්සේලාගේ හිටපු අගමැතිවරයකු වන සර් ජෝන් කොතලාවල මහත්මයයි. ඒ ඒ දේශපාලන යුගවලදී, දේශපාලන අහසේ පායන ඒ විධියේ දේශපාලන වල්ගා තරු තිබෙනවා. දේශපාලන විපර්යාසයක් ඇති වන්නට පෙර ඒ විධියේ වල්ගා තරු පායනවා. හිටපු අගමැති කොතලාවල මහතා ගිය ගිය තැන්වලදී කොයි තරම් ජනප්‍රසාදයට ලක් වුණාද යන්න තාමුන් නාන්සේලා දන්නවා. එතුමාගේ පින් තූරය සිනමා ශාලාවක සිනමා තිරයේ පෙනුණු හැම විටම හැම තැනින්ම අප් පුඩි හඬ නැගෙනවා, තවත් එකා හඬනුත් සමග. ඒ වගේම අද තමුන්නාන්සේලා ගේ අධ්‍යාපන ඇමති ඊරියගොල්ල මහතාත් කොතැනකට ගියත් ඒ විධියට ජනප්‍රසාදයට ලක් වෙනවා. එතුමාගේ ඡායාරූපය සිනමා ශාලාවක සිනමා තිරයේ දකින්නට තවම එතුමාට භාග්‍යය ලැබී නැහැ. ජීවමාන ඊරියගොල්ල මහත්මයා කොතැනක ගියත්, 1956 ට පෙර කොතලා වල මහත්මයාට ලැබුණු ගෞරවය, ජන ප්‍රසාදය, ජනාදරය, ප්‍රශංසාව හැම වයසෙම හැම දෙනාගෙන්ම එතුමාට අද ඒ ස්වර යෙන්ම ලැබෙනවා.

ගරු කථානායකතුමනි, මේ යුගයේ අපට ලැබුණු අගය කළ නොහැකි අපේ ගරු අධ්‍යාපන ඇමතිතුමාගේ අතීත කථාවින් ගෙන් එකක් පමණක් ගෙන හැර දක්වා, මේ යෝජනාවේ සඳහන් වන කාරුණු රාශි යෙන් එකක් හෝ දෙකක් ගැන සවිස් තරව කරුණු දක්වීමට මා ඔබතුමාගේ අව සරය පතනවා. ගරු අගමැතිතුමාත් නැහැ, ගරු අධ්‍යාපන ඇමතිතුමත් නැහැ.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
උප ඇමතිතුමා ඉන්නවා.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)
නමුත් මෙය උප ඇමතිතුමා පිළිබඳ ප්‍රශ්නයක් නොවෙයි. විත්තිකරුවකු වෙනු වෙන් ඔහුගේ දෙවැනියාට පෙනී සිටින් නට බැරි බව ඔබතුමාත් දන්නවා.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
මේක උසාවියක් නොවෙයි.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)
මහජනයා විසින් පත් කරන ලද උසස් තම උසාවිය මෙයයි. මහජන මතය විසින් අද සවසට විසඳන්නට යන්නේ මොහු වැරදිකාරයාද, නැද්ද, යන්නයි. නමුත් එක්සත් ජාතික පක්ෂයේ පක්ෂ යන් ත්‍රය මේ නඩු තීන්දුවේ නිවැරදි නිගමන යට එන්නට ඉඩ දෙන්නෙ නැහැ. ඒයට හේතුව කුමක්ද කියා පෙන්වන්නට මම තවත් පත්‍රයක් එතුමාට යවන්නම්. 1968 සැප්තැම්බර් 28 වැනිදා මුල් පිටුවේ මෙහෙම තිබෙනවා :

"*Media of instruction : Tamil. Sinhala Green light given for Tamil University—F.P.*

Mr. A. Amirthalingam, General Secretary of the Federal Party, claimed yesterday that before the Party withdrew from the Government, it had secured an assurance from the Prime Minister, Mr. Dudley Senanayake, and the Minister of Education, Mr. I. M. R. A. Iriyagolle, that a Tamil university would be established at Trincomalee."

මෙන්න මේ ප්‍රතිඥාව තමයි මහජන මතය විසින් පත් කරන ලද මේ ශ්‍රේෂ්ඨ තම අධිකරණයෙන් අද සැන්දෑවට ලැබෙන්නට යන තීන්දුවට හරස්ව තිබෙන්නෙ. ත්‍රිකුණාමලේ දෙමළ විශ්ව විද්‍යාලයක් පිහිටුවන්නට යනවාය කියා වර්තමාන ආණ්ඩුව විසින් දෙමළ රාජ්‍ය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රින්ස් ගුණසේකර මයා.]

පක්ෂයට දී තිබෙන මෙන්න මේ ප්‍රතිඥාව අනුව අද සැන්දෑවට දෙමළ රාජ්‍ය පක්ෂයේ ඡන්ද අධ්‍යාපන ඇමතිතුමාට ලැබෙන වාය කියන එකයි දැන් පැතිර පවත්නා රාවය. තව පැය තුනක් ඇතුළත දී අපට ඒ රාවයේ සත්‍යාසත්‍ය භාවය දැනගන්නට පුළුවන් වෙනවා. ඒ නඩු තීන්දුවට ලක් වන, නඩු විභාගයට පාත්‍ර වී සිටින විත්තිකරු වන අධ්‍යාපන ඇමතිතුමා මීට මාස දහයකට පමණ පෙර තමන් ගැනම මෙසේ කියා තිබෙනවා.. ජාතියේ පෙර පිනක් නිසා අපට ලැබුණු අධ්‍යාපන ඇමතිවරයකු හැටියට තමන්ම හඳුන්වාගත් ඊරියගොල්ල අධ්‍යාපන ඇමතිතුමා එදා කියා සිටියේ කුමක්ද? "මෙකල ඇමතිකම ලැබුණේ පෙර කළ පව් පල දීමෙන්ලු." මෙවැනි පව්කාරයකු අපේ රටේ අධ්‍යාපන ඇමති පදවියට පත් වීමට රටවැසියා නැත් නම් ජාතිය කළ පව්කාරකම කුමක්ද යන ප්‍රශ්නයයි මා නගන්නෙ. අගමැතිතුමා හැටියට ඕනෑම පව්කාරයකු තමන්ගේ ඇමති මණ්ඩලයට පත් කර ගැනීමට අගමැතිතුමාට අයිතියක් තිබෙනවා. නමුත් මේ රටේ අහිංසක ශිෂ්‍යශිෂ්‍යාවන්ට ගරහන, ඔවුන්ට ආදරයෙන් අධ්‍යාපනය දෙන ගුරුවර න්ට ගරහන, උසස් අධ්‍යාපන ආයතනවලට යන බුද්ධිමත් සිසු දරුවන්ට නොඉවසිය හැකි විධියට බණින, අවලාදවලින් චෝදනා කරන, ඒ සිසු දරු ඇරිවියන් රැක බලාගන්න විශ්ව විද්‍යාලවල ගුරු පරපුරට ඊටත් වඩා නින්දිත විධියට අවමන් කරන අමාත්‍යාංශයේ තමන්ට හමු වන සෑම තරාතිරකම සෑම දෙනාටම එකසේ අවමන් කරන අධ්‍යාපන ඇමතිවරයකු ලැබීමට තරම් මේ ජාතිය මොන පවක් කර තිබෙනවාද?

ගරු කථානායකතුමනි, බටහිර ලේඛකයකු නැත්නම් චින්තකයකු කියා තිබෙන දෙයක් මට මේ අවස්ථාවේදී මතක් වෙනවා. සෑම රටකටම ලැබෙන්නේ තමන්ට ගැළපෙන දේශපාලනඥයින් වන පාලකයින්ය කියා ඔහු ප්‍රකාශයක් කර තිබෙනවා. පොදුවේ රටක් දෙස බැලුවොත් එය පිළිගත හැකි ප්‍රකාශයක් වුවද අපේ මේ අධ්‍යාපන ඇමතිතුමා දෙස බැලුවොත් නම් අපට ඒ ප්‍රකාශය පිළිගන්නට බැහැ. අපේ රටට මෙවැනි අධ්‍යාපන ඇමතිවරයකු ලැබීමට තරම් අපේ රට වරදක් කර තිබෙනවාද කියා මට නම් සිතා ගන්නට බැහැ. අවුරුදු තුනහමාරක් තිස්සේ මේ රටේ අධ්‍යාපන කටයුතුවල නිරත වන සෑම දෙනාම කොයි තරම් සිත් වේදනාවකින්ද මේ අධ්‍යාපන ඇමතිතුමාගේ කයිකතන්දරවලට ඇහුම්කන් දීගෙන සිටියෙ. එබඳු තත්ත්වයකට තවත් මුහුණ දෙන්නට බැරි තරම්, තවත් ඉවසන්නට බැරි තරම් කණගාටුදායක තැනකටයි මේ රටේ අධ්‍යාපන පරිසරය දැන් එළඹ තිබෙන්නෙ. පාඨශාලාවකට ගියොත් ගුරුවරුන් ගත් කටටම කියන්නේ පසුගිය අවුරුදු කීපය තුළ ඔවුන්ට විඳින්නට වූ ගැහැට ගැනයි. විශ්ව විද්‍යාලයකට ගියොත් ආචාර්ය මණ්ඩලය නමවත් සඳහන් කරන්නට කැමති බවක් පෙනෙන්නේ නැහැ. විශ්ව විද්‍යාලයීය ශිෂ්‍යයන් අතරට ගියොත් අපට පෙනෙන්නේ කුමක්ද? මේ දුර්දාන්ත පාලන යුගයේ වූ අවැඩ නිසා, විඳින්නට බැරි තරම් දුක් ගැහැටවලට ඔවුන්ට මුහුණ පාන්නට වූ නිසා, ඔවුන්ට තමන්ගේ ශරීරයේ නහරවල දුවන ලේවලින් අත්සන් කිරීමෙන් මේ ක්‍රියා මාර්ගයට විරුද්ධත්වය දක්වන්නට සිද්ධ වුණා. ගරු ඇමතිතුමා නම් ගත් කටටම කියනවා, ඔය අත්සන් කරන ලේ මිනිස් ලේ නොවේය, හරක් ලේ ය කියා. විශ්ව විද්‍යාල ශිෂ්‍යයන්ටත්, අධ්‍යාපන කටයුතුවල නිරතව සිටින වෙනත් පිරිස්වලටත් ඒ තරම් නොසරුප් විදියට සලකන කනගාටුදායක යුගයක් තමයි, 1965 සිට අද දක්වා පවතින යුගය. විශ්ව විද්‍යාලවල පවත්නා අසහනයට ප්‍රධාන හේතුව කොහේදෝ බලවේගයක් විසින් පුහුණු කරවන ලද ශිෂ්‍යයන් 100ක් හෝ 200 ක් බව කියමින් ගරු අධ්‍යාපන ඇමතිතුමා මේ ප්‍රශ්නයෙන් පැන දුවන්නට උත්සාහ කිරීම අපේ කනගාටුවට හේතුවක්. විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් පමණක් නොවෙයි, විශ්ව විද්‍යාලවල ගුරුවරුන් පමණක් නොවෙයි, පාඨශාලාවල ගුරුවරුන් පමණක් නොවෙයි එතුමාගේ මේ වාගේ ප්‍රහාරයට ලක්වී තිබෙන්නේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මෑතකදී අභ්‍යාස විද්‍යාල ගුරු සංහතියම එතුමාගේ මේ දරුණු වාග් ප්‍රහාරයට ලක් වුණා. පසුගියදා පැවති විවාදයකදී පාර්ලිමේන්තුවේදීම මේ ද්විතීයික පුහුණු ගුරු සංගමය පිළිබඳව සඳහනක් කරමින් එතුමා නොකියා කිව්ව, ඒ සංගමයේ හැම සාමාජිකයකුම වගේ හොරුන්ය, තක්කඩින්ය කියා. කවුරුන් දෙන උපදෙස් අනුව, කාවුරුන් සපයන තොරතුරු අනුව මේ විධියට එක එක්කෙනාගේ ඇඟට කඩා පණිනවාදැයි ටිකක් සොයා බලන්න ඕනෑ. මේ ද්විතීයික පුහුණු ගුරු සංගමයේ නිලධාරීන් පත් කර ගැනීම පසුගියදා පැවැත් වුණා. ඒ අවස්ථාවේදී එක් දහස් අටසිය ගණනක් ඡන්දය දුන් බවත් සංගමයේ මුළු සාමාජික සංඛ්‍යාව එක් දහස් එකසිය ගණනක් බවත් කියමින් සාමාජිකයන් එක් දහස් එක සිය ගණනක් සිටින සංස්ථාවක එක් දහස් අට සිය ගණනක් ඡන්දය දෙන්නේ කොහොමදැයි ප්‍රශ්න කරමින් බරපතල චෝදනාවක් නැගුවා. ඒ අන්දමට ඒ සංගමය හොරුන්ගෙන් හා තක්කඩියන්ගෙන් පිරුණු සංගමයක් වශයෙන් හඳුන්වා දුන්නා. එහෙත් සත්‍යය වාර්තාගත විය යුතු නිසාම ඒ සම්බන්ධයෙන් මේ කාරණය ඉදිරිපත් කරනවා. ඒ සංගමයට නිලධාරීන් පත් කර ගැනීමේ වාර්ෂික රැස්වීම පැවැත්වුණේ 1968 ජූනි 30 වැනිදායි. එදින වන විට ද්විතීයික පුහුණු ගුරු සංගමයේ හිටපු සාමාජික සංඛ්‍යාව 5480 ක් බව අධ්‍යාපන ඇමතිතුමා හැටියට අදත් එතුමාට සොයා දැන ගන්නට පුළුවන්.

ගරු කථානායකතුමනි, අධ්‍යාපන ඇමතිතුමාගේ වාග් ප්‍රහාරයට අළුතෙන්ම ලක් වූ පිරිස මේ රටේ හැම පාඨශාලාවකම වගේ දකින්නට ලැබෙන සංවිධානයක් වන සමස්ත ලංකා බෞද්ධ ශිෂ්‍ය සමිති සම්මේලනයට අයත් සාමාජිකයන්. ගරු ඇමතිතුමාගේ නියෝගය පරිදි අද ඒ සංවිධානය දෙපාර්තමේන්තුවේ නරක නාමයට ලක් වී තහනම් කරනු ලැබූ සංවිධානයක් බවට පත් වී තිබෙනවා. පසුගිය දිනෙක මේ බෞද්ධ ශිෂ්‍ය සම්මේලනයට කරන වෙනස්කම් ගැන සඳහන් කළ අවස්ථාවේදී එක්තරා චක්‍ර ලේඛයක් යැව් බව සැබෑය. එහෙත් ඒ මගින් බෞද්ධ ශිෂ්‍ය සමිති සම්මේලනය ගැන සඳහන් කළේ නැත" යනුවෙන් ගරු ඇමතිතුමා විසින් කියන ලද බව තමුන්නාන්සේට මතක ඇතැයි මා සිතනවා. එතුමා එවැනි අදහසක් එම විවාදයේදී දුන්නා. එම චක්‍ර ලේඛය ඉදිරිපත් කරන නැඹි එදා එතුමා මට අභියෝග කළා. අද මට පුළුවන් වී තිබෙනවා එම චක්‍ර ලේඛයේ පිටපතක් සොයා ගන්නට. අධ්‍යාපන අමාත්‍යාංශය මගින් 1968 අගෝස්තු මස 16 වන දින අංක 94 සහිතව නිකුත් කරන ලද මෙම චක්‍ර ලේඛයට පසුව අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් මගින් සමස්ත ලංකා බෞද්ධ ශිෂ්‍ය සමිති සම්මේලනය සම්පූර්ණයෙන් තහනම් ආයතනයක් හැටියට සලකන්නට පටන් ගෙන තිබෙනවා. සමස්ත ලංකා බෞද්ධ ශිෂ්‍ය සමිති සම්මේලනය නීතිගත සංස්ථාවක් කරන හැටියට ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක් පසුගියදා පනත් කෙටුම්පතක් ඉදිරිපත් කළා. ආණ්ඩු පක්ෂයේ එක් මන්ත්‍රීවරයෙක් මෙම ආයතනය නීතිගත සංස්ථාවක් කරන්නට පනත් කෙටුම්පතක් ඉදිරිපත් කොට මුළු මන්ත්‍රී මණ්ඩලයේම සහයෝගය ලබා ගන්නා අතර මේ සාධාරණ සංස්කෘතික ඇමතිතුමා නවත් චක්‍ර ලේඛයක් නිකුත් කරනවා "මෙය කොමියුනිස්ට් සංවිධානයක්ය ; එම නිසා මෙය තහනම් කරන්න ; ඔවුන්ට කිසිම සහයෝගයක් දෙන්නට එපා " යනුවෙන්. මෙම චක්‍ර ලේඛය නිකුත් කිරීමෙන් පසු ඇති වී තිබෙන තත්ත්වයට අනුව විද්‍යාලයාධිපතිවරුන්ට සිදු වී තිබෙනවා, අපේ පාසලේ තිබෙන බෞද්ධ ශිෂ්‍ය සමිති ශාඛාවේ ලියාපදිංචිය අවලංගු කරන්නටය යනුවෙන් සඳහන් කොට බෞද්ධ ශිෂ්‍ය සමිති සම්මේලනයේ මහා මධ්‍යස්ථානයට ලියුම් යවන්නට. මෙම චක්‍ර ලේඛයට අනුව බෞද්ධ ශිෂ්‍ය සමිති සම්මේලනය හංවඩු ගසා තිබෙන්නේ දේශපාලන සංවිධානයක් හැටියටයි. එහි අන්තිමට මෙසේ කියා තිබෙනවා :

"...........එවැනි සමිතියක සාමාජිකත්වයෙන් වහාම අස්වන ලෙස පාසැල් සිසුනට උපදෙස් දිය යුතුයි."

එහි තවදුරටත් මෙසේද සඳහන් වෙනවා :

"පාසැලක සමිතියක් පිහිටවීම සඳහා බලය ලත් නිලධාරියා වන්නේ පාසැල් ප්‍රධානියායි. කෙසේ වුවද යම් කිසි බාහිර සංවිධානයක අනුග්‍රහය යටතේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රින්ස් ගුණසේකර මයා.]

පාසැලක සමිතියක් පිහිටුවීමට අදහස් කරන්නේ නම් පළමුවෙන් එවැනි සමිතියක් පිහිටුවීමට අදහස් කරන අය ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ /ප්‍රධාන අධ්‍යාපන නිලධාරීන්ගේ අනුමැතිය ලබා ගන්නා ලෙස එවැනි සංවිධානයන්ට දැනුම් දිය යුතුයි."

අද පිටිසර පාසලක ශිෂ්‍යයන් පිරිසක් තමන්ට කැමති සංවිධානයක් පිහිටුවා ගන්නට පෙර අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් සහ අධ්‍යාපන නිලධාරීන්ගෙන් අවසර ලබා ගතයුතුයි. මුන්නැහේලා තප්පු ගගහා උඩ පැන පැන දේශනා කරන ප්‍රජාතන්ත්‍ර වාදය මේකද? පිටිසරබද ස්කෝලයක සිටින තරුණ ශිෂ්‍ය ශිෂ්‍යාවන් ටිකකට ආගමික වශයෙන් වේවා, සංස්කෘතික වශයෙන් වේවා වෙනත් විෂයයක් පිළිබඳ ව වේවා තමන්ට කැමති කුඩා සංගමයක් පිහිටුවා ගන්නට වුවමනා වූ විට අධ්‍යාපන නිලධාරීන්ගෙන් සහ අධ්‍යාපන උපදේශකයන්ගෙන් අවසර ලබා ගන්නට වුවමනා නම් කුමක්ද මේ රටේ ශිෂ්‍ය සංහතියට ලැබී තිබෙන ප්‍රජාතන්ත්‍රවාදී නිදහස?

ගරු කථානායකතුමනි, මාත් පිටිසරබද ස්කෝලයකට ගිය කෙනෙක්. බ්‍රිතාන්‍ය යුගයේදීවත් මෙවැනි නීති රීති, මෙවැනි සීමාවන් සහ මෙවැනි බලපෑම් තිබුණේ නැහැ. සාහිත්‍යෝදය සමිතියක් වේවා වෙනත් සමිතියක් වේවා තමන්ට කැමති අන්දමින් සකස් කර ගැනීමට ඔවුන්ට අයිතියක් තිබෙන්නට ඕනෑ. ඇයි, එවැනි දේකටත් නිලධාරීන්ගේ අවසරය ලබා ගැනීම පිණිස ඔවුන් නිලධාරීන් කරා දණ ගාවන්නේ? මෙයින් පසු ඇති වූ තත්ත්වය කුමක්ද? මේ ඇමතිවරයාගේ බල කිරීමට අවනත වීමක් වශයෙන් විද්‍යාලයාධිපතිවරුන්ට සිදු වී තිබෙනවා ඉතා කනගාටුවෙන් නමුත් මේ බෞද්ධ ශිෂ්‍ය සමිති සම්මේලනයෙන් ඉල්ලා අස් වන්නට. බෞද්ධ ශිෂ්‍ය සමිති සම්මේලනයට එවැනි ලියුම් රාශියක් දැනටමත් ලැබී තිබෙනවා.

"ගරු ලේකම් මහතා,

සමස්ත ලංකා බෞද්ධ ශිෂ්‍ය සමිති සම්මේලනය,

බෞද්ධාලෝක මාවත,

කොළඹ 7.

අප විද්‍යාලයේ පිහිටුවා ඇති බෞද්ධ ශිෂ්‍ය සමිතිය සමස්ත ලංකා බෞද්ධ ශිෂ්‍ය සමිතියේ සාමාජික සමිතියක් වශයෙන් ලියාපදිංචි වී ඇත. අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය මඟින් නිකුත් කරන ලද චක්‍රලේඛය අංක 94 (1968 අගෝස්තු 16 වැනි දින දරන) අනුව අප සමිතිය සමස්ත ලංකා බෞද්ධ ශිෂ්‍ය සමිති සම්මේලනයේ සාමාජිකත්වයෙන් අස් කරන මෙන් ඉතා කණගාටුවෙන් ඉල්ලමි.

.....................

විදුහල්පති."

ගරු කථානායකතුමනි, මෙවැනි ලිපි දූන් බෞද්ධ ශිෂ්‍ය සමිති සම්මේලනයට ලැබෙන්නට පටන්ගෙන තිබෙනවා. මේ තත්ත්වය ගැන කරුණු අවබෝධ කර දීමට මේ තරම් යුක්තිගරුකය, මේ තරම් සාධාරණය, මේ තරම් පින්වත්ය කියන අපේ ගරු අධ්‍යාපන ඇමතිතුමා හමු වීමට ඒ ශිෂ්‍ය සමිතියේ නිලධාරි පිරිසක් උත්සාහ කළා. වරක් දෙවරක් නොවෙයි කීප වරක්ම උත්සාහ කළා. එහෙත් ඇමතිතුමා හා සම්මුඛ සාකච්ඡාවක් කිරීමට අවස්ථාවක් ඒ අයට ලබාගන්නට පුළුවන් වුණේ නැහැ. ඒ නිසා අන්තිමේදී ඒ බෞද්ධ ශිෂ්‍ය සමිති සම්මේලනය මේ ගැන තම විරුද්ධත්වය පළ කරමින් නියම තත්ත්වය මහජනයාට හෙළිකිරීම සඳහා සන්දේශයක් නිකුත් කර තිබෙනවා. එය පටන්ගෙන තිබෙන්නේ මෙන්න මෙහෙමයි:

"ගරු අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති අයි. ඇම්. ආර්. ඒ. ඊරියගොල්ල මැතිතුමා අප සම්මේලනය සම්බන්ධයෙන් නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේදී පවසනු ලැබූ කරුණු කිහිපයකට පිළිතුරු වශයෙන් පහත සඳහන් ප්‍රකාශය කිරීමට සිදු වී තිබේ. මේ පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා ගරු අධ්‍යාපන ඇමතිතුමා සමුවීමට සම්මේලනය හැකි ඉහළම අයුරින් උත්සාහ කළ මුත් ඇමතිතුමා හමුවීමට ඉඩ නොදෙන ලදින්, විශේෂයෙන් රටේ බෞද්ධ ජනතාව වෙත මෙසේ පුවත්පත් මඟින් ප්‍රකාශයක් කිරීමට අපට සිදුවූ බව මෙහිලා පළමුවෙන් සඳහන් කළ යුතුය."

ගරු කථානායකතුමනි, මේ විධියට කියාගෙන යන මේ සන්දේශයේ ගරු අධ්‍යාපන ඇමතිතුමාට කළ අභියෝගයකුත් තිබෙනවා. ඒ සන්දේශයේ මෙන්න මේ අන්දමේ අභියෝගයක් තිබෙනවා:

"සම්මේලනය තම රැස්වීම් මඟින් හෝ පුවත්පත් මඟින් හෝ වෙන ඕනෑම ලෙසකින් හෝ යම් දේශපාලන මතයක් පැතිරවීමට උත්සාහ ගත්තේ යයි කරුණු ඇතිව ඔප්පු කිරීමට ගරු අධ්‍යාපන ඇමතිතුමාට හැකි නම්, සම්මේලනයේ සියලම නිලධාරීන් තම පදවිවලින් ඉල්ලා අස් වී සම්මේලනය විසුරුවා හැරීමට සදානම්ය. ඇත්තෙන්ම අපට එවැනි බෞද්ධ ශිෂ්‍ය සම්මේලනයක් අවශ්‍ය නැත."

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මෙවැනි අභියෝගයක් කිරීමට තරම් බෞද්ධ ශිෂ්‍ය සමිති සම්මේලනය එඩිතර වී තිබෙනවා. එහෙත් එය පිළිගැනීමට අපේ අධ්‍යාපන ඇමතිතුමා අද ආසනේවත් නැහැ. ගරු අධ්‍යාපන ඇමතිතුමා එම සම්මේලනයේ නිලධාරී පිරිසට ඇමතිතුමා සමග සම්මුඛ සාකච්ඡාවකට අවස්ථාවක්වත් ලබා දුන්නේ නැහැ.

ගරු අධ්‍යාපන ඇමතිතුමා ගුරුවරුන් සිය ගණනක් රක්ෂාවෙන් අස් කර දැම්මා. විශ්ව විද්‍යාල හතරෙන් තුනක්ම මාස ගණනාවක් වසා දමා තිබුණා. තමන්ගෙ මතයට හිස නොනමන හැම දෙනාටම එක විධියට උභුලන්නට බැරි විධියේ භාෂාවෙන් බැන අධ්‍යාපනයට සම්බන්ධ හැම දෙනාගේම සිත් රිදෙන විධියට ක්‍රියා කරමින් සිටි අධ්‍යාපන ඇමතිතුමා අන්තිම වරට බෞද්ධ ශිෂ්‍ය සමිති සම්මේලනය අල්ලාගෙන ඔවුන්ට පහර දෙන්නට පටන් ගත්තා. මේ අනුව එක්තරා කරුණක් පැහැදිලි වේගෙන යනවා. අපේ ගරු අධ්‍යාපන ඇමතිතුමා මේ විධියට නොසරුප් අයුරින් හා අසංස්කෘතික අන්දමින් පසුගිය කාලයේදී ගෙනගිය මේ ක්‍රියා කලාපය නිසා මුළු අධ්‍යාපන ප්‍රණාලියේම එක්තරා පහත වැටීමක් සිදු වී තිබෙනවා පමණක් නොවෙයි සාමාන්‍ය බෞද්ධ සංවිධානයකුත් අලුත් විධියේ තර්ජනයකට ගොදුරු වී තිබෙනවා. මෙය අධ්‍යාපන ඇමතිතුමාගේ පිටුපසින් සිටගෙන ඔහුගේ පාලනය කළ නොහැකි වාග්චාතුර්යයෙන් ප්‍රයෝජන ගන්නා සමහර පිරිසක් විසින් මේ රටේ බෞද්ධ හා සිංහල ශිෂ්‍ය සංවිධානයකට පහරක් එල්ලකිරීමට තැත් කිරීමක ආරම්භයක්ද කියා මේ ශිෂ්‍ය සම්මේලනයට දැන් සැකයක් ඇති වී තිබෙනවා.

ගරු කථානායකතුමනි, පසුගිය කාලය තුළ අධ්‍යාපන කටයුතු විෂයයෙහි විශේෂයෙන්ම බෞද්ධ කටයුතු විෂයයෙහි, ශිෂ්‍ය සම්මේලනය මගින් කරන ලද සේවයන්ගෙන් කිහිපයක් මේ සන්දේශයට ඇතුළත් වෙනවා. ගරු අධ්‍යාපන ඇමතිතුමා තමන්ගෙ කථාවේදී තමන්ගෙ ඇඟ බේරා ගැනීමටදෝ, විශ්ව විද්‍යාල ශිෂ්‍යයන්ගේ චරිතය ගැනවත් විශ්ව විද්‍යාලවල මහාචාර්යවරුන්ගේ චරිතය ගැනවත් තමන් පොදුවේ කිසියම් චෝදනාවක් නොකළ බවක් කීවා. එහෙත් එබඳුම අහේතුක චෝදනා රාශියක් බෞද්ධ ශිෂ්‍ය සම්මේලනයේ සාමාජික සාමාජිකාවන් විෂයයෙහි එතුමා විසින් කර තිබෙනවා. ඒවාටත් සන්දේශයෙන් පිළිතුරු ලැබී තිබෙනවා. හැන්සාඩ් වාර්තාගත වීම සඳහාවත් මෙවැනි අව්‍යක්ත, අශ්ලීල ප්‍රකාශයන් ගරු අධ්‍යාපන ඇමතිතුමාගේ කටින් පිට වූවත්, ඒවා මේ ගරු මන්ත්‍රණ සභාවේදී කියවන්නට පවා මා නම් ඉදිරිපත් වන්නේ නැහැ. එහෙත් මෙබඳු කනගාටුදායක දුක්ඛදායක තත්ත්වයක් මේ රටේ අධ්‍යාපන කටයුතු විෂයයෙහි පැන නැගීමට ප්‍රධාන හේතුව වී තිබෙන්නේ අපේ මේ ගරු අධ්‍යාපන ඇමතිතුමායි.

ඉතා නුදුරු අතීතයේදී සිදු කරන ලද මේ පාඨශාලා ප්‍රතිසංවිධාන කටයුතු නීති විරෝධී නොවේයයි ඇඟ බේරාගෙන ප්‍රකාශ කොට, පිළිතුරු කථාවකටවත් ඇහුම්කන් නොදීම ගරු ඇමතිතුමා පැන ගියා. එහෙත් ගරු කථානායකතුමා වශයෙන් ඔබතුමා දන්නවා, පාඨශාලා ප්‍රතිසංවිධානය හා සම්බන්ධ වැදගත් යෝජනා අඩංගු පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුව ඉදිරියට පසුගිය වාරයේදී ඉදිරිපත් කර එය සාකච්ඡා කරන්නේවත් නැතිව මේ වාරයේදී එය න්‍යාය පත්‍රයට ඇතුළත් කරන්නේවත් නැතිව, ඒ කෙටුම්පත් පණතෙහි ඇතුළත් වූ යෝජනා රාශියක් දැනටමත් ක්‍රියාත්මක වී හමාර බව. එහෙම නම් මොකටද පනත් කෙටුම්පත් ? එහෙම නම් මොකටද පාර්ලිමේන්තුව ? කිසියම් නීතියක් සංශෝධනය කරන්නේ නැතිව දෙපාර්තමේන්තුවේ නියෝග මාර්ගයෙන් පමණක් මේ හැම එකක්ම කරන්නට පුළුවන් නම්, එදා ඒ පනත් කෙටුම්පත ඉදිරිපත් කෙළේ මොකටද ? එය විවාදයට ගන්නට පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කෙළේ මොකටද ? එය පාර්ලිමේන්තු කණ්ඩායමේ සාකච්ඡාවට භාජන කෙළේ කුමන කාරණයක් සඳහාද ? කෙටුම්පතක් හෝ නීතියක් හෝ අවශ්‍ය නැත්නම්, පරණ කොමිටියක තීරණ යථා පරිදි ක්‍රියාත්මක කරන්නට පමණක් එතුමා අදහස් කරනවා නම්, එබඳ නීතියක් ඉදිරිපත් කෙළේ මොකටද ? දැන් මේ විත්තිකාරයා අහු වෙලා තිබෙනවා. සාක්ෂි කූඩුවේදී සාක්ෂි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රින්ස් ගුණසේකර මයා.]

දීමේදී තමන්ගේ කට වරද්දා ගැනීමෙන් තමන්ගේ වරද ඔප්පු වන පරිදි සාක්ෂි දී තිබෙනවා.

මට නියමිත කාල සීමාව තුළදී එතුමා කළ නොපනත්කම් සියල්ලක්ම කියන්නට අවසරයක් නැහැ. ශිෂ්‍ය ගුරුවරුන් පත් කිරීමේදී සිදු වූ නොපනත්කම් රාශියක් ගැන මට සඳහන් කරන්නට තිබෙනවා. නම් ගම් ආදි තොරතුරු ඇතිව ඒවා ඉදිරිපත් කරන්නට මට පුළුවන්කම තිබෙනවා. මට ඒවා ඉදිරිපත් කරන්නට පුළුවනි. දැන් මා ළඟ ඒ ලැයිස්තු තිබෙනවා. ගුරුවරුන් මාරු කිරීමේදී විශේෂයෙන්ම මගේ පළාතේ ගුරුවරුන් පසුපස එළවා දේශපාලන වශයෙන් ඔවුන්ගෙන් පලිගන්නට වූ අවස්ථාවල් ගැන මට කියන්නට පුළුවනි. මා ළඟ දැන් ඒ සම්බන්ධයෙනුත් අවශ්‍ය ලැයිස්තු තිබෙනවා. එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිපත්ති මාලාවෙහි කියා තිබෙන්නේ දේශපාලන නිදහස ගුරුවරුන්ට දෙනවාය කියන එකයි. එහෙත් බලයට ආ හැටියේම විරුද්ධ පක්ෂයේ දේශපාලන මත දැරූ ගුරුවරුන් සිය ගණන් පසු පස එළවා ගොස් අද ඔවුන් මහ මඟට බස්සවා තිබෙනවා. මේ තරම් නොපනත්කම් කෙරුණු, අධ්‍යාපන කටයුතු විෂයයෙහි යෙදුණු අය නොසරුප් ලෙස මර්දනයට ලක් වුණු යුගයක් මීට පෙර නො තිබුණු නිසා, ගරු අධ්‍යාපන ඇමතිතුමා මේ කනගාටුදායක තත්ත්වයට කෙලින්ම වගකිව යුතුයි. ඒ නිසා මා මීට ඉස්සරවෙලා එතුමාගෙන් එක්තරා ඉල්ලීමක් කළා. ඉතිහාසගත වන විධියට එසේ කරන ලෙස මා එතුමාගෙන් ඉල්ලා සිටියා. මහජනයා විසින් බලහත්කාරයෙන් අධ්‍යාපන ඇමතිතුමා එම පදවියෙන් තල්ලුකර දමන්නට කලින්, යුක්තියත් සාධාරණත්වයත් මත කටයුතු කරන පුද්ගලයකු වශයෙන් සිය කැමැත්තෙන්ම එම පදවියෙන් ඉල්ලා අස් වන ලෙස මා එතුමාගෙන් ඉල්ලීමක් කළා. එහෙත්, එවැනි ඉල්ලීමක් කිරීම නිකම් විහිළුවට ලක් වුණා එම නිසා, වෙනත් කෙනකු විසින් කරන ලද යෝජනාවක් නිර්දේශ කරමින්, එය පිළිපදින ලෙස අධ්‍යාපන ඇමතිතුමාගෙනුත් එතුමාගේ කැබිනට් මණ්ඩලයේ නායකයාගෙනුත් ඉල්ලා සිටිමින් මගේ කථාව කෙළවර කරන්නට මා අදහස් කරනවා. මා මගේ කථාව ආරම්භ කෙළේ, තම අත් අකුරෙන්ම ලියන ලද එක්තරා ප්‍රකාශයක් අධ්‍යාපන ඇමතිතුමාට ඉදිරිපත් කරමිනුයි. අවුරුදු ගණනවාක් මුළුල්ලේ මේ රටේ සාමාන්‍ය ශීලාචාර මහජනතාව විඳින දුකින් ඔවුන් මුදවා මේ රට සුඛිත මුදිත කිරීමට නම්, අද හැන්දෑවේ "ජනතා" පත්තරයේ මුල් පිටුවේ තීරු තුනක් හරහා වැටී ඇති පහත සඳහන් යෝජනාව ක්‍රියාත්මක කරන ලෙස අධ්‍යාපන ඇමතිතුමාගෙනුත් අගමැති තුමාගෙනුත් මා ඉල්ලා සිටිනවා.

"හැට පැනපු අය එපා

මන්ත්‍රී ධුර සඳහා තරගයට තරුණ අයට ඉඩ සලසන්න මන්ත්‍රී ධුර සඳහා තරග කිරීමට හැට පැනපු අයට ඇති අවසරය නීතියෙන් තහනම් කරන ලෙස දේශ විමුක්ති සංවිධානය අගමැති ඩඩ්ලි සේනානායක මහතාගෙන් ඉල්ලා සිටී.

රට සංවර්ධනය කිරීමට තරුණ පරපුරට අවස්ථාව ලබා දීම සඳහා මෙම නීති රීති පැනවිය යුතු බව දේශ විමුක්ති සංවිධානය වැඩි දුරටත් කියා සිටී."

අවුරුදු ගණනක් තිස්සේ මේ රටේ අධ්‍යාපනය ලබන්නන්ට පමණක් නොව සෙසු ශීලාචාර බුද්ධිමත් හැම දෙනාටම ලොකු බරක් වී තිබෙන අධ්‍යාපන කරදරයෙන් මිදෙන්නට නම් මේ යෝජනාව ක්‍රියාත්මක කරන ලෙස මා ගරු අගමැති තුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ඒ. අමිර්තලිංගම් මයා.** (වඩුක්කොඩෙයි)

*(திரு. ஏ. அமிர்தலிங்கம்—வட்டுக் கோட்டை)*

(Mr. A. Amirthalingam—Vaddukkoddai)

கௌரவ சபாநாயகர் அவர்களே, கௌரவ ஹபருத்துவைப் பிரதிநிதி (திரு. பிறின்ஸ் குணசேக்கர) 'சன்' பத்திரிகையிலிருந்து, அந்தப் பத்திரிகைக்கு நான் விடுத்ததாகக் கூறும் ஒரு செய்தியை வாசித்துக் காட்டினர். அவர் அந்தப் பத்திரிகையைப் படித்த விதம், ஒரு பட்டிக்காட்டான் பத்திரிகை படித்த கதையைத்தான் எனக்கு நினைவூட்டுகின்றது. சிலர் பத்திரிகைகளை எடுத்தால் பத்திரிகைகளில் போட்டிருக்கும் செய்தித் தலைப்புக்களை மாத்திரம் படித்துவிட்டு திருப்தியடைந்து விடுகின்றனர். நான் நினைக்

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தேன், அரைகுறைப் படிப்புள்ளவர்கள்தாம் அப்படிச் செய்வார்கள் என்று. ஆனால், கௌரவ ஹபருதுவை பிரதிநிதிகூட அப் படித்தான் பத்திரிகைகளைப் படிக்கிறார் என்று அறியும் பொழுது, ஏன் இவர்கள் இவ்வளவு தலை கீழாக நடக்கிறார்கள் என்று எனக்கு விளங்கிக் கொள்ளக் கூடியதாக இருக்கின்றது. அவர் வாசித்த 'சன்' பத்திரிகையில், ஒரு தமிழ்ப் பல்கலைக்கழகம் அமைப்பதைக் கல்வி அமைச்சர் ஒப்புக்கொண்டிருக்கிறார் என்று தலையங்கத்தில் போட்டுவிட்டு, கீழே தமிழி லும் சிங்களத்திலும் இயங்கும் பல்கலைக் கழ கம் என்று போடப்பட்டிருக்கின்றது. கௌரவ ஹபருதுவைப் பிரதிநிதிக்கு கீழே சொல்லப் பட்டிருப்பவற்றை வாசிக்கும் பழக்கம் இல்லை போலிருக்கின்றது. தலையங்கத்தைப் படித்து விட்டு. தமது வேத புத்தகமாக அவர் 'சன்' பத்திரிகையையும் 'ஜனதா' பத்திரிகையை யும் கொள்கிறார்போல் எனக்குத் தோற்று கின்றது.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
**(Mr. Prins Gunasekera)**

அப்படி ஒன்றுமில்லை.

**අමිර්තලිංගම් මයා.**
*(திரு. அமிர்தலிங்கம்)*
**(Mr. Amirthalingam)**

மூளையிலே ஒன்றுமில்லை. அதுதான் இருக் கின்ற பிழை. அவர் இனிமேலாவது இந்த அறிவற்ற வகையில் நடப்பதைவிட்டு, பத் திரிகைகளில் வருகின்ற உண்மையான செய்தி களுக்கும் பிழையான செய்திகளுக்கும் இடை யில் இருக்கின்ற வித்தியாசத்தைத் தெரிந்து, அவற்றில் சரியானவற்றைக் கண்டுபிடித்துக் கொள்ளத் தம்மைப் பயிற்றுவித்துக் கொள் வார் என்று நான் எதிர்பார்க்கிறேன்.

'சன்' பத்திரிகைக்கோ, அல்லது வேறு எந் தப் பத்திரிகைக்கோ இப்படியான ஓர் அறிக் கையை நான் விட்டது கிடையாது. யாரோ ஒரு நிருபருடைய கற்பனையில் உதித்த செய் தியை வைத்துக் கொண்டு முதல் பக்கத்தில் கொட்டை எழுத்துக்களில் போட்டு, அடுத்த நாள் அதற்கு ஒரு மறுப்பையும் இன்னொரு வரிடம் பெற்றுப் போட்டு, அதையிட்டு ஓர் ஆசிரிய தலையங்கத்தையும் எழுதி, இந்த நாட் டிலே இனத் துவேஷத்தை வளர்ப்பதையே தொழிலாகக் கொண்டு இந்த 'சன்' பத்திரி கையும் அதன் குழுவைச் சேர்ந்த பத்திரி கைகளும் நடந்து வருவதை இந்தச் சந்தர்ப் பத்தில் நான் இந்த கௌரவ சபையிலே கண் டிக்கக் கடமைப்பட்டவனாக இருக்கின்றேன்.

நான் முன்னர் ஒரு சந்தர்ப்பத்தில் அதைப் பற்றிக் குறிப்பிட்டிருக்கிறேன். இதே கோஷ்டி யைச் சேர்ந்த 'தினபதி' பத்திரிகையிலே தமிழில் போடுவது ஒன்று; 'சன்' பத்திரிகை யிலே ஆங்கிலத்தில் போடுவது இன்னொன்று. சிங்களப் பத்திரிகையான 'தவச'விலே போடுவது வேறொன்று. மக்களைத் தவறான வழியிலே நடத்தி, அவர்கள் மத்தியில் இனத் துவேஷத்தை வளர்க்கும் வழியிலே நடக்கும் இந்தப் பத்திரிகைகளை ஒரு வழக்கறிஞராக இருக்கும் கௌரவ ஹபருதுவைப் பிரதிநிதி நம்பி, அவைதாம் தமது வேதம் என்று எடுத் துக் கூற முற்படுவதை அவர் இனிமேலாவது விட்டொழிப்பார் என்று நினைக்கின்றேன்.

இந்த நாட்டிலே கல்வியிலே அதிக கவனம் செலுத்தும் ஒரு சமுதாயத்தின் பிரதிநிதி யாக நான் இங்கு இருக்கிறேன். மற்ற எவரி லும் பார்க்க தங்கள் பிள்ளைகளுக்குக் கல்வி யூட்டுவதில் கூடிய அக்கறை கொண்ட மக் கள் இலங்கையில் வட பகுதியில்தான் இருக் கிறார்கள் என்பதை இந்த நாட்டில் உள்ள வர்கள் எல்லோரும் ஒப்புக் கொள்வார்கள். இந்த நாட்டில் இன்று கல்வி இருக்கிற நிலைமை திருப்திகரமானதாக இல்லை என் பதை எவரும் மறுக்க முடியாது. உயர்தரக் கல்வி என்றால் என்ன, பாடசாலைக் கல்வி என்றால் என்ன, எவ்வளவோ சிக்கல்களின் மத்தியில், எவ்வளவோ குழப்பங்களுக்கிடை யில் நாம் இன்று தத்தளித்துக் கொண்டிருக் கின்றோம் என்பதை எவரும் மறுக்க மாட் டார்கள். ஆனால், அதற்குப் பொறுப்பு, கடந்த மூன்றரை ஆண்டுகளாக இந்தப் பதவியை வகித்து வரும் இன்றைய கல்வி அமைச் சர்தானா என்பதைத்தான் நாம் சிந்திக்க வேண்டும்.

1960 ஆம் ஆண்டு இந்த நாட்டில் பாட சாலைகளை அரசாங்கம் பொறுப்பேற்க வேண் டும் என்ற கொள்கையை கைக்கொள்ளத் தொடங்கியதிலிருந்துதான் கல்வியில் இந்

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අමිර්තලිංගම් මයා.]

தப் பெரிய குழப்பம் ஏற்பட ஆரம்பித்தது. அன்று ஏற்பட்ட குழப்பத்திலிருந்து இன்னமும் நாடு விடுபடவில்லை. அதை விடுபடச் செய்வதற்கு எத்தனையோ நடவடிக்கைகளை கல்வி இலாகா மேற்கொள்ள வேண்டியதாக இருக்கிறது. உதாரணமாக, சிறந்த முறையில் நன்றாக நிர்வகிக்கப்பட்டு வந்த பல உதவி நன்கொடை பெறும் பாடசாலைகளை அரசாங்கம் பொறுப்பேற்று அங்கிருந்த அதிபர்களையும் ஆசிரியர்களையும் நினைத்த விதமாக மாற்றி அந்தப் பாடசாலைகள் பலவற்றைச் சீர்குலைத்திருப்பதை யாழ்ப்பாணத்தில் நன்றாகக் காணக்கூடியதாக இருக்கிறது. இது 1965 ஆம் ஆண்டுக்குப் பின் நடந்தது அல்ல. 1960 ஆம் ஆண்டு தொடக்கம் இது நடைபெற்று வருகிறது.

பாடசாலைகளின் தரத்தைக் குறைத்துச் சீர்குலைக்கும் செயலைப் பற்றி நான் இந்தச் சபையிலே பலமுறை குறிப்பிட்டிருக்கிறேன். இன்று இந்த நாட்டிலே கல்வி சீர்கேடு அடைந்திருக்கிறது என்றால் அதற்குக் காரணம் சரியான ஒரு திட்டமில்லாமல், சரியான ஒரு முன்யோசனை இல்லாமல், ஏற்கெனவே ஒரு நூற்றாண்டுக்கு மேலாக நடைமுறையிலிருந்து வந்த கல்வி முறையைக் குழப்பியடித்த முன்னைய அரசாங்கத்தினுடைய செயல்கள்தான் என்பதை இந்தச் சபையிலே நான் எடுத்துக் கூறக் கடமைப்பட்டிருக்கிறேன். அன்று கடைப்பிடித்த அதே கொள்கையை இன்றும் கடைப்பிடிக்கும் பல உத்தியோகத்தர்கள் இன்றும் கல்வி இலாகாவில் இருக்கிறார்கள். அவர்களது செயல்களினால் ஏற்படும் நிலைமையை நிவர்த்தி செய்ய எத்தகைய நடவடிக்கையும் எடுக்கப்படவில்லை.

இப்பொழுது உயர்கல்வி கற்கும்—சர்வகலாசாலைக் கல்வியைச் சொல்லவில்லை—மாணவர்களது எண்ணிக்கை பாடசாலைகளில் கூடிக் கொண்டு வருகிறது. இன்று மாணவனைக் கல்விபெற வேண்டுமென்றே விரும்புகிறார்கள். பெற்றோரும் தங்கள் பிள்ளைகள் விஞ்ஞானக்கல்வி பெறவேண்டுமென்றே விரும்புகிறார்கள். விஞ்ஞானக் கல்வி பெறுவதாக இருந்தால் அதற்கேற்ற விஞ்ஞான ஆய்கூடங்கள் முதலியன இன்னும் அநேகம் அமைக்கப்பட வேண்டும். ஆனால், கல்வித் திணைக்களத்தில் விஞ்ஞானக் கல்விக்குப் பொறுப்பாக இருக்கும் பகுதியில் புதிய விஞ்ஞான ஆய்கூடங்கள் அமைப்பதற்குப் பல தடைகளைப் போட்டுக்கொண்டு வருகிறார்கள். உயர்தர விஞ்ஞான வகுப்புக்களை பாடசாலைகளில் அமைப்பதற்கு பல தடைகள் போட்டுக் கொண்டு வருகிறார்கள். இதனால் ஒரு புறத்தில் பெற்றோர் அதிருப்தியடைகிறார்கள்.

கௌரவ தம்பதெனிய பிரதிநிதி (திரு. ஆர். ஜீ. சேனநாயக்க) போன்றவர்கள் இந்தச் சபையிலே பேசும்பொழுதெல்லாம் உயர்தர விஞ்ஞானப் பரீட்சைகளில் தமிழ் மாணவர்கள் அதிகமாகச் சித்தியடைகிறார்கள் என்று குற்றஞ்சாட்டுவதை நாங்கள் பல தடவைகள் கேட்டிருக்கிறோம். ஏற்கெனவே உதவி நன்கொடை பெற்ற பாடசாலைகள் அவ்வப் பகுதிகளிலுள்ள மக்களினதும் பெற்றோர்களினதும் உதவிகளால் தேடிக் கொண்ட வசதிகளைப் பயன்படுத்தி சிறந்த விஞ்ஞான ஆய்கூட வசதியுடன் இயங்கிவரும் காரணத்தால் அப் பாடசாலைகளில் கல்வி கற்கும் மாணவர்கள் உயர்பரீட்சைகளில்—விஞ்ஞானப் பரீட்சைகளில்—சித்தியடையக் கூடியதாக இருக்கிறது. தவிர கௌரவ தம்பதெனிய பிரதிநிதி போன்றவர்களோ அல்லது இந்த நாட்டிலே வகுப்புத் துவேஷத்தைக் கிளப்பும் வேறு யாருமோ ஒரு விஞ்ஞான ஆய் கூடத்தை நிறுவுவதற்கு அப்பாடசாலைகளுக்கு ஒரு சதமேனும் கொடுத்தது கிடையாது.

துரதிஷ்டவசமாக கல்வித் திணைக்களத்தில் சில உத்தியோகத்தர் மத்தியில் கௌரவ தம்பதெனிய பிரதிநிதி, கௌரவ ஹபருதுவ பிரதிநிதி போன்றவர்களுடைய மனப்பான்மை புகுந்து விட்டது. விஞ்ஞானக் கல்வி தமிழ்ப் பிள்ளைகளுக்குக் கிடைக்கப் போதிய வசதியிருக்கிறது. ஆனபடியால் இனிக் கொடுக்கத் தேவையில்லை என்ற மனப்பான்மை உத்தியோகத்தர்கள் சிலரிடம் இருக்கக் காண்கிறோம். அது தவறு. நாடு முழுவதும் விஞ்ஞானக் கல்வி வளர வேண்டும். விஞ்ஞானக் கல்வி வளர வேண்டுமென்றால் ஒரு சிறிது முன்னேறி விட்டவர்களைப் பிடித்து நிறுத்திப் பின்தங்கச் செய்வது அல்ல. பின் தங்கி இருப்பவர்களை இத்துறையில் முன்னேறச் செய்ய வேண்டும். இந்த நாட்டில் விஞ்ஞானக் கல்வியில் ஒரு பகுதியினர் மாத்திரமன்றி எல்லோருமே முன்னேற

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

வேண்டும். அப்படிச் செய்வதில்தான் எமது சுபிட்சம் தங்கி இருக்கின்றது. இதைத்தான் இந்தச் சபையில் நான் மிகத் தெளிவாகக் கூறிவைக்க விரும்புகிறேன். தற்போதைய கல்வி அமைச்சர் அவர்கள் சில துறைகளில் இவற்றை நிவர்த்தி செய்ய முயன்று வருகின்றார்கள்.

உதாரணமாக, சமீபத்தில் நடத்திமுடிக்கப் பட்ட ஆசிரியர் இடமாற்றத் திட்டம் பாரபட்சமற்ற முறையில் அமைந்து இருக்கின்றது. பாடசாலைகளின் தேவைக்கு ஏற்றமுறையில் ஆசிரியர் இடமாற்றத் திட்டத்தைக் கௌரவ கல்வி அமைச்சர் கையாண்டிருக்கிறார் என்பதை நான் இங்கு கூற விரும்புகிறேன். விசேடமாக மலைநாட்டுப் பகுதிகளிலுள்ள பல தமிழ்ப் பாடசாலைகளில் ஆசிரியர் பற்றாக்குறை இருந்தது. இந்த ஆண்டில் கல்வி அமைச்சர் ஆசிரியர் தராதரப்பத்திரம் பெற்ற ஆசிரியர்களுக்கு தோட்டப்பகுதி அரசாங்க பாடசாலைகளில் நியமனம் கொடுத்திருக்கிறார். தோட்டப் பகுதிப் பாடசாலைகளில் நிலவிய ஆசிரியர் பற்றாக்குறையை ஓரளவாவது நிவர்த்தி செய்தது கல்வி அமைச்சர் அவர்களுடைய ஒரு நல்ல செயல் என்று கூற விரும்புகிறேன். கடந்த காலத்தில் நடைபெற்றதுபோல் கட்சிபேதம் பார்த்து இடமாற்றங்களைச் செய்யாமல் கொள்கை அளவில் இடமாற்றங்களை நடத்தி இருக்கிறார் கௌரவ அமைச்சர். இதற்காக அமைச்சர் அவர்களுக்கும் இதற்குப் பொறுப்பான அதிகாரிகளுக்கும் நாங்கள் பாராட்டுத் தெரிவிக்கக் கடமைப்பட்டிருக்கிறோம்.

மாணவ ஆசிரியர் தெரிவுகளும் பாரபட்சமற்றமுறையில் நடைபெற்றிருக்கின்றன. ஆனால் தெரிவுசெய்யப்பெற்ற மாணவ ஆசிரியர்களின் எண்ணிக்கை போதாது என்ற ஒரு குறையைத் தவிர இவ்விடயத்தில் வேறு எவ்வித குறைகளுக்கும் கல்வி அமைச்சர் அவர்கள் இடமளிக்கவில்லை.

இன்று எல்லாப் பகுதிகளிலும் ஆசிரியர் பற்றாக் குறை இருக்கின்றது. ஆசிரியர்கள் தொகை அதிகமாக உள்ளபகுதியாகக் கருதப்படும் யாழ்ப்பாணப் பகுதியிற்கூட ஆசிரியர் பற்றாக் குறை இருக்கின்றது. எத்தனையோ கல்லூரிகளில் நிரந்தர அதிபர்கள் இல்லை. பல கல்லூரிகளில் பதில் அதிபர்கள்தான் கடமையாற்றுகிறார்கள். இந்த ஆண்டுகூட சில அதிபர்கள் நியமிக்கப்பட்டார்கள். பலகாலமாக இருந்து வந்த குறைபாட்டை நிவர்த்தி செய்யவே கல்வி அமைச்சர் சில நியமனங்களைச் செய்தார். ஆனால் இவ்விதம் செய்யப்பட்ட நியமனங்கள் அறவே போதாது. பல பாடசாலைகளுக்கு அதிபரோ தலைமை ஆசிரியரோ உரிய முறையில் இல்லாமல் இருக்கும் குறையும் இந்த நாட்டின் கல்விச் சீர்கேடுகளில் ஒன்று.

அடுத்ததாக உயர்தரக் கல்வியைப் பற்றி நான் இரண்டொரு வார்த்தைகள் குறிப்பிட விரும்புகிறேன். சென்ற சில ஆண்டுகளில் முன் ஒருபோதும் இல்லாத வகையில் பல்கலைக்கழகக் கல்வியை நாடும் மாணவர் எண்ணிக்கை அதிகரித்து இருக்கிறது. அதற்கேற்ப பல்கலைக்கழக வசதிகள் விஸ்தரிக்கப் படவில்லை. அதனால்தான் பல்கலைக்கழகங்களில் திருப்தியின்மையும் மாணவர் மத்தியில் குழப்பங்களும் கலவரங்களும் நிலவிக் கொண்டு வருகின்றன. இவற்றை நிவர்த்தி செய்யவேண்டுமானால் எங்கள் நாட்டிற்கு இன்னும் பல பல்கலைக்கழகங்கள் வேண்டும். குறிப்பாக வடக்கு, கிழக்கு மாகாண மக்கள் தங்கள் பகுதியில் ஒரு பல்கலைக்கழகம் வேண்டுமென்று கடந்த பத்துப் பன்னிரண்டு ஆண்டுகளாக கிளர்ச்சிசெய்து வருகின்றார்கள். பல்கலைக்கழகக் கல்வியைப் பற்றிப் பரிசீலனை செய்த Needham Commission என்றாலென்ன? மற்ற ஆணைக்குழுக்கள் என்றால் என்ன இவை எல்லாவற்றின் முன்னிலையிலும் சென்று, வடக்கு, கிழக்கு மாகாண மக்கள் அவர்களுடைய உயர்தரக் கல்வித் தேவையைப் பூர்த்திசெய்வதற்கு ஒரு பல்கலைக்கழகம் வேண்டுமென்ற கோரிக்கையைச் சமர்ப்பித்து வந்திருக்கிறார்கள்.

இப்பொழுது, இந்த ஆண்டு நடந்த பல்கலைக் கழகப் புகுமுகப் பரீட்சைப் பெறுபேறுகளின் பிரகாரம் தமிழில் விஞ்ஞானம் தாவரவியல் விலங்கினவியல் போன்ற பாடங்களைப் படிக்க வேண்டிய மாணவர்கள், பேராதனைப் பல்கலைக்கழகத்திலோ கொழும்புப் பல்கலைக்கழகத்திலோ இடமில்லாத காரணத்தால் வித்தியாலங்காரப் பல்கலைக்கழகத்திற்குச் செல்லும்படி கேட்கப்பட்டார்கள். வித்தியாலங்காரப் பல்கலைக் கழகத்திற்கு அவர்கள் செல்லுவதாக இருந்தால் சிங்களத்திலேதான் கல்விகற்க முடியுமென்றும்

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අමිර්තලිංගම් මයා.]

அறிவிக்கப்பட்டது. ஆகவே, பலன் என்னவென்றால் விஞ்ஞானம், தாவரவியல், விலங்கியல் பகுதியில் கல்வி கற்க விரும்பும் மாணவர்கள் பலர் பேராதனையிலோ, கொழும்பிலோ இடமில்லாத காரணத்தால் தமது வாழ்நாளில் கிடைத்த ஒரு வாய்ப்பை இழந்து தாம் விரும்பிய பாடத்தில் பல்கலைக் கழகக் கல்வியைப் பெறமுடியாத நிலைமைக்குள்ளாக்கப் பட்டுவிட்டார்கள். இந்த மாணவர்களுக்கு விசேஷமாக வடக்கு, கிழக்கு மாகாணங்களிலிருந்து வந்தவர்களுக்கு, வடக்கு, கிழக்கு மாகாணத்தில் ஒரு பல்கலைக் கழகம் இருக்குமாகவிருந்தால், இந்தப் பிரச்சினை ஏற்பட மாட்டாது.

கௌரவ சபாநாயகரவர்களே, சமீபத்தில் பேராதனைப் பல்கலைக் கழகமும், கொழும்புப் பல்கலைக் கழகத்திலிருந்து செல்லும் கலைப் பகுதி மாணவர்களின் இரண்டாவது வருட வகுப்புக்களுக்குப் பேராதனையில் இடம் கொடுக்க முடியாதென்று கூறியிருப்பதை பத்திரிகைகளிலே பார்த்தோம். அப்படியென்றால், விஞ்ஞானப் பகுதித் தமிழ் மாணவர்களுக்கும் இடம் இல்லாமலிருக்கிறது. கலைப்பகுதி மாணவர்களுக்கும் இடமில்லாத நிலைமை ஏற்பட்டிருக்கிறது. இவர்களுக்குப் பல்கலைக் கழகக் கல்வியை வழங்க வசதி செய்துகொடுக்க வேண்டியது இவ்வரசாங்கத்தின் முக்கிய கடமையாகும்.

வடக்கு, கிழக்கு மாகாணங்களில் ஒரு பல்கலைக்கழகம் நிறுவப்பட வேண்டுமென்ற கோரிக்கையை இனிமேலாவது கவனித்து உடனடியாக ஆவன செய்யுமாறு இந்தச் சந்தர்ப்பத்தில் நான் கேட்டுக் கொள்கின்றேன். ஏற்கனவே இரண்டு ஆண்டுகளுக்கு முன்னர் இந்தக் கௌரவ சபையிலுள்ள பதினெட்டுப் பாராளுமன்ற அங்கத்தினர்கள்—வடக்கு, கிழக்கு மாகாணங்களைச் சேர்ந்த பிரதிநிதிகள்—திருகோணமலையிலே ஒரு பல்கலைக்கழகம் நிறுவுமாறு அரசாங்கத்துக்கு ஒரு வேண்டுகோள் விடுத்தனர். வட மாகாணத்தைச் சேர்ந்த பத்துப் பிரதிநிதிகளும் கிழக்கு மாகாணத்தைச் சேர்ந்த எட்டு பிரதிநிதிகளும்—எதிர்க்கட்சியான ஸ்ரீ லங்கா சுதந்திரக் கட்சியைச் சேர்ந்த கௌரவ மூதூர் இரண்டாவது பிரதிநிதி (ஜனாப் ஏ. எல். அப்துல் மஜீது) உட்பட—கையொப்பமிட்டு இந்த வேண்டுகோளை அரசாங்கத்துக்குச் சமர்ப்பித்தனர். அதனைக் கவனிக்க வேண்டிய நாள் நெருங்கிவிட்டது என்பதை மாத்திரம் நான் இந்தச் சந்தர்ப்பத்தில் வலியுறுத்திக் கூறுகிறேன்.

ஏனென்றால், நான் ஏற்கனவே விளங்கப் படுத்தியது போல, தமிழ் மாணவர்களுக்கு விஞ்ஞானக் கல்வி பெற பேராதனையில் இடமில்லை; கொழும்பில் இடமில்லை; வித்தியாலங்காரப் பல்கலைக்கழகத்தில் கல்வி பயிலுங்கள் என்று கூறும் நிலை இன்று வந்துவிட்டது. இந்த வருடத்தில் தமிழ் மொழியில் கலைப் பகுதியில் கல்வி பயில பேராதனையில் இடமில்லை. இந்தப் பிரச்சினை தீரவேண்டுமானால் தமிழ்ப் பகுதியில் ஒரு பல்கலைக்கழகம் நிறுவப்பட வேண்டியது மிக அவசியம். இப்படிக் கூறும் நேரத்தில், நாம் அமைச்சர் அவர்களை எதிர்க்காமல் இருப்பதற்கு இதுதான் காரணம் என்று எதிர்க் கட்சியினர் கூறுவதை நான் முற்றாக மறுத்துக்கூற விரும்புகிறேன். எங்களைப் பொறுத்தவரையிலே நாம் ஒரு கொள்கையளவில் நடப்பவர்கள் என்பதை இந்தச் சபையில் இரண்டு பக்கத்திலுள்ளவர்களும் அறிந்திருப்பார்கள். நாம் சென்ற மாதம் சில விஷயங்களையிட்டு அரசாங்கத்திலிருந்தும் அரசாங்கப் பாராளுமன்றக் குழுவிலிருந்தும் வெளியேறத் தீர்மானித்த நேரத்தில், தமிழ்ப் பேசும் மக்களுக்குப் பாதகம் அற்ற விஷயங்களில் அரசாங்கத்தை ஆதரிப்போம் என்று தீர்மானித்தோம். அதன்பிரகாரம், கல்வி அமைச்சர் மீது கொண்டுவரப்பட்டிருக்கும் இந்த நம்பிக்கையில்லாப் பிரேரணையையொட்டி அரசாங்கத்தை ஆதரிக்கிறோமேயொழிய வேறு எந்தவிதமான காரணமுமில்லை.

கௌரவ ஹபருதுவைப் பிரதிநிதி 'சன்' பத்திரிகையில் தவறாக அநாமதேய நிருபர் ஒருவர் எழுதியதை வைத்துக்கொண்டு, அல்லது தெருப் பேச்சுக்களைக் கேட்டு கௌரவ அங்கத்தவர்களுடைய நடத்தைக்குக் காரணம் கற்பிக்க முற்படுவது அழகல்ல, முறையல்ல என்பதைக் கூறிவைக்க விரும்புகிறேன். நான் என் பேச்சில் குறிப்பிட்டது போல,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

கௌரவ அமைச்சர் செய்த சில நல்ல விஷயங்களைப் பாராட்டுகிறேன். அவர் செய்ய வேண்டிய சிலவற்றை எடுத்துக் கூறினேன். அவர் செய்யாதவற்றையும் எடுத்துக் கூறினேன். 1960 ஆம் ஆண்டு முன்னைய அரசாங்கம் பாடசாலைகளைப் பொறுப்பேற்ற நாள் தொடக்கம் ஏற்பட்ட குழப்பமான நிலை இன்னும் நீங்கவில்லை. அந்தப் பொறுப்பை இன்றைய அமைச்சர்மேல் போடுவது நியாயமானதல்ல. 1960 ஆம் ஆண்டு தொடக்கம் கல்வியைக் குழப்பியடித்து அதனைப் பாழ்படுத்திய அதே பிரமுகர்கள் இன்று எதிர்க் கட்சியில் இருந்துகொண்டு கொண்டுவந்த இந்த நம்பிக்கையில்லாப் பிரேரணையை ஆதரிக்க நாம் மறுக்கிறோம். எம் இனத்துக்குப் பாதகமற்ற விஷயங்களில் இந்த அரசாங்கத்துக்கு ஆதரவு கொடுப்போம் என்று நாம் கொடுத்த வாக்கின்படி நாம் அரசாங்கத்தை இந்த விஷயத்தில் ஆதரிக்கின்றோம். நாம் இந்த நம்பிக்கையில்லாப் பிரேரணையை எதிர்ப்பதற்கு அதுவன்றி வேறெந்தக் காரணமுமில்லை. எனவே, வேறு காரணங்களைக் கற்பிக்க வேண்டாமென்று நான் கேட்டுக் கொள்கின்றேன். எங்கள் நிலையை நாம் தெளிவாகக் கூறியிருக்கிறோம். அந்த நிலையிலிருந்து நாம் வழுவாது நிற்போம். எனவே, இந்தப் பிரேரணையை எதிர்த்து நாம் வாக்களிப்போம் என்று எமது கட்சி சார்பில் கூறி எனது பேச்சை முடித்துக் கொள்கிறேன்.

අ. භා. 4.41

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න (සමාජ සේවා ඇමති)**

*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன—சமூக சேவை அமைச்சர்)*

(The Hon. N. H. A. M. Karunaratne—Minister of Social Services)

ගරු කථානායකතුමනි, ආණ්ඩු පක්ෂය සිතූ තරමට උණුසුම්ව, වේගවත්ව, අප බලාපොරොත්තු වූ තරම් තත්ත්වයකට මෙම විශ්වාස භංග යෝජනාව නැඟ නැති බව තමුන්නාන්සේලාට අවබෝධ වෙනවා ඇති. මීට වඩා බොහොම වේගවත්ව නොයෙක් දේ එල්ල කරමින් මෙම විශ්වාස භංග යෝජනාව සාර්ථක කර ගැනීමට විරුද්ධ පක්ෂය කටයුතු කරාවිය කියා අප බලාපොරොත්තු වුණා. එහෙත් අපේ අධ්‍යාපන ඇමතිතුමාගේ කථාවෙන් පසු, බොහොම සාර්ථක ලෙස විරුද්ධ පක්ෂය පසුබැස තිබෙන බව පෙනී යනවා. සමහරුන් සිතනවා ඇති අප මෙවැනි දෙයක් ගෙනා එකත් මෝඩකමක් කියා. කෙසේ වෙතත් ඉදිරියට ආ නිසා, තමන්ගේ ගෞරවය බේරා ගැනීම පිණිස කථා කිරීම අවශ්‍ය බව පෙනී ගිය නිසා, බොහෝ දෙනකු කථා කිරීමට අදහස් කළා වෙන්න ඇති.

අපේ අධ්‍යාපන ඇමතිතුමාට විරුද්ධව ගෙනැවිත් ඇති මෙම විශ්වාස භංග යෝජනාවේ පරමාර්ථය මා හිතන හැටියට එතුමා කෙරෙහි විශ්වාස භංග යෝජනාවක් ඉදිරිපත් කිරීමම නොවෙයි. මෙය මෙසේ ඉදිරිපත් කර ඇත්තේ, යම් දෙයක් අවබෝධ කර ගැනීමේ ශක්තියක් නැති පුද්ගලයන් සිටිනවා නම් ඒ අයටත්, ඒ වාගේම අස්සක් මුල්ලක් නැර සිටින ශිෂ්‍යයනටත්, ගුරුවරුන්ටත්, දෙමව්පියන්ටත්, වෙනත් ආයතනවල උසස් අධ්‍යාපනය ලබන අයටත්, මෙම විශ්වාස භංග යෝජනාව උඩ යම් යම් කරුණු මතු කිරීමෙන් දේශපාලන වාසියක් සලසා ගැනීමේ බලාපොරොත්තුවෙන් හෝ චේතනාවෙන් බවයි අපට පෙනී යන්නෙ.

මෙම අධ්‍යාපන ඇමතිතුමාගේ ක්‍රියා මාර්ගය මීට පෙර සිටි අධ්‍යාපන ඇමතිවරුන්ගේ ක්‍රියා මාර්ග සමග අප සන්සන්දනය කර බැලිය යුතුයි. දැන් කරගෙන යන වැඩ පිළිවෙළට වඩා හොඳ වැඩ පිළිවෙළක් කලින් ආණ්ඩුවේ අධ්‍යාපන ඇමතිවරුන්ගෙන් කෙරුණාය, මීට වඩා හොඳ ප්‍රතිඵල ලැබුණාය, මීට වඩා අවුල් වියවුල් රහිතව කරගෙන ගියාය, ආදි වශයෙන් පෙන්නුම් කළා නම් අන්න ඒක මෙම යෝජනාවේදී තර්කයක් වශයෙන් පිළිගන්න තිබුණා. එහෙත් අද කෙරී තිබෙන වැඩ පිළිවෙළ ගැන බලන විට, එහෙම දෙයක් පෙන්නුම් කරන්න තරම් ශක්තියක් විරුද්ධ පක්ෂයට නැති බවයි අපට වටහාගන්න තිබෙන්නෙ.

අධ්‍යාපන ඇමති ධුරය කොයි ඇමතිවරයා දැරුවත් එම ධුරයේ කටයුතු කිරීම ඒ තරම් පහසු වැඩක් නොවෙයි. මා හිතන හැටියට ඇමතිකම්වලින් ඉතාම අමාරු ඇමතිකම අධ්‍යාපන ඇමතිකමයි. මා එසේ කියන්න හේතුව මොකක්ද? මෙය නො-

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න]

යෙක් විධියේ ප්‍රශ්න පැන නඟින දෙයක්. ගුරුවරයෙක් මාරු කළත්, ප්‍රතිපත්තියක් අනුව වෙනත් වැඩ පිළිවෙළක් යෙදූවත්, දේශපාලනඥයන්ගෙන් බේරෙන්න බැහැ. නොයෙක් නොයෙක් බලපෑම් ඇති වෙනවා. පත් වීමේදී, මාරු කිරීමේදී, නොයෙක් නොයෙක් බලපෑම් ඇති වෙනවා. ඒ වාගේම එක තැනකට පාසලක් දී තවත් තැනකට නොලැබුණොත් ඒකත් කරදරයක් වෙනවා. මොන විධියෙන් කටයුතු කළත් කොයි පැත්තකින්වත් බේරුමක් නැහැ.

අපේ අධ්‍යාපන ඇමතිතුමා ප්‍රකාශ කළාක් මෙන්, අධ්‍යාපන ඇමතිවරයකුගේ පරමාර්ථය විය යුත්තේ දේශපාලන වාසියක් සලසා ගැනීමවත්, අවස්ථාවෙන් ප්‍රයෝජන ගැනීමවත්, නොවෙයි. අපේ ඇමතිකම් නැති වෙන්න පුළුවන්. අප පරාජය වෙන්න පුළුවන්. අප මැරී යන්න පුළුවන්. ඔය පැත්තටත් එහෙමමයි. එම නිසා අධ්‍යාපන ඇමතිවරයකුගේ පරමාර්ථය විය යුත්තේ නියම පදනමක් උඩ, නියම මාර්ගයක් ඔස්සේ, අපේ අනාගත දරු පරම්පරාව ගමන් කරවීමයි. විදේශිකයන්ට මේ රට තිබුණ කාලයේ ඉංගිරිසි භාෂාවෙන් කටයුතු කළත්, යම් කිසි පරමාර්ථයක් තිබුණා. දෙමව්පියනුත් දරුවනුත් දැනගෙන සිටියා—අප ඉගෙන ගන්න කාලයේ පවා—අප යන්නෙ කොහෙද කියා. මොන දේද අප ඉගෙන ගන්න ඕන, මොන රක්ෂාවද අප කරන්න බලාපොරොත්තු වන්නෙ, අප විශ්ව විද්‍යාලයට ඇතුළු වෙනවාද, එසේ නැත්නම් මග දී නැවතී වෙනත් රක්ෂාවකට යනවාද, කියා මොකක් හෝ නිරාකරණය කරගන්නට තිබුණා. තවත් අඩුපාඩුකම් තිබෙනවා. නමුත් මේ මෑතක් වන තෙක්ම නියම සැලැස්මක් නැතුවයි අධ්‍යාපනය ඉදිරියට ගමන් කළේ. සිංහල භාෂාව රජයේ භාෂාව කළා. අපේ දරුවන් ඉගෙන ගත්තා. විශ්ව විද්‍යාලය තෙක්ම ඉගෙන ගත්තා. කොහේ ඉගෙන ගත්තත් යන්න මාර්ගයක් නැතිව සියලු දෙනාම අනාථ වෙන තත්ත්වයක් ඇති වුණා. දෙමව්පියන් ළමයින්ට ගොවිතැනුත් අත්හිමේදී අතරමං වන තත්ත්වයකුයි ඇති වුණේ. එයට ප්‍රතිකර්මයක් වශයෙන් තමයි, මේ අවල නැති කරන්නට තමයි. නියම අධ්‍යාපන ක්‍රමයක් ඇති කිරීම සඳහා මේ ආණ්ඩුව

පියවරක් ගෙන තිබෙන්නෙ. එය ඇමති කෙනෙකුට ලෙහෙසියෙන් කරන්න පුළුවන් වැඩක් නොවෙයි. එක් පැත්තකින් පාගන විට අනික් පැත්ත උඩ යනවා. ඒ පැත්ත පාගන විට අනික් පැත්ත උඩ යනවා. හරියටම පොල් පිත්තක අග මුල පාගන්නා වගේ වැඩක් තමයි. ඉතාමත් අමාරු දෙයක්. නමුත් අධ්‍යාපන ඇමතිතුමා නිර්භයව—මා එතුමා වර්ණනා කරනවා නොවෙයි—ඕනෑ හෙනයක් ගැහුවත් කමක් නැත කියා, ඇමතිකම නැති වුණත් ඇති වුණත් කමක් නැහැ කියා සිතා ගෙන, මේ දේ කළ යුතුය කියා හරියාකාර වැඩ පිළිවෙළක් අර ගෙන කටයුතු කර ගෙන යනවා. ඒ නිසා කන්නන්ගර මැතිතුමාගේ නම මෙන් එතුමාගේ නමත් කවදා හෝ එතුමා නැති කාලයකදී මේ ස්ථානයේදී කියවෙන බව මා ප්‍රකාශ කරන්න කැමතියි. අපට මේ විධියේ අධ්‍යාපනයක් ලබා දුන්නේ අසවල් ඇමතිවරයාය කියා අපේ අනාගත පරම්පරාව එතුමාට ප්‍රශංසා කරනවා ඇති. ගරු අධ්‍යාපන ඇමතිතුමාගේ නම කවදා හෝ ගෞරවයට, කීර්තියට, පාත්‍ර වන බවට කිසිම සැකයක් නැහැ.

ගරු කථානායකතුමනි, බොහෝ දෙනෙක්, විශේෂයෙන් හබරාදුවේ ගරු මන්ත්‍රීතුමා, (ප්‍රින්ස් ගුණසේකර මයා.) කියන දේවල් අපි වැඩිය ගණන් ගන්නේ නැහැ. එතුමා නිතරම මේ මන්ත්‍රී මණ්ඩලය උසාවියකට සම කරනවා. ඔබතුමාත් එතුමාගේ කතාව අසා ගෙන සිටින්න ඇති. නිතරම නීතිය ගැන තමයි කතාව. මේ ස්ථානයත් උසාවියකට සම කළාය කියා මා කියන්නේ මෙන්න මේ හේතුව නිසයි. එතුමා හැම විටම උත්සාහ කරන්නේ බොරුව ඇත්තක්ය කියා ඔප්පු කරන්නයි. එතුමාට ඒ සඳහා ආණ්ඩුවෙනුත් ගාස්තුවක් ලැබෙනවා. ඒ නිසා එතුමාගේ වෘත්තිය අනුව හැම විටම බොරුව ඔප්පු කරන්න ඕනෑ. එතුමා හැම කතාවකින්ම කරන්නේ එයයි. කොහෙන් හෝ පත්‍ර පිටකුත් උස්සා ගෙනැවිත් බොරුවම සනාථ කරන්න සූදානම් වෙනවා; යම් යම් පුද්ගලයන්ට මඩ ගහන්න උත්සාහ කරනවා. නමුත් මා කියන්න කැමති, අපි ඒ විධියට කිසි කෙනෙකුට මඩ ගැසීමට සූදානම් නැති බව. හිටපු ඇමතිවරයෙකුට හෝ නමුන්නාන්සේලාට හෝ මඩ

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

ගැසීමට අපි උත්සාහ කරන්නේ නැහැ. හබරාදුවේ ගරු මන්ත්‍රීතුමා කතා කළේ කුඩුවක ඉඳගෙන නඩුවක් අසන ආකාරය වයි. එවැනි නඩුවක් මෙතන ඇත්තේ නැහැ. විත්තිකාරයෙක් මෙහි ඇත්තේ නැහැ. රටට සේවයක් කරන හොඳ ඇමති වරයෙක් පිළිගන්න අවස්ථාවයි මේ අවස්ථාව. ඒ නිසා මා ඒ මන්ත්‍රීතුමාගෙන් ඉල්ලා සිටිනවා, බොරුව සනාථ කරන උසාවියක් හැටියට මේ ස්ථානය සල කන්නේ නැතිව කාගේත් ගෞරවය රැකෙන අන්දමට කටයුතු කරන්නය කියා.

ඊළඟට ගරු කථානායකතුමනි, ගුරු මාරු ගැනත් කියන්න යෙදුනා. ලොකු වරදක්, ලොකු ද්‍රෝහිකමක්, ලොකු අපරාධයක් හැටියට එය හඳුන්වන්න යෙදුණා. එතුමා එය කරන අවස්ථාවේදී මේ රටේ ලොකු උද්ඝෝෂණයක් ඇති වුණ බව ඇත්ත. එතුමාට ගුරුවරු බැණ වැදුණා. එතුමාට විරුද්ධව විශාල පිරිසක් නැගී සිටියා. ඒ කාරණාව ඇත්ත. ගාල්ල, මාතර, යාපනය, ආදී ප්‍රදේශවල පාසැල්වලට ඊංගාගෙන, දරුවන්ට හොඳ අධ්‍යාපනයක් දෙන්න පුළුවන් ගුරුවරුන් පිරිස ඒ ප්‍රදේශවලම අවුරුදු 15 ක් 18 ක් තිස්සේ මුල් බැස ගෙන සිටියා. හොඳ අධ්‍යාපනයක් දිය හැකි හොඳ උගත්කමක් ඇති ගුරුවරුන් පිරිස ඒ ප්‍රදේශවලට පමණක් සීමා වුණා. ඒ අය ඒ නගරවලට පමණයි. ඒ අය එතැනින් ගළවන්න කිසිම ඇමති කෙනෙකුට ශක්ති යක් තිබුණේ නැහැ. ඒ ප්‍රදේශවල එවැනි ගුරුවරුන් සිටි අතර වන්නිය ආදී ප්‍රදේශ වල—හද්දා පිටිසර ප්‍රදේශවල—දුක් විඳි මින් දරු පවුල් සමග අවුරුදු 15 ක් 18 ක් තිස්සේම තවත් ගුරු පිරිසක් සිටි බව මා තමුන්නාන්සේට කියන්න කැමතියි. එක ගුරුවරයකු සඳහටම කොළඹ සිටින අතර තවත් ගුරුවරයකු සඳහටම වන්නිකරයට වී දුක් විඳිනවා. මෙය මෙසේ වන්නට ඉඩ හැරීම සාධාරණද? ඒ වාගේම පසුගිය කාලයේ සමහර පාඨශාලාවලට වුවමනාවට වඩා ගුරුවරුන් හිටියා. ගුරුවරුන් 10 දෙනකු වුවමනා තැන ගුරුවරුන් විසි දෙනකු සිටියා. තවත් සමහර පාඨශාලා වලට ගුරුවරුන් 10 දෙනකු වුවමනා වුණත් පත් කර සිටියේ දෙදෙනයි; එහෙම නැත්නම් එක්කෙනයි. සමහර ස්ථානවල මුල් ගුරුවරුන් තුන් හතර දෙනා හිටියා. කොටින්ම එදා පැවතුණේ අවුල් ජාලාවක්. මේ අවුල් ජාලාව නැති කිරීම සඳහා පාඨශාලාවල ළමයින් සිටින ප්‍රමාණය අනුව ගුරුවරුන් පත් කරන්න වත්, ඒ වාගේම දීර්ඝ කාලයක් පහසුකම් තිබෙන ප්‍රදේශවල සිටි ගුරුවරුන් ටික කාලයකට දුෂ්කර ප්‍රදේශවලට මාරු කර යවා ඒ දුෂ්කර ප්‍රදේශවල සිටි ගුරුවරුන් පහසුකම් තිබෙන ප්‍රදේශවලට මාරු කරන් නටත් ක්‍රියා කෙළේ මේ ගරු අධ්‍යාපන ඇමතිතුමායි.

මේ ගුරු මාරු සම්බන්ධයෙන් ලොකු උද්ඝෝෂණයක් ඇති වුණා. ඒක ඇත් තයි. මාත් කොළඹ ස්කෝලයක ගුරුවර යකු හැටියට සිටියදී මටත් වන්නි ප්‍රදේ ශයේ ස්කෝලයකට මාරු වීමක් ලැබුණා නම් මාත් අධ්‍යාපන ඇමතිතුමාට බණිනවා. පහසුකම් තිබෙන ප්‍රදේශවල සිට දුෂ්කර ප්‍රදේශවලට මාරු කර යවනු ලැබූ සියලුම ගුරුවරුන් එසේ බණිනවා ඇති. ඉතින් මේ වැඩ පිළිවෙළ නරක යයි හබරාදුවේ ගරු මන්ත්‍රීතුමා කියනවාද? මේ වැඩ පිළිවෙළ නරක යයි කොමියුනිස්ට් පක්ෂය කියනවාද? සමසමාජ පක්ෂය කියනවාද? ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කියනවාද? මොල යක් තිබෙන කෙනකු නම් මේ බැණුම් අනුමත කරන්නේ නැහැ. ගරු අධ්‍යාපන ඇමතිතුමා කෙළේ යුක්තිසහගත දෙයක්. මධ්‍යස්ථ අන්දමට හිතා එඩිතර පියවරක් ගන්නට පුළුවන් කෙනකුයි, අධ්‍යාපන ඇමතිවරයා වශයෙන් සිටිය යුත්තේ. ඇත්තෙන්ම අපේ ඊරියගොල්ල අධ්‍යාපන ඇමතිතුමාගේ මේ මධ්‍යස්ථ හා සාධාරණ වැඩ ගැන කාගේත් ප්‍රශංසාව එතුමාට හිමි වන්නට ඕනෑ. විද්‍යා ගුරුවරුන් හා වෙනත් අංශයන්හි දක්වා තිබෙන ගුරු වරුන් වන්නිකරයට මාරු කර යැවීමේ ප්‍රතිඵලයක් වශයෙන් අද ඒ ගම්බද දුප් පත් ළමයින්ට සෑහෙන අධ්‍යාපනයක් ලබාගන්නට පුළුවන් වී තිබෙනවා. නගර බද පාඨශාලාවලට වඩා ගම්බද පාඨශාලා වලින් වෛද්‍ය හා ඉංජිනේරු අංශවලට ශිෂ්‍යයන් තේරී සිටින බව මේ කාරණයට උදාහරණයක් වශයෙන් දක්වන්නට පුළු වනි.

ඇත්තෙන්ම ගරු අධ්‍යාපන ඇමතිතුමා කළ මේ සේවයෙන් දුප්පත් ගම්බද ළම යින්ට ලොකු සෙතක් සැලසුණා. ලොකු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න]

සහනයක් ලැබුණා. මේ තාක් මෙවැනි පියවරක් ගන්නට කිසිම අධ්‍යාපන ඇමති වරයකුට පුළුවන්කමක් තිබුනේ නැහැ. එසේ හෙයින් ඒ ගම්බද ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට සෙත සලසා දුන්නේ තමන් යයි පුරසාරම් දොඩන්නට විරුද්ධ පාර්ශ්වයේ සිටින හිටපු අධ්‍යාපන අමතිතුමාට පුළුවන්කමක් නැහැ. එවැන්නක් කියන්නට පුළුවන් වන්නේ ඊරියගොල්ල අධ්‍යාපන ඇමතිතුමාට පමණයි. වේදිකාවලට නැඟ බොරු දෙසා බන්නට විරුද්ධ පාර්ශ්වයේ උදවියට අමාරුවක් නැහැ. මෙම ගරු සභාව ඇතුළෙදීත් සමහර විට නොයෙකුත් අසත්‍ය දේ කියනවා නම් මහජන වේදිකා වලදී මොන විධියේ බොරු බේගල් දෙසා බාන්නට බැරිද? නොයෙක් කාරණා තේරුම් කර උන් විට මෙම ගරු සභාව තුළදී ඒවා පිළිගන්නවා. තර්ක විරහිතව පිළිගන්නට පුළුවන් දේ එසේ පිළිගෙන මහජන වේදිකාවලට නැඟ වෙනත් විධියට කථා කරනවා. සත්‍යය හංගා මහජනයා මුළා කරන්නටයි, ඒ උදවිය උත්සාහ කරන්නේ. ගරු මාරු ගැන ගරු අධ්‍යාපන ඇමතිතුමා තම කථාවේදී හොඳ හැටි පැහැදිලි කරනුන්නා.

ගරු අධ්‍යාපන ඇමතිතුමා උසස් අධ්‍යාපනය ගැනත් තම කථාවේදී පැහැදිලි කර දුන්නා. ඉංග්‍රීසි භාෂාව සම්පූර්ණයෙන්ම අතහැර දැමීමේ විපාක විඳින්නට අද සිදු වී තිබෙනවා. සිංහල භාෂාවට මුල් තැන දිය යුතුයි. එහෙත් ඒ නිසාම ඉංග්‍රීසිය සම්පූර්ණයෙන් අතහැර නොදැමිය යුතුයි. අප අතර සුළු සුළු මතභේද තිබෙන්නට පුළුවනි. එහෙත් ජාතික ප්‍රශ්නවලදී ජාතියට ආදරයක් ඇතිව ක්‍රියා කළ යුතුයි. එසේ නැත්නම් එහි විපාක විඳින්නට සිදු වන්නේ දරුවන්ටයි. ඉංග්‍රීසි අධ්‍යාපනය සම්පූර්ණයෙන්ම නැති කර දැමූ නිසා සිදුවුණේ මොකක්ද? ඇත් වුණත් ලොකු ලොකු අයගේ ළමයින් ඔක්කොම ඉංග්‍රීසි ඉගෙන ගන්නවා. සියලු දෙනාටම ඉංග්‍රීසි උගන්වනවා නම් පංක්ති භේදය නැති වෙනවා. මා නම් මගේ ළමයින්ට ඉංග්‍රීසි ඉගැන්වීම සඳහා ගුරුවරයකු කැඳවාගෙන සිටිනවා. සිංහල උගන්වන අතර මා විශේෂ ගුරුවරයකු යොදා මගේ දරුවන්ට ඉංග්‍රීසිත් උගන්වනවා. නොයෙකුත් අන්දමට වේදිකාවල සිංහල ගැන කථා කරන ඔය උදවිය යටින් තමන්ගේ දරුවන්ට ඉංග්‍රීසි උගන්වනවා. මට පුළුවන්කමක් තිබෙනවා නම් මගේ දරුවන් එංගලන්තයට හෝ යවා උගන්වනවා. මා යවන්නෙ එළිපිට, ඒ ගොල්ලන් යවන්නෙ හොරෙන්. වේදිකාවලට නැඟී කියනවා, සිංහල භාෂාවට මුල් තැන දුන්නාය, ගමේ ගොඩේ දරුවන්ටත් ඉංජිනේරුවන් වන්න, දොස්තරවරුන් වන්න අවස්ථා සලසා තිබෙනවාය කියා. නමුත් මෙපමණ කලක් ගත වුණා, සිංහල භාෂාවෙන් ඉගෙන ගෙන සිංහලෙන් සමත් වූ එක් දොස්තරවරයකු සිටිනවා නම් කියන්න, මාත් කැමතියි ඔහු හමු වන්න. සිංහල භාෂාව ඉගෙන ගෙන සමත් වූ එක් දොස්තර මහත්මයෙකුවත් තවම නැහැ. එක් ඉංජිනේරුවෙකුවත් විශ්ව විද්‍යාලයෙන් පිට වී නැහැ.

අපේ හබරාදුවෙ මන්ත්‍රීතුමා (ප්‍රින්ස් ගුණසේකර මයා.) මෙහිදී සිංහල ගැන කථා කරනවා. නමුත් උසාවියට ගියාම ගාස්තු ලැබුණාම එතුමා කථා කරන්නෙත් ඉංග්‍රීසියෙන්. ඔය වාගේ දවල්ට සිංහලෙන් පමණක් කථා කරන රෑට දෙමළත් කථා කරන උදවිය ඉන්නවා. ද්‍රවිඩ පක්ෂයට දවල්ට පුළුවන් තරම් බනිනවා, නමුත් රෑට දෙමළ දවල්ට රෙද්ද අඳින රෑ වන විට කලිසම් අඳින උදවියත් සිටිනවා. ඇතැම් අය පුළුවන් උත්සාහය යොදා තමන්ගේ දරුවන්ට ඉංග්‍රීසි උගන්වනවා, පෝසත් උදවියගෙ දරුවන් එංගලන්තයට, ප්‍රංශයට යවා උගන්වනවා. එහි ගොස් විභාගවලින් සමත් වී ආවාට පසු අපේ දුප්පත් දරුවන්ට තැනක් නැහැ. සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටියාම, ඉංග්‍රීසි භාෂාව දැනීමත් අවශ්‍ය කරුණක් සේ සලකනවා. ඇත්ත වශයෙන්ම, ඉංග්‍රීසි දැනුම ප්‍රයෝජනවත්. විදේශීය රටවල් සමග ගණුදෙනු කිරීම ආදී කටයුතු සඳහාත් ඉංග්‍රීසි දැනුම අවශ්‍යයි. අපේ රටින් නියෝජිතයන් විදේශීය රටවලට යවනවා නම් ඒ අයට ඉංග්‍රීසි භාෂාව පිළිබඳ දැනුම ඉතාමත් අවශ්‍යයි. නොයෙකුත් උසස් තනතුරුවලට පත් වන්න නම්, දිසාපතිවරුන් වශයෙන් පත් වන්න නම්, මෙම නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ ලිපිකරු තනතුරකට පත් වී එනවා නම්, ඉංග්‍රීසි දැනම ඉතාමත් ප්‍රයෝජනවත්. ඒ සමගම දෙමළ භාෂාව දැනීමත් ප්‍රයෝජනවත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බව කියන්න ඕනෑ. මේ හැරෙන්න විදේශීය භාෂාවන්, රුසියානු, චීන, ප්‍රංශ ආදී භාෂාවන් ඉගෙන ගැනීමට පුළුවන් නම් එය ලොකු දෙයක්. නමුත් මේ සියල්ලක්ම නැති කළා.

ඉංග්‍රීසි දැනීමක් නැතිව විශ්ව විද්‍යාලයට ඇතුළත් වන ළමයින්ගේ තත්ත්වය කුමක්ද? ඇත්ත වශයෙන්ම ඉංග්‍රීසි දැනීමක් ඇති ශිෂ්‍යයන් වෛද්‍ය අංශයෙන්, ඉංජිනේරු අංශයෙන්, විද්‍යා අංශයෙන්, නීති අංශයෙන් මුල් තැන ගන්නවා. ගමේ ගොඩේ ළමයින් ඉගෙන ගන්නේ මොනවාද? කලාව. කලා අංශයේ ඉගෙනීම ලැබීමෙන් පමණක් යම් සේවයක් රට වෙනුවෙන් කිරීමට ඒ ශිෂ්‍යයන්ට අවස්ථා සැලසෙනවාද? විශ්ව විද්‍යාලවලින් යම් අධ්‍යාපනයක් ලබා පිට වන ළමයින්ගෙන් බලාපොරොත්තු වන්නේ යම්කිසි සේවයක් රට වෙනුවෙන් කිරීමයි. නමුත් ඇත්ත වශයෙන් එබන්දක් වෙනවාද? සිංහල භාෂාව, පාලි, ඉතිහාසය, වැනි කලා විෂයයන් ඉගෙනීමෙන් කරන්න පුළුවන් මොකක්ද? කවුද රටට අවශ්‍ය පාලම් තනන්නේ? කලාව ඉගෙන ගෙන පාලම් තනන්න පුළුවන්ද? කලාව ඉගෙන ගෙන වෙදකම් කරන්න පුළුවන්ද? බැහැ. එහෙම නම් මෙතෙක් කල් කර ගෙන ආ වැඩ පිළිවෙළෙහි වෙනසක් කරන්න ඕනෑ නොවේද? ගරු කථානායකතුමනි, විශ්ව විද්‍යාල පිහිටෙව්වා. භික්ෂූන්වහන්සේලා විශාල සංඛ්‍යාවක් කලා විෂයයන් හදාරනවා. නමුත් කලා විෂයයන් පමණක් හදාරා මොනවාද කරන්න යන්නෙ? ඇත්ත වශයෙන්ම සියළු දෙනාටම කොහොමද ඉඩ කඩ සලසා දෙන්නෙ? එම නිසා විද්‍යා අංශයෙහි, ගොවිකම් අංශයෙහි ඉගෙනීම ලැබීමට පහසුකම් සලසා දෙන්න ඕනෑ. ඉගෙනීමට මාර්ග සකස් කර දෙන්න ඕනෑ.

අද අප යම් යම් කාර්යයන් සඳහා විදේශීය රටවලින් පුද්ගලයන් ගෙන්වන්න ඕනෑ. පිටරට යවා පුහුණුව ලැබූ පැරණි උදවියගෙන් තමයි මේ රටේ තවමත් කටයුතු බොහොමයක් කෙරෙන්නෙ. ඇතැම් අවස්ථාවලදී විශ්‍රාම යැවූ අයත් නැවත මේ කටයුතු සඳහා යොදවන්න සිදු වී තිබෙනවා. එම නිසා, කිරි කපන මිනිහාගේ ළමයාටත්, මාළු අල්ලන මිනිහාගේ දරුවාටත්, අන්ත දුගී පැල්පතක වාසය කරන ශිෂ්‍යයාටත් 3 වැනි ශ්‍රේණියේ සිට ඉංග්‍රීසි උගන්වන්න දැන් පියවර ගෙන තිබෙනවා. එහෙත් අවශ්‍ය තරම් ගුරුවරුන් නැහැ. ගුරුවරුන් මැටියෙන් අඹන්නද? එංගලන්තයෙන් නැත්නම් අමෙරිකාවෙන් ඉංග්‍රීසිකාරයන් 7,000 ක් පමණ ගෙන්වත් දමන්න පුළුවනි. එහෙත් සිංහල දැනුමක් නැතිව ඔවුන් ඉංග්‍රීසි උගන්වන්නේ කොහොමද? පාසල්වලට ඉංග්‍රීසි ගුරුවරුන් නැතිලු. වැරදිකරුවෝ කවුද? ඊරියගොල්ල ඇමතිතුමාද?

ජාතික රජයට කලින් තිබුණු ශ්‍රී ලංකා නිදහස් පක්ෂ හා සභාග රජයන්ගෙන් ඉංග්‍රීසි ඉගැන්වීම සම්බන්ධයෙන් කෙරුණේ මොකක්ද? ඒවාට මාත් ටිකක් හවුල්කාරයෙක්. සෑම අංශයක් සම්බන්ධයෙන්ම, ඉංග්‍රීසියෙන් ලියැවුණු දහස් ගණන්, ලක්ෂ ගණන් පොත් විශ්ව විද්‍යාලයේ තිබෙනවා. එහෙත් දැන් විශ්ව විද්‍යාලවලට ඇතුළු වන ශිෂ්‍යයන්ගෙන් බොහෝ දෙනකුට ඒවා කියවා තේරුම් ගන්නට තරම් ඉංග්‍රීසි දැනුමක් ඇත්තේ නැහැ. පිංතූර විතරක් නම් බලන්නට පුළුවනි. ඒ පොත්වල අඩංගු කරුණු අවබෝධ කර ගන්නට ඔවුන්ට ශක්තියක් නැහැ. එම නිසා. විශ්ව විද්‍යාල ශිෂ්‍යයන්ගේ ඉංග්‍රීසි දැනීම වර්ධනය කිරීම සඳහා දැන් අමුතුවෙන් පන්ති පවත්වනවා. ඒවා පළමුවෙන්ම කළේ, කවුද? ඒවාත් හොඳ නැතිලු! ඒවායින් ජාතිය නැති වෙනවාලු! අනාගත පරපුර අනාථ වෙනවාලු!

ඒ වාගේම, දැන් ඒ ඒ ඡන්දදායක කොට්ඨාශ හා දිස්ත්‍රික්ක අනුව කාර්මික විද්‍යාල පිහිටුවාගෙන යනවා. විරුද්ධ පාර්ශ්වයේ සමහර මන්ත්‍රීවරුන් ඊටත් විරුද්ධයි. යම් කෙනකුට උසස් අධ්‍යාපනයක් ලබා ගන්නට තරම් පුළුවන්කමක් නැත්නම්, ඒ අයගේ සහජ දක්ෂතා දියුණු කරවීම සඳහාවත් කටයුතු කරන්නට ඕනෑ. ඔවුන් හොඳ කාර්මිකයන් වන්නට පුළුවනි. එහෙත් ඒ සඳහා මෙතෙක් කිසියම් පියවරක් ගත්තාද? නැහැ. ජාතික රජය දැන් කාර්මික විද්‍යාල පිහිටුවීම සඳහාත් කටයුතු කරගෙන යනවා.

පළෙක් අදිනවා; තොරණක් ගහනවා; ඇමතිවරයා නැත්නම් මන්ත්‍රීවරයා යනවා. "මහා විද්‍යාලය" යනුවෙන් "බෝඩ්"

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න]

එකක් එල්ලනවා. ඔය විධියටයි, පසුගිය කාලයේ මහා විද්‍යාල ඇති කළේ. හැබැයි, ඒවායේ උගන්වන්න නරියෙක්වත් නැහැ. පසුගිය මහා මැතිවරණය කාලයේදී මගේ ඡන්දදායක කොට්ඨාශයේ "බෝඩ්" ලැලිවලට පමණක් සීමා වුණු මහා විද්‍යාල කීපයක්, මගේ ප්‍රතිවාදී ඡන්දාපෙක්ෂකයා විසින් විවෘත කරනු ලැබුවා. ඒ කාලයේ සැතපුම් භාගයෙන් භාගයට වාගේ මහා විද්‍යාල ඇති කළා. එහෙත් ඒවායේ ඉගෙන ගන්නා දරුවන්ගේ ප්‍රයෝජනය සඳහා අත්‍යවශ්‍ය දේවල්වත් සැපයුවේ නැහැ. එසේ "බෝඩ්වලට" පමණක් සීමා වුණු මහා විද්‍යාල කීපයක්ම දැන් නැති කර තිබෙනවා.

අපි හිතමු, එක විද්‍යාලයක උසස් පන්තිවල ඉගෙන ගන්නේ ළමුන් හතර දෙනකු පමණක්ය කියා. ඒ හතර දෙනාගේ ප්‍රයෝජනය සඳහා උපාධිධරයන්, රසායනාගාර හා අවශ්‍ය අනෙකුත් දේවල් සපයනවාට වඩා ප්‍රයෝජනවත්, ඔවුන් අසල මහා විද්‍යාලයක හෝ කොළඹ හෝ නතර කරවා ඉගැන්වීම. ඒ අනුව, අධ්‍යාපනය ලබන ශිෂ්‍ය සංඛ්‍යාව හා දුර ප්‍රමාණයත් සලකා ගෙනයි, දැන් මහා විද්‍යාල පිහිටුවාගෙන යන්නේ. ඒ මහා විද්‍යාල අංග සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය රසායනාගාර, කාර්මික හා කෘෂිකාර්මික ගුරුවරුන් හා උපකරණ දැන් සපයාගෙන යනවා. හැබැයි, එක වර සියලුම මහා විද්‍යාල අංග සම්පූර්ණ කරන්න නම් බැහැ. ඒවා කරන්නට පුළුවන් වන්නේ, ලැබෙන මුදල් ප්‍රමාණය අනුවයි. එපමණක් නොවෙයි, මහා විද්‍යාලවලට අවශ්‍ය සෙල්ලම් පිට්ටනි පවා දැන් ඇති කරගෙන යනවා. එය, විද්‍යාලයකට අත්‍යවශ්‍ය දෙයක්. "බෝඩ්වලට" පමණක් සීමා වුණු මහා විද්‍යාල ඇති කිරීමට, අපේ වර්තමාන අධ්‍යාපන ඇමතිතුමා නම් කොහෙත්ම කැමති නැහැ. මහජනයාගේ හිත සතුටු කරන්නටවත් "මහා විද්‍යාලය" යනුවෙන් "බෝඩ්" එකක් එල්ලන්නැයි කීවොත් එතුමා ඔහු එලවා ගන්නවා. එතුමා බෝඩ් එකෙන් කරන්නෙ නැහැ. එතුමා කරන්නේ ක්‍රියාවෙන්. විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන්ගේ ආසනවලට පාඨශාලා ගොඩනැගිලි ලැබුණේ නැත කියා කිව්වා. ඒක සම්පූර්ණ බොරුවක් බව මා කියනවා. එතුමා මුදල් තිබෙන හැටි යට බොහොම අපක්ෂපාතව ගොඩනැගිලි දී තිබෙනවා. එතුමා පක්ෂපාතව කිසි දෙයක් කර නැති බව කියන්නට පුළුවන්. පසුගිය ආණ්ඩුව කාලයේදී නම් ඒ විධියට සිදු වුණේ නැහැ. හැබැයි, මගේ මිත්‍ර කළුකළුගල්ලේ ඇමතිතුමා මට නම් කිසිම විරුද්ධකමක් දක්වූවේ නැහැ. එතුමා මගේ කොට්ඨාශයට එක අවුරුද්දට රුපියල් 88,000 ක් වියදම් කළා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
ඇමතිතුමාට බයයි.

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
**(The Hon. N. H. A. M. Karunaratne)**

නැහැ, බයට නොවෙයි, මිත්‍රකමටයි එහෙම කළේ. දේශපාලන වේදිකාවලට නැගී කොයි විධියට කථා කළත් එක ප්‍රදේශයේ අය හැටියට මිත්‍රකම ඒ පිළිවෙළටම ගෙන යනවා. ඒ නිසා මට හුඟක් මුදල් දුන්නා. සමහර අයට බොහොම අඩුවෙනුයි, දුන්නේ. අගමැතිතුමාගේ ආසනයට 8,000 ක්වත් ලැබුණේ නැහැ. කළුගල්ලේ ඇමතිතුමා අධ්‍යාපන ඇමති හැටියට එතුමාගේ ආසනයට ලක්ෂ 11 ක් පමණ වියදම් කළා. ඒ ගැනත් අප විරුද්ධ නැහැ. මා අධ්‍යාපන ඇමති වුණත් මගේ ආසනයට ටිකක් වැඩිපුර වියදම් කරනවා. එතුමා කොහොමහරි 11 ලක්ෂයක්ම වියදම් කර ගත්තා. ඒ නිසා පාසල් ගොඩනැගිලි සාධාරණව නොදීම සම්බන්ධයෙන් ගරු අධ්‍යාපන ඇමතිතුමාට විරුද්ධව චෝදනාවක් එල්ල කළාට ඒක සාර්ථක වන්නේ නැහැ. එය ඔප්පු කර ගන්නට බැරි චෝදනාවක් බව මා හබරාදුවේ මන්ත්‍රීතුමාට (ප්‍රින්ස් ගුණසේකර මයා.) මතක් කරන්නට කැමතියි. ඔය වගේ නීතිඥයකු කථා කළොත් ඒ නඩුව සම්පූර්ණයෙන්ම අහක යනවා.

ගරු කථානායකතුමනි, උසස් අධ්‍යාපනය ගැන සහ විශ්වවිද්‍යාලවල තත්ත්වය ගැන කියන්නට යෙදුණා. විශ්ව විද්‍යාලවලට ස්වෛරී බලයක් තියෙනවා. අධ්‍යාපන ඇමතිතුමාට විශ්ව විද්‍යාල ඇතුළේ ඕනම දෙයක් කරන්නට පුළුවන්ය කියා සමහරුන් හිතාගෙන ඉන්නවා. සමහර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු මන්ත්‍රීවරුනුත් ඒ කාරණය තවම හරියට දන්නෙ නැහැ. බොහෝ දෙනකු හිතාගෙන ඉන්නේ ඊරියගොල්ල ඇමතිතුමාට විශ්ව විද්‍යාල ඇතුළේ ඕනෑම දෙයක් කරන්නට පුළුවන්ය කියායි. එහෙම කරන්නට බැහැ. ඒක කරන්නට පුළුවන් උසස් අධ්‍යාපන මණ්ඩලයටයි. විශ්ව විද්‍යාල භාරව කටයුතු කරන්නේ ඒ අයයි. ආණ්ඩුවෙන් මුදල් දෙනවා. එහි පාලනය පිළිබඳ ස්වෛරී බලය ඒ අය අතේ තියෙනවා. විරුද්ධ පාර්ශ්වයේ බොහෝ දෙනෙකුත්, ඊරියගොල්ල මන්ත්‍රීතුමාට විරුද්ධව රටේ සිටින වෙනත් අයත් පුළුවන් තරම් උත්සාහ කරනවා, එතුමා නරක මිනිහකු හැටියට රටට පෙන්වන්නට. සත්‍යය අවබෝධ වුණුදාට ඔය කථා කරන අය කොයි ලෝකෙ යයිද දන්නෙ නැහැ. ඒ වන තෙක් අප බැට කාගෙන ඉවසනවා. දෙලොවක් අතර කව්රුන් ඉදියි ද, කව්රුන් පරලොව යයිද, කාට එලොව, මෙලොව දෙලොවම නැතුව යයිද කියා බලා ගන්නට පුළුවන් සත්‍යය අවබෝධ වුණුදට. නිතරම ප්‍රචාරය වන්නේ එතුමාට විරුද්ධවයි.

විශ්ව විද්‍යාලවල ඉන්න අපේ ළමයින් සියළු දෙනාම දූෂණය වෙලා ඉන්නවායයි එතුමා ප්‍රකාශ කළාය කියා මේ ගරු සභාවෙත් කියන්නට යෙදුණා. පාර්ලිමේන්තුවේදී එතුමා එහෙම කිව්වාය කිව්වා. හැන්සාඩ් වාර්තාවෙන් ඒක පෙන්වන්නය කියා එතුමා කිව්වා. පෙන්වන්නට බැරිව ගලේ පහරපු බළලුන් වගේ ඇකුළුණා. පත්‍රයේ පළ වෙන්නයි, ඕවා කියන්නේ. පත්‍රයේ ලොකු අකුරින් ප්‍රසිද්ධ කරවා පුළුවන් තරම් මඩ ගසන්නට සමහර ගරු මන්ත්‍රීවරුන් කථා කරනවා. ගරු අධ්‍යාපන ඇමතිතුමා එදා කළ කථාව මං අසාගෙන සිටියා. ඇත්ත වශයෙන්ම එතුමා ප්‍රකාශ කළේ කුමක්ද? යුරෝපීය සංස්කෘතියේ විකාශනයක් මේ රටේත් බෝවීම නිසාදෝ අපේ රටේ දරුවනුත්, ගම්බද ප්‍රදේශවල හොඳ විනයක් අනුව හැදුණු, බෞද්ධ ප්‍රතිපත්ති අනුව හැදුණු, අපේ රටේ හොඳ දරුවනුත් නරක අතට යනවාය කියා එතුමා කිව්වා. ඒකයි ප්‍රකාශ කළේ. ඒක සම්පූර්ණ සත්‍යයක්. එසේ නැතිව අර ගරු මන්ත්‍රීතුමා කී ආකාරයේ ප්‍රකාශයක් කළේ නැහැ. එතුමන්ලා කරන සෑම ප්‍රකාශයක්ම එහෙම තමයි. අධ්‍යාපන ඇමතිතුමා මෙන්න මෙහෙම කිව්වාය කියා වේදිකාවලට ගිහින් කියනවා. කියා තිබෙන තැන පෙන්වන්නටය කිව්වාම උත්තරයක් නැහැ. මේ සභා ගර්භය තුළ දීත් එවැනි ප්‍රකාශ කරනවා නම් වේදිකාවලදී මොන තරම් බොරු කියයිද?

ඇත්ත වශයෙන්ම කුමන උත්සාහයක් දරා හෝ සෑහෙන තත්ත්වයකට අපේ විද්‍යාලවල විනය උසස් කළ යුතුයි. අප කවුරුවත් අපේ දරුවකු නරක මිනිසකු වනු දකින්නට කැමති නැහැ. අපේ දරුවකු විශ්ව විද්‍යාලයක අධ්‍යාපනය ලබනවා නම් අප ඒ දරුවා ගැන ආඩම්බර වෙනවා. මගේ පුතා නැත්නම් මගේ දුව අපුඩිල් විශ්ව විද්‍යාලයේ ඉගෙන ගන්නවාය කියා කොයි දෙමව්පියනුත් ආඩම්බර වෙනවා. පුතා හෝ දුව විශ්ව විද්‍යාලයේ අධ්‍යාපනය ලබා උසස් ගති පැවතුම් ඇති උසස් මිනිසකු හෝ ගැහැණියක වී එළියට අවුත් ඒ පවුලේ අනෙකුත් සහෝදර සහෝදරියන්ටත් ආධාර උපකාර කර වයසට යන දෙමව්පියනුත් ආරක්ෂා කරගෙන මුළු පවුලම දීප්තිමත් කරාවිය කියා කොයි දෙමාපියනුත් ආඩම්බර වෙනවා. බලාපොරොත්තු ඇතිව ඉන්නවා. නමුත් ඒ ආකාරයට දරුවාට අධ්‍යාපනයක් නොලැබෙනවා නම්, ඔහු නොමග යනවා නම්, ඒ අධ්‍යාපනයෙන් වැඩක් නැහැ. මුළු ලංකාවටම, මුළු රටටම මුළු ජාතියටම, ප්‍රයෝජනවත් පිරිසක් එතනින් බිහි කිරීමට අප උත්සාහ ගන්නට ඕනෑ. ඒ විධියේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නට තමයි ගරු අධ්‍යාපන ඇමතිතුමා සටන් කරන්නෙ.

ශිෂ්‍යයන්ට ණය දීම ගැනත් මා සඳහන් කරන්නට සතුටුයි. ශිෂ්‍යයන්ට ණය දෙන්නට ගිය ආණ්ඩුවෙන් කටයුතු කළාය කිව්වාට, ලක්ෂ ගණනක් වෙන් කළාය කිව්වාට මොකද, එවැනි මුදලක් තවම නම් අපට දකින්නට ලැබුණේ නැහැ. සතියකින් දෙකකින් ශිෂ්‍යයින්ට ණය මුදල් දෙන්නට අපට පුළුවනි. නමුත් බැංකු නීති වෙනස් කරන තුරු අපට එසේ ණය මුදල් දීම අමාරුයි. ශිෂ්‍යයාත් පියා හෝ භාරකාරයාත් අත්සන් කිරීමෙන් ණය ගැනීමට වැඩ පිළිවෙළක් අප සකස් කර තිබෙනවා. ශිෂ්‍යයා විශ්ව විද්‍යාලයෙන් පිට වී රක්ෂාවක් ලබාගත් දට ඒ ණය ආපසු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න]

ගෙවන්නට පුළුවනි. අප එවැනි සහන යක් ඉගෙනගන්න ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට සලසා දී තිබෙනවා.

ඒ වාගේම අපේ පාලන කාලය තුළදී උගත් අයට වැඩියෙන් රක්ෂා සපයා දී තිබෙනවා. 1956 සිටම විභාගවලින් සමර්ථ වූ, එස්.එස.සී., එච්.එස්.සී. ආදී විභාගවලින් සමර්ථ වූ උදවිය ගෙවල්වල රස්තියාදු වෙමින් සිටිනවා. ඒ වාගේම විශ්ව විද්‍යාලවලින් පිට වන මේ උපාධි ධරයන් මොනවද කරන්නට යන්නෙ? ඒ අයට රක්ෂා සැපයීමේ වැඩ පිළිවෙළක් ඇනුයි සකස් කර තිබෙන්නෙ. විශ්ව විද්‍යාලවලින් පිට වන උදවිය ඇතුළු මේ රටේ රක්ෂා නැති සියලු දෙනාටම රක්ෂා සපයා, මේ රට ස්වයම් පෝෂිත කර මේ රට නියම අඩියකට පත් කරලීමට අප පදනමක් යොදා අව සානයි.

ගරු කථානායකතුමනි, මීට වඩා කථා කරන්නට මා අදහස් කරන්නේ නැහැ. විරුද්ධ පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් කොයි තරම් පිම්බුවත් බැලුම් බෝලය පිපුරුවේ නැහැ. විරුද්ධ පක්ෂයේ බලාපොරොත්තුව සාර්ථක නොවූ බව එතුමන්ලා පිළිගන්නවා ඇති. අධ්‍යාපන ඇමතිතුමාට විරුද්ධව අද මේ එල්ල කළ චෝදනාවල සත්‍යයක් තිබෙනවාය කියා මහජනතාවට සිතන්නට පුළුවන්කමක් නැහැ. ඇත්ත වශයෙන්ම මේ යෝජනාව අමූලික බොරුවක්; අසත්‍යයක්. මේක මහජනතාව මුළා කිරීමට දැරූ ප්‍රයත්න යක් බව කවුරුත් පිළිගන්නවා. අධ්‍යා පන ඇමතිතුමා ගැන මා ආඩම්බර වෙන වා. කියන්නට තියෙන එක හරියට කිය න, කරන්නට තියෙන එක හරියට කරන බොරුවක් ව්‍යාජයක් නැතුව ලංකාවේ අනාගත ජනතාව ගැන නියම කැක්කුම කින් දරුවන්ගේ ශිෂ්ටාචාරය හා සභ්‍යත් වය රකින්නට උත්සාහ දරන දරු කැක් කුමක් ඇති පියෙකු හැටියට සියලු දෙනා ටම අපක්ෂපාතව වැඩ කරන ලංකාවේ එකම ඇමතිවරයා ගරු අධ්‍යාපන ඇමති වරයා බව නිර්භයව ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනවා.

අ. භා. 5.15

බර්නාඩ් සොයිසා මයා. (දකුණු කොළඹ)

(திரு. பெர்னட் சொய்ஸா—கொழும்புத் தெற்கு அங்கத்தவர்)

(Mr. Bernard Soysa—Colombo South)

ගරු කථානායකතුමනි, ගරු අධ්‍යාපන ඇමතිතුමාට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ඉදිරිපත් කර තිබෙන මේ අවස්ථාවේදී කවදත් අධ්‍යාපන ප්‍රතිපත්ති ගැන විවේචනාත්මක විධියකට කථා කරන මට අද නම් සිදු වී ඇත්තේ යෝජනාව සම්පූර්ණයෙන්ම අනුමත කර න අතර පෞද්ගලිකත්වය උඩ නම් මගේ හිතේ කනගාටුවක් ඇති බව කියන්නටයි. මේ කනගාටුව ඇති වී තිබෙන්නෙ ඇයි? ගරු අධ්‍යාපන ඇමතිතුමා 1965 මේ ඇමති නිලය භාර ගත් කාලයේදී එතුමා තුළ විශාල බලාපොරොත්තුවක් තිබුණු බව මා දන්නවා. අපි කවුරුත් දේශපාලනයට පා තබන අවස්ථාවලදී අපේ දේශපාලන අභිමතාර්ථයන් අනුව—පෞද්ගලික අභිමතාර්ථ යන් නොවෙන්නට පුළුවනි. ආත්මාර්ථ කාමී අරමුණු නොවෙන්නට පුළුවනි. ඊට පිටස්තරව වුණත්—යම් ශ්‍රේෂ්ඨ කියා පිළිගන්න අරමුණක් සම්පූර්ණ කර ගැනී මේ බලාපොරොත්තු ඇති වෙනවා. එවැනි බලාපොරොත්තුවක් ඉටු කර ගැනී මෙන් මා යම් දෙයක් කළා කියන විශාල ප්‍රීතියක් ආඩම්බරයක් ඇති කර ගැනීමේ අදහසක් කා තුළත් වගේ තිබෙන බව අපි දන්නවා. ඒක මනුෂ්‍යත්වයට අයිති දෙයක්. ගරු ඇමතිතුමා ඇත්තෙන්ම බලාපොරොත්තු වූයේ නම පවතින ආකා රයට ඉතාමත්ම ශ්‍රේෂ්ඨ කර්තව්‍යයක් ඉෂ්ට කිරීමටයි. කනගාටුව මට ඇති වී තිබෙන්නේ ඒ නිසයි. මන්ද? අවුරුදු 3½ක් වැයම් කළාට පසුව එතුමා ගත් සෑම පියවරක්ම කෙළවර වී තිබෙන්නේ අවුලකිනුයි. එතුමා ඇති කර ගත් ඒ ශ්‍රේෂ්ඨ බලාපොරොත්තු සුන් වන අවස් ථාවටයි ඇත් පැමිණ තිබෙන්නේ. වට පිට බැලූ හැම දිසාවලම පෙනෙන්නේ අධ්‍යාපන ක්‍රමය බිඳ වැටීමේ ලකුණුයි. මේ යන පිළිවෙළේ හැටියට අපි තවදුර ටත් ගියොත් ඇත්තටම රටේ අධ්‍යාපන ක්‍රමය නිසා දැනට මතු වීගෙන එන පරම්පරාවට විශාල හානියක් සිදු වන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නිසා තමයි, පෞද්ගලිකව පහරක් ගැසීමට මගේ කිසිම කල්පනාවක් නැති වුනත් මේ පොදුවේ ඉදිරිපත් කර තිබෙන යෝජනාවට සම්පූර්ණයෙන්ම පක්ෂව කථා කරන්නට මට සිදු වී තිබෙන්නේ.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

තමුන්නාන්සේ හරියට වටපිට බලල නැහැ.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னட் சொய்சா)*
(Mr. Bernard Soysa)

තමුන්නාන්සේගේ කණ්ණාඩි කුට්ටම මට නැහැනෙ.

ගරු කථානායකතුමනි, අධ්‍යාපන ඇමතිතුමාගේ ආරක්ෂාවට සාමාන්‍යයෙන් කියනා කථා දෙකක් තිබෙනවා. ඒ දෙකම අද පාවිච්චි කළා. එකක් නම්, "තමුන්නාන්සේලා මට පෙර අවුරුදු 9 ක් ආණ්ඩු කළානෙ. ඒ කාලයේදී ඇයි මේව නොකළේ ?" කියන එකයි. අනික "ඒ කරපු දේවල් නිසා තමයි, අද මා මේ අමාරුවට පත්ව සිටින්නේ." කියන එකයි. ඔය දෙකම කියනවා.

අද අපේ අධ්‍යාපන ඇමතිතුමාගේ පාර්ලිමේන්තු ලේකම්තුමාත් කරුණු වගයක් මතක් කර දුන්නා. යටගිය අවුරුදු 3½ තුළ සංඛ්‍යා ලේඛනවලින් පෙන්වා දුන්නා, ඊට කලින් සිටියාට වඩා ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි වුණු හැටි. වියදම් කළ මුදල් ප්‍රමාණය වැඩි වුණු හැටි. ඇමතිතුමා අද ඊට වඩා අමුතු විධියේ තර්කයක් ගෙනාවා. මොකක්ද? කන්නන්ගර ඇමතිතුමාගේ උරුමය අනුව මම ඉදිරියට යනවා කියන තර්කයයි. ගරු කථානායකතුමනි, මේ යෝජනාවේ ගැබ් වී තිබෙන චෝදනාව මෙතැනින්ම ඔප්පු කරන්නට පුළුවනි. නීති විරෝධීව; නීතියෙන් අනුමැතියක් නොමැතිව ගරු ඇමතිතුමා අධ්‍යාපනය පිළිබඳ පියවර කීපයක් දැනට අරගෙන තිබෙන බවට මේ යෝජනාවෙන් චෝදනා කර තිබෙනවා. ඒ නංවා තිබෙන චෝදනාව මේ කථාවෙන්ම ඔප්පු වෙනවා. මොකක්ද හිටපු කන්නන්ගර අධ්‍යාපන ඇමතිතුමා කළාය කියන විශාල සේවය? එතුමා විශේෂ කමිටුවක් පත් කළා. ඒ කමිටුව පත් කළේ, අධ්‍යාපනය සංශෝධනය කළයුත්තේ කෙසේද යන්න වාර්තා කිරීම පිණිසයි. 1943 කාලයේ ඒ කියන්නේ දෙවන මහා යුද්ධය කර ගෙන යන කාලයේ තමයි එම කමිටුව පත් කළේ. ඒ කමිටුව මගින් වාර්තාව සකස් කර ගෙන යන අවස්ථාවේදී අන්තිම මොහොතේදී මේ යෝජනාව ඉදිරිපත් වුණා. එම යෝජනාව ගෙනා අයට ඊට නිසි ගරුත්වය දීමට සහ ස්තුතිය පිරිනැමීමට යුතුකමක් තිබෙනවායැයි මාත් ප්‍රකාශ කරනවා. එයින් එක් අයෙක් තමයි, තමුන්නාන්සේලා මතක් නොකළ, අද සෙනෙට් සභාවේ සභාපතිතුමා වශයෙන් සිටින ඒ. රත්නායක මහතා. මෙම යෝජනාව එදා ඉදිරිපත් කළේ අවසාන මොහොතේදීයි. ඒ කොමිටිය වැඩ කර ගෙන ආවේ නිදහස් අධ්‍යාපන ක්‍රමයක් ඇති කිරීමට නොවෙයි. අන්තිම මොහොතේදීයි, එම අදහස ඉදිරිපත් වුණේ. ඒ හෙයින් අන්තිමේ දී සිදු වුණා, ඒ ඉදිරිපත් කළ වාර්තාව අනුව කටයුතු කරන්නට.

එක්සත් ජාතික පක්ෂයට අයිති ඇමතිවරුන් දෙදෙනකු විසින් කටයුතු කර ඉතිරි කළ හරිය සම්පූර්ණ කිරීමට ඉදිරිපත් වන්නා හැටියට තමුන්නාන්සේ කරපු කතාවෙන් පෙනී යන්නේ කුමක්ද? අසම්පූර්ණ වාර්තාවක් ක්‍රියාත්මක කරන්නට තැත් කිරීමයි. නිදහස් අධ්‍යාපන ක්‍රමයය කියන වැදගත් අදහස එහි ගැබ් වූ නමුත් එය සනාථ කිරීමට අවශ්‍ය වූ සංවිධානයක් එම වාර්තාවෙන් නිර්දේශ කර තිබුණේ නැහැ. එසේ නිර්දේශ කරන්නට එම කොමිටියට ශක්තියක් තිබුණේත් නැහැ. බැඩිබි මහතා අයිවර් ජෙනිංස් මහතා වැනි අධිරාජ්‍යවාදී හා මිටිකාර අදහස් දරණ පුද්ගලයන් ගෙන්ද නිසි විධියේ අධ්‍යාපන ක්‍රමයක් සකස් කරන්නට හැකි වැඩ පිළිවෙළක් යෝජනා කෙරේවිය කියා බලාපොරොත්තු විය හැක්කේ? මේ කමිටුවෙන් ඉදිරිපත් කළ වැඩ පිළිවෙළේ හරය කුමක්ද? එනම් උපකෘත පාඨශාලා ක්‍රමයයි; ආධාර ලබන පාඨශාලා ක්‍රමයයි. ඒ ක්‍රමයට තමයි බැස්සේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

ඒවා ආණ්ඩුවේ පාඨශාලා විය යුතුය කියා තිබෙනවා.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

ආණ්ඩුවේ පාඨශාලා විය යුතුය කිව්වාට එම පියවර නිසි විධියට ගතයුතුය කියා යෝජනා කරන්නට, නිර්දේශ කරන්නට ශක්තියක් තිබුණේ නැහැ. එදා නිදහස් අධ්‍යාපනය පිළිබඳව එක්සත් ජාතික පක්ෂයේ මතභේදයක් තිබුණා. කොටසක් ඊට පක්ෂව සිටියා. කන්නන්ගර මැතිතුමාගේ එම වැදගත් අදහස සනාථ කරන්නට ඒ අය කැමති වුණා. ගරු ඇමතිතුමා දන්නවා ඇති එතුමා අපත් සමග 1947 මහා මැතිවරණයට මුහුණ දුන් අන්දම ගැන. එදා එතුමා වේදිකාවල නැගී එක්සත් ජාතික පක්ෂයට විරුද්ධව කෑ ගැසුවා. අපි නිදහස් අධ්‍යාපන ක්‍රමය ක්‍රියාත්මක කරනවාය; එම නිසා අපට ඡන්දය දෙන්නැයි එදා එතුමා ඒ අයට විරුද්ධව ඉදිරිපත් වන නිදහස් මන්ත්‍රීවරයකු හැටියට කතා කළා. "අපට ඡන්දය දෙන්න, අපි නිදහස් අධ්‍යාපන ක්‍රමයක් ඇති කරනවා" යනුවෙන් එදා එතුමා කී බව අපට මතකයි. එදා එක්සත් ජාතික පක්ෂය සිටියේ දෙගිඩියාවෙනුයි; තිබුණේ දෙකඩවයි. නිදහස් අධ්‍යාපන ක්‍රමයට එහි නායකයන් කීප දෙනෙක් විරුද්ධව සිටියා. 1947 මහා මැතිවරණයේදී එම කාරණය පදනම් කර ගෙන ඇති වූ උද්ඝෝෂණය නිසා වමේ පක්ෂවලින් 20 දෙනෙක් විතර විරුද්ධ පාර්ශ්වයට ආවා. ඊරියගොල්ල මැතිතුමා වැනි නිදහස් මන්ත්‍රීවරුන් කීප දෙනෙක් ද පත් වුණා. "නිදහස් අධ්‍යාපන ක්‍රමය ක්‍රියාත්මක කරන්නට අපි බල කරනවාය" කියන චේතනාව අනුව කතා කළ නිසයි ඒ උදවියට එදා එම ජයග්‍රහණය ලැබුණේ. 1947 මැතිවරණයෙන් බිහි වූ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවට නිදහස් අධ්‍යාපන ක්‍රමය අකමැත්තෙන් වුවත් සනාථ කරන්නට සිදු වුණා. ඉතිහාසය නොදන්නා බඩ්බු නම්, ගරු අධ්‍යාපන ඇමතිතුමාගේ පාර්ලිමේන්තු ලේකම්තුමා වැනි උදවිය නම් මෙම කාරණය නොදන්නා එක ගැන සමාවක් දෙන්නට පුළුවනි. එහෙත් එදා එම සිද්ධින්ට සහභාගි වූ අධ්‍යාපන ඇමතිතුමා වැනි අය ඒවා අමතක කර කතා කිරීම ගැන නම් සමාවක් දෙන්නට බැහැ.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

එය ක්‍රියාත්මක වුණා.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

කෙසේද ක්‍රියාත්මක වුණේ? උපකෘත පාඨශාලා ක්‍රමය ඇති කිරීමයි සිදු වුණේ. ඒ නිදහස් අධ්‍යාපන ක්‍රමය සම්පූර්ණ කිරීමට ගත් පියවර තමයි, උපකෘත පාඨශාලා ක්‍රමය. එම පියවරවලින් කුමක්ද සිදු වුණේ? ඒ ක්‍රමය මේ රටේ එදා පැවති පන්ති භේදය තවදුරටත් තහවුරු කිරීමට ගත් පියවරක් මිස වෙන පියවරක් නොවේය කියා අපට අද හඳුන්වා දෙන්නට සිදු වී තිබෙනවා. එය ඉදිරියට තැබූ පියවරක් හැටියට තවමත් සලකන්නට පුළුවන් එහෙත් නියම විධියේ නිදහස් අධ්‍යාපන ක්‍රමයක් අනුව නොමිලයේ අධ්‍යාපනය දීමට ඒ තරම් එඩිතරකමක්, නිර්භීතකමක් හෝ ත්‍යාගශීලී බවක් එදා තිබුණු ආණ්ඩුවට 'නොතිබුණු නිසා උපකෘත පාඨශාලා ඇති කිරීමේ පියවරින් එය නැවත්වුවා. උපකෘත පාඨශාලා ඇති කිරීමෙන් සිදු වුණේ කුමක්ද? පොහොසත් අයට තිබුණු ඒ උපකෘත පාඨශාලා ක්‍රමය පොහොසතුන්ගේ දරුවන්ගේ යහපත සඳහා රජයේ ආධාර ඇතිව ඉදිරියට ගෙනයන්නට පිළිවෙළක් ඇති කිරීමයි. අතරින් පතර මධ්‍ය මහා විද්‍යාලයක් ඇති කළ බව ඇත්තයි. එහෙත් ඊට පහළින් සිටි දුප්පත් ගැමි ජනතාවගේ දරුවන්ට තිබුණේ "වර්නකියුලර් ස්කූල්ස්" හා "ඇන්ග්ලෝ වර්නකියුලර් ස්කූල්ස්" කියන දෙක පමණයි.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

දන් නැහැනේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

දන් නැහැ තමයි. ඒ යුගය ගැන දන් අමතක වෙලා. උපකෘත පාසල් ක්‍රමයෙන් සිදු වූයේ රජයේ මුදල්, බදු ගෙවන්නන්ගේ මුදල්, මේ රටේ දුප්පත් අයගෙන් ගන්නා මුදල් මේ රටේ පොහොසත් අයගේ නැත් නම් ධනපති පිරිසේ දරුවන්ට විශේෂ අධ්‍යාපනයක් ලබාදීමට යෙදවීමයි. ගරු අධ්‍යාපන ඇමතිතුමා දන් ඒ කරුණ අමතක කරනවා නම් සත්‍යයෙන් තොරව කරුණු ඉදිරිපත් කරනවාය කියා මා හිතනවා.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

**කොහොම වුණත් දන් ඒ තත්ත්වය නැහැනේ.**

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

**දන් නැහැ තමයි. හොඳයි නැති වුණේ කොහොමද ?**

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

**කොහොම හෝ නැති වෙලානේ.**

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

ගරු ඇමතිතුමා කලින් සිටි අධ්‍යාපන ඇමතිවරුන් දෙදෙනකු ගැන වර්ණනා කළා. ඔවුන්ගේ මාර්ගයෙන් ලැබෙන උරුමය ඉදිරියට ගෙනයන කෙනෙක් හැටියට ගරු ඇමතිතුමා ඉදිරිපත් වුණා.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

ඒ ස්වභාෂාව ගැන.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

ස්වභාෂාව මාර්ගයෙන් අධ්‍යාපනය ලබා දීම ගැන තමුන්නාන්සේගේම කැබිනට් මණ්ඩලයේ සිටින ඇමතිවරයෙක් දන් මට කලින් කථා කරමින් දොස් කීවේ කාට ද ? ඉංග්‍රීසි භාෂාව නැති කළා, ස්වභාෂාවෙන් අධ්‍යාපනය ලබා දුන්නා, ඒ නිසා මේ අයට දන් පොතක් පතක්වත් බලා ගන්නට විධියක් නැහැ කියා ආන්දෝලනයක් කළේ ගරු අධ්‍යාපන ඇමතිතුමා සමගම කැබිනට් මණ්ඩලයේ එකට සිටින සමාජ සේවා ඇමතිතුමා නේද ?

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

එතුමා කීවේ සිංහල භාෂාව උගන්වන අතර ඉංග්‍රීසි භාෂාවත් ඉගැන්විය යුතුයි. එහෙත් එය නැති කළාය කියන එකයි. නිකම් පටලවන්න එපා. සියලුදෙනාම මෝඩයෝ නොවෙයි.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

කිසිම විධියකින් පැටලිල්ලක් ඇති වුණේ නැහැ. එසේ කථා කළ සමාජ සේවා ඇමතිතුමාට ඉඳහිට කරුණු පැටලෙනවා. එහෙත් එතුමා ඒ අවස්ථාවේදී නම් කිසිම පැටලිල්ලක් නැතිව එය පැහැදිලිවම කිවා. ඉංග්‍රීසි භාෂාව දියුණු කිරීම සම්බන්ධව කමිටුවක් පත් කළේ ඔය යූ. එන්. පී. කාලයේදීමයි. එහෙත් එම කමිටුවේ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට බණ්ඩා ඇමතිතුමාවත් නුගවෙල ඇමතිතුමාවත් එකම පියවරක්වත් ගත්තේ නැහැ. ඊට පසුව දහනායක ඇමතිතුමාගේ කාලයේ ඒවා ක්‍රියාත්මක කරන්නට පටන් ගත්තා. එහෙත් එසේ පටන් ගැනීමේදීත් නිසි විධියට වුවමනා කරන ගුරුවරුන් පුහුණු කිරීමට උත්සාහයක් දැරුවේ නැති බව නම් මතක් කරන්නට මට සිදු වෙනවා. ඒ ගැන වරද පිළිගන්නත් සිදු වෙනවා. ඒ උරුමය තමුන්නාන්සේට ලැබුණාට පසුවත් තමුන්නාන්සේත් හැමදාම ඉංග්‍රීසි ගැන කථා කළා. එහෙත් ඒ ගත් පියවරවල් එකක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

වත් සම්පූර්ණ වී නැහැ. ගරු අධ්‍යාපන ඇමතිතුමා ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳව උපදෙස් ගන්නේ මේ රට ගැන දැනීමක් ඇති අයගෙන් නොවෙයි. ඇමතිතුමා උපදෙස් ගත්තේ බ්‍රිතාන්‍ය නානාපති කාර්යාලය මගින් මෙහි පිහිටුවා ඇති ආයතනයකින්. ඒ ආයතනය ගෙන යන අය බ්‍රිතාන්‍ය සංස්කෘතිය පැතිරවීමට විශේෂ උත්සාහයක් ගන්නා බව මා දන්නවා. එහෙත් ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේදී ඒ අයගේ රක්ෂාවල් ගැනයි ඒ අය බලන්නේ.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

සම්පූර්ණයෙන්ම වැරදි හැඟීමක්. ඒ කමිටුවේ සිටින්නේ අපේ විශේෂඥයෝයි. ඒ කමිටුව ඒ භාෂාව ගැන දන්නා ඒ අය ගෙනුත් උපදෙස් ගන්නවා. එහි ඇති වරද කුමක් ද? ඉංජිනේරුවන් ආදී වෙනත් විශේෂඥයින් ඒ රටින් ලබා ගන්නේ.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

ගරු කථානායකතුමනි, එහෙත් ඒ කමිටුව නිර්දේශ කර සකස් කළ ඉගැන්වීමේ පිළිවෙළ අර අයගේ උපදෙස් අනුව යටපත් කිරීමට ගරු ඇමතිතුමා ලැහැස්ති වුණා.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

එකක් කළා. මාර්ක්ස්වාදය පැතිරවීමට ගසා තිබුණු පොතක් නම් නැවැත්තුවා.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

ගරු කථානායකතුමනි, රතු පාට දැක්කාම කලබල වන එක්තරා සත්ව වර්ගයක් මේ ලෝකයේ සිටිනවා. ඒ ගණයට අපේ අධ්‍යාපන කටයුතු භාර ගරු ඇමති තුමා ඇතුළත් කරන්නට මගේ සිතන් කිසිම කැමැත්තක් නැති බව මේ අවස්ථාවේ මතක් කරන්නට ඕනෑ.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

වැඩේ වැරදුණා. ඒකට මට කරන්නට දෙයක් නැහැ.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

ගරු කථානායකතුමනි, ගරු අධ්‍යාපන ඇමතිතුමාගේ පාඨශාලා ප්‍රතිසංවිධානය කිරීමේ යෝජනාව ගැන මීට පෙර ධවල පත්‍රිකාව සාකච්ඡාවට භාජන වූ අවස්ථාවේදී අපට කරුණු ඉදිරිපත් කරන්නට අවස්ථාවක් ලැබුණා. ධවල පත්‍රිකාවක් ඉදිරිපත් කිරීමේ මූලික අදහස මේ ගරු සභාව මගින් මහජන මතය කුමක් දැයි මැනීමයි. අධ්‍යාපන ධවල පත්‍රිකාව සාකච්ඡා කිරීමෙන් එදා මහජන මතය මැන්නා. මැන්නායින් පස්සේ ගරු ඇමතිතුමා වේදිකාවලදී මා සමග කීවේ මොකක් ද? විවේචනය කරද්දී තමුසේ ඉදිරිපත් කළ කරුණුවලින් කොටසක් පිළිගන්නාය කිව්වා. පිළිගැනීමට හැකි වන අන්දමට අධ්‍යාපන ක්‍රමයක් සකස් කර තිබෙන බවත් එතුමා මා සමග කිව්වා. එහෙත් මේ අවුරුද්දේ මුල හරියේ දී, අපට ගිය වර්ෂයේ මුල හරියේදී, දකින්නට ලැබුණු ප්‍රතිසංවිධානය කිරීමේ යෝජනා ගැන සලකන විට, දකින්නට ලැබුණේ මොකක් ද? ඉතින් මොකක් ද මෙහි හරය? මෙහි හරය මෙයයි. ගරු අධ්‍යාපන ඇමතිතුමා පනතක් මගින් සම්පූර්ණ කරන්නට බලාපොරොත්තු වූ වර්ග කිරීම—දරුවන් වයස 14 දී වර්ග කර, උසස් අධ්‍යාපනය මේ කොටසටය; අනෙක් කොටසට උසස් අධ්‍යාපනයක් නැත, යනුවෙන් වර්ග කරන්නට ගත් උත්සාහය—පනතක් නොමැතිව ප්‍රතිසංවිධානයේ මාර්ගයෙන් කිරීමයි. අපේ අධ්‍යාපන ඇමතිතුමාට නැවත වරක් ඉතිහාසයෙන් කොටසක් මතක් කරන්නට ඕනෑ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමති ගරු අයි. එම්. ආර්. ඒ. ඊරියගොල්ල කෙරෙහි

**ටී. බී. එම්. හේරත් මයා.**
(திரு. ரி. பி. எம். ஹேரத்)
(Mr. T. B. M. Herath)

වැඩක් නැහැ. එයින් වන ප්‍රයෝජනයක් නැහැ.

**ද සොයිසා සිරිවර්ධන මයා.**
(திரு. டி சொய்ஸா சிறிவர்தன)
(Mr. de Zoysa Siriwardena)

එතුමාට පරණ ඒවා මතක නැහැ.

**බර්නාඩ් සොයිසා මයා.**
(திரு. பெர்னாட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

ගරු කෘෂිකර්ම ඇමතිතුමා අධ්‍යාපන ඇමති නිලය දැරූ කාලයේ මේ විශේෂ උරුමය—නිදහස් අධ්‍යාපන ක්‍රමයේ උරුමය—සනාථ කිරීම සඳහා කළ යුතු දේ සම්පූර්ණ කරන්නට තවත් යම් පියවරක් ගත්තා. ඒ කාලයේ හවුස් නමින් මහත් මයකු ගෙන්වා ගත්තා. ඒ මහත්මයා වාර්තාවක් නිකුත් කළා. ඒ වාර්තාවේ අඩංගු වූයේ මොනවා ද? වයස අවුරුදු 8 සිට 14 දක්වා දරුවන් වර්ග කරන්නට ඕනෑය කිව්වා. මේ අය කෘෂිකර්මාන්තයට හොඳයි, මේ අය හොඳ මසුන් මරන්නන් හැටියට පුහුණු කරන්නටයි. වඩුවන් හැටියට පුහුණු කරන්නට මේ අය හොඳය, දෙස්තර මහත්වරුන් හැටියට පුහුණු කරන්නට මේ අය හොඳය, ගුරුවරුන් වශයෙන් පුහුණු කරන්නට මේ අය හොඳය, නීතිවේදීන් හැටියට පුහුණු කරන්නට මේ අය හොඳය ආදී වශයෙන් වර්ග කරන්නට ක්‍රමයක් ඇති කිරීම සුදුසු යයි කිව්වා. මේ ආදී වශයෙන් ළමයින් වයස අවුරුදු 8 සිට 14 දක්වා කාලය තුළ දී වර්ග කිරීමේ යම් ක්‍රමයක් යෝජනා කළ හවුස් වාර්තාව මේ ගරු සභාවේදී සංවාදයට භාජන වූ අවස්ථාවේදී තමුන්නාන්සේලාගේ ඔය කැබිනට් මණ්ඩලයේ අද සිටින ස්වදේශ කටයුතු භාර ගරු ඇමතිතුමා තමයි විශේෂයෙන් එය හෙළා දැක්කේ. එපමණක් නොවෙයි අද කර්මාන්ත හා ධීවර කර්මාන්ත පිළිබඳ ගරු අමැතිතුමාත්, ඒ වාගේම යටියන්තොට ගරු මන්ත්‍රීතුමාත් (ආචාර්ය එන්. එම්. පෙරේරා) යනාදි බොහෝ දෙනෙක් එදා එයට විරුද්ධව කථා කළා පමණක් නොවෙයි, එය හෙළා දැක්කා. හවුස් වාර්තාවේ ගැබ් වූ අදහස කවදා නමුත් ක්‍රියාත්මක කරන්නට යනවා ද? අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සිටින නිලධාරීන් සියලු දෙනාම නරක අයය කියා මම කවදාවත් කියන්නේ නැහැ. සියලු දෙනාම සම්බන්ධයෙන් එවැනි චෝදනාවක් කරන්නේ නැහැ. එහෙත් සමහර අය ඉන්නවා, ඒ අදහස් ක්‍රියාත්මක කරන්නට වටිනවා යයි අදත් කල්පනා කරන. හවුස් වාර්තාව මේ දුප්පත් ඇමතිතුමාගේ හිතට කාවද්දවා ඇමීම නිසා දැන් එතුමා මෙය කර ගහගෙන ඉන්නවා.

හවුස් වාර්තාවෙන් කියන්නේ මොකක් ද? ධනේශ්වර සමාජයට අවශ්‍ය වූ කොටසක් විශේෂයෙන් වෙන් කර, මේ අයට පමණයි උසස් අධ්‍යාපනයක් ලබා දෙන්නේ, කියනවා. උසස් රක්ෂාවල් ලබා දෙන්නේත් පැසසුම් ලබා දෙන්නේත් මේ උදවියටයි කියනවා. ධනේශ්වර ක්‍රමයට අවශ්‍ය වූ කම්කරු පෙළපතට පත් කිරීම සඳහා අනෙක් උදවිය තබා ගැනීමටයි වැඩ පිළියෙළ කෙළේ. මේ රටේ ආර්ථික ක්‍රමයේ තිබෙන පංක්ති භේදය, පංක්ති වෙනස තව දුරටත් තහවුරු කරන්නට සේවයක් වන ආකාරයට ඊට වුවමනා කරන කම්කරුවන් වැනි සේවක පිරිස මේ රටේ ඇති කිරීම සඳහා අධ්‍යාපන ක්‍රමය පරිවර්තනය කිරීමයි එදා හවුස් කොමිටියේ පරමාර්ථය වූයේ. අද එය සනාථ කිරීමටයි මේ ප්‍රතිසංවිධානය කිරීමේ යෝජනා සකස් කර තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, මොකක්ද මේ ගරු ඇමතිතුමා අද කියන්නේ? 8 වැනි ශ්‍රේණිය දක්වා කණිෂ්ඨ විද්‍යාලයේ ඉගෙන ගන්නවා. එතැනින් සමත් වුණොත් ශිෂ්‍යත්වයක් ලබාගෙන ජ්‍යෙෂ්ඨ විද්‍යාලයකට යවනවා. හත් වර්ගයකට බෙදා තිබුණු පාසල්, දෙවර්ගයක් දක්වා අඩු කිරීමෙන් තමා විශාල සේවයක් කළ බව අධ්‍යාපන ඇමතිතුමා කියනවා. 8 වන ශ්‍රේණියෙන් සමත් නොවන අය සම්බන්ධව එක්තරා පිළිවෙළක් අධ්‍යාපන ඇමතිතුමාගේ ධවල පත්‍රිකාවෙහි යෝජනා කර තිබුණා. කාර්මික විදුහලකට ගොස් එතැන දී කිසියම් කර්මාන්තයක් ඉගෙන ගෙන ඉන් එහා යන්නට කැමැති අයට එසේ යා හැකි පිළිවෙළක් එම ධවල පත්‍රිකාවෙහි සඳහන් වුණා. ඒ පණත සම්මත වුණා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නම් ඒ නීතිය අනුවම කාර්මික විදුහල් ඇති කරන්නටත් අධ්‍යාපන ඇමතිතුමාට සිදු වෙනවා.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
ඇති කරගෙන යනවා.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)
ඇති කරගෙන යන නමුත් 8 වන ශ්‍රේණිය පැන්නායින් පසු ගෙදර බලා යන්නට කීදෙනකුට සිදු වෙනවාද ? මේ රටේ අධ්‍යාපනයෙන් කිසියම් සේවයක් සිදු වී තිබෙන බව, එහි ඉතිහාසය මුල සිට අගට බැලුවොත් අපට පෙනී යනවා. එය පිළිගත යුතු කාරණයක්. එය එසේ නො වේයයි මා කියන්නේ නැහැ. නිදහස් අධ්‍යාපන ක්‍රමයක් මේ රටේ ඇති කිරීම අධ්‍යාපනය සම්බන්ධයෙන් ඉදිරියට තබන ලද විශාල පියවරක්. පාඨශාලා රජයට ගැනී මත් එවැනිම විශාල ප්‍රගතශීලී පියවරක්. වඩ්ඩුක්කොඩේ ගරු මන්ත්‍රීතුමා නම්, (අමිර්තලිංගම් මයා.) පාසල් රජයට ගැනීම හෙළා දැක්කා. ප්‍රතිගාමී හණමිටි අදහස් දරන එවැනි මන්ත්‍රීවරුන් පසෙක තබමු. එවැනි කීපදෙනකු හැරුණු විට අනෙක් කවුරුනුත්, පාසල් රජයට ගැනීම ප්‍රගතිශීලී පියවරක් වශයෙන් පිළිගන්නවා ඇති. එහෙත්, අංග සම්පූර්ණ සමාජවාදී පාලන ක්‍රමයක් මේ රටේ බිහි කරනතුරු අධ්‍යාපන ප්‍රශ්නය හරියාකාර විසඳෙන්නේ නැහැ. මේ රටේ අධ්‍යාපනයට ශත වර්ෂ යක් සම්පූර්ණ වී තිබෙන අද පවා 100 දෙනකු පහළ බාලාංශ පන්තියට ඇතුළක් වුණොත් අවුරුදු 9 කට පසු ජ්‍යෙෂ්ඨ පන්තියෙහි ඉතිරි වන්නේ එයින් 28 දෙනකු පමණයි. අනෙක් සියයට 72 දෙනා දුප්පත්කම, දිළිඳුකම නිසා අධ්‍යාපනය කඩාකප්පල් වීමෙන් අධ්‍යාපනයෙන් සම් පූර්ණයෙන්ම තුරන් වෙනවා. ඒකයි ඇත්ත. හතර දෙනකුට පමණක් උගන් වන්නට ගුරු මණ්ඩලයට අමුතුවෙන් ගුරුවරුන් බඳවා ගන්නට වුවමනා නැත යනුවෙන් සමාජසේවා ඇමතිතුමා එක් වැදගත් තර්කයක් ඉදිරිපත් කළා. මාත් එය පිළිගන්නවා. ඒ අතින් මුදල් ඉතිරි කරගෙන, සිටින ගුරුවරුන් ඒ අවශ්‍යතා වන්ට අනුව යොදා ගන්නට පුළුවන් නම් හොඳයි. එහෙත්, ඒ මතය පමණක් පිළි ගෙන මෙය අංග සම්පූර්ණ ප්‍රතිසංවිධාන යක් හැටියට බාර ගන්නට අපට පුළුවන් කමක් නැහැ. සියයට 72 දෙනකු අධ්‍යා පනයෙන් තුරන් කෙරෙන ක්‍රමය තහවුරු කිරීමක් මේ. එයයි අපගේ චෝදනාව. 8 වන ශ්‍රේණියේ විභාගයෙන් යම් දරුවකු සමත් වුණත් එම පාඨශාලාවේ ඉඩ නැතැයි කිව්වොත් හෝ, එසේ නැත්නම්, විභාග යෙන් එම දරුවා අසමත් වුණොත් හෝ ඔහුට තවදුරටත් ඒ පාඨශාලාවේ ඉන්නට බැහැ. ඔහු ගෙදර යා යුතුයි.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
තව අවුරුද්දක් පුළුවනි.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)
හතේදී නැවතුණොත් බැහැ.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
ඒත් පුළුවනි.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)
මේ අවුරුදු දෙක ඉඩදී තිබෙන්නේ යන් තම් නමින් පමණක් නීතිය කඩ කිරීමෙන් බේරීම සඳහායි.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
හැම දෙයක් සම්බන්ධයෙන්ම ඔය විධි යට හිතීම නරකයි.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)
මේ අවුරුදු දෙක ඉඩ නොදුන්නොත්, අනිවාර්ය අධ්‍යාපන වයස වන අවුරුදු 14 දක්වා අධ්‍යාපනය දිය යුතුය යන ප්‍රති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පත්තිය උල්ලංඝණය වෙනවා, ගරු ඇමති තුමාගේ මේ ප්‍රතිසංවිධාන ක්‍රමයෙන්. අවසාන අවුරුද්දේදී තවත් අවුරුද්දක් ඉඩ දෙන බව කියන්නේ එයින් බේරීම ටයි. මෙය උගුරට හොරා බෙහෙත් කෑමක්.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

අප එහෙම කරන්නේ නැහැ. ඒ ගැන සැක කරන්නට එපා.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

ඇමතිතුමාගේ වෙද මහත්මයා කවුරුන් දැයි මා දන්නේ නැහැ. එහෙත්, 8 වන ශ්‍රේණිය පැන ගන්නට බැරි වන දරුවන්ට සිදු වන්නේ කුමක්දැයි මා දන්නවා. ඔතනදී තමයි, තමුන්නාන්සේලාගේ මේ ධනේශ්වර සමාජයට ඔබින ආකාරයට පංක්ති හැඟීමක් ලත් ප්‍රධානාචාර්ය වරුන්, තමුන්නාන්සේලාගේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සමහර නිලධාරීන්, අධ්‍යාපන අමාත්‍යාංශයේ සමහර නිලධාරීන් ඔය 8 වෙනි ශ්‍රේණියේදී තමයි බෙල්ල කපන්නට පිහිය මුවහත් කරගෙන ඉන්නෙ. එතැනදී තමයි දරුවන්ගේ අධ්‍යාපනය එතැනින් එහාට යන එක නවත්වන්න බලන්නෙ.

ගරු කථානායකතුමනි, දරුවන් වර්ග කරනවාට විරුද්ධ වුණ නිසා දැන් දරුවන් වර්ග කරන්නේ නැතුව, පාසල් වර්ග කරනවා. පාසල් වර්ග කිරීමෙන් ඒ කාර්‍යය ඉටු කර ගන්නයි බලන්නෙ. වහෙන් ඹරෝ කිව්වත් ඔහෙන් වරෝ කිව්වත් එකම තේරුම බව එකම ප්‍රතිඵලය බව අප දන්නා නොවේද? මෙහි සිද්ධ වී තිබෙන්නෙත් ඒකමයි. මෙම ප්‍රතිසංවිධානය කිරීමෙන් නීතියක් කඩවෙන්නේ නැත කියා එතුමා කියනවා. මෙවැනි ප්‍රතිසංවිධානයක් කිරීම සඳහා එදා අපේ බණ්ඩා ඇමතිතුමා අවසාන වශයෙන් ඉදිරිපත් කළ ධවල පත්‍රිකාව ක්‍රියාත්මක කිරීමට එය නීතියක් වුණේ නැහැ. එහෙත් ඊට පසුව ඇති වුණ නීතිය අනුව හෝ ඊට කලින් ඇති වුණ නීතිය අනුව හෝ තමුන්නාන්සේ කරන මෙම ප්‍රතිසංවිධානයට නීත්‍යානුකූල පදනමක් නැහැ. ප්‍රදේශ වශයෙන් ඇති කර තිබෙන මෙම ප්‍රතිසංවිධානයට නීතියෙන් කිසිම බලයක් නැහැ. තමුන්නාන්සේ "ඩිරෙක්ටර් ජෙනරල්" කෙනෙක් පත් කර තිබෙනවා. "ඩිරෙක්ටර් ජෙනරල්" කෙනෙක් පත් කිරීම ගැන මොනම පනතකවත් සඳහන් වී නැහැ. තමුන්නාන්සේලා වෙනත් ප්‍රාදේශීය ඩිරෙක්ටර්ලා පත් කර තිබෙනවා.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

ඇයි අය වැය වාර්තාවෙ සඳහන් වුණේ.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

අය වැය වාර්තාවෙන් කරන්නේ වියදම් කිරීම සඳහා මුදල් වෙන් කිරීමයි.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

තමුන්නාන්සේලා ඉඩ දුන්නා නොවැ?

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

ගරු කථානායකතුමනි, මෙතෙක් කල් ඇමති නිලයක් දැරූ, මටත් පෙර සිට මේ ගරු සභාවේ සභිකයකු වශයෙන් අවුරුදු ගණනාවක් තිස්සේ වැඩ කළ මේ ගරු අධ්‍යාපන ඇමතිතුමා තවමත් දන්නෙ නැහැ වැය ශීර්ෂයක් යටතේ යම් කිසි මුදලක් වෙන් කළ පලියට ඒ මුදල නීත්‍යානුකූලව වියදම් කිරීමට පිළිවෙළක් නැත් නම් නීතියක් නැත් නම් ඒ මුදල වියදම් කරන්නට බැරි බව.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

නිලය පාර්ලිමේන්තුවෙන් සම්මත කර තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

නිලය පාර්ලිමේන්තුවෙන් සම්මත වුණේ නැහැ. අය වැයෙන් වුණේ වැය ශීර්ෂයකින් ඒ සඳහා මුදල් වෙන් කිරීම පමණයි. එම නිලය ගැන තමුන්නාන්සේ පළමුවෙනි වරට සඳහන් කෙළේ උසස් අධ්‍යාපන පනත සාකච්ඡා කරන විටයි. එදා අපි කිව්වා එහෙම නිලයක් නැත කියා. තමුන්නාන්සේ කියන්නේ, නැති තනතුරක් බව අප පෙන්වා දුන්නා. [බාධාකිරීම්] පස්සේ නීති ගේනවාය කිව්වාට තවමත් ගෙනැවිත් නැහැ. එනවා, යනවා. දැන් යළිත් න්‍යාය පත්‍රයට වැටී තිබෙනවා. කවදා සාකච්ඡා වේවිද දන්නේ නැහැ.

නීතියක පදනමක් නොමැති ක්‍රියා මාලාවක් ගරු ඇමතිතුමා ක්‍රියාත්මක කරගෙන යනවා. අධ්‍යාපනය පිළිබඳ මෙවැනි දෙයක් සම්බන්ධයෙන් කවුරුවත් ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම් ඉදිරිපත් කරන්නේ නැහැ. ඒ නිසා ගරු ඇමතිතුමා බේරී සිටිනවා. එහෙත් නීතියෙන් "ඩිරෙක්ටර් ජෙනරල්" කෙනකුට ඉඩක් නැහැ. තවම ඒ සඳහා නීතියක් නැහැ. තමුන්නාන්සේගේ ප්‍රාදේශීය ප්‍රතිසංවිධානයටවත් නීත්‍යානුකූල තත්ත්වයක් නැහැ. අධ්‍යාපනය 14 දක්වා තිබිය යුතුය කියන නීතිය කඩ කරන්න තමුන්නාන්සේ නීතිය සංශෝධනය කර නැහැ.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

ඒක කඩ කර නැහැ.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

තමුන්නාන්සේගේ උරුමය—ගරු කන්නන්ගර ඇමතිතුමාගේ ඒ ශ්‍රේෂ්ඨ අදහස් ගැබ් වී තිබෙන්නේ වී නමුත්—තමුන්නාන්සේගේ යූ.එන්.පී. උරුමය නොහොත් බණ්ඩා ඇමතිතුමාගෙන් ලබා ගත් උරුමය හැටියට තමුන්නාන්සේ පෙන්වන මේ කාර්‍ය්‍යීය ක්‍රියාත්මක කිරීමට තවමත් නීතියක් පහළ වුණේ නැහැ.

පසු ගිය ආණ්ඩුවෙන් එක් පියවරක් ගත්තා. පෞද්ගලික අංශයේ හැටියට වෙන් කළ පාසල් කීපයක් හැර අනික් සියලුම පාසල් ආණ්ඩුවට භාර ගත්තා. එයින් මේ රටේ සෑම දරුවකුගේම අධ්‍යාපනය පිළිබඳව ආණ්ඩුව වගකීමක් ගත්තා. සෑම දරුවකුගේම අධ්‍යාපනය පිළිබඳව රජය වගකීමක් දරණවාය කියන ශ්‍රේෂ්ඨ ප්‍රතිපත්තිය පළමුවෙනි වරට ඇති කර ගත්තේ ඒ ආණ්ඩුව බව මා සතුටින් ප්‍රකාශ කරන්න කැමතියි. ඒ පියවරට සරිලන තවත් පියවර කීපයක් ගන්නට තිබුණා. ඒ පියවර ගැනීමට අංග සම්පූර්ණ අධ්‍යාපන ක්‍රමයක් බිහි වුණේ නැහැ. ඒවා කරන්නට මත්තෙන් එදා තිබුණ ආණ්ඩුව පෙරළා දැම්මා. ඒවා කරන්නට මත්තෙන් ආණ්ඩුව කඩා වැටුණා. "තමුන්නාන්සේලා අවුරුදු තුනහමාරක් තිස්සේ මොනවාද කළේ" කියා ප්‍රශ්න කළ විට, අධ්‍යාපනය ඒ තරම් ඉක්මනින් සකස් කරන්න පුළුවන් දෙයක් නොවේයයි තමුන්නාන්සේලා කියනවා. අවුරුදු තුන හතරක් ගත වුණත් තමුන්නාන්සේලාට කිසිම දෙයක් කරන්න බැරි වුණා. නමුත් එදා තිබුණ ආණ්ඩුව පාඨශාලා රජයට ගත්තා. එහෙත් ජාතික අධ්‍යාපනයක් හැටියට එය අංග සම්පූර්ණ කරන්න ඉඩක් ලැබුණේ නැහැ. රජය කඩා වැටුණා. ඊට පසු ඒ වගකීම භාර ගත්තේ තමුන්නාන්සේලායි. ඒ වගකීම කොයි ආකාරයටද තමුන්නාන්සේලා ඉටු කර තිබෙන්නේ? ගැමි ජනතාවගේ දරුවන්ට, කොළඹ මුඩුක්කුවල සිටින දරුවන්ට, අධ්‍යාපනය නොමිළේ ලබා ගැනීමට අවස්ථාවක් ලැබී තිබුණා නම් එම අවස්ථාව වළලා දැමීමේ පියවරක් දැන් තමුන්නාන්සේලා ගෙන තිබෙන බව ප්‍රකාශ කරන්න ඕනැ.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

පටන් ගත්තේ අපි නේ.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

How much longer will you take?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමති ගරු අයි. එම්. ආර්. ඒ. ඊරියගොල්ල කෙරෙහි

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

How many more minutes can you give me ?

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

You have only ten minutes more. There are two more speakers.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

I shall try to stop on time.

මා එහි ඉතිහාසය කිව්වා නේ. ඒ නිසා නැවත වරක් කියන්න යන්නේ නැහැ. ගරු කන්නන්ගර මැතිතුමාගේ ශ්‍රේෂ්ඨ අදහස, නොමිලේ අධ්‍යාපනයක් ලබා දීමේ අදහස, සම්පූර්ණ කිරීම සඳහා මෙතෙක් ගෙන තිබෙන එකම පියවර පාඨශාලා රජයට ගැනීමයි. එසේ නැතිව ඒ කටයුත්ත සම්පූර්ණ කරන්න බැහැ. නමුත් තමුන්නාන්සේලා මේ ප්‍රතිසංවිධාන කිරීමේ පිළිවෙල අනුව පාඨශාලා කොටස් දෙකක් අත්හැර දමා තිබෙනවා. එක් කොටසක් නාම් වතු පාඨශාලායි. තමුන්නාන්සේලා ඉදිරිපත් කර සම්මත කර ගත් නීතිය අනුව ඒ වතුවල සිටින කොටසත් මේ රටේ පුරවැසියන් වෙනවා. ඒ දරුවන්ට අධ්‍යාපනයක් නැද්ද? තමුන්නාන්සේලා අර පත් කළ මන්ත්‍රී තොන්ඩමන් මහතා සමග එකතු වී හැම විටම වතු කම්කරුවන් ගැන කඳුළු සළනවා. ඒ අය ගැන දුක් වෙනවා. නමුත් තමුන්නාන්සේලාගේ ප්‍රතිසංවිධානයන් අනුව වතු කම්කරුවන්ගේ දරුවන් සම්පූර්ණයෙන් අධ්‍යාපනයෙන් පහ කර දමා තිබෙනවා. ඒ අයට අධ්‍යාපන ක්‍රමයක් නැද්ද? ඒ එක් කොටසක්.

ඊළඟට ගරු කථානායකතුමනි, පෞද්ගලික ආයතන ගැන බලමු. මේ සම්බන්ධයෙන් ගරු ඇමතිතුමාට දොස් පවරන්න ඕනෑ. ඇයි එතුමා ඒ දෝෂය භාර ගන්නේ නැත්තේ? එදා පෞද්ගලික ආයතන රජයට ගැනීමේදී කොටසක් ඉතුරු කළා. විශේෂයෙන්ම ආගමික ආයතනවල ඒ ඒ අයගේ පැමිණිලි ගැන කල්පනා කර නිර්දේශයන් ඉදිරිපත් කළා, ඒ නිර්දේශ අනුව ඒ පාඨශාලාවල කටයුතු ගෙන යා යුතුය කියා. එදා අධ්‍යාපන ඇමතිව සිටි බද්උද්දීන් මහතා කිව්වා, මේ නිර්දේශ අනුව මේ පාඨශාලාවල කටයුතු කළ යුතුය, එහෙම නැත්නම් රජය යටතට ගත යුතුය කියා. නමුත් අවුරුදු තුනක් ගත වුණත් තමුන්නාන්සේලා මොකක්ද කර තිබෙන්නෙ? නැවත වරක් මේ පාඨශාලාවල දරුවන්ගෙන් ගාස්තු අය කිරීමට ඉඩ දෙනවාද නැද්ද යන්න නිරාකරණය කර ගැනීමට බැරි වී තිබෙනවා. නොමිලේ අධ්‍යාපනය දීම පසෙක තබා අධ්‍යාපනය වෙනුවෙන් දරුවන්ගෙන් මුදලක් ගාස්තුවක් අය කර ගන්නට ඉඩ දෙනවාද නැද්ද කියන කාරණය ගැන තමුන්නාන්සේලා අවුරුදු 3ක් තිස්සේ දෙගිඩියාවෙන් සිටිනවා. තමුන්නාන්සේලා මීගමුවේ අතුරු මැතිවරනය කාලයේදී මීගමුවේ ඡන්ද දායකයන්ගේ ඡන්ද ලබා ගැනීමේ බලාපොරොත්තුවෙන් පොරොන්දුවක් දුන්නා. එයට අග්‍රරාජගුරු ප්‍රසාදිතුමානන් වහන්සේ සාක්ෂි දරනවා ඇති. තමුන්නාන්සේලා කතෝලික සභාවට පොරොන්දුවක් දුන්නා. ඒ පෞද්ගලික ආයතන ගෙන යාමට මුදල් ලබා ගැනීමට ඉඩ ප්‍රස්තා සලසා දෙනවාය කියා පොරොන්දු වුණා. දැන් ඒ පොරොන්දුව ඉටු කරන්නත් බැහැ. ඉටු නොකරත් බැහැ. කොටි වල්ගය අල්ලා ගත්තා වගේ වැඩක් තමයි සිදු වී තිබෙන්නෙ. ගරු කථානායකතුමනි, ගරු අධ්‍යාපන ඇමතිතුමාට සිදු වී තිබෙන්නේ එයයි. ඒ නිසා මේ පෞද්ගලික ආයතන මේ ප්‍රතිසංවිධානයට අයත් වන්නේ නැහැ. එම යෝජනාවට මේ ආයතන ඇතුළත් වන්නේ නැහැ.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

ඒ අයත් මේ ක්‍රමයට වැඩ කර ගෙන යන්න ඕනෑ.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

ගරු කථානායකතුමනි, මීට වඩා ඒ ගැන කියන්න වුවමනාවක් නැහැ. ඒ ගරු අධ්‍යාපන ඇමතිතුමා ගත් පළමුවැනි පියවරයි.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

ඊළඟට උසස් අධ්‍යාපනය ගැන ඕනෑ තරම් වේලා කරුණු කියන්නට පුළුවනි. එහෙත් කාල වේලා නැහැ. භික්ෂු අධ්‍යාපනය පිළිබඳව ගරු ඇමතිතුමා දන්නවා. භික්ෂූන්ගේ අධ්‍යාපනය සඳහා උසස් අධ්‍යාපන ආයතනයක් ඇති කරන්නට ගරු ඇමතිතුමා බලාපොරොත්තු වුණා.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

උපකුලපති සහ දායක සභාව පත් කරල ඉවරයි. ජනවාරි මාසයේ පටන් ගන්නවා.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

ඒ සම්බන්ධයෙන් සාධු සාධු යයි කියන්නට අපත් ලෑස්තියි. එහෙත් එක වචනයක් විතරක් මතක් කරන්නට ඕනෑ. බුදුරජාණන් වහන්සේගේ කාලයේ සිට මේ දක්වා තිබුණු සංඝ රත්නයේ අභ්‍යන්තර වශයෙන් ස්වාධීන වූ විනය රැකීමේ ක්‍රමය අහිමි කර ගරු අධ්‍යාපන ඇමතිතුමා සංඝ රත්නයට අමුතු විනයක් පනවන්නට බලයක් ලබාගෙන තිබෙනවා. ගරු අධ්‍යාපන ඇමතිතුමා බුදු රජාණන් වහන්සේටත් වඩා ඉහළින් ක්‍රියා කිරීමට බලයක් ලබාගෙන තිබෙනවා. බුද්ධ ශ්‍රාවක ධර්ම පීඨය පිළිබඳ පනතින් ගරු ඇමතිතුමා ඒ විධියේ බලයක් ලබා ගත් බව චෝදනාවක් වශයෙන් ඉදිරිපත් කරනවා.

උසස් අධ්‍යාපනය සම්බන්ධයෙන් අද පාපොච්චාරණයක් කළා. මීට පෙර නම් කිව්වේ එකම දෙයයි. හැමදාම ගුරුවරුන්ට බැන්නා; මහාචාර්යවරුන්ට බැන්නා; ශිෂ්‍යයන්ට බැන්නා.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

ඔක්කොටම නොවෙයි.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

අද කිව්වේ "ලෝකෙන් උතුම් රට ලංකාවයි" යන සිංදුව අනුවයි. හැබැයි පිට ගියාම නම් "අවලං වැඩ, අවලං මිනිස්සු අශික්ෂිත වැඩ, අශික්ෂිත මිනිස්සු" යනුවෙන් ඒ ඒ අය සම්බන්ධයෙන් කියනවා.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

අවලමුන් ඉන්නවා. සේරම එහෙම නැහැ. සේරම එහෙම යයි මා කී තැනක් පෙන්වන්න.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

මම පෙන්වන්නම්. හැන්සාඩ් වාර්තාවෙන්ම පෙන්වන්නම්.

"විශ්ව විද්‍යාලවල අවලං වැඩවලට මහජනතාව කැමති නෑ. මෙතෙක් කල් මහජනයා කරුණු නොදැන හිටියා. මහාචාර්යවරුන් හාදෙන්නට ඕනෑ. එසේ නැත්නම් අස් වී යන්නට ඕනෑ."

මේ කියන්නේ මුළු වර්ගයාම ගැනයි.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

මුළු වර්ගයා ගැන නොවෙයි, මා සඳහන් කර තිබෙන්නේ. ඔක දිගටම කියවන්න.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

ඔක්කොම කියවන්නට කාල වේලා නැහැ.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

නරක වැඩ කරන මහාචාර්යවරුන් ගැනයි, මා කියා තිබෙන්නේ. තව ටිකක් දිගට කියවන්න.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

කාල වේලා නැහැ. බැන්නාම හරි යනවා යයි ගරු අධ්‍යාපන ඇමතිතුමා තුළ මිථ්‍යා මතයක් තිබෙනවා.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

කවදාවත් නැහැ.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

ඒ විධියේ මතයක් තිබෙන නිසා තමයි, ගරු ඇමතිතුමා සමහර පියවරවල් ගන්නේ. නිලධාරීන් ගරු ඇමතිතුමාට කොයි කොයි විධියේ උපදෙස් දෙනවාදැයි මා දන්නේ නැහැ. සමහර විට මුළා කිරීම සඳහා උපදෙස් දෙනවා ඇති. ගරු ඇමතිතුමා හිඟුරක්ගොඩ මහා විද්‍යාලයට ගිය වේලාවේදී හුවක් ඇහුණා යයි කියා ගුරුවරුන් 44 දෙනකුගේ වැඩ තහනම් කළා. අද හුව ජාතික සිරිත් විරිත්වල අංගයක්. රෝහලේ නැවති ප්‍රතිකාර ලබමින් සිටි ගුරුවරුන් ගෙනුත් මීරිගම අභ්‍යාස විද්‍යාලයේ උගන්වන්නට ආ ගුරුවරුන් ගෙනුත් දඬුවම් නොකිරීමට හේතු අසා චෝදනා පත්‍ර ඉදිරිපත් කර තිබෙනවා. මීරිගම සිට කී හුව හිඟුරක්ගොඩට ඇසී තිබෙනවා. ගරු අධ්‍යාපන ඇමතිතුමා ගැන මා කනගාටු වෙනවා.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

සංවේග බව දන්නවා.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

තමුන්නාන්සේගේ හිතේ සංවේගය තිබෙන්නා වාගේම මගේ හිතෙත් සංවේගය තිබෙනවා. "අල්ලට සිහාවත් රස නැති කැවිලි කකා" අධ්‍යාපනය ලබා ගත් කාලයේදී ගරු අධ්‍යාපන ඇමතිතුමා ඉපදුණා නම්, රජය මැදිහත් වී රස නැති කැවිලි වෙනුවට හොඳ ආහාර වේලක් දෙන්නැයි කියන යුගයට පෙර ගරු ඇමතිතුමා ඉපදුණා නම්, එතුමාගේ ඔය අදහස් සම්පූර්ණයෙන්ම සනාථ කරන්නට ඉඩ තිබෙනවා. එහෙත් අද ලෝකය වෙනස් වෙලා. අද පියා ජාතික ඇඳුම් ඇඳගෙන උත්සවයකට යනවා. දියණිය යන්නේ මිනි කබාය ඇඳගෙන. එබඳු පරිවර්තන යුගයකයි අප ඉන්නේ.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

පංගුවක් උදවිය යනවා ඇඳුම් නැතුවත්.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

ගරු රාජ්‍ය ඇමතිතුමාට පමණයි ඒ භාග්‍යය ලැබී තිබෙන්නෙ; අපට නම් තවම එබඳු අවස්ථාවක් ලැබී නැහැ.

ගරු අධ්‍යාපන ඇමතිතුමා කියන විධියට මෙය දේශපාලන පොරපිටියක ප්‍රශ්නයක් කර ගන්න වුවමනාවක් නැති බව මා පිළිගන්නවා.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

කොපමණ කිවත් අහන්නෙ නැහැ නෙ.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

අපේ දරුවන්ගේ අනාගතය අප සකස් කරන්නයි බලන්නෙ.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

ඒක තමයි මාත් කියන්නෙ.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

ඒ දරුවන් අප කාටත් අයිතියි. අප නැති වුණු දවසක, අපේ අධ්‍යාපන ඇමතිතුමාත් මාත් මේ ලෝකයෙන් තුරන් වී


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

ගිය දවසක, මේ දරුවන්ටයි භාර වෙන් නේ රට ගෙන යාමේ වගකීම. අප විරුද්ධ පක්ෂය, ආණ්ඩු පක්ෂය වශයෙන් සිටි යත්, අප නැති වූ දවසක මේ දරුවන්ට රට ගෙන යාමේ භාර දුර කාර්යය පැවරෙ නවා. ; ඒ අයටයි රට හදන්න භාර වෙන්නෙ. ඒ දරුවන් අපට වඩා හොඳ දෙ යක් කරාවිය කියන සම්පූර්ණ විශ්වාස යක් මගේ හිතේ තිබෙනවා.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

තමුන්නාන්සේලා ඇඟිලි ගහන්නෙ නැති නම් අපූරුවට කරනවා.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

අප ඇඟිලි ගැහීමේ ප්‍රතිඵලයක් වශයෙන් එය සිදු වනවාය කියා මා විශ්වාස කරන වා. අප පෙන්වා දෙන්නෙ අනාගත දර්ශන යක් ; මේ ලෝකය හදන්න පුළුවන් දර් ශනයක් ; දුක නැති කරන්න පුළුවන් දර්ශනයක්; දුප්පත්කම නැති කරන්න පුළුවන් දර්ශනයක්. පෝසත් අයට ආ වඩන තත්ත්වයේ සමාජයක් තවදුරටත් ගෙන යන්න බලාපොරොත්තුවන අධ්‍යා පන ප්‍රතිසංවිධානයකින් මේ රට හදන්න තමුන්නාන්සේලාට පුළුවන් වෙන්නෙ නැහැ. එම නිසා දරුවන්ගේ අනාගතය නියම විධියට සකස් කරන්න නම්, අලං කාර අන්දමට සකස් කරන්න නම්, මෙම ධනේශ්වර පදනමක් මත සකස් වූ ප්‍රති පත්තිවලින් තොරව, නියම විධියේ අනා ගත දර්ශනයක් ඇතුව සකස් කෙරෙන අධ්‍යාපන ප්‍රතිසංවිධානයක් ඇති කළ යුතුය කියන අදහස ඉදිරිපත් කරමින් මෙම යෝජනාව සියයට සියයකින්ම අනු මත කරන බව ප්‍රකාශ කරන අතර ගරු සභාවටද එය අනුමත කරන ලෙස ඉල්ල මින් මගේ කථාව අවසන් කරනවා.

අ. භා. 5.58

**ඩී. පී. අතපත්තු මයා. (රාජ්‍ය ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**
*(திரு. டீ. பீ. அத்தபத்து—இராஜாங்க அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*
(Mr. D. P. Atapattu—Parliamentary Secretary to the Minister of State)

ගරු කථානායකතුමනි, විරුද්ධ පාර්ශ් වය විසින් ඉදිරිපත් කරන ලද නොයෙකුත් විධියේ අදහස්වලට අප සවන් දුන්නා. අනි කුත් කථා කෙසේ වෙතත් දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමා දැක්වූ අදහස් මගේ මතක යේ තවමත් තිබෙනවා. කෙසේ හෝ වේවා, ඉදිරිපත් කළ අදහස් ගැන කරුණු දක් වන්න පෙර ඉදිරිපත් කර ඇති මෙම යෝජනාව කුමක්දැයි සලකා බැලීම වැද ගත් යයි මට කල්පනා වෙනවා. මෙම යෝජනාවෙන් කියා තිබෙන්නෙ මොකක්ද?

"තවමත් පාර්ලිමේන්තුවේ දෙවැනි වර කියවීමට පවා ලක් නොවූ සාමාන්‍ය හා කාර්මික අධ්‍යාපන පනතට ඇතුලත් යෝජනා මන්ත්‍රී මණ්ඩලයේ සම්මතය නොලබා අමාත්‍යාංශයේ නියෝග මගින් ක්‍රියාත්මක කරගෙන යන බැවින් ද, දැනටමත් බුද්ධිමත් ගම්බද දරුවන්ට නිදහස් අධ්‍යාපනය යටතේ විවෘතව තිබූ උසස් අධ්‍යාපන පහසුකම් රාශියක් අහිමි කර ඇති බැවින් ද, මේ නිසාම විද්‍යා, කාර්මික ආදී උසස් යයි සම්මත වෘත්තීය අධ්‍යා පනය එක්තරා පිරිසකට සීමාවන බැවින් ද, දැනට වර්ගකර ඇති පාසැල් ශ්‍රේණි ක්‍රමය යටතේ ගුරු ශිෂ්‍ය දෙපක්ෂයටම බලවත් අසාධාරණයක් සිදුවී ඇති බැවින් ද, වර්තමාන ඇමතිවරයාගේ කාලයේ දී සම්පූර්ණ අධ්‍යාපන ප්‍රණාලිය අවුල් ජාලයක් බවට පත්ව ඇති බැවින් ද, මෙම මන්ත්‍රී මණ්ඩලය වර්තමාන අධ්‍යාපන ඇමතිවරයා කෙරෙහි විශ්වාසය නොතබයි."

අනිකුත් කාරණා කොයි හැටි වුණත්, යෝජනාවේ අවසානයේදී කියන අන්දමට අධ්‍යාපන ප්‍රණාලිය අවුල් ජාලයක් බවට පත් වී ඇති බැවින් අධ්‍යාපන ඇමතිවරයා කෙරෙහි විශ්වාසය නැත කියන කාරණය ගැන සලකා බැලීම වැදගත් යයි මා කල් පනා කරනවා.

යෝජනාව ඉදිරිපත් කළ වලපනේ මන්ත්‍රීතුමාත් (ටී. බී. එම්. හේරත් මයා.) ඊට අදාළව කථා කළ හබරාදුව මන්ත්‍රී තුමාත්, (ප්‍රින්ස් ගුණසේකර මයා.) තවත් විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රී වරුන් කීප දෙනකුත් නොයෙකුත් විධියෙන් අධ්‍යාපන ඇමතිතුමාට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

විරුද්ධව චෝදනා නැගුවත් එතුමා ඒ අන්දමට ක්‍රියා කර තිබෙනවාය කියන කාරණය ඔප්පු කිරීමට කිසිම සාධාරණ කරුණක් ඉදිරිපත් කරන්න සමත් වුණේ නැහැ. මෙම අධ්‍යාපන ප්‍රතිසංවිධානයෙන් එක් පංක්තියකට පමණක් උසස් අධ්‍යාපනය ලබාගැනීමේ අවස්ථාව සැලසෙන බව දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමා සඳහන් කළත් ඒ කරුණ සනාථ කිරීමට තරම් හේතුවක් ඉදිරිපත් කරන්න එතුමාට පුළුවන් වුණේ නැහැ. එහෙත් එය සීමා වී තිබෙන්නේ කොයි විධියටදැයි පෙන්වා දුන්නේ නැහැ. එය පෙන්වා නොදුන්නේ, එසේ සීමා වී නැති නිසායි. මා දැනුත් අහන්න කැමතියි, අධ්‍යාපනය එක කොටසකට පමණක් සීමා වී තිබෙන්නේ කොයි විධියටද කියා.

අවුරුදු 14 වන තෙක් අනිවාර්යයෙන්ම ඉගෙන ගත යුතු යයි තිබෙන නීතියෙන් ගැලවීම සඳහා අධ්‍යාපන ඇමතිතුමා කටයුතු කරන්නට ඉඩ තිබෙන බවකුත් දකුණු කොළඹ ගරු සම මන්ත්‍රීතුමා කීවා. ළමයෙක් දෙතුන් වරක් එකම පන්තියෙන් අසමත් වෙනවා නම්, එම පන්තියෙන් සමත් වීම සඳහා තව කී වාරයක් ඉඩ දිය යුතුයි කියා ද, එතුමා කියන්නේ ? ඒ පිළිබඳව යෝජනාවක් කරන්නේත් නැහැ. ඒ ළමයා සම්බන්ධයෙන් ගත යුතු පියවර කුමක් දැයි යෝජනා කරන්නේත් නැහැ. ළමයෙක් හැම දාමත් අසමත් වෙනවා නම් අධ්‍යාපන ඇමතිතුමාත්, අධ්‍යාපන දෙපාර්තමේන්තුවත්, අධ්‍යාපන ක්‍රමයත් ඒකට පළිද ? ඒ සම්බන්ධයෙන් එතුමා කිසිම යෝජනාවක් කළේ නැහැ. සමාජවාදී ක්‍රමයට කටයුතු කරන්නලු. මොකක්ද, ඒ ක්‍රමය ? කරුණාකර ඒ ක්‍රමය මොකක්දැයි විස්තර කර දෙන ලෙස මා ඉල්ලා සිටිනවා. අපට පෙන්වා දෙන්න, සමාජවාදී ක්‍රමය කියන්නේ මොන ක්‍රමයකට ද කියා. අධ්‍යාපන ඇමතිතුමාට කොතෙකුත් චෝදනා කරන්න පුළුවනි. එහෙත් වරද සිදු වන්නේ මේ නිසායි, එම නිසා මේ විධියට කටයුතු කළ යුතු යයි යනුවෙන් අපට නිදර්ශනයක් පෙන්වා දෙන්නට විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන්ට පුළුවන් වුණේ නැහැ.

රුහුණේ අන්තිම කෙළවරේ හම්බන්තොට දිස්ත්‍රික්කයේයි, මගේ ඡන්දදායක කොට්ඨාශය පිහිටා තිබෙන්නේ. මේ අධ්‍යාපන ක්‍රමයෙන් යහපතක් සිදු වුණාද, අයහපතක් සිදු වුණාද, ඒ කොයි කාලයේද කියා අපට වැටහීමක් තිබෙනවා. 1965 දක්වා හම්බන්තොට දිස්ත්‍රික්කයේ එකම විද්‍යාලයකට පමණයි, රසායනාගාරයක් තිබුණේ. එහෙත් ඒ රසායනාගාරයේ පවා ප්‍රායෝගික පුහුණුව සඳහා අවශ්‍ය පහසුකම් තිබුණේ නැහැ. ඒ විද්‍යාලයට පවා පත් කර තිබුණේ, සාමාන්‍යයෙන් විශ්ව විද්‍යාලයෙන් පිට වුණු ගුරුවරයෙක්. ළමයින්ට අධ්‍යාපනය ලබා දීමේ ආශාවක්, ඉගැන්වීමේ ආශාවක් ඒ ගුරුවරයා තුළ තිබුණේ නැහැ. එසේම ඔහු පළපුරුද්දක් ඇති ගුරුවරයෙකුත් නොවෙයි. ඒ කාලයේ විශ්ව විද්‍යාලවලින් පිට වුණු උපාධිධාරීන් තුළ පුරුද්දක් වශයෙන් කළා, හොඳ රක්ෂාවක් ලැබෙන තුරු අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතේ ඉගැන්වීම. එවැනි ගුරුවරු කීප දෙනකුම අර විද්‍යාලයේ ඉගැන්නුවා. එහි විපාකයක් වශයෙන්, 1967 වන තුරු විද්‍යා අංශයෙන් විශ්ව විද්‍යාලයට ඇතුළු වන්නට ඒ විද්‍යාලයේ කිසිම ළමයකුට පුළුවන්කමක් ලැබුණේ නැහැ.

එහෙත් අපේ වාසනාවට වාගේ, 1967 අවුරුද්දේ දී පුහුණු ගුරුවරුන් ඒ විද්‍යාලයට ලැබීමේ ප්‍රතිඵලයක් වශයෙන් හම්බන්තොට දිස්ත්‍රික්කයේ පාඨශාලා ඉතිහාසයේ පළමු වරට ළමුන් 7 දෙනකු විද්‍යා අංශයෙන් විශ්ව විද්‍යාලයට තේරුණා. එයින් දෙදෙනෙක් ඉංජිනේරු අංශයටත්, එක් කෙනකු වෛද්‍ය අංශයටත් තේරුණා. වෛද්‍ය අංශයෙන් තේරුණු ශිෂ්‍යා ලිඛිත පරීක්ෂණයෙන් සමත් වුණත්, විද්‍යාලයේදී ප්‍රායෝගික පුහුණුවක් ලැබීමේ භාග්‍යය නොතිබුණු නිසා ප්‍රායෝගික පරීක්ෂණයෙන් අසමත් වුණා. අර හත් දෙනාගෙන් ඔහුට පමණයි, විශ්ව විද්‍යාලීය අධ්‍යාපනයක් ලබන්නට බැරි වුණේ. ඒ කොහොම වුණත්, වර්තමාන අධ්‍යාපන ඇමතිතුමාගේ වැඩ පිළිවෙළ නිසා, එදාට වඩා සියයට සියයක පමණ දියුණුවක් අපේ පිටිසරබද පළාත්වල තිබෙන බව මා ආඩම්බරයෙන් මතක් කරන්නට කැමතියි.

මේ පාඨශාලා වර්ග කිරීම නරක දෙයක් හැටියට අහන්නට ලැබෙන්නේ මේ ගරු සභාවේ ඇති වන විවාදයකදී තමයි. අපේ පළාතේ දේශපාලන වැඩ කරන ගුරුවරුන් නැතුවාට නොවෙයි, මා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අතපත්තු මයා.]

මේ විධියට කියන්නේ. 1965 මාර්තු මැතිවරණ කාලයේදී මගේ මුහුණට හම්බ වුණා, ගුරුවරුන් 37 දෙනකු එකට පාරේ යනවා. මොකක්ද තමුන්නාන්සේලා කරන්නේ කියා මා ඇහුවා. ගම් ගම්වලට ගිහින් දේශපාලන වැඩ කරන බව කිව්වා. ඒ ආණ්ඩුවට විරුද්ධව පියවර ගන්නට ඒ අයට හේතු කීපයක්ම තිබුණා. ආණ්ඩුවට විරුද්ධව වැඩ කිරීම තමුන්නාන්සේලාගේ වැඩක්ද කියා මා ඒ අයගෙන් ඇහුවා. ලොකු තැන්වලින් අපට ඒ සඳහා ඉඩ ලැබී තිබෙනවාය කියා ඒ අය කිව්වා.

**එස්. කේ. කේ. සූරියආරච්චි මයා.** (මහර)
*(திரு. எஸ். கே. கே. சூரியாரச்சி—மகற)*
(Mr. S. K. K. Suriarachchi—Mahara)

එතකොට තිබුණු ආණ්ඩුව මොකක්ද?

**අතපත්තු මයා.**
*(திரு. அத்தபத்து)*
(Mr. Atapattu)

එතකොට තිබුණේ තමුන්නාන්සේලාගේ ආණ්ඩුව.

**සූරියආරච්චි මයා.**
*(திரு. சூரியாரச்சி)*
(Mr. Suriarachchi)

ඒ ගුරුවරුන් ඒ ආණ්ඩුවට විරුද්ධය කියලයි, තමුන්නාන්සේ කිව්වේ.

**අතපත්තු මයා.**
*(திரு. அத்தபத்து)*
(Mr. Atapattu)

මොන ආණ්ඩුවට වුණත් විරුද්ධව වැඩ කරන්නට ඒ ගොල්ලන්ට බලයක් තිබුනද? ආණ්ඩුවේ නිලධාරීන් හැටියට දේශපාලන කටයුතුවල යෙදෙන්නට තමුන්නාන්සේලා ඒ අයට රෙගුලාසි මාර්ගයෙන් බලයක් දී තිබුණාද? අපට බලයක් ලැබී තිබෙනවාය කියා ඒ අය කිව්වා. අපේ පැත්තෙ උනන්දුවෙන් වැඩ කරන අය මේ සම්බන්ධයෙන් ටිකක් කලබල වෙන්නට ලෑස්ති වුණා. කලබල වන්නට එපාය, තමුන්නාන්සේලාගේ ගමේ ඉපදුණු, ගමේ සැලකිය යුතු කෙනකුට ඡන්දයක් ගන්නට බැරි නම් වෙන වෙන පළාත්වලින් ඇවිත් සිටින ගුරුවරුන්ට ඡන්දයක් ලබා ගන්නට බැරිය කියා මා කිව්වා. ඒ ගුරුවරුන්ගෙන් සමහර අයට නියම ප්‍රතිඵල ලැබුණා. ඡන්ද ව්‍යාපාරයෙන් පසු ගුරුවරුන් මාරු කළ බවට නොයෙකුත් ප්‍රකාශ කර තිබෙනවා. මගේ ආසනයේ එසේ ඡන්ද වැඩ කළ එකම ගුරුවරයකුවත් මාරු කර යවන්නට මා කල්පනා කළේ නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

තමුන්නාන්සේ වගේ අය ඉන්නෙ ටික දෙනයි.

**අතපත්තු මයා.**
*(திரு. அத்தபத்து)*
(Mr. Atapattu)

සෑම දෙනාම මා වගේය කියා මා කියන්නෙ නැහැ. තමන්ට වැරද්දක් කළාම පලි ගන්න අය ඉන්නවා. එලව එලවා පලි ගන්න ජාතියකුත් ඉන්නවා. මගේ ගතිය හුඟ දෙනකුට නැති වන්නට පුළුවන්. ඒ කාලයේදී දේශපාලන වැඩ කළ ගුරුවරුන් මේ ආණ්ඩුව පිහිටෙව්වාට පසුවත් නොයෙකුත් විධියේ දේශපාලන රැස්වීම්වලට සහභාගි වෙනවා නම්, නොයෙකුත් විධියේ දේශපාලන පත්තිවලට සහභාගි වෙනවා නම් ඒ අය සම්බන්ධයෙන් පියවරක් ගැනීම පලි ගැනීමක්ද කියා මා අහන්නට කැමතියි. අද වුණත් ඒ විධියට ක්‍රියා කර ගෙන යන අය මගේ ආසනයේ ඉන්නවා. මා ඒ සම්බන්ධව ඇමතිතුමාට කියන්නෙ නැහැ. ඒවා නැවැත්වීමට මා බොහොම මහන්සි ගන්නවා.

මේ අළුත් අධ්‍යාපන සැලැස්ම නිසා අපට හොඳ ප්‍රතිඵල ලැබුණු බවයි, අවංකවම කියන්නට තිබෙන්නේ. මේ අළුත් සැලැස්ම නිසා මේ විධියට පාඩු සිදු වී තිබෙනවාය කියා කරුණු ඉදිරිපත් කරන්නට පුළුවන් නම් එසේ කරන්නට ඕනෑ. එසේ නැතිව විරුද්ධව කථා කරනවා වෙනුවට කථා කිරීමෙන් වැඩක් නැහැ. මේ විශ්වාස භංග යෝජනාවට සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියත් අත්සන් කර තිබෙනවා. අත්තනගල්ල ආසනයේ උත්සවයකට ගරු අධ්‍යාපන ඇමතිතුමා ගෙන්වා එතැනදී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය කී දෙයක් "ලංකාදීප" පත්‍රයේ මේ විධියට පළ වී තිබෙනවා :

"අධ්‍යාපන ඇමතිතුමා අත්තනගලු මණ්ඩලයේ ඉල්ලීම් කීපයක් දී තිබෙන බව කෘතඥතා පූර්වකව සඳහන් කරන අතර අනෙකුත් අඩුපාඩු සම්පූර්ණ කර දෙනු ඇතැයි බලාපොරොත්තු වන බවත් පසුගිය රජයෙන්—"

අප නොවෙයි, මේ කියන්නේ.

"—මහා විද්‍යාලයක් බවට පත් කළ අලවල බෝඩ් ලැල්ලට පමණක් සීමා නොකර කාර්මික, විද්‍යා, වාණිජ ආදී විෂයයන් හැදෑරීමට අවශ්‍ය පහසුකම් සලසා දෙනු ඇතැයි විශ්වාස කරන බවත් බණ්ඩාරනායක මැතිනිය කීවාය."

අප නොවෙයි මේක කියන්නෙ. මේක මේ විශ්වාස භංග යෝජනාවට අත්සන් කළ කෙනෙකුම කියන කථාවක්. අධ්‍යාපන අංශයෙන් මේ විධියේ සේවයක් අපේ ප්‍රදේශයට අත්වී තිබෙනවාය, තවත් මේ මේ අඩුපාඩුකම් ඉෂ්ට කර දිය යුතුය කියා මේ යෝජනාව ඉදිරිපත් කළ අයගෙන් කෙනෙකු වන විරුද්ධ පාර්ශ්වයේ නායකතුමිය කියනවා. පසුගිය ආණ්ඩුව මෙන් නාම පුවරුවලට පමණක් මේවා සීමා කරන්නට එපාය කියාත් එතුමිය කියනවා. අප නොවෙයි මෙහෙම කියන්නෙ. විරුද්ධ පාර්ශ්වයේ නායිකාවයි.

ගරු කථානායකතුමනි, තවත් කාරණයක් තිබෙනවා. සාමාන්‍යයෙන් පත්‍ර සම්බන්ධව අපේ අධ්‍යාපන ඇමතිතුමා හොඳ වචනයක් කියා නැති බව තමුන්නාන්සේ දන්නවා. හොඳ කිව්වත්, නරක කිව්වත් සමහර විට හෙටත් පත්‍රවලට ඇමතිතුමාගෙන් උත්තරයක් ලැබෙන්නට පුළුවනි. අනෙක් අතට යම් කෙනෙකු පත්‍ර සමග සටන් කරන්නට යනවා නම් ඔහු බැට කන්නටත් සූදානම් වෙන්නට ඕනෑ. ඒක අධ්‍යාපන ඇමතිතුමා දන්නවා. එතුමා ඒක දැනගෙන සිටින නිසා තමයි ඇත්ත කියන්නට සිද්ධවුණාම ඇත්ත කියා බැට කන්නෙ. අධ්‍යාපන ඇමතිතුමාත් මේ රටේ පත්‍ර අතරත් එවැනි සම්බන්ධයක් පවතින්නෙ. ඔය අතරතුර 1968 ඔක්තෝබර් 8 වන දින "සිලෝන් ඔබ්සර්වර්' පත්‍රයේ පළ වූ කර්තෘ වාක්‍යයක් මට කියවන්නට ලැබුණා. ඇත්ත වශයෙන්ම ඒ කර්තෘ වාක්‍යය මට පුදුමයට හේතුවක් වුණා. මා පුදුම වුණේ එහි සඳහන් කර තිබුණු කරුණු ගැන නොවෙයි. ඒ පත්‍රයෙන් අධ්‍යාපන ඇමතිතුමාට කර තිබුණු ප්‍රශංසාව ගැනයි. විරුද්ධ පක්ෂයේ අද කථා කළ ගරු මන්ත්‍රීවරුන් කීප දෙනෙකුම අද පමණක් නොවෙයි සෑම දාම ඒ ආකාරයට කථා කරනවා. විශේෂයෙන්ම වලපනේ ගරු මන්ත්‍රීතුමා (පී. බී. එම්. හේරත් මයා.) අධ්‍යාපන ඇමතිතුමාගෙන් ප්‍රශ්නයක් ඇසුවත් මොකක් හරි දොසක් කියාගෙනයි ඒක අසන්නෙ. හබරාදුවේ ගරු මන්ත්‍රීතුමාත් (ප්‍රින්ස් ගුණසේකර මයා.) එහෙමයි. ඒවා අහලම එපාවී තිබෙනවා. හැමදාම කියන ඒ දේවල් පිළිබඳව දැන් වැඩි පිළිගැනීමක් නැහැ. 1968 ඔක්තෝබර් 8 වන දින දරණ මේ "ඔබ්සර්වර්" පත්‍රයේ කර්තෘ වාක්‍යයේ අධ්‍යාපන ඇමතිතුමා ගැන මේ ආකාරයට සඳහන් කර තිබෙනවා. මුලු කර්තෘ වාක්‍යයම කියවන්නට මං අදහස් කරන්නේ නැහැ. අතරින් පතර කොටස් කීපයක් පමණයි කියවන්නෙ. මෙවැනි විවාදයකදී වාර්තා ගතවීම සඳහා මේ කොටස් කියවීම ඉතමා වැදගත් කියා මා කල්පනා කරනවා :

"We have had Ministers of Education before Mr. I. M. R. A. Iriyagolle who acted very much like the legendary 'Kekilla Rajjuruwo' confronted by a difficult question.

One Minister yielding to two importunate M. Ps transferred two principals to be in charge of the same school. Then, using the wisdom of Solomon when his error was discovered, he ordered that the school be split into two."

That was the action of a Minister previous to the present Minister.

මගේ හැඟීමේ හැටියට හොඳ නාමයක් ගැනීමේ බලාපොරොත්තුවෙන් හෝ එහෙම නැත්නම් පගාවක් ගැනීමේ බලාපොරොත්තුවෙන් හෝ එහෙම නැත්නම් වෙනත් කාරණයක් අරමුණු කොට ගෙන හෝ 'ඔබ්සර්වර්" පත්‍රයේ කර්තෘ වාක්‍යයකින් මෙවැනි වර්ණනාවක් කරන්නේ නැහැ. එය අප කවුරුත් දන්නවා. එවැනි පත්‍රයකින් මෙවැනි දෙයක් කියැවෙනවා නම් අප ඒ ගැන සැලකිලිමත් විය යුතුයි. සාමාන්‍යයෙන් අපේ කටවල් දහයකින් කියනවාටත් වැඩිය, ඔය පැත්තේ කටවල් විස්සකින් කියනවාටත් වැඩිය මෙවැනි තැනකින් කියැවෙන මෙවැනි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අතපත්තු මයා.]

දෙයක් ලොකු දෙයක් හැටියට මා සලකනවා. එමනිසයි මා මේ කර්තෘ වාක්‍යයෙන් කොටසක් උපුටා කියවන්නට අදහස් කළේ.

"For Mr. Iriyagolle, the Minister of Education, it should be said that he has brought sanity and system into the transfer of teachers.

He has not yielded to the requests even of his party's backbenchers. He has invariably been guided by the needs of the children whose Minister he is."

It goes on further :

"This has annoyed many backbench M. Ps. It has upset the backroom boys in constituencies who thrive on influence peddling and presume the use of a government is that it can be manipulated to serve an individual's interests even when it is damaging the general good.

Mr. Iriyagolle has set in motion a reorganisation of schools—a reform long desired. This again has upset vested interests."

මේ "වෙස්ටඩ් ඉන්ටරස්ට්" කියන කොටස කවුදැයි දැන් අපට තේරෙනවා.

"Mr. Iriyagolle has attempted to redress the balance of science education, supplying equipment to those areas which were denied these facilities by the subtle manoeuvres of certain department personnel who now ingratiatingly operate as the Minister's cheer leaders."

I know nothing about it.

"On balance it is a good record Mr. Iriyagolle has."

Please take it from the impartial national press of this country.

"But the good is often interred in a file. His weaknesses are used to taint a man's image. Mr. Iriyagolle's infirmity is that his tongue speaks without the restraint of second thoughts."

To a considerable extent I agree with the paper on that.

මේ කතෘ වාක්‍යයේ සඳහන් වෙන්නෙ ඊරියගොල්ල අධ්‍යාපන ඇමතිතුමාගේ ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් රටේ නැත් නම් මහජනයා තුළ මේ කාලය ඇතුළත ඇතිවුණු අදහසුයි. "මගේ කොට්ඨාශයට මේ මේ විධියේ සේවයක් සිදු වෙලා තිබෙනවා. තවත් ඉදිරියට ඒ විධියේ සේවා ඉටු වෙයි කියා මා බලාපොරොත්තු වෙනවා" යයි සිරිමා බණ්ඩාරනායක මැතිනිය විසින් කර තිබෙන ප්‍රකාශයක් මා මුලින් පටන් ගත් අවස්ථාවේ සඳහන් කළා. ඒ නිසා මේ යෝජනාවේ කියා තිබෙන දේවල කිසිම හරයක් නැති බව අපට අවබෝධ වෙනවා. මේ විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කරන්නට අදහස් කරන්න කලින් වෙන්නට පුළුවන් අධ්‍යාපන ඇමතිතුමාගෙන් ඒ ප්‍රදේශයට සිදු වුණු සේවය ගැන එතුමිය අත්තනගල්ලේදී වර්ණනා කරන්නට ඇත්තෙ. ඊට පසුව පක්ෂය තුළ මේ ගැන සාකච්ඡාවක් ඇතිවෙලා ඒ සේවය අමතක වුණු අවස්ථාවක තමයි, එතුමිය මේකට අත්සන් කර තිබෙන්නෙ.

1965 වන විට හම්බන්තොට දිස්ත්‍රික්කයේ තිබුණේ එකම රසායනාගාරයක් පමණයි. ඒ රසායනාගාරය තිබුණු ස්ථානයේත් සිටි ගුරුවරුන්ගේ දුර්වලකම් මා තමුන්නාන්සේට කලින් මතක් කළා. මා ආඩම්බරයෙන් කියනවා, දැන් හම්බන්තොට දිස්ත්‍රික්කයට රසායනාගාර 4ක් ලැබී තිබෙන බව. මේ අවුරුද්දේ අන්තිමට ඒවායේ වැඩ සම්පූර්ණ කරගෙන වැඩ කටයුතු කරගෙන යන්න පුළුවන් වෙයි කියා මා විශ්වාස කරනවා. වලපනේ ගරු මන්ත්‍රීතුමා (ටී. බී. එම්. හේරත් මයා.) එතුමාගේ කථාවේදී කිව්වා, අපේ අධ්‍යාපන ඇමතිතුමා අධ්‍යාපන ඇමති ධුරය භාරගත්තාට පසුව ඒ කොට්ඨාශයේ අළුතෙන් සාදන්නට යෝජනා කර තිබුණු පාඨශාලා ගොඩනැගිලි හුඟක් සෑදීම අත්හැර දැම්මා කියා. ඒ කොට්ඨාශයට එහෙම වෙන්නට පුළුවනි. මගේ පළාතටත් නොයෙක් විධියේ පාසල් ගොඩනැගිලි තනා දෙන බවට පොරොන්දු දී තිබුණා. මා අධ්‍යාපන කාර්යාලයට ගිහින් කරුණු අසා බැලුවාම මට දැනගන්නට ලැබුණා, ඒ පොරොන්දු සියල්ලම ඉටු කරන්නට නම් අවුරුදු ගණනාවක් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට පාසැල් ගොඩනැගිලි තැනීම සඳහා ලැබෙන මුදල් එකතු කරන්න ඕනෑ කියා. ඒ තරම් පාසල් ගොඩනැගිලි තනන්නට රට පුරාම පොරොන්දු රාශියක් දී තිබුණා. ඒ නිසා අපට පොරොන්දු වී තිබුණු ගොඩනැගිලි කීපයකුත් නොසෑදීම ගැන මා පුදුම වෙන්නෙ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

හම්බන්තොට දිස්ත්‍රික්කයට උසස් අධ්‍යාපනය ලබා දෙන මහා විද්‍යාල රාශියක් දැන් ලැබී තිබෙනවා. ඒ සියල්ලම නියම තත්ත්වයට ගෙනෙන්නට බැරි බව පෙනෙනවා. පරීක්ෂණයක් කර මහා විද්‍යාල නැති තැන්වල මහා විද්‍යාල ඇති කිරීමට අදහස් කර තිබෙනවා. එහෙත් හැතැප්මෙන් හැතැප්මට තිබෙන මහා විද්‍යාල සමහරක් නැති වන්නට පුළුවනි. ඒකට අපට කරන්නට දෙයක් නැහැ.

අපේ හබරාදූව ගරු මන්ත්‍රීතුමා (ප්‍රින්ස් ගුණසේකර මයා.) හැමදාම පහරවල් ගහන්නට මහන්සි ගන්නවා. කවුරු එක්ක කෝන්තියෙන් සිටිනවාද මන්දා. තමන්ගේ වැඩිහිටියන් සමග ටිකක් කෝන්තියෙන් සිටින බව නම් පෙනෙනවා. එතුමා අදත් යෝජනාවක් ගෙනැවිත් වාඩි වුණා. අගමැතිතුමාටත් අධ්‍යාපන ඇමතිතුමාටත් විශේෂයෙන් ඒ ගැන සළකන්නය කිව්වා. අවුරුදු 60 පැනපු මිනිස්සු පක්ෂයෙන් පන්නන්නැයි එතුමා කිව්වා. මට පේන හැටියට එතුමාට ලෙඩක් තිබෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
වාචාලකම.

**අතපත්තු මයා.**
*(திரு. அத்தபத்து)*
(Mr. Atapattu)
එතුමා සිංහල සංස්කෘතිය ගැන සහ බෞද්ධ සංස්කෘතිය ගැන කොතරම් කථා කළත් එහි අදහස එතුමා දන්නවායයි මා සිතන්නේ නැහැ. එතුමා එසේ කතා කිරීම තමාගේ දෙමව්පියන්ට කරන වරදක් හැටියටයි පෙනෙන්නේ. [බාධා කිරීමක්] මා විතරක් නොවෙයි, එවැනි අය නොයෙකුත් පක්ෂවල සිටිනවා. විරුද්ධ පාර්ශ්වයේ වාඩි ගෙන සිටින සමහර මන්ත්‍රීවරුන්ටත් අවුරුදු 60 වෙලා. එහෙත් ඒ උදවියගෙන් ඇතැම් අය අවුරුදු 30, 40, 45 වයසැති අයවලුන් මෙන් ක්‍රියා කරන බව පෙනෙනවා. මගේ කල්පනාවේ හැටියට හබරාදූව ගරු මන්ත්‍රීතුමා කවදාවත් නාකි වන්නේ නැහැ. අවුරුදු 60 වුණාම මොකුත් කරන්නට බැරිය කියා අයින් වනන්ට ඔහු සිතාගෙන සිටිනවා.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
දැන් පුළුවන්ද?

**අතපත්තු මයා.**
*(திரு. அத்தபத்து)*
(Mr. Atapattu)
ඒක මම දන්නේ නැහැ.

එම යෝජනාව එතුමා අද වාගේම ඉස්සරත් කර තිබෙනවා. ඒ කෙසේ වෙතත් එතුමා තරුණයකු නිසා මේ ආණ්ඩුවටවත් ඇවිත්ලා මොකක් හරි ලබා ගන්නට පුළුවන් වේයැයි සිතා සිටිනවාද කියන්න මා දන්නේ නැහැ.

මෙම යෝජනාවට අදාළ දේශනයක් අපේ දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමාගෙන් (බර්නාඩ් සොයිසා මයා.) වත් අසන්නට ලැබුණේ නැහැ. සාමාන්‍යයෙන් දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමා බොහොම තර්කානුකූලව කතා කරන කෙනෙක්. උන්නැහේ කතා කළේ ඒ උදවිය එක මල්ලේ ලුණු කෑ යුගය පිළිබඳවයි. අපි ඒවා මොකවත් දන්නේ නැහැ. අපට වුවමනා කර තිබුණේ මෙම යෝජනාවට අදාළව කතා කරන්නටයි. "මේ රටේ අධ්‍යාපනය සීමා වී තිබෙන්නේ ධනපති පක්ෂයටය; දුප්පත් පන්තියට කිසිම තැනක් නැත" යනුවෙන් කියනවා. අපට එක නිදර්ශනයක්වත් පෙන්වා මෙයින් මෙන්න මේක වෙනවාය කියා කීවේ නැහැ. අධ්‍යාපනය ගැන නොයෙක් දේවල් කීවා. තන්නන්ගර ඇමතිතුමාගේ කාලයේ ඊරියගොල්ල ඇමතිතුමාත් සමග එක වේදිකාවේ සිටගෙන කථා කරද්දී නොයෙක් අදහස් හුවමාරු වුණාය කියා කීවා. ඒ ගැන සන්තෝෂයි. එහෙත් අපට ඒවා ඒ තරම් වුවමනා කරන්නේ නැහැ. ඒ ඇර මේ කරුණ සම්බන්ධව විශේෂ දෙයක් අපට දැනගන්නට ලැබුණේ නැහැ. ඒ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අතපත්තු මයා.]

අනුව ඉදිරිපත් කළ කරුණු කිසිවක් මේ යෝජනාවට ඉදාළ නැති බව කියන්නට සිදු වී තිබෙන බව ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය මෙයින් නතර කරනවා.

අ. භා. 6.28

**කළුගල්ල මයා.**
*(திரு. கலுகல்ல)*
(Mr. Kalugalla)

ගරු කථානායකතුමනි, මේ වැදගත් විවාදයේදී ගරු අධ්‍යාපන ඇමතිතුමාත් ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුත් ගෙනා තර්කවලට ප්‍රතිඋත්තර දෙන්නට කාල වේලාව නැති නිසා මගේ කථාව ඉතාමත්ම කෙටියෙන් කිරීමට මා බලාපොරොත්තු වෙනවා. මේ විශ්වාස භංග යෝජනාව පිළිබඳ විවාදයේදී අපේ අධ්‍යාපන ඇමතිතුමා 1956 සිට 1964 දක්වා ලංකා ජනතාවට අධ්‍යාපනයෙන් සිදු වූ සේවය ගැන වචනයක්වත් මතක් නොකර, 1947 සිට 1955 දක්වාත්, 1965 සිට 1968 දක්වාත් කළ වැඩ පමණක් ප්‍රකාශ කිරීම ගැන මා කණගාටු වෙනවා. එය ගරු අගමැතිතුමා ඉදිරියේදී ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් හා ගරු ඇමතිවරුන් විසින් කරුණු වසන් කිරීමට කළ වෑයමක් හැටියට මා සලකනවා. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුනුත්, ඇමතිවරුනුත්, අගමැතිතුමාත් දැනගත යුතු දෙයක් තමයි රටේ සාමාන්‍ය පොඩි මිනිහාගේ දරුවන්ට 1956 න් පසුව සිදු වූ සේවය කුමක්ද යන්න. එමෙන්ම 1956 සිට 1965 දක්වා සිටි අධ්‍යාපන ඇමතිවරුන්ගෙන් සිදු වූ සේවය ගැනත් මේ ඇමති මණ්ඩලය දැනගත යුතුයි. 1956 සිට 1965 දක්වා කාලය පිළිබඳව එක වචනයක්වත් අධ්‍යාපන ඇමතිතුමා සඳහන් කළේ නැහැ. ඒ කාලය තුළ මොකුත් සිදු වී නැහැ වගෙයි. මේ විවාදයේදී දේශපාලන වාසියක් ලබා ගැනීමට අපේ අධ්‍යාපන ඇමතිතුමා ප්‍රශ්න ඉදිරිපත් කළා මිස අධ්‍යාපනයේ නියම තත්ත්වය හෝ අද ඇති වී තිබෙන අර්බුද ගැන හෝ කිසිවක් කීවේ නැහැ. මේ විශ්වාස භංග යෝජනාවට ආණ්ඩු පක්ෂයේ හැම කෙනෙක්ම පාහේත් දෙමළ ජනතාව වෙනුවෙන්—සාමාන්‍ය පොඩි ජනතාව වෙනුවෙන්—කයිට්ස් මන්ත්‍රීතුමාත් (වී. නවරත්නම් මයා.) පක්ෂව ඡන්දය දෙන්නය කියන එකයි මගේ කල්පනාව. දෙමළ කොන්ග්‍රස් පක්ෂයේ මන්ත්‍රීවරුන් කිසිකෙනෙක් මෙයට සහභාගී වුණේ නැහැ. පෙඩරල් පක්ෂයේ මන්ත්‍රීවරු කුමක් හෝ යටි අදහසක් ඇතිව, උතුරු නැගෙනහිර පළාත්වල සිටින සාමාන්‍ය දෙමළ ජනතාව පාවා දීමක් කර තිබෙනවා.

ස්වභාෂා අධ්‍යාපනය, එනම් සිංහල හා දෙමළ මාධ්‍යයෙන් ඉගැන්වීම, හැමදාම කෙරුණේ මුදල් අයකිරීමක් නැතිවයි. අපේ කන්නන්ගර ඇමතිතුමා විශේෂයෙන් ඉංග්‍රීසි අධ්‍යාපනය නොමිලයේ දීමට කටයුතු සකස් කළා. ප්‍රාථමික පන්තිවල ස්වභාෂාවෙන් ඉගැන්වීම 1955 දක්වාම කෙරීගෙන ආවා. එහෙත් උසස් අධ්‍යාපනය ස්වභාෂාවෙන් ඉගැන්වීමට මුල පිරුවේ 1956 දීයි. එදා ඇමතිවරුන් හැටියට හිටපු කිහිප දෙනෙක් අදත් ඇමතිවරුන් හැටියට ඔය පැත්තේ ඉන්නවා. ඒ නිසා නියම තත්ත්වය එතුමන්ලා පිළිගන්නට ඕනෑ. අධ්‍යාපනය ගැන කථා කරන විට බොරු කරන්නට බැහැ. අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරීන් සියලු දෙනාම මේ ගැන හොඳාකාර දන්නවා. ඊයේ මට අධ්‍යාපන අමාත්‍යාංශයෙන්ම පත්‍රිකා කීපයක් ලබා ගන්නට පුළුවන් වුණා. මගේ කථාවේ අන්තිමට මම ඒවා සියල්ලක්ම සභාමේසය මත තබන්නට බලාපොරොත්තු වෙනවා. ඒවා සියල්ලක්ම මුද්‍රණය කර ලංකාවේ හැම තැනම විසුරුවා හරින්නැයි මම ගරු අගමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. 1956 සිට 1965 දක්වා කාලය තුළ මේ රටේ අධ්‍යාපනය සම්බන්ධයෙන් සිදු වූ ඒ උදාර සේවය පිළිබඳ තොරතුරු දැක්වෙන පත්‍රිකා මුද්‍රණය කර විසුරුවා හරින්නැයි මම කියනවා. එතුමා එසේ නොකළහොත් ගරු කථානායකතුමා ලබන අවුරුද්දේදීවත් විශේෂ වැය ශීර්ෂයක් මගින් මුදල් ලබාගෙන අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් 1964 දී නිකුත් කරන ලද මේ පත්‍රිකා මේ රටේ මහ ජනයාගේ දැනගැනීම පිණිස ප්‍රසිද්ධ කරනු ඇතැයි මම බලාපොරොත්තු වෙනවා.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Show me the procedure whereby I can do it.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**කළුගල්ල මයා.**
*(திரு. கலுகல்ல)*
(Mr. Kalugalla)

අධ්‍යාපනය ගැන ගරු කථානායකතුමා සැලකිල්ලක් දක්වන බව මම දන්නවා. ඒ බව හැම දෙනාම දැනගත යුතුයි. එම නිසයි මම මේවා කියන්නේ. සමහර විට අපේ ගරු අගමැතිතුමාට ඒවා ප්‍රසිද්ධ කරන්නට පුළුවනි. මට මේ සියල්ලම ගැන සඳහන් කරන්නට අද වෙලාවක් ඇති වන්නේ නැහැ. ඒ නිසා ලුහුඬින් කියන්නට කැමතියි.

සිංහල මාධ්‍යයෙන් උසස් අධ්‍යාපනය දෙන්නට ඕනෑය යන තීරණය ගත්තාට පස්සේ, 1959 වන විට සිංහල භාෂාවෙන් විශ්ව විද්‍යාලයේ ඉගැන්වීම නිසා ඉංගිරිසි ඒ. බී. සී. අකුරු පවා දන්නේ නැති ගම් බද සාමාන්‍ය ළමයින් බී.ඒ. විභාගයෙන් පවා සමර්ථ වන තැනට කටයුතු කරන්නට අපට පුළුවන් වුණා. අද ඒ විධියටම අපේ ගරු අධ්‍යාපන ඇමතිතුමා වැඩ කටයුතු භාර ගෙන යනවා. ඒ ගැන මා විරුද්ධත්වය ප්‍රකාශ කරනවා නොවෙයි. එතුමා යම් යම් කරුණු ප්‍රකාශ කළ නිසයි මා මේවා කියන්නේ.

1958දී විද්‍යාව ස්වභාෂාවෙන් ඉගැන්වීමට වැඩ පිළිවෙළ යොදා ඒ සඳහා වුවමනා කරන විද්‍යා පොත්පත් සිංහලයට පරිවර්තනය කර 1963 වන විට සිංහල භාෂාවෙන් විද්‍යාව ඉගැන්වීමට අවශ්‍ය විද්‍යා පොත්පත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සිටින නිල ධාරීන්ගේ සම්පූර්ණ සහාය ඇතිව සකස් කිරීමට පුළුවන් වුණා. 1963 වන විට විද්‍යාව පිළිබඳ පොත්පත් සකස් කිරීමේ කාර්යය භාරව සිටි අධ්‍යාපන අධ්‍යක්ෂ අලස් මහත් මයාගේ සහයෝගය අපට ලැබුණා. ඒ මහත් මයා බොහොම දක්ෂ නිලධාරියෙක්. ඒ සහයෝගය අනුව අපට පුළුවන් වුණා, ජ්‍යෙෂ්ඨ පංක්තිය දක්වා විද්‍යාව ඉගැන්වීමට අවශ්‍ය පොත්පත් සකස් කර ගැනීමටත්, ඒ අනුව සිංහලයෙන් ඉගැන්වීමටත්. ඒ වාගේම මහරගම ගුරුවරුන් පුහුණු කරන අභ්‍යාස විද්‍යාලයේ කටයුතුත් සිංහල භාෂාවෙන් හැඩගස්සා ගැනීමට පුළුවන් වුණා. 1963දී මම නියෝග කළා, විශ්ව විද්‍යාලයේ විද්‍යාව ඉගැන්වීම සිංහල භාෂාවෙන්ම කළ යුතුය යනුවෙන්. මේ නිල ධාරීන්ට, ගරු අගමැතිනිය ඉදිරියේදී, 1964 පටන් ගන්නා විට විශ්ව විද්‍යාලයේ වෛද්‍ය අංශය, ඉංජිනේරු අංශය ආදි අංශවල වැඩ කටයුතු ස්වභාෂාවෙන් ගෙන යන්නට ඕනෑය යන නියෝගය එදා අධ්‍යාපන ඇමති වරයා හැටියට මම දුන්නා. නියෝගය දුන්නා පමණක් නොව ඒ සඳහා වුවමනා කරන පොත්පත් සිංහලයට පරිවර්තනය කරන්නටත් කිව්වා. ඉන් පසු අපේ නිල ධාරි මණ්ඩලය ශීඝ්‍රයෙන්ම ඒ වැඩ පිළිවෙළ ඉදිරියට ගෙන ගියා.

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)

ඊට පෙර ඒ පොත්පත් සිංහලයට පරිවර්තනය කර තිබුණේ නැද්ද?

**කළුගල්ල මයා.**
*(திரு. கலுகல்ல)*
(Mr. Kalugalla)

1956ට ඉස්සර වෙලා සිංහලයෙන් විද්‍යා පොත්පත් තිබුණේ නැහැ.

මුළු ලංකාවේම තිබුණේ උසස් අධ්‍යාපනය දෙන පාඨශාලා 125යි. 1956ට පසුවයි ගම් බද මහා විද්‍යාල ඇති වුණේ. 1956ට ඉස්සර වෙලා තිබුණේ 125ක් පමණයි.

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)

මධ්‍ය මහා විද්‍යාල කීයක් තිබුණාද?

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

ඒවායේ ඉගැන්වූයේ ඉංගිරිසියෙන්. [බාධා කිරීම්.]

**කළුගල්ල මයා.**
*(திரு. கலுகல்ல)*
(Mr. Kalugalla)

හැම දෙයක්ම පටන්ගත්තේ බෝධි ඇල්ලෙන් තමයි. බෝධි ඇල්ලෙන් පටන් ගත් විද්‍යෝදය විද්‍යාලංකාර පිරිවෙන් අද විශ්ව විද්‍යාල බවට පත් වී තිබෙනවා. බෝධි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කළුගල්ල මයා.]

ලැලිවලින් ඇති වුණු මහා විද්‍යාලවලින් ශිෂ්‍යශිෂ්‍යාවන් විශ්ව විද්‍යාලයට පවා ගොස් සිටින බව අධ්‍යාපන ඇමතිතුමාගේ කථාවේදීම කියවුණා. පළමුවෙන් බෝඩ් ලැල්ල සවි කරනවා ; ඊට පසු ගොඩනැගිලි හදනවා ; ඊටත් පසු ගුරුවරුන් පත් කරනවා. එසේ නැතිව, හැම දෙයක්ම එක පාරටම කරන්නට බැහැ.

1963 සිට 1965 වන තුරු මහා විද්‍යාල 550 ක් ඇති කරන්නට මට පුළුවන් වීම ගැන මා සන්තෝෂ වෙනවා. මා අධ්‍යාපන ඇමති වන විට මහා විද්‍යාල තිබුණේ 650 ක් පමණයි. 1964 වන විට එය 1,200 දක්වා වැඩි කරන්නට පුළුවන් වුණා. අධ්‍යාපන ඇමතිතුමා කී අන්දමට, ඒ එකක්වත් බෝඩ් ලැල්ලට පමණක් සීමා කෙළේ නැහැ. මහා විද්‍යාලවලට ගුරුවරුන් පත් කිරීම මා සම්පූර්ණයෙන්ම අධ්‍යාපන අධ්‍යක්ෂ තුරෙයිසිංගම් මහත්මයාට බාර දී තිබුණා. මහා විද්‍යාලයක් ඇති වනවාත් සමගම ඊට අවශ්‍ය උපාධිධාරී ගුරුවරුන් පත් කිරීමේ කාර්යය ඒ දක්ෂ නිලධාරියා ඉතාම උනන්දුවෙන් කළා. අප කිසිම ශිෂ්‍යයකු අනාථ කෙළේ නැහැ. විශ්ව විද්‍යාලයෙන් පිට වන විටම අප හැම කෙනාකුටම රක්ෂා දුන්නා. මුදල් නැත කිවේ නැහැ, පත්වීම් දෙන්නට බැරි යයි කීවේ නැහැ. 1965 ට කලින් සමත් වුණු හැම දෙනාටම අප රක්ෂා දුන්නා. අපට එය නිර්භයවම කියන්නට පුළුවනි. [බාධා කිරීම්] 1965 දී ධනවාදී ආණ්ඩුවක් ඇති වීම නිසත්, පත්වීම් නොදෙන ලෙස ලෝක බැංකුවෙන් කෙරුණු අණ නිසත්, 1965 සිට 1968 වන විට විශ්ව විද්‍යාලයෙන් පිට වුණු උපාධිධාරීන්ගෙන් සියයට 75ක් අද අනාථ වී සිටිනවා.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Order, please! I thought this is a Debate on a Vote of No Confidence on the Hon. Iriyagolle.

**කළුගල්ල මයා.**
*(திரு. கலுகல்ல)*
(Mr. Kalugalla)

කථානායකතුමනි, අපගේ ආණ්ඩුවෙන් මේ රටේ ජනතාවට සිදු වුණු සේවාව ටිකක් වත් අධ්‍යාපන ඇමතිතුමා ප්‍රකාශ කළා නම් මට මෙවැනි දේවල් කියන්නට වුවමනා වන්නේ නැ. විශේෂයෙන්ම උසස් අධ්‍යාපනය සම්බන්ධයෙන් අද මේ රටේ ඇති වී තිබෙන තත්ත්වය කුමක්ද ? විෂයයන් 4 කින් සමත් වුණු සෑම ශිෂ්‍යයකුම අප විශ්ව විද්‍යාලයට ඇතුළත් කළා. ඒ අනුව, 1965 දීත් ශිෂ්‍යශිෂ්‍යාවන් 6,500 දෙනාකු ඇතුළත් කරන්නට අධ්‍යාපන ඇමතිතුමාට සිදු වුණා. එහෙත් දැන් ඒ ප්‍රමාණය සීමා කර තිබෙනවා. මේ වාරයේදී 35,000 ක් පමණ විශ්ව විද්‍යාල ප්‍රවේශ විභාගය ගත් නමුත් ඉන් 30,000 ක් පමණම විශ්ව විද්‍යාලයට ඇතුළත් කරගෙන නැහැ. අද දක්ෂ ශිෂ්‍යයන් විශ්ව විද්‍යාලයට ඇතුළු කරගෙන නැහැ. පේරාදෙණිය විශ්ව විද්‍යාලයට මේ වර නවක ශිෂ්‍යයන් ඇතුළු වුණු වෙලාවේ, එහි උප කුලපති එම්. ජේ. පෙරේරා මහතා ඒ ශිෂ්‍යයන් අමතා කථා කළා. එහිදී ශිෂ්‍ය නායකයකුටත් කථා කරන්නට ඉඩ දුන්නා. 6 වෙනිදා ලංකාදීප, සිරිලක, ඩේලිනිවුස් ආදි පත්‍රවල, එදා උප කුලපති එම්. ජේ. පෙරේරා මහතා ඉදිරිපිට ඒ ශිෂ්‍ය නායකයා කළ කථාව වාර්තාව වී තිබෙනවා. ඒ කථාව අධ්‍යාපන ඇමතිතුමා දන්නවාදැයි මා දන්නෙ නැහැ.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

ඒකට මා උත්තර දී අවසානයි.

**කළුගල්ල මයා.**
*(திரு. கலுகல்ல)*
(Mr. Kalugalla)

ඔව්, එය තමුන්නාන්සේ විශෙෂයෙන් දැනගන්න ඕනැ. ඒ ශිෂ්‍යයා කවුද කියා මා දන්නේ නැහැ. ඒ ශිෂ්‍යයාගේ නම මැල්කම් විජිතපාලයි. ඔහු කියා තිබෙන්නේ,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

කවුරුත් ඒක කිව්වා. මමත් කිව්වා උත්තරත් දුන්නා.

**කළුගල්ල මයා.**
*(திரு. கலுகல்ல)*
(Mr. Kalugalla)

මෙය හැන්සාඩ් වාර්තාවේ පළ විය යුතුයි. ඒ මොකද? මොහු ඉතාමත්ම වීරෝදාර ශිෂ්‍යයෙක්. විශ්ව විද්‍යාලයේ ඉගෙන ගන්න ගන්නා 15,000 ක් පමණ මුළු මහත් ශිෂ්‍ය යන් වෙනුවෙනුයි ඔහු කථා කර තිබෙන්නෙ. ඒ වාගේම මේ කථාව විශ්ව විද්‍යාලයේ උප කුලපතිතුමා ඉදිරිපිට කළ කථාවක් මේ විධියටයි 6 වෙනිදා පත්‍රයේ පළ වී තිබෙන්නෙ :

"දුප්පතාට සරසවි දොර ඇරුණේ 1956 න් පසු වයි... ශිෂ්‍ය නායකයා නවක ශිෂ්‍යයන්ට මතක් කරයි...."

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

ඔහු තුන් හවුලෙ කොමියුනිව් කාරයෙක්. මිනිහගෙ තත්ත්වය මා කියා දුන්නා.

**කළුගල්ල මයා.**
*(திரு. கலுகல்ல)*
(Mr. Kalugalla)

"සහෝදර සහෝදරවරුනි ඔබටත් මටත් මේ විශ්ව විද්‍යාලයේ දොරටුව විවෘත වූයේ 1956 යේ ජනතා ජයග්‍රහනයේ ප්‍රතිඵලයක් වශයෙනි. එහෙත් වර්තමාන අධ්‍යාපන ක්‍රමය පටන් ගන්නා වූ දිසා වත්, ආකාරයත් පිළිබඳව සලකා බලන විට ඔබ අප වැනි දුප්පත් ගම්බද සිසුන්ගේ බුද්ධිය මොට කිරීමටත් උසස් අධ්‍යාපනයක් ලැබීම අහුරා දමීමටත් ඉතා සියුම් වූ වැඩ පිළිවෙළක් වර්තමාන අධ්‍යාපන ප්‍රතිපත්තිය මගින් අරන් ඇති බව රහසක් නොවේ."

මුළු කථාවම කියවන්න මා අදහස් කරන්නෙ නැහැ.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

මට මිනිත්තු බාගයක් දෙනවා නම්—

**කළුගල්ල මයා.**
*(திரு. கலுகல்ல)*
(Mr. Kalugalla)

මේ කථාව විශෙෂයෙන් ශිෂ්‍ය නායක යෙක් කළ කථාවක්. මා හිතනවා කොන්ද පණ ඇති ශිෂ්‍ය නායකයෙක් අද අපේ විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යයන් අතර සිටින බව. මෙම ශිෂ්‍ය නායකයා කවුද කියා මා දන්නෙ නැහැ.

අද ලංකාව සෑම තැනම මේ විශ්ව විද්‍යාල අධ්‍යාපනය පිළිබඳව ආන්දෝලන යක් තිබෙනවා. පසු ගිය සුමානයේ මගේ කොට්ඨාශයේ විශ්ව විද්‍යාල ප්‍රවේශ සහ ජ්‍යෙෂ්ඨ පංක්තිවල ඉගෙන ගන්නා ළමයින් තුන් දාහක් පමණ කෑගලු නගරය දෙවනත් කරමින් "අපේ අධ්‍යාපනය කාබාසිනියා කළාය," "විශ්ව විද්‍යාල මාර්ගය අවහිර කළාය" යනාදි වශයෙන් සටන් පාඨ කියමින් උද්ඝෝෂණය කර ගෙන ගියා.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

තමුන්නාන්සේ අධ්‍යාපනය කෑවා.

**කළුගල්ල මයා.**
*(திரு. கலுகல்ல)*
(Mr. Kalugalla)

ඔව්, මම අධ්‍යාපනය කෑවා. මම අධ්‍යාප නය කෑවෙ මෙහෙමයි. විශ්ව විද්‍යාලයෙන් පිට වන සෑම කෙනකුටම රක්ෂා දුන්නා. මම අධ්‍යාපනය කෑවා.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

752 යි එදා පිට වුණේ.

**කළුගල්ල මයා.**
*(திரு. கலுகல்ல)*
(Mr. Kalugalla)

ජ්‍යෙෂ්ඨ විභාගය සමත් වූ ශිෂ්‍යයන් දහ දාහකට ගුරු පත් වීම් දීගෙන ආවා. ඔව්, මම අධ්‍යාපනය කෑවා. නොමිලේ පොත් පත් දුන්නා. මම අධ්‍යාපනය කෑවා. කවුද කෑවේ කියා මා කියන්න කැමතියි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)
අඩි ඕකට.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
Order, please! Please do not reduce this to the level of a political meeting.

**ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා** (අගලවත්ත)
*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா—அகலவத்த)*
(Dr. Colvin R. de Silva—Agalawatta)
This is a political meeting.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
It is certainly not.

**කළුගල්ල මයා.**
*(திரு. கலுகல்ல)*
(Mr. Kalugalla)
කථානායකතුමනි, මා අධ්‍යාපන ඇමති වශයෙන් විශේෂයෙන් ඒ අවදියේ කර ගෙන ගිය වැඩ ඔය විධියයි. එම වැඩ මේ ඇමතිතුමා ඒ විධියට ගෙන යෑම ගැන අපේ කිසිම විරුද්ධත්වයක් නැහැ. අපේ ඒකම අරමුණ වූයේ විශ්ව විද්‍යාලයෙන් ඉගෙන ගෙන පිට වෙන හැම ශිෂ්‍යයෙකුටම රජයේ හෝ පෞද්ගලික ආයතනයක හෝ කොහේ හෝ රැකියාවක් ලබා දී ඔවුන්ගේ ජීවිය වාසනාවන්ත කර ගැනීමට හැකි වැඩපිළිවෙළක් සකස් කර දීමයි. මොන ආණ්ඩුවක් විසින් හෝ එය කළ යුතුයි. ගරු කථානායකතුමනි, තමුන්නාන්සෙත් පිළිගන්නවා ඇති, 1956 සිට අපි ඒ විධියට කටයුතු කරගෙන ආවා. විශ්ව විද්‍යාලයෙන් පිට වන විට වෛද්‍යවරුන් හෝ වේවා, ඉංජිනේරුවන් හෝ වේවා, කලා උපාධිධාරීන් හෝ වේවා, හැම දෙනාටම අපි රක්ෂාවල් ලබා දුන්නා. නමුත් අපට එක් දෙයක් කරන්න බැරි වුණා. අපි එය පිළිගන්නවා. 1964 දී ශිෂ්‍ය ගුරු විභාගය පැවැත්වූවා. මේ විභාගය අප විසින් ඇති කරන ලද්දේ විශේෂයෙන්ම ජ්‍යෙෂ්ඨ විභාගයෙන් සමත් වන උදවිය පුළුවන් තරම් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට ඇතුළත් කර ගෙන ඒ අයගේ ජීවිත වාසනාවන්ත කිරීමේ අදහස ඇතුවයි. ඒ අනුව 1964 දී ශිෂ්‍ය ගුරු විභාගය පැවැත්වූවා. ශිෂ්‍යයන් 84,332 ක් විභාගයට ඉදිරිපත් වුණා. එයින් 10,000 කට පත්වීම් ලබා දුන්නා. 74,000 ක් පත්වීම නැතුව සිටියා.

අද තත්ත්වය කොහොම ද? අධ්‍යාපන ඇමතිතුමා විශේෂයෙන්ම ජ්‍යෙෂ්ඨය සමත් අය අධ්‍යාපන දෙපාර්තමේන්තුවට ඇතුල් වීමේ කඩුලු සම්පූර්ණයෙන්ම වසා දැම්මා. ඒ වගේම විශ්ව විද්‍යාලයට ඇතුළත් වීමේ දොරටු හුඟක් දුරට අවහිර කළා. එපමණක් නොවෙයි, අද පේරාදෙණියේ විශ්ව විද්‍යාලයේ තත්ත්වය ගැන ටිකක් බලන්න. එහි වැඩි කොටසක් ඉන්නේ ද්‍රවිඩ උදවියයි. අපේ පළාත්වල උදවියට අද පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ඉඩක් නැහැ. ගරු කථානායකතුමනි, මා ඒ සම්බන්ධ සංඛ්‍යා, ලේඛන ඉදිරිපත් කරන්න කැමතියි. පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ වෛද්‍ය අංශය අප විසින් පටන් ගන්නා ලද්දේ 1963 දීයි. අපට ඒ විධියට දෙවැනි වෛද්‍ය විද්‍යාලයක් ඇති කිරීමට වුවමනා කළේ විශේෂයෙන්ම උඩරට උදවිය සඳහායි. ඒ වගේම සබරගමුව, ඌව, ආදී ප්‍රදේශවල උදවිය හුඟ දෙනෙක් ඇතුළත් කර ගැනීමේ අදහසිනුයි. නමුත් අද සිදු වී තිබෙන්නේ මොකක් ද? 1962 සිට 1964 දක්වා කාලය ඇතුළත ඇතුළත් වුණ වෛද්‍ය ශිෂ්‍ය සංඛ්‍යාව මෙසේ යි. සිංහල ශිෂ්‍යයන් සියයට 55 යි; ද්‍රවිඩ ශිෂ්‍යයන් සියයට 45 යි. නමුත් 1965 දී ඇතුළත් කර ගත් සිංහල ශිෂ්‍යයන් ගණන 25 යි; දෙමළ ශිෂ්‍යයන් 70 යි. 1966 දී සිංහල ශිෂ්‍යයන් 10 යි; දෙමළ අය 64 යි. 1967 දී සිංහල ශිෂ්‍යයන් 24 යි; දෙමළ ශිෂ්‍යයන් 51 යි.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
සම්පූර්ණ බොරු.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**කළුගල්ල මයා.**
*(திரு. கலுகல்ல)*
(Mr. Kalugalla)

බොරු නොවෙයි, ඇත්ත. බොරු නම් ඇමතිතුමා හැටියට හෙට ප්‍රකාශයක් කරන්න. වෛද්‍ය අංශයෙන් ලැබුණු සංඛ්‍යා ලේඛනයි මා ඒ ඉදිරිපත් කළේ. විශේෂයෙන්ම අද ෆේඩරල් පක්ෂයේ ඡන්ද ලැබෙන්නේ ඒ නිසයි. උතුරු නැගෙනහිර පළාත්වල සිටින ධනවත් ද්‍රවිඩ උදවියගේ දරුවන්ට පේරාදෙණිය විශ්ව විද්‍යාලය ඇරී තිබෙනවා. උතුරු නැගෙනහිර ප්‍රදේශවල සිටින දුප්පත් ගොවි ජනතාවගේ දරුවන්ට එම විශ්ව විද්‍යාලය සම්පූර්ණයෙන්ම වැසී තිබෙනවා. අද උතුරු නැගෙනහිර පළාත්වල සාමාන්‍ය ජනතාව වෙනුවෙන් පෙනී සිටින මන්ත්‍රීවරුන් හුඟ දෙනෙක් කථා කළේ නැහැ. ඔන්න ඔය විධියටයි අද පේරාදෙණිය විශ්ව විද්‍යාලය සකස් වී තිබෙන්නෙ.

ඒ වගේම මට තවත් කරුණක් කෙටියෙන් සඳහන් කළ යුතුව තිබෙනවා. මට තව තිබෙන්නේ විනාඩි 10 ක කාලයක් පමණයි. 1964 දී අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් පිට කරන ලද "අධ්‍යාපන ගමනේ මඟ සලකුණ" කියා පත්‍රිකාවක් තිබෙනවා. ඒ පත්‍රිකාවේ අඩංගු දේවල් මම කියවන්නම්. නිදහස් අධ්‍යාපන ක්‍රමය ඇරඹුණේ 1945 දීයි. 1947 දී, ප්‍රාථමික පන්තිවල ස්වභාෂා මාධ්‍යයෙන් ඉගැන්වීම ඇරඹුණා. එහෙත් ගම්බද පාඨශාලාවල නවීන විද්‍යාව ඉගැන්වීම ආරම්භ වුණේ 1957 දීයි. 1959 දී පළාත්බද කණිෂ්ඨ කාර්මික විද්‍යාල ඇති වුණා. ඒ වාගේම විද්‍යෝදය හා විද්‍යාලංකාර යන පිරිවෙන් විශ්ව විද්‍යාල බවට පත් කළෙත් ඒ අවුරුද්දේදීමයි. 1960 සිට 1968 දක්වා වූ කාලය තුළ උපකෘත පාඨශාලා 2,854 ක් රජයට ගැනීමත්, ජාතික අධ්‍යාපන කොමිසම හා කාර්මික අධ්‍යාපන කොමිසම පත් කිරීමත්, නව කාර්මික හා අභ්‍යාසන දෙපාර්තමේන්තුව පිහිටුවීමත්, අධ්‍යාපන ධවල පත්‍රිකාව ඉදිරිපත් කිරීමත් කෙරුණා. 1963 දී විද්‍යාව සිංහලෙන් ඉගැන්වීම ආරම්භ වුණු අතර, පාසල් පොත් රජය මගින් මුද්‍රණය කිරීම හා ප්‍රථම වරට ශිෂ්‍ය ගුරුවරුන් 10,000 ක් පත් කිරීමත් සිදු වුණේ 1964 දීයි.

අප වැඩ කරගෙන ගිය අන්දම ඒ අනුව කාටත් පැහැදිලි වෙනවා ඇති. එපමණකුත් නොවෙයි. ගම්බද දරුවන්ට කාර්මික අධ්‍යාපනයක් දීම සම්බන්ධයෙන් කිසිම වැඩ පිළිවෙළක් 1956 ට පෙර තිබුණේ නැහැ. වර්තමාන අධ්‍යාපන ඇමතිතුමාත් ඒ කාලයේ දී අප සමඟ එක් වී එකම වේදිකාවේ කථා කළේත්, එක්ව සටන් කළේත් ඒ නිසයි.

විශේෂයෙන් කාර්මික අධ්‍යාපනය ගම්බද දුප්පත් ළමුන්ටත් ලබා දීම සඳහා අප කළ වැඩ කොටස කුමක් දැයි, "ලක්දිව කාර්මික අධ්‍යාපන දියුණුවේ තවත් පියවරක්" නමැති පත්‍රිකාවෙන් උපුටා දක්වන්නම්:

"ප්‍රථම වරට ප්‍රදේශයක කණිෂ්ඨ කාර්මික විද්‍යාල ආරම්භ කරන්නට යෙදුණේ 1957 දීය. පළමුවෙන් ගාල්ලේත්, ඊට පසුව, යාපනේ, මහනුවර හා බදුල්ල යන ස්ථානයන්හිත් පිහිටුවන ලද කණිෂ්ඨ කාර්මික විද්‍යාල මගින් බලාපොරොත්තු වූයේ, කාර්මික අධ්‍යාපනය රටපුරා ව්‍යාප්ත කරලීමයි. මෙතෙක් දෙපාර්තමේන්තුවල අවශ්‍යතාවන් ප්‍රධාන වශයෙන් සපුරා ගැනීමට මධ්‍යස්ථානය කොට පැවති කාර්මික අධ්‍යාපනය මෙසේ දිවයින පුරා පතුරුවාලීමට ගන්නා ලද පියවර කෙතරම් සතුටුදායක වීදයත්, මුලදී පළාත් නවය අනුව නගර නවයක පිහිටුවීමට බලාපොරොත්තු වූ කණිෂ්ඨ කාර්මික විද්‍යාල, දැන් සෑම දිස්ත්‍රික්ක නගරයකම පිහිටුවාලීමට තීරණය කොට ඇත."

තීරණය කළා පමණක් නොව කුරුණෑගල, කෑගල්ල හා තවත් දිස්ත්‍රික්ක නගර කීපයකම කණිෂ්ඨ කාර්මික විද්‍යාල පිහිටුවාගෙන ආවා. එහෙත් මේ රජය මගින් ඒ වැඩ පිළිවෙළ සම්පූර්ණයෙන්ම අහෝසි කර තිබෙනවා. මුළු කෑගලු දිස්ත්‍රික්කයේම දරුවන්ගේ කාර්මික අධ්‍යාපනය වෙනුවෙන් රුපියල් ලක්ෂ 5 ක පමණ වියදමින් කෑගල්ලේ පිහිටුවූ කණිෂ්ඨ කාර්මික විද්‍යාලයෙන් දැන් කිසිම ප්‍රයෝජනයක් ගන්නේ නැහැ. ඒ අනුව අපට කියන්නට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමති ගරු අයි. එම්. ආර්. ඒ. ඊරියගොල්ල කෙරෙහි

**[කළුගල්ල මයා.]**

පුළුවනි, වර්තමාන අධ්‍යාපන ඇමතිතුමා කාර්මික අධ්‍යාපනය දියුණු කිරීම සම්බන්ධයෙන් කිසිම පියවරක් ගන්නේ නැති බව.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

ගරු මන්ත්‍රීතුමා මේ ගරු සභාවේ ඔය තරම් බොරු කියන්නේ ඇයි ?

**කළුගල්ල මයා.**
*(திரு. கலுகல்ல)*
(Mr. Kalugalla)

මෙය දේශපාලන වේදිකාවක් නොවෙයි. මා කියවූයේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ පත්‍රිකාවලින් උපුටා ගෙනයි. නිලධාරීන්ට බොරු කරන්න බෑ.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

ඕවා ප්‍රචාරක පත්‍රිකා. [බාධා කිරීම්]

**කළුගල්ල මයා.**
*(திரு. கலுகல்ல)*
(Mr. Kalugalla)

අධ්‍යාපන ඇමතිතුමා මොනවා කීවත් අපේ කාලයේ නම් විශාල අධ්‍යාපන දියුණුවක් තිබුණා. මා අධ්‍යාපන ඇමතිතුමාට පෞද්ගලිකව චෝදනා කරන්නේ නැහැ. අධ්‍යාපන ඇමතිතුමාට විරුද්ධව මේ විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කර තිබුණත්, මුළු රජයේම ප්‍රතිපත්ති කෙරෙහි විශ්වාස භංගත්වයකුයි, එයින් පළ කරන්නේ. මේ රජයට වුවමනා වී තිබෙන්නේ, ගම්බද පොඩි මිනිහාගේ දරුවාගේ අධ්‍යාපනය මොට කරන්නටයි.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

ඕවා කියා ඡන්දය ගන්න බෑ.

**කළුගල්ල මයා.**
*(திரு. கலுகல்ல)*
(Mr. Kalugalla)

මේවා ඡන්දය ගන්න කියන ඒවා නොවෙයි. අප මේ කරුණු ඔප්පු කළා.

බණ්ඩාරනායක මැතිනිය ගරු අධ්‍යාපන ඇමතිතුමාට ප්‍රශංසා කළ බව අධ්‍යාපන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්තුමා ප්‍රකාශ කළා. අත්තනගල්ලේ සිරි සඟබෝ මහා විද්‍යාලයේදී මැතිනිය අධ්‍යාපන ඇමතිතුමාට ප්‍රශංසා මුඛයෙන් කථා කළාලු. අධ්‍යාපන ඇමතිතුමා අධ්‍යාපනයට මහත් සේවයක් කර තිබෙනවා යයි එතුමිය කොයිම අවස්ථාවකදීවත් ප්‍රකාශ කර නැහැ. එහෙත් සිරිසඟබෝ විද්‍යාලයට විද්‍යාගාරයක් දීම ගැන එතුමිය අධ්‍යාපන ඇමතිවරයාට ස්තුතිවන්ත වුණා. ඒ විද්‍යාගාරය දීමට පටන් ගත්තේ 1958 දී යි. [බාධා කිරීමක්] විද්‍යාගාර ගම්බද පාඨශාලාවලට දීමේ ප්‍රතිපත්තිය පටන් ගත්තේ 1958 දීයි. [බාධා කිරීමක්] ඊට කලින් ලංකාවේ මධ්‍ය මහා විද්‍යාල 57 ට පමණයි, විද්‍යාගාර තිබුණේ. ගම්බද විද්‍යාලවලට විද්‍යාගාර දෙන්නට පටන් ගත්තේ 1958 සිටයි.

ප්‍රශ්නය විමසන ලදී.

කටහඬවල් අනුව "විරුද්ධ" මන්ත්‍රීන්ට ජය බව කථානායකතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

வினா விடுக்கப்பெற்றது.

குரல்களின்படி "இல்லை" என்றவர்களுக்கு வெற்றியென சபாநாயகர் அவர்களால் பிரகடனப் படுத்தப் பட்டது.

*Question put.*

MR. SPEAKER, *having collected the Voices, declared that the "Noes" had it.*

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்ஸா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

Divide, by name !

මන්ත්‍රී මණ්ඩලය මතු පළ වන අන්දමට— පක්ෂව 49 ; විරුද්ධව 82 ; යනුවෙන්—බෙදුණේය:

சபை பிரிந்தது : சார்பாக 49 ; எதிராக 82.

*The House divided ; Ayes* 49 ; *Noes* 82

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පක්ෂව

சார்பாக

AYES

ආර්. එම්. අප්පුහාමි මයා.
திரு. ஆர். எம். அப்புஹாமி
Mr. R. M. Appuhamy

ඒ. එල්. අබ්දුල් මජීඩ් මයා.
ஜனாப் ஏ. எல். அப்துல் மஜீது
Mr. A. L. Abdul Majeed

එම්. සී. අහමඩ් මයා.
ஜனாப் எம். சீ. அகமது
Mr. M. C. Ahamed

ඩබ්ලිව්. පී. ජී. ආරියදාස මයා.
திரு. டபிள்யூ. பி. ஜீ. ஆரியதாஸ
Mr. W. P. G. Ariyadasa

ටී. බී. ඉලංගරත්න මයා.
திரு. ரீ. பீ. இலங்கரத்ன
Mr. T. B. Ilangaratne

ජේ. පී. ඔබේසේකර මිය.
திருமதி ஜே. பி. ஒபயசேகர
Mrs. J. P. Obeyesekere

පී. බී. ජී. කලුගල්ල මයා.
திரு. பீ. பி. ஜீ. கலுகல்ல
Mr. P. B. G. Kalugalla

එච්. ජී. ඇල්බට් කාරියවසම් මයා.
திரு. எச். ஜீ. அல்பேட் காரியவசம்
Mr. H. G. Albert Kariyawasam

රාජා කුලතිලක මයා.
திரு. இராஜா குலத்திலக
Mr. Raja Kulatillake

පී. ජී. බී. කෙනමන් මයා.
திரு. பீ. ஜீ. பி. கெனமன்
Mr. P. G. B. Keuneman

චම්ලි ගුණවර්ධන මයා.
திரு. சம்ளி குணவர்தன
Mr. Cholmondeley Goonewardene

ලෙස්ලි ගුණවර්ධන මයා.
திரு. லெஸ்லி குணவர்தன
Mr. Leslie Goonewardene

ප්‍රින්ස් ගුණසේකර මයා.
திரு. பிறின்ஸ் குணசேகர
Mr. Prins Gunasekera

සෝමවීර චන්ද්‍රසිරි මයා.
திரு. சோமவீர சந்திரசிறி
Mr. Somaweera Chandrasiri

ලක්ෂ්මන් ජයකොඩි මයා.
திரு. இலக்ஷ்மன் ஜயக்கொடி
Mr. Lakshman Jayakody

ස්ටැන්ලි තිලකරත්න මයා.
திரு. ஸ்ரான்லி திலகரத்ன
Mr. Stanley Tillekeratne

බී. වයි. තුඩාවේ මයා.
திரு. பீ. வை. துடாவ
Mr. B. Y. Tudawe

පී. එම්. කේ. තෙන්නකෝන් මයා.
திரு. பி. எம். கே. தென்னக்கோன்
Mr. P. M. K. Tennakoon

ටී. බී. තෙන්නකෝන් මයා.
திரு. ரீ. பீ. தென்னக்கோன்
Mr. T. B. Tennakoon

ආර්. ජේ. ජී. ද මැල් මයා.
திரு. ஆர். ஜே. ஜீ. த மெல்
Mr. R. J. G. de Mel

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
கலாநிதி கொல்வின் ஆர். த சில்வா
Dr. Colvin R. de Silva

එම්. පී. ද සොයිසා සිරිවර්ධන මයා.
திரு. எம். பீ. த சொய்சா சிறிவர்தன
Mr. M. P. de Zoysa Siriwardena

ඩබ්ලිව්. ඒ. ධර්මදාස මයා.
திரு. டபிள்யு. ஏ. தர்மதாச
Mr. W. A. Dharmadasa

එච්. එම්. නවරත්න මයා.
திரு. எச். எம். நவரத்ன
Mr. H. M. Nawaratna

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පක්ෂව

சார்பாக

AYES

වී. නවරත්නම් මයා.
திரு. வீ. நவரத்தினம்
Mr. V. Navaratnam

ඩී. ටී. පස්කුවල් මයා.
திரு. டீ. ரி. பஸ்குவல்
Mr. D. T. Pasqual

කේ. ඩී. ඩී. පෙරේරා මයා.
திரு. கே. டீ. டீ. பெரேரா
Mr. K. D. D. Perera

ආචාර්ය එන්. එම්. පෙරේරා
கலாநிதி என். எம். பெரேரா
Dr. N. M. Perera

බී. එච්. බණ්ඩාර මයා.
திரு. பீ. எச். பண்டார
Mr. B. H. Bandara

එස්. ඩී. බණ්ඩාරනායක මයා.
திரு. எஸ். டீ. பண்டாரநாாக்க
Mr. S. D. Bandaranayake

සිරිමාවෝ ආර්. ඩී. බණ්ඩාරනායක මිය.
திருமதி சிறிமாவோ ஆர். டீ. பண்டாரநாயக்க
Mrs. Sirimavo R. D. Bandaranaike

ආර්. බී. රත්නමලල මයා.
திரு. ஆர். பீ. இரத்னமலல
Mr. R. B. Ratnamalala

කේ. බී. රත්නායක මයා.
திரு. கே. பீ. இரத்நயக்க
Mr. K. B. Ratnayake

මල්ලිකා රත්වත්තෙ මිය.
திருமதி எம். ஈ. இறத்வத்தெ
Mrs. M. E. Ratwatte

ජෝර්ජ් රාජපක්ෂ මයා.
திரு. ஜோர்ஜ் இராஜபக்ஷ
Mr. George Rajapaksa

ලෙටිෂියා රාජපක්ෂ මිය.
திருமதி லெரீஷியா இராஜபக்ஷ
Mrs. Leticia Rajapakse

රත්නසිරි වික්‍රමනායක මයා.
திரு. இரத்தினசிறி விக்கிரமநாயக்க
Mr. Ratnasiri Wickramanayake

පර්සි වික්‍රමසිංහ මයා.
திரு. பேர்ஸி விக்கிரமசிங்க
Mr. Percy Wickremasinghe

ලීලාරත්න විජේසිංහ මයා.
திரு. லீலாரத்ன விஜேசிங்க
Mr. Leelaratne Wijesinghe

පී. බී. විජේසුන්දර මයා.
திரு. பீ. பி. விஜேசுந்தர
Mr. P. B. Wijesundara

ඩී. පී. ආර්. වීරසේකර මයා.
திரு. டீ. பீ. ஆர். வீரசேகா
Mr. D. P. R. Weerasekera

රාජා වෙලේගම මයා.
திரு. இராஜா வெலேகம
Mr. Raja Welegama

හේමචන්ද්‍ර සිරිසේන මයා.
திரு. ஹேமச்சந்திர சிறிசேன
Mr. Hemachandra Sirisena

ටී. බී. සුබසිංහ මයා.
திரு. ரீ. பீ. சுபசிங்க
Mr. T. B. Subasinghe

එස්. කේ. කේ. සූරියාරච්චි මයා.
திரு. எஸ். கே. கே. சூரியாராச்சி
Mr. S. K. K. Suriyarachchi

සෝමරත්න සෙනරත් මයා.
திரு. சோமரத்ன செனரத்
Mr. Somaratne Senarath

මෛත්‍රීපාල සේනානායක මයා.
திரு. மைத்திரிபால சேனநாயக்க
Mr. Maithripala Senanayeke

බර්නාඩ් සොයිසා මයා.
திரு. பேணட் சொய்சா
Mr. Bernard Soysa

ටී. බී. එම්. හේරත් මයා.
திரு. ரீ. பி. எம். ஹேரத்
Mr. T. B. M. Herath

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

විරුද්ධව

எதிராக

NOES

ගරු ඩඩ්ලි සේනානායක
கௌரவ டட்லி சேனநாயக்க
The Hon. Dudley Senanayake

ගරු අයි. එම්. ආර්. ඒ. ඊරියගොල්ල
கௌரவ ஐ. எம். ஆர். ஏ. ஈரியகொல்ல
The Hon. I. M. R. A. Iriyagolle

ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න
கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன
The Hon. N. H. A. M. Karunaratne

ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන
கௌரவ டீ. பி. ஆர். குணவர்தன
The Hon. D. P. R. Gunawardena

ගරු ජේ. ආර්. ජයවර්ධන
கௌரவ ஜே. ஆர். ஜயவர்தன
The Hon. J. R. Jayewardene

ගරු එම්. ඩී. එච්. ජයවර්ධන
கௌரவ எம். டீ. எச். ஜயவர்தன
The Hon. M. D. H. Jayawardena

ගරු මොන්ටේගු ජයවික්‍රම
கௌரவ மொன்ரேகு ஜயவிக்கிரம
The Hon. Montague Jayewickreme

ගරු සී. පී. ද සිල්වා
கௌரவ சி. பீ. த சில்வா
The Hon. C. P. de Silva

ගරු ආචාර්ය ඩබ්ලිව්. දහනායක
கௌரவ கலாநிதி டபிள்யு. தஹநாயக்க
The Hon. Dr. W. Dahanayake

ගරු හියු ප්‍රනාන්දු
கௌரவ ஹியு பெர்ணண்டோ
The Hon. Hugh Fernando

ගරු ආර්. ප්‍රේමදාස
கௌரவ ஆர். பிரேமதாச
The Hon. R. Premadasa

ගරු එම්. ඩී. බණ්ඩා
கௌரவ எம். டீ. பண்டா
The Hon. M. D. Banda

ගරු එම්. එච්. මොහමඩ්
கௌரவ எம். எச். முகம்மது
The Hon. M. H. Mohamed

ගරු ඊ. එල්. සේනානායක
கௌரவ ஈ. எல். சேனநாயக்க
The Hon. E. L. Senanayake

ගරු ඊ. එල්. බී. හුරුල්ලෙ
கௌரவ ஈ. எல். பீ. ஹுருல்ல
The Hon. E. L. B. Hurulle

ගරු එන්. විමලසේන
கௌரவ என். விமலசேன
The Hon. N. Wimalasena

ගරු ඩී. බී. වෙලගෙදර
கௌரவ டீ. பி. வெலகெதர
The Hon. D. B. Welagedara

ඩී. පී. අතපත්තු මයා.
திரு. டி. பீ. அத்தபத்து
Mr. D. P. Atapattu

පී. සී. ඉඹුලාන මයා.
திரு. பீ. சீ. இம்புலான
Mr. P. C. Imbulana

විමලා කන්නන්ගර මිය., එම්.බී.ඊ.
திருமதி விமலா கன்னங்கர, எம்.பீ.ஈ.
Mrs. Wimala Kannangara, M.B.E.

ඩී. ෂෙල්ටන් ජයසිංහ මයා.
திரு. டீ. ஷெல்டன் ஜயசிங்க
Mr. D. Shelton Jayasinghe

එස්. ද එස්. ජයසිංහ මයා., ඕ.බී.ඊ.
திரு. எஸ். த எஸ். ஜயசிங்க, ஓ.பீ.ஈ.
Mr. S. D. S. Jayasinghe, O.B.E.

ගාමිනී ජයසූරිය මයා.
திரு. காமனி ஜயசூரிய
Mr. Gamani Jayasuriya

එල්. බී. දසනායක මයා.
திரு. எல். பி. தஸநாயக்க
Mr. L. B. Dassanayaka

එස්. ඒ. පීරිස් මයා., ඕ.බී.ඊ.
திரு. எஸ். ஏ. பீரிஸ், ஓ.பீ.ஈ.
Mr. S. A. Peiris, O.B.E.

සී. ආර්. බෙලිගම්මන මයා.
திரு. சி. ஆர். பெலிகம்மன
Mr. C. R. Beligammana

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

විරුද්ධව

எதிராக

NOES

එම්. එම්. මුස්තාපා මයා.
ஜனாப் எம். எம். முஸ்தபா
Mr. M. M. Mustapha

විජයපාල මෙන්ඩිස් මයා.
திரு. விஜயபால மெண்டிஸ்
Mr. Wijayapala Mendis

සී. පී. ජේ. සෙනෙවිරත්න මයා.
திரு. சீ. பி. ஜே. செனெவிரத்ன
Mr. C. P. J. Seneviratne

එම්. ෆලීල් අබ්දුල් කෆූර් මයා., එම්.බී.ඊ.
ஜனாப் எம். பளீல் அப்துல் கபூர், எம்.பீ.ஈ.
Mr. M. Falil Abdul Caffoor, M.B.E.

එම්. අබ්දුල් බකීර් මාකර් මයා.
ஜனாப் எம். அப்துல் பாக்கீர் மாக்கார்
Mr. M. Abdul Bakeer Markar

එම්. ඒ. අබ්දුල් මජීඩ් මයා.
ஜனாப் எம். ஏ. அப்துல் மஜீது
Mr. M. A. Abdul Majeed

ජෝර්ජ් අබයගුණසේකර මයා.
திரு. ஜோர்ஜ் அபயகுணசேகர
Mr. George Abeyagoonasekera

එම්. එස්. අමරසිරි මයා.
திரு. எம். எஸ். அமரசிறி
Mr. M. S. Amarasiri

ඒ. අමිර්තලිංගම් මයා.
திரு. ஏ. அமிர்தலிங்கம்
Mr. A. Amirthalingam

සුගතදාස අරඹවල මයා.
திரு. சுகததாச அறம்பவெல
Mr. Sugathadasa Arambewala

ඇලික් අලුවිහාරේ මයා.
திரு. அலிக் அலுவிகாரை
Mr. Alick Aluvihare

ඩී. පී. ආටිගල මයා.
திரு. டீ. பீ. ஆட்டிகல
Mr. D. P. Attygalle

සී. එෆ්. ඩබ්ලිව්. එදිරිසූරිය මයා.
திரு சீ. எவ். டபிள்யு. எதிரிசூரிய
Mr. C. F. W. Edirisuriya

එච්. බී. ඒකනායක මයා.
திரு. எச். பி. எக்கநாயக்க
Mr. H. B. Ekanayake

සී. එන්. කන්නන්ගර මයා.
திரு. சீ. என். கன்னங்கர
Mr. C. N. Kannangara

චන්ද්‍රා කරුණාරත්න මයා.
திரு. சந்திரா கருணாரத்ன
Mr. Chandra Karunaratne

එච්. කුලරත්න මයා.
திரு. எச். குலரத்ன
Mr. H. Kularatne

රාජනීතිඥ එස්. ජේ. වී. චෙල්වනායගම් මයා.
திரு. எஸ். ஜே. வி. செல்வநாயகம், கியு.ஸி.
Mr. S. J. V. Chelvanayakam, Q.C.

එම්. ඒ. ඩැනියෙල් මයා.
திரு. எம். ஏ. டானியல்
Mr. M. A. Daniel

ඩී. ඊ. තිලකරත්න මයා.
திரு. டீ. ஈ. திலகரத்ன
Mr. D. E. Tillekeratne

කේ. තුරෙයිරත්නම් මයා.
திரு. கே. துரைரத்தினம்
Mr. K. Thurairatnam

එස්. තොන්ඩමන් මයා.
திரு. எஸ். தொண்டமான்
Mr. S. Thondaman

කේ. ඩබ්ලිව්. දේවනායගම් මයා.
திரு. கே. டபிள்யூ. தேவநாயகம்
Mr. K. W. Devanayagam

ආර්. එම්. ධර්මදාස බණ්ඩා මයා.
திரு. ஆர். எம். தர்மதாச பண்டா
Mr. R. M. Dharmadasa Banda

වී. ධර්මලිංගම් මයා.
திரு. வி. தர்மலிங்கம்
Mr. V. Dharmalingam

වී. එන්. නවරත්නම් මයා.
திரு. வீ. என். நவரத்தினம்
Mr. V. N. Navratanam

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

විරුද්ධව

எதிராக

NOES

වෛද්‍යාචාර්ය ඊ. එම්. වී. නාගනාතන්
டொக்டர் ஈ. எம். வீ. நாகநாதன்
Dr. E. M. V. Naganathan

ඒ. පිලපිටිය මයා.
திரு. ஏ. பிலப்பிற்றிய
Mr. A. Pillapitiya

ෆේස්ටස් පෙරේරා මයා.
திரு. பெஸ்ரஸ் பெரேரா
Mr. Festus Perera

ජී. ජේ. පාරිස් පෙරේරා මයා.
திரு. ஜீ. ஜே. பாரிஸ் பெரேரா
Mr. G. J. Paris Perera

රාජ්‍ය නීතිඥ ජී. ජී. පොන්නම්බලම් මයා.
திரு. ஜீ. ஜீ. பொன்னம்பலம், இயு.ஸி.
Mr. G. G. Ponnambalam, Q.C.

ඩෙන්සිල් ප්‍රනාන්දු මයා.
திரு. டென்சில் பெர்ணண்டோ
Mr. Denzil Fernando

එම්. රස්කින් ප්‍රනාන්දු මයා.
திரு. எம். றஸ்கின் பெர்ணண்டோ
Mr. R. Ruskin Fernando

ඩබ්ලිව්. එම්. ජී. ටී. බණ්ඩා මයා.
திரு. டபிள்யு. எம். ஜீ. ரீ. பண்டா
Mr. W. M. G. T. Banda

ඩී. එම්. ටී. බණ්ඩාර මයා.
திரு. டீ. எம். ரீ. பண்டார
Mr. D. M. T. Bandara

එස්. එම්. මානික්කරාජා මයා.
திரு. எஸ். எம். மாணிக்கராசா
Mr. S. M. Manickarajah

සී. එන්. මැතිව් මයා.
திரு. சீ. என். மத்தியூ
Mr. C. N. Mathew

පී. ජී. මුතුබණ්ඩා මයා.
திரு பி. ஜீ. முத்துபண்டா
Mr. P. G. Muthubanda

එම්. ඉසදීන් මොහමඩ් මයා.
ஜனாப் எம். இஸ்ஸதீன் முகம்மது
Mr. M. Izzadeen Mohamed

එම්. ඊ. එච්. මොහමඩ් අලි මයා.
ஜனாப் எம். ஈ. எச். முகம்மது அலி
Mr. M. E. H. Mohamed Ali

ඩී. බී. රණතුංග මයා.
திரு. டீ. பீ. றணதுங்க
Mr. D. B. Ranatunga

වෛද්‍යාචාර්ය ඒ. රත්නපාල
வைத்திய கலாநிதி ஏ. இரத்னபால
Dr. A. Ratnapala

සී. රාජදුරෙයි මයා.
திரு. சீ. இராசதுரை
Mr. C. Rajadurai

එස්. එම්. රාසමානික්කම් මයා.
திரு. எஸ். எம். இராசமாணிக்கம்
Mr. S. M. Rasamanickam

එස්. බී. ලේනව මයා.
திரு. எஸ். பி. லேனவ
Mr. S. B. Lenawa

ඩී. බී. විජේතුංග මයා.
திரு. டீ. பி. விஜேதுங்க
Mr. D. B. Wijetunga

ආර්. පී. විජේසිරි මයා.
திரு. ஆர். பீ. விஜயசிறி
Mr. R. P. Wijesiri

එඩ්මන්ඩ් විජේසූරිය මයා.
திரு. எட்மண்ட் விஜயசூரிய
Mr. Edmund Wijesuriya

පී. බී. ඒ. වීරකෝන් මයා.
திரு. பி. பீ. ஏ. வீரக்கோன்
Mr. P. B. A. Weerakoon

වෛද්‍යාචාර්ය එම්. එච්. සද්ධාසේන
வைத்திய கலாநிதி எம். எச். சத்தாசேன
Dr. M. H. Saddhasena

ඒ. ලතීෆ් සින්නලෙබ්බේ මයා.
ஜனாப் ஏ. லத்தீவ் சின்னலெப்பை
Mr. A. Latiff Sinnalebbe

ජේ. එල්. සිරිසේන මයා.
திரு. ஜே. எல். சிறிசேன
Mr. J. L. Sirisena

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

විරුද්ධව ...

எதிராக

NOES

එම්. සිවසිතම්පරම් මයා.
திரு. எம். சிவசிதம்பரம்
Mr. M. Sivasithamparam

ටී. සිවසිතම්පරම් මයා.
திரு. ரீ. சிவசிதம்பரம்
Mr. T. Sivasithamparam

ඒ. සී. එස්. හමීඩ් මයා.
ஜனாப் ஏ. சீ. எஸ். ஹமீத்
Mr. A. C. S. Hameed

එස්. බී. හේරත් මයා.
திரு. எஸ். பி. ஹேரத்
Mr. S. B. Herat

## කල් තැබීම
### ஒத்திவைப்பு
### ADJOURNMENT

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

I move,

"That the House do now adjourn."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

வினா விடுக்கப்பெற்று ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

මන්ත්‍රී මණ්ඩලය ඊට අනුකූලව අ. භා. 7.11 ට, 1968 ඔක්තෝබර් 11 වන සිකුරාද පූ. භා. 10 වන තෙක් කල් ගියේ ය.

அதன்படி சபை பி. ப. 7.11 க்கு, 1968 ஒக்ரோபர் 11, வெள்ளிக்கிழமை மு. ப. 10 மணிவரை ஒத்திவைக்கப்பெற்றது.

*Adjourned accordingly at 7.11 P.M. until 10 A.M. on Friday, 11th October 1968.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දායක මුදල් : මුදල් ගෙවන දිනෙන් පසුව ඇරඹෙන මාසයේ සිට මාස 12ක් සඳහා රු. 32.00යි. (අශෝධිත පිටපත් සඳහා නම් රු.35.00යි.) මාස 6කට ගාස්තුවෙන් අඩකි. පිටපතක් ශත 30යි. තැපෑලෙන් ශත 45යි. මුදල්, කොළඹ ගාලු මුවදොර, මහලේකම් කාර්යාලයේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කලින් එවිය යුතුය.

சந்தா : பணம் கொடுத்த தேதியையடுத்துவரும் மாதம் தொடக்கம் 12 மாதத்துக்கு ரூபா 32.00 (திருத்தப்படாத பிரதிகள் ரூபா 35.00) 6 மாதத்துக்கு அரைக்கட்டணம். தனிப்பிரதி 30 சதம், தபால்மூலம் 45 சதம், முற்பணமாக அரசாங்க வெளியீட்டு அலுவலக அத்தியட்சரிடம் (த. பெ. 500, அரசாங்க கருமகம், கொழும்பு 1) செலுத்தலாம்.

Subscriptions : 12 months commencing from month following date of payment Rs. 32.00 (uncorrected copies Rs. 35.00). Half rates for 6 months, each part 30 cents, by post 45 cents, payable in advance to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. Box 500, Colombo 1

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org